


REDMI NOTE 9S
AI QUAD CAMERA

Scanned with CamScanner

# දුම්රිය මාර්ගයේ තිබූ මළසිරුර

සයිමන් අප්පුහාමි රේල් ගේට්ටුවක සේවය කළ මුරකරුවෙකි. ඔහු සේවය කළ දුම්රිය ගේට්ටුව පිහිටා තිබුණේ ඔහුගේ නිවසේ සිට සැතැප්ම කාලක් පමණ දුරින් ය. දරුවන් නොමැති, සයිමන්ගේ භාර්යාව වූ සිසිලියානාත් ඔහුගේ නැන්දම්මා වූ වයස්ගත කරෝලිනා හාමිනේත් සයිමන් අප්පුහාමි සමග ඔහුගේ නිවසේ ජීවත් වූ හ.

සයිමන් වාසය කළ නිවසට යාර සීයයක් පමණ දුරින් පිහිටි, දුම්රිය මාර්ගයේ ඇති වංගුවේ දී පෙර දින රාත්‍රියේ මිනිසෙකු දුම්රියට හසුව මැරී සිටින බවට පුවතක්, පසුදා උදේ ගම පුරා පැතිර ගියේ ය. මරණයට පත් වී ඇත්තේ ගමේ ජීවත් වූ සංසදාස නමැත්තා බව, මළසිරුර බැලීමට පැමිණි අය හඳුනා ගත් හ. සංසදාස ධීවර රැකියාවේ යෙදී සිටි අයෙකි. සිද්ධිය ආරංචි වූ සංසදාසගේ බිරිය හඬා වැලපෙමින් මළසිරුර හමු වූ ස්ථානයට පැමිණ, එම මළසිරුර තම ස්වාමිපුරුෂයාගේ බවට හඳුනා ගත්තා ය. කැබලිවලට කැඩී තිබූ සංසදාසගේ සිරුරෙහි ද ඔහු ඇඳ සිටි ඇඳුම්වල ද රුධිරය, ලිහිසි තෙල්, වැලි සහ පස් තැවරී තිබූ අතර ඔහු ඇඳ සිටි සරම සහ කමිසය ද තැන් තැන්වලින් ඉරී තිබුණි. දුම්රිය මාර්ගයේ තිබී සංසදාසගේ මළසිරුර සොයා ගත් අවස්ථාව වන විට එම ස්ථානයෙන් දුම්රිය දෙකක් ධාවනය වී තිබුණත් මිනිසකු දුම්රියට හසු වූ බවක් වාර්තා වී නො තිබුණි. ලිහිසි තෙල් තැවරී අපවිත්‍ර වී කැඩී බිඳී ගිය සංසදාසගේ සිරුර දුටු කීප දෙනෙකුම කියා සිටියේ, ඔහු බේබද්දෙක් බැවින් හෙතෙම බීමත්ව දුම්රිය මාර්ගය ඔස්සේ තම නිවසට යන විට දුම්රියට හසු වී මිය යන්නට ඇති බවයි.

මෙම ආරංචිය පළාතේ පොලිසියට දැන්වීමෙන් පසුව පරීක්ෂණ පැවැත්වීම සඳහා මළසිරුර තිබූ ස්ථානයට පොලිස් සැරයන්වරයෙක් පැමිණියේ ය. අපරාධ නඩු විධාන සංග්‍රහයේ ( Criminal Procedure Code ) තුන්සිය හැත්තෑවෙනි වගන්තිය යටතේ කිසියම් අයකු මහා මාර්ගයේ දී වාහනයකට හසු වී මරණයට පත් වූ විට හෝ දුම්රිය මාර්ගයේ දී දුම්රියට හසු වී මිය ගියේ නම්, හදිසි මරණ පරීක්ෂණයක් ( inquest ) පැවැත්විය යුතු වේ. ඒ අනුව, සංසදාසගේ



Scanned with CamScanner

මරණය පිළිබඳව පළාතේ පොලිසිය විසින් හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්විය

සංසදාසගේ මළසිරුර හමු වූ දිනට පෙර දින, රාත්‍රියේ හතයි නිහට පමණ මලගෙදරක යන බව පවසා ඇතු නිවසෙන් පිට වූ බව නිහට පමණ මලගෙදරක යන බව පවසා ඇතු නිවසෙන් පිට වූ බව මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දුන් ඔහුගේ බිරිය පැවසුවා ය. රේල් ගේට්ටු මුරකරු වූ සයිමන්, රාත්‍රී සේවයට යන විට රේල් පාරේ දී සංසදාස තමාට හමු වූ බව මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දෙමින් සඳහන් කළේ ය. එදින අලුයම හතරයි තිහට පමණ තමා මුහුදු ගොස් ගෙදර එන විට දුම්රිය මාර්ගයේ දී සංසදාස හමු වූ බවත්, ඒ අවස්ථාවේ දී සංසදාස බීමත්ව සිටි බවත් මළ ගෙදර දී බුරුවා ගසා මුදල් පරාද වූ බව ඇතු තමන් සමග ප්‍රකාශ කළ බවත් සයිමන්ගේ ඥාති සහෝදරයකු වූ මාටින්, හදිසි මරණ පරීක්ෂණයේ දී ප්‍රකාශ කළේ ය.

ගමේ මළ ගෙයක් වූ විට සාමාන්‍යයෙන් බුරුවා ගැසීම කරන බැවින්; එයට සම්බන්ධ වී මුදල් පැරදීමෙන් පසුව හට ගත් හිතේ අමාරුවට සංසදාස ධාවනය වන දුම්රියකට පැන දිවි නසා ගත් බව සමහරු පැවසූ හ. සංසදාසගේ මරණය පිළිබඳව පරීක්ෂණ පැවැත් වූ පළාතේ පොලිසිය ද එලෙසම සිතුවේ ය.

සංසදාස දුම්රිය අනතුරට ලක් වූ බවට ඇසින් දුටු සාක්ෂි ( eye witness ) නො තිබූ බැවින්, තීන්දුවක් දීමට පෙර මළසිරුර වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ යුතු බවට තීරණය කළ හදිසි මරණ පරීක්ෂකවරයා, පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පළාතේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා වෙත එය යොමු කළේ ය. එම කාලය තුළ පළාතේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා පුහුණු වැඩ මුළුවක් සඳහා සහභාගි වීමට ගොස් තිබූ බැවින් රෝහලේ අධිකරණ වෛද්‍ය කටයුතු කළේ ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරියෙකි. ඔහු මීට පෙර පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණයක් නො පවත්වා ඇති හෙයින් කළ යුත්තේ කුමක් දැයි පළාතේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියාට දුරකථනයෙන් අමතා උපදෙස් පැතී ය.

ඒ අනුව, විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා විසින් පහත සඳහන් උපදෙස් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියාට දෙන ලදී. මහා මාර්ගයේ



රිය අනතුරකට භාජනය වී මිය ගිය අයෙකුගේ වෛද්‍ය පරීක්ෂණයක් පවත්වන විට ඇසින් දුටු සාක්ෂි ඉදිරිපත් වූ අවස්ථාවල එම සාක්ෂිවල විශ්වාසනීය භාවය සත්‍ය වුවත්, අධිකරණ වෛද්‍යවරයාගේ අවධානය යොමු විය යුත්තේ සැබවින්ම මරණය සිදු වී ඇත්තේ රිය අනතුරකින් ද නැති නම් ඒ තැනැත්තා වෙත යම් ආකාරයකින් මරණයට පත් කොට රිය අනතුරකින් මිය ගිය බව පෙන්වීමට මාර්ගයේ මළසිරුර දමා ඇද්ද යැයි සොයා ගැනීම ගැන ය. යම් අයකු දුම්රියට හැපීමෙන් සිදු විය නො හැකි ඇනුම් තුවාල, කැපුම් තුවාල, තැලුම් තුවාල සහ ගෙල මිරිකීම්වලින් හා වෙඩි වැදීම් වලින් සිදුවිය හැකි තුවාල, කට බැඳ තැබීම්, අත්පා බැඳ තැබීම් සහ විස වර්ග ශරීරගතවීම් යනාදිය තිබේ දැයි සොයා බැලීම වෛද්‍යවරයා විසින් විශේෂයෙන් කළ යුතු බවට ද, උපදෙස් දෙන ලදී.

තවද, මීට පෙර අධිකරණ වෛද්‍ය මරණ පරීක්ෂණයක් පවත්වා නොමැති නම් මෙවැනි පරීක්ෂණයක් පැවැත්වීම සුදුසු නො වන බව ද අධිකරණ වෛද්‍යවරයා වැඩ බලන දිස්ත්‍රික් වෛද්‍යවරයාට උපදෙස් දුන්නේ ය. තවද, එම වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීම සඳහා විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාට යොමු කළ යුතු බව හදිසි මරණ පරීක්ෂකවරයාට නිර්දේශ කිරීම සුදුසු බව තව දුරටත් විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා එම වෛද්‍ය නිලධාරියාට උපදෙස් දෙමින් දන්වා සිටියේ ය. විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා සංසදාසගේ වෛද්‍ය පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ දී එය නිරීක්ෂණය කිරීමට ශ්‍රේණිගත වෛද්‍යවරයාට ද ආරාධනා කළේ ය.

එක් අයෙකුට වඩා මිය ගිය රිය අනතුරක දී වුව ද ඉහත සඳහන් කරුණු අධිකරණ වෛද්‍යවරයාගේ අවධානයට ලක් කළ යුතු අතර, එවන් අනතුරුවල දී ඇසින් දුටු සාක්ෂි බොහෝ ඇති බැවින් එවැනි අවස්ථාවල ප්‍රායෝගික වශයෙන් අධිකරණ වෛද්‍යවරයා වැඩි අවධානය යොමු කළ යුත්තේ, මියගිය අයගේ මරණයට හේතුව සොයා ගැනීම සහ ඔවුන් කවුරුන් දැයි හඳුනා ගැනීමට ය. රිය අනතුරක දී හෝ වෙනයම් අනතුරක දී විශාල මගීන් සංඛ්‍යාවක් මිය යන අවස්ථාවල දී මියගිය අයවලුන්ගේ ඥාතීනට රක්ෂණය මගින් හෝ රජය මගින් වන්දි මුදල් ගෙවන බැවින් මියගිය අය හඳුනා ගැනීම ඉතාම වැදගත් වේ. මරාගෙන මැරෙන කල්ලි විසින් බෝම්බයක් ( suicide bombers ) පුපුරුවා විශාල සංඛ්‍යාවක් මරණයට



Scanned with CamScanner

පත් කරන අවස්ථාවල ද මියගිය සැම දෙනාම හඳුනා ගැනීම හැකිතාක් දුරට අධිකරණ වෛද්‍යවරයා විසින් කළ යුතු ය. සාවද්‍ය හඳුනා ගැනීමක් නිසා මරා ගෙන මැරෙන ඝාතක කල්ලියේ අයට වන්දි මුදල් ගෙවීම කිසිසේත්ම සාධාරණ නො වන නිසා මියගිය අය හඳුනා ගැනීම ඉතාම වැදගත් වේ. මහා මාර්ගයේ සිදුවන වාහන අනතුරක දී සහ දුම්රිය මාර්ගයේ සිදුවන අනතුරක දී මියගිය අයගේ තුවාල මරණයට පසුව සිදු වූ ඒවා ද, නැතහොත් මරණයට පෙර සිදු වූ ඒවා ද යන්න වෛද්‍ය පරීක්ෂණයක දී මළසිරුර පරීක්ෂා කිරීමෙන් පසුව වෛද්‍යවරයා විසින් තීරණය කළ යුතු ය. ඒ අනුව, සංසදාසගේ මළසිරුර වෛද්‍ය පරීක්ෂණය සඳහා පළාතේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කරන ලදී. තවද, විශේෂඥ වෛද්‍යවරයාගේ උපදෙස් මත මළසිරුර හමු වූ ස්ථානයේ සිට මෘතශරීරාගාරයට රැගෙන යාමට පෙර එය නයිලෝන් මල්ලකට බහාලන ලදී.

මීට අවුරුදු කීපයකට පෙර අධිකරණ නියෝගයක් මත සිදු කරනු ලැබූ වෛද්‍ය පරීක්ෂණ මළසිරුර සොයා ගත් ස්ථානයේ දී ම පැවැත්වීම සාමාන්‍ය සිරිත විය. එවැනි පරීක්ෂණවලට ක්ෂේත්‍රයේ දී පවත්වනු ලබන පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණ ( field post mortem examination ) යැයි නම් කරන ලදී. මහජනයා බොහෝ සේ ගැවසෙන ස්ථානයක හෝ මහා මාර්ගයක් අසල හෝ වත්තක හෝ පුද්ගලික නිවසක් අසල මළසිරුරක් විච්ඡේදනය කිරීම සාර ධර්මයන්ට ද ( unethical ) පටහැනි වන අතර මහජනයාගේ සෞඛ්‍යට ද හානිකර ය. තවද, ක්ෂේත්‍රයේ දී පවත්වනු ලබන එවැනි පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය නල ජලය, ආලෝකය, වාතාශ්‍රය, විදුලිය සහ අනෙකුත් පහසුකම් නොමැතිකම නිසා මළසිරුරුවල වෛද්‍ය පරීක්ෂණ ක්ෂේත්‍රයේ දී ම පැවැත්වීම දැනට සම්පූර්ණයෙන්ම නවතා ඇත. එනමුත්, මළසිරුර හමු වූ ස්ථානයේ දී ම වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීමට ඇතැම් පොලිස් නිලධාරීන් විසින් අධිකරණ වෛද්‍ය කටයුතුවල යෙදෙන දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්ගෙන් බලපෑම් කරනු ලැබේ.

අධිකරණ නියෝගයක් මත සිදු කරන පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණයක් වගකීමෙන් යුතුව සුපරීක්ෂාකාරීව කළ යුතු බැවින් නල ජලය, ආලෝකය, උපකරණ පාවිච්චි කිරීමට විදුලිය, වාතාශ්‍රය සහ එක්ස් කිරණ ( X - ray ) යන්ත්‍රයක් යනාදී පහසුකම් ඇති මෘත



ශරීරාගාරයකට මළසිරුරු රැගෙන යාම කළ යුතු ය. අප රටේ එක්ස් කිරණ යන්ත්‍ර ඇත්තේ මහ රෝහල්වල සහ මූලික රෝහල්වල පමණක් බැවින් වෙඩි වැදීමෙන්, බෝම්බ ප්‍රහාරවලින්, ගෙල මිරිකීමෙන් මිය ගියේ යැයි සැක කරන අයගේ මළසිරුරු සහ දැඩි ලෙස පිළිස්සී ගිය මළසිරුරු විච්ඡේදනය කිරීමට පෙර අනිවාර්යයෙන්ම එක්ස් කිරණ පරීක්ෂාවට භාජනය කළ යුතු බැවින් එවැනි පරීක්ෂණ දිස්ත්‍රික් රෝහල්වල නො පැවැත්විය යුතු ය. දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියෙකුට එවැනි මළසිරුරුවල පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීමට මහේස්ත්‍රාත්වරයකු විසින් නියෝග කරනු ලැබූ විට, එවැනි පරීක්ෂණ සංකීර්ණ ඒවා බව ගරු මහේස්ත්‍රාත්වරයාට දන්වා එවැනි පශ්චාත් මරණ පරීක්ෂණයන් විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු ලවා කිරීම සුදුසු බව ගරු මහේස්ත්‍රාත්වරයාට නිර්දේශ කළ යුතු වේ. මළසිරුර හමු වූ ස්ථානයේ සිට මෘත ශරීරාගාරයට රැගෙන යාම පරීක්ෂණ භාර පොලිසියේ වගකීම වේ. එනමුත්, බොහෝ අවස්ථාවල මළසිරුරු රෝහල් මෘත ශරීරාගාරයට රැගෙන එන්නේ ඥාතීන්ගේ වියදමෙන් හෝ පරීක්ෂණය භාර පොලිස් නිලධාරියා ගේ දැඩි කැපවීම සහ උනන්දුව නිසා ය. මේ පිළිබඳව උසස් පොලිස් නිලධාරීන් මුනිවත රැකීම කණගාටුවට කරුණකි. මළසිරුරු මෘතශරීරාගාරයට රැගෙන ඒම සඳහා දැනට ක්‍රියාත්මක වන ක්‍රමය වෙනුවට සංවිධානාත්මක රාජකාරී මට්ටමේ වැඩ පිළිවෙලක් සකස් කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාට යොමු කරන ලද සංසදාසගේ මළසිරුරේ වෛද්‍ය පරීක්ෂණය මහ රෝහලක දී පවත්වන ලදී. විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා ප්‍රථමයෙන්ම කළේ සංසදාසට වෙඩි තබා හෝ කපා කොටා හෝ ගෙල මිරිකා හෝ පිහියකින් ඇන හෝ මොට ආයුධයකින් පහර දී මරා දමා ඇද් දැයි හඳුනා ගැනීම සඳහා නයිලෝන් මල්ලේ දමා තිබිය දී ම මළසිරුර කොටස් වශයෙන් එක්ස් කිරණ පරීක්ෂාවට භාජනය කිරීමයි. වෙඩි උණ්ඩ හෝ මුනිස්සම්වල ඡායා එක්ස් කිරණ පටලවල දක්නට නො වී ය. අස්ථීන්වල කැපුම් හෝ ඛණ්ඩක අස්ථිය භග්නයවීම් යන මේවා කිසිවක් ද එක්ස් කිරණ ඡේයා පටලවල දක්නට නො ලැබුණි. සංසදාසට වෙඩි තබා හෝ මන්නා හෝ කඩු වැනි දිග පිහි වලින් කපා කොටා හෝ ගෙල මිරිකා මරා දමා නොමැති බව එක්ස් කිරණ පරීක්ෂාවෙන් අනතුරුව විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා



Scanned with CamScanner

තීරණය කළේ ය. ඉන් පසු, වෛද්‍යවරයා විසින් සංසදාසගේ මළසිරුරේ බාහිර පරීක්ෂාව දැඩි ලෙස කරන ලද අතර, අදාල සටහන් තබා ගැනීමෙන් පසුව ඡායාරූප ගත කිරීම කරන ලදී. අනතුරුව, උණුවතුරෙන් සහ රසායනික සැව්ලෝන් වතුරින් මළසිරුර සෝදා එහි තැවරී තිබුණු වැලි, රුධිරය, ලිහිසි තෙල් සහ අනෙකුත් අපද්‍රව්‍ය ඉවත් කරන ලදී. එසේ මළසිරුර පිරිසිදු කිරීමෙන් පසුව උදරයේ ඉදිරිපස දකුණු පැත්තේ නාභියට පහතින් උදරය තුළට විනිවිද ගිය ඇනුම් තුවාලයක් ඇති බව වෛද්‍යවරයාට දක්නට ලැබුණි. එය දික් වූ සිදුරක් හෝ නූල් ඔතන ඉද්දක ( thread spindle ) හැඩය ඇති තුවාලයක් විය. එම තුවාලයේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා දිග අඟලක් වූ අතර, එහි මැද කොටසෙහි පළල නූල් දෙකක් විය. තුවාලයෙහි දාර දෙකම තියුණු ලෙස කැපී තිබුණු අතර එහි උඩ දාරය පහත දාරයට වඩා ඇලව කැපී තිබුණි. එම ඇනුම් තුවාලය සම්පූර්ණයෙන්ම උදර කුහරය තුළට විනිවිද ගොස් තිබුණු අතර උදර කුහරයේ ඇති ප්‍රධාන ශිරාව ද ( vein ) කැපී තිබුණි. උදර කුහරය තුළ ග්‍රෑම් දාහක පමණ රුධිර කැටියක් ( blood clot ) විය.

යම් අයෙකුගේ උදරයට පිහියෙන් ඇනීමෙන් එම තැනැත්තා අවම වශයෙන් පැය භාගයක් පමණ ජීවත්ව සිටියේ නම් උදර කුහරය තුළට රුධිරය වහනය වූ විට රුධිරයේ කැටිවීමක් සිදු වේ. යම් අයකු දුම්රියට හසු වූ විට හෝ දුම්රියට පැන මරණයට පත් වූ විට සිරුරේ ලේ කැටි ගැසීමක් ඇති නො වේ. එයට හේතුව ලේ කැටි වීමට පෙර තුවාලකරු මිය යන නිසා ය. කැඩී බිඳී ගිය ස්ථානවල තිබූ පටක තුළට රුධිරය උරා නො තිබුණි. මළසිරුරේ කැඩිබිඳී ගිය ස්ථානවල තිබූ රුධිරය ජලයෙන් සෝදා ඉවත් කිරීමට හැකි බවත් වෛද්‍යවරයාට පෙනුණි. දුම්රියක හැපීමේ දී ඇනුම් තුවාලයක් සිදු විය නො හැකි බව වෛද්‍යවරයාට පෙනී ගියේ ය. එවැනි තුවාලයක් ඇති විය හැක්කේ මරණයට පෙර උල් පිහියකින් උදරයට ඇනීමකින් බව විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය.

යම්කිසි කෙනකු අබිරහස් ලෙස මොනයම් ආකාරයකින් හෝ මරණයට පත්කොට මියගිය තැනැත්තාගේ සිරුර මහා මාර්ගයක හෝ දුම්රිය මාර්ගයේ තැබීම හෝ උස ගොඩනැගිල්ලකින් බිමට



දැමීමක් යන අවස්ථාවන්හි දී සිරුරේ කැඩුම් බිඳුම්, අවසන්ධිවීම් හෝ අභ්‍යන්තර ඉන්ද්‍රියයන්වල දරුණු තුවාල හට ගනී. මෙම තුවාල මරණයෙන් පසුව ( post mortem wound ) සිදු වන තුවාල යැයි නම් කරනු ලැබේ. මරණයට පෙර සිදු වූ තුවාලයක ( ante mortem wound ) පටක තුළට රුධිරය උරා යෑම නිසා ( tissues are infiltrated with blood ) ප්‍රබල ජල ධාරාවකින් ( stream of running water ) එම තුවාල පිරිසිදු කළත් උරා ගිය රුධිරය ඉවත් කළ නො හැකි ය. මරණයට පසුව සිදු කරන තුවාලයන්හි ( post mortem wounds ) පටකවලට රුධිරය උරා යාමක් නොමැති නිසා මරණයට පෙර සිදු වූ සහ මරණයට පසුව සිදු වූ තුවාල වෙන් කර ගැනීමට තුවාල ජල ධාරාවකින් සේදීම කරනු ලැබේ. එසේ වුවත් පළපුරුදු අධිකරණ වෛද්‍යවරයෙකුට පවා මෙම වෙනස බොහෝ අවස්ථාවල නිසැකව බාහිරව පරීක්ෂා කිරීමෙන් පමණක් වෙන් කර හඳුනා ගත නො හැකි ය. එබැවින්, සංසදාසගේ මළසිරුරේ තිබූ තුවාල මරණයට පෙර සිදුවූ ඒවා ද නැතහොත් මරණයට පසුව සිදුවූ ඒවා ද යන්න ස්ථිරව දැන ගැනීමට පටකවේද පරීක්ෂාව ( histopathological examination ) කිරීමට සිදු විය.

පශ්චාත් මරණ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද, සෙන්ටි මීටර් එකක් දිග, එකක් පළල සහ මිලිමීටර් තුනක් ඝනකම සහිත ශරීරයේ කුඩා කැබලි ෆෝමලින් ද්‍රාවනයක ( solution ) අවම වශයෙන් දින තුනක්වත් තැබීමෙන් පසුව යන්ත්‍රයක ( histokinette ) ආධාරයෙන් ක්‍රමයෙන් සාන්ද්‍රණය වැඩිවන ඊතයිල් මධ්‍යසාරය ( ethyl alcohol ) තුළ තැබීමෙන් පසුව, කොලොරොෆෝම්වල ( choloroform ) බහා ඉන් පසුව ඉටිවල තැබිය යුතු ය. එසේ ප්‍රසරය ( processed ) කරන ලද පටක මයික්‍රොටෝම යන්ත්‍රයක ( microtome ) ආධාරයෙන් මියු ( micron ) පහක හෝ හයක ඝනකමකින් යුත් තුනී තීරුවලට කපා ඊට පසුව හෙමොටොක්ස්සලින් ( haemotoxyalin ) සහ ඉයොසින් ( eosin ) රසායනිකවලින් වර්ණ ගන්වා ( staining ) අන්වීක්ෂයකින් පරීක්ෂා කරනු ලැබේ ( microsiopic examination ). මෙයට පටකවේද පරීක්ෂාව යැයි ( histopathological examination ) කියනු ලැබේ.

කිසි යම් අයකු මරණයට පත් කොට හඳුනා ගැනීම වැලැක්වීම සඳහා ශරීරයේ කොටස් කපා ඉවත් කරනු ලැබේ. එක්දහස් නවසිය තිස් හතේ දී එංගලන්තයේ ලැංකස්ටර් හි වෛද්‍ය වෘත්තියේ නියැලී



Scanned with CamScanner

සිටි බක්ස් රක්ස්ටන් නමැති වෛද්‍යවරයා විසින් ඔහුගේ බිරිය වන ඉසබෙලා රක්ස්ටන් මහත්මිය සහ ඇයගේ මෙහෙකාරිය වූ මේරි රොජර්සන් යන කාන්තාවන් දෙදෙනා මරණයට පත්කොට ඔවුන්ගේ සිරුරු කොටස්වලට කපා ඉවත් කොට එංගලන්තයේ නොයෙක් ස්ථානවල දමා තිබුණි. මෙවැනි සිදුවීමක් ලෝකයේ වාර්තා වූ ප්‍රථම අවස්ථාවයි. ශ්‍රී ලංකාවේ ද පසුගිය කාළයේ ඇති වූ භීෂණ සමයේ දී ඝාතන කල්ලි විසින් පුද්ගලයන් වෙඩි තබා හෝ වෙනයම් ආකාරයකින් මරණයට පත් කොට බෙල්ල කපා කඳෙන් ඉවත් කොට සහ අත් පා කපා දැමීම යනාදිය සිදු කරනු ලැබූ හ. බල්ලන්, බළලුන්, මීයන්, කබරගොයින් සහ මාලුන් වැනි සතුන් විසින් ඇතැම් අවස්ථාවල මළසිරුරු කා දමනු ලැබේ. මළසිරුරේ ඇති තුවාල මරණයට පෙර සිදු වූ තුවාල ද නැතහොත් මරණයට පසුව සිදු කළ තුවාල ද යන්න වෙන් කර ගැනීම අධිකරණ වෛද්‍යවරයට අයත් කාර්යයක් වේ. ඇතැම් අපරාධ නඩු විභාගවල දී පැමිණිල්ල විසින් වරද ඔප්පු කිරීමට මෙම වෙනස අධිකරණයට පහදා දීම අවශ්‍ය වේ.

යම් අයෙකු මරණයට පත් කිරීමෙන් පසුව කරනු ලබන තුවාලයන්හි ( antemortem wounds ) කුඩා ධමනිකා ( arterioles ), අනු ශිරා ( venules ), කේශනාලිකා ( capillaries ) යනාදිය තුළ ( intra vascular space ) රුධිරය තිබෙන අතර එම තැනැත්තා ජීවත්ව සිටින විට එම තුවාල සිදු කළේ නම්, කුඩා ධමනිකා, අනුශිරා සහ කේශනාලිකාවලින් බාහිරව ඇති බහිවාහිනික පරතරයෙහි ( extra vascular space ) රුධිරය එකතු වේ. ඒ අනුව, සංසදාසගේ සිරුරේ නාභියේ තිබූ ඇනුම් තුවාලයේ කොටසක් පටකවේද පරීක්ෂාවට ලක් කිරීමෙන් පසුව දක්නට ලැබුණේ එම තුවාලය මරණයට පෙර සිදු කළ තුවාලයක් බව ය.

සංසදාස මිය යෑමට පෙර මාටින්ට දුම්රිය මාර්ගයේ දී හමු වී කථා කළ බවත්, ඒ අවස්ථාවේ දී ඔහු බීමත්ව සිටි බවත් මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දෙමින් මාටින් පවසා තිබූ බැවින්, සංසදාස මිය යෑමට පෙර මත් පැන් පානය කර සිටියේ දැයි දැන ගැනීමට ඔහුගේ මළසිරුරෙන් රුධිරය ලබා ගෙන රස පරීක්ෂක වෙත යැවීමට අධිකරණ වෛද්‍යවරයා විසින් කටයුතු කරන ලදී. සංසදාසගේ රුධිරයේ ඊතයිල් මධ්‍යසාරය නො තිබුණ බව රස පරීක්ෂකවරයා



වාර්තා කොට තිබුණි. ඒ අනුව මිය යාමට පෙර සංසදාස මත් පැන් පානය කර නොමැති බව තහවුරු විය.

මිය යාමට පෙර යම් අයකු මත් පැන් පානය කර ඇත් දැයි යන්න දැන ගැනීම සඳහා ආමාශය ( stomach ) තුළ තිබෙන ද්‍රව්‍යවල පිළුණු ( stale ) මත් පැන් ගඳ වහනය වනවා දැයි නිරීක්ෂණය කිරීම බොහෝ වෛද්‍ය නිලධාරීන් භාවිතා කරන ක්‍රමයකි. මෙම පියවර එතරම් සාර්ථක ක්‍රමයක් නො වේ. මළසිරුරෙන් ලබා ගන්නා රුධිරයේ ( blood taken during postmortem eximination ) ඊතයිල් මද්‍යසාරය විශ්ලේෂණය කිරීම සඳහා රස පරීක්ෂක වෙත යැවීම විද්‍යාත්මකව සුදුසුම ක්‍රමයයි. මරණයෙන් පසුව ආමාශයේ මද්‍යසාර උත්පාදනය ( production ) වන . නිසා එම මද්‍යසාරය විසරණය (diffussion) වන නිසා උදර කුහරයේ වාහිනී තුළ තිබෙන රුධිරය ඊතයිල් මද්‍යසාරය විශ්ලේෂණය කිරීම සඳහා පශ්චාත් වෛද්‍ය මරණ පරීක්ෂණයේ දී ලබා ගැනීම සුදුසු නො වේ.

යම් අයකු මද්‍යසාරය පානය කිරීමෙන් පසුව පැය දොළහක් ඇතුලත මරණයට පත් වී ඇත්නම් පමණක්, එම මළසිරුරෙන් ලබා ගත් රුධිරයේ මද්‍යසාරය තිබේ දැයි කිව හැකි ය. මත් පැන් පානය කළ තැනැත්තා දළ වශයෙන් පැය දොළහක් ඉක්මවා ජීවත් වී මරණයට පත්වූයේ නම්, සාම්පලයේ ඇති මද්‍යසාර ක්‍රමයෙන් ක්ෂය වී යනු ඇත. යම් අයකු මරණයට පෙර පානය කළ මද්‍යසාරය මරණයෙන් පසුව වුව ද ආමාශයෙන් උදර කුහරයේ ඇති රුධිර වාහිනීවලට විසරණය වන බැවින් උදර කුහරයේ ඇති ශිරාවලින් මද්‍යසාරය විශ්ලේෂණය කර ගැනීම සඳහා රුධිර සාම්පල ලබා ගත යුතු නො වේ. මේ සඳහා ඉන ප්‍රදේශයේ ඇති ඌරු ශිරාවෙන් (femoral vein) රුධිරය ලබා ගත යුතු ය. එම රුධිරය කැටි ගැසීම වැළැක්වීමට පොටෑසියම් ඔක්සලේට් හෝ ඊ ඩී ටී ඒ ( EDTA ) නම් රසායනික කුඩු එකතු කළ යුතු ය. මළසිරුරෙන් ලබා ගන්නා ලද සාම්පලයේ රතු රුධිරානු මගින් ඊතයිල් මද්‍යසාරය සුළු ප්‍රමාණයක් වුවත් උත්පාදනය වන බැවින් ලබා ගන්නා ලද රුධිර සාම්පලයට සෝඩියම් ෆ්ලෝරයිඩ් ( sodium fluoride ) රසායනික සංයෝගය ද එකතු කරනු ලැබේ. එම නිසා මළසිරුරුවල ඊතයිල් මධ්‍යසාරය විශ්ලේෂණය කිරීම සඳහා ඉන ප්‍රදේශයේ පිහිටි ඌරු ශිරාවෙන් ( femoral vein ) අවම වශයෙන් මිලිලීටර් දහයක්වත් රුධිරය ලබා



Scanned with CamScanner

ගත යුතු වේ. මෙම සාම්පල පරීක්ෂණය බාර පොලිසියේ නිලධාරියකු මගින් රස පරීක්ෂකවරයා වෙත විස්තරාත්මක ආවරන ලිපියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

සංසදාසගේ උදරයට උල් පිහියකින් ඇනීමෙන් උදර කුහරයට ලේ වහනය වීම නිසා කම්පනය ඇති වී මිය යාමෙන් පසුව සංසදාස දුම්රිය අනතුරකට භාජනය වී මරණයට පත් වී ඇති බව පෙන්වීමට ඔහුගේ මළසිරුර දුම්රිය මාර්ගයේ තබා ඇති බව පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණයෙන් පසුව, විශේෂඥ වෛද්‍යවරයා නිගමනය කොට ඒ බව අධිකරණයට වාර්තා කළේ ය.

සංසදාසගේ මරණය මනුෂ්‍ය ඝාතනයක් බව වෛද්‍ය පරීක්ෂණයෙන් ඔප්පු වූ නිසා, ඔහුගේ මරණය සිදු කළ සැකකරුවන් අත් අඩංගුවට ගැනීම පොලිසියට භාර විය. රාත්‍රී හතයි තිහට පමණ සංසදාස මළගෙදරක යන බව පවසා නිවසින් පිට වූ බවට ඔහුගේ බිරිය මහේස්ත්‍රාත් පරීක්ෂණයේ දී සාක්ෂි දී තිබුණි. එදිනම රාත්‍රී අටට පමණ සයිමන් මුර සේවය සඳහා යන විට දුම්රිය මාර්ගයේ දී සංසදාස හමු වූ බවටත් සාක්ෂියක් තිබුණි. තවද, සංසදාසගේ මළසිරුර හමු වූ දින පෙරවරු හතරයි තිහට පමණ දුම්රිය මාර්ගයේ දී මාටින්ට සංසදාස හමු වී බූරුවා ගැසීමෙන් පසු විශාල මුදලක් පරාද වූ බව පැවසූ බවටත් සාක්ෂියක් තිබුණි. පෙරවරු හතරයි තිහට මාටින්ට දුම්රිය මාර්ගයේ දී සංසදාස හමු වූ බවට සාක්ෂියක් තිබුණ නිසා සංසදාස බූරුවා ගැසීමෙන් පසුව ඔහු පිටත් වූ වේලාව පිළිබඳව පරීක්ෂණය බාර පොලිස් නිලධාරියා මළගෙදර අයගෙන් සාක්ෂි ලබා ගත්තේ ය. එවිට ඔවුන් පැවසුවේ සංසදාස තවත් තිපදෙනෙකු සමග බූරුවා ගසා රාත්‍රී එකොළහට පමණ මළගෙදරින් පිට වී ගිය බව ය.

ඉදිරිපත්ව තිබූ සාක්ෂි පරස්පර විරෝධී බැවින් ද සංසදාස සහ සයිමන්ගේ බිරිඳ වන සිසිලියානාත් අතර අනියම් සම්බන්ධයක් තිබූ බවට ගමේ කට කථා පැතිරී තිබූ බැවින් ද සයිමන්, සයිමන්ගේ බිරිඳ සහ ඔහුගේ නැන්දම්මා පොලිසියට කැඳවා වෙන් වෙන් වශයෙන් ඔවුන්ගෙන් පොලිස් නිලධාරීන් විසින් ප්‍රශ්න කරන ලදී. එවිට තිදෙනාම එකහෙලාම ප්‍රකාශ කළේ සංසදාස මරණයට පත් වූ ආකාරය ඔවුන් නො දන්නා බව ය.



ඉන් පසුව සයිමන්ගේ භාර්යාව සහ නැන්දම්මා පොලිසියේ ඇති වෙනත් කාමරයකට යවන ලදී. එහි දී ඔවුන් ගෙන් තොරතුරු ලබා ගැනීමට තැත් කළ පොලිස් නිලධාරීන් සයිමන්ට තර්ජනය කොට, පහරදෙන බව හා සයිමන් විලාප දෙන බව හැඟවීමට පොලිස් නිලධාරියකු යොදවන ලදී. පොලිස් නිලධාරීන් සයිමන්ට තදබල ලෙස පහර දෙන බව සිතූ සයිමන්ගේ බිරිය සහ නැන්දම්මා විලාප දෙමින් " අනේ බුදු මහත්තයෝ, සයිමන්ට ගහන්න එපා, ඔහු ලෙඩා, ගුටි කන්නට බැහැ, ඔය මිනිහා මැරිලා යාවි, වෙච්ච සිද්ධිය අපි කියන්නම් " යැයි හඬන්නට පටන් ගත් හ. ඒ අනුව, සංසදාස මිය ගිය ආකාරය දෙදෙනාම මෙසේ විස්තර කළෝ ය.

රාත්‍රී මුර සේවය සඳහා සයිමන් රේල් ගේට්ටුවට ගිය පසු සංසදාස මැදියම් රාත්‍රියේ සයිමන්ගේ නිවසට පැමිණි බවත් නො සිතූ පරිදි බීඩියක් පත්තු කර ගැනීමට නිවසට පැමිණි සයිමන්ට, තමා සමග සංසදාස නිදා සිටින බව දැක ගන්නට ලැබුණු බවත්; සිසිලියානා හඬමින් පැවසුවා ය. මෙය දුටු සයිමන් කෝපයෙන් වියරු වී සංසදාසට පහර දෙන්නට වූ බවත්, කිසිවක් කර කියා ගත නො හැකි වූ සංසදාස නිවසින් පිටතට පැන දුවන්නට උත්සාහ කළ විට සයිමන්ගේ ඉනේ තිබූ උල්පිහියෙන් ඔහු එක් වරක් සංසදාසගේ බඩට ඇන්න බවත් ඔවුන් දෙදෙනාම පොලිසියට ප්‍රකාශ කළෝ ය. සංසදාස සහ සිසිලියානා අතර තිබූ අනියම් සම්බන්ධය තමා කලක සිට දැන සිටි බවත්; එය නතර කරන ලෙස තම දියණියට අවවාද කළත් ඔවුන් එය අත් නොහල බවත් සයිමන්ගේ නැන්දම්මා පොලිසියට ප්‍රකාශ කළා ය. නැන්දම්මා විසින් කළ ප්‍රකාශය සත්‍ය බව සයිමන් ද පිළිගත්තේ ය.

උදරයට වැදුනු පිහි පහරින් තුවාල ලත් සංසදාස මිදුලට පැන ටික දුරක් දිවීමෙන් පසුව "මට වතුර ටිකක් දෙන්නට" කියමින් මිදුලේ ඇද වැටුනු බවත් තුන්දෙනාම පොලිසියට පැවසුවෝ ය. සංසදාසගේ උදරයේ තිබූ තුවාලයෙන් රුධිරය ගලා ආ නිසා ගෙදර තිබූ සරමක් ඉරා ලේ නැවැත්වීමට තුවාලය මත තබා තද කළ බවත් පසුව ලේ තැවරුනු එම රෙදි කැබැල්ල වහලේ හැංගු බවත් සයිමන් පැවසුවේ ය. සයිමන්ගේ පිහි පහරින් සංසදාස මිය ගොස් ඇති බව තුන්දෙනාටම වැටහී ගිය බවත්, කළ යුතු දේ කුමක් දැයි කතිකා කිරීමෙන් පසු දුම්රිය අනතුරකින් මිය යන්නට ඇතැයි



Scanned with CamScanner

සිතීමට: සංසදාසගේ මළසිරුර රේල් පාරේ වංගුව අසල තැබූ බවත් තිදෙනාම කියා සිටියෝ ය. ඔවුන්ගේ ප්‍රකාශයන් අනුව ලේ තැවරී තිබූ සරොම් කැබැල්ල වහලේ තිබී පොලිසිය විසින් සොයා ගන්නා ලදී. එම රෙදි කැබැල්ල අධිකරණය මගින් රස පරීක්ෂක වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව එහි තිබූ රුධිරය සංසදාසගේ රුධිරය වර්ගයට සමාන බව රස පරීක්ෂකගේ වාර්තාව අනුව පෙනී ගියේ ය.

ඉදිරිපත් වූ පරිවේෂණීය සාක්ෂි ( circumstantial evidence ) සහ වෛද්‍යමය සාක්ෂි ( medical evidence ) සලකා බැලූ පොලිසිය සැකකරු වන සයිමන් මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළේ ය. සැකකරු වන සයිමන් මාටින්ට විරුද්ධව අධිකරණයේ නඩු ව්‍යාජ සාක්ෂි දීමේ වරදට මාටින්ට විරුද්ධව අධිකරණයේ නඩු පවරන ලදී.

මළගෙදර දී බුරුවා ගසා සංසදාස මුදල් පැරදීමෙන් පසුව ධාවනය වන දුම්රියකට පැන සිය දිවි හානි කර ගත්තේ යැයි, පූර්ව නිගමනයකට පැමිණ වෛද්‍ය පරීක්ෂණය සිදු කළේ නම් මෙය මනුෂ්‍ය ඝාතනයක් ( culpabale homicide ) බව සොයා ගැනීමට අධිකරණ වෛද්‍යවරයාට නො හැකි වනු ඇත. ,

උදරයේ තිබූ ඇනුම් තුවාලය, එම ඇනුම් තුවාලයේ කොටස් පටකවේද පරීක්ෂාවට භාජනය කිරීම, උදර කුහරයේ තිබූ රුධිර කැටිය, සහ වහලේ සඟවා තිබූ රුධිරය තැවරුනු සරොම් කැබැල්ල යන ඒවා මරණයට හේතුව සහ සැකකරුවන් සොයා ගැනීමට උපකාරී වූ " නිහඬ සාක්ෂි " ලෙස හැඳින් විය හැකි ය.



# මිනුම් රිටේ සැඟවුනු "මාරයා"

නිමල් අවුරුදු තිස්පහක් පමණ වයසැති; දරුවන් දෙදෙනෙකුගේ පියෙකි. ඔහු රැකියාව වශයෙන් කළේ කුලී වැඩ කිරීම ය. එයින් ලැබෙන මුදලින් භාර්යාව සහ පාසැල් යන ළමයින් දෙදෙනාගේ කටයුතු කිරීමටත්, ඔහුගේ මහලු මව රැක ගැනීමටත් නිමල්ට සිදු විය.

මෙසේ කල් ගතවන අතරතුර ඉදිකරමින් පවතින වෙල්ලක මිනුම් කටයුතු කරන විදේශීය සමාගමක කම්කරුවෙකු වශයෙන් සේවය කිරීමට නිමල්ට අවස්ථාව ලැබුණි. ඔහුගේ රාජකාරිය වූයේ විකෝණමාන ( theodolite ) උපකරණය පාවිච්චි කරන විට මිනුම් රිට ( surveying pole ) සෘජුව ඇල්ලීමටත්, මිනුම්දෝරු උපකරණ තැනින් තැනට රැගෙන යාමත් ය. එක් දිනක, මිනුම් රිට සෘජුව අල්ලා සිටින විට හිටිහැටියේම නිමල් සිහිසන් නොමැතිව ඇද වැටුණි. කලබල වූ මිනුම්දෝරු කණ්ඩායමේ අනිකුත් අය ළඟම තිබූ රෝහලට නිමල්ව වහාම රැගෙන ගියත් ඒ වන විටත් ඔහු මිය ගොස් සිටියේ ය. නිමල්ව රෝහලට ඇතුල් කරන විටත් ඔහු මිය ගොස් සිටි බැවින් ඔහුගේ මරණයට හේතුව සොයා ගැනීම සඳහා හදිසි මරණ පරීක්ෂකවරයාට දැන්වීමට රෝහල් පොලිසිය කටයුතු කළේ ය.

පොලිසිය විසින් පරීක්ෂණයක දී මරණ පරීක්ෂකවරයාට ඉදිරිපත් කරනු ලබන සාක්ෂි අනුව යම් අයෙකුගේ මරණය සිදු වී ඇත්තේ ස්වාභාවික ( natural ) හේතුවක් නිසා ද, නැතහොත් සිය දිවි හානි කර ගැනීමක් ( suicide ) නිසා ද, නැත්නම් අහඹු සිදුවීමක් (accident) නිසා ද, යන්න පිළිබඳව අපරාධ නඩු විධාන සංග්‍රහයේ (criminal procedure code) තුන්සිය හැට නවවෙනි වගන්තියේ සිට තුන්සිය හැත්තෑ එක්වෙනි වගන්ති යටතේ තීරණයකට එළඹිය යුතු ය. නිමල්ගේ මරණයට තුඩු දුන් කරුණු දන්නා, ඔහු සමග එම අවස්ථාවේ දී රාජකාරී කටයුතු කළ අයගෙනුත්, නිමල්ගේ බිරිය සහ ඔහුගේ මල්ලීගෙනුත් හදිසි මරණ පරීක්ෂකවරයා සාක්ෂි ලබා ගත්තේ ය. නිමල් අධික ලෙස දුම්පානය කළ බවත් නිතර පපුවේ කැක්කුම තිබුණ බවත් ඔහුගේ බිරිය සහ ඥාතීහු හදිසි මරණ



Scanned with CamScanner

පරීක්ෂකවරයා ඉදිරියේ ප්‍රකාශ කළෝ ය. ඒ අනුව, පරීක්ෂණය භාර පොලිස් නිලධාරියා විසින් ලබා දුන් සාක්ෂිවලින් හදිසි මරණ පරීක්ෂකවරයා සෑහීමකට පත් වූ බැවින් ද, නිමල් සිහියන් නොමැතිව වැටුණු ස්ථානය පරීක්ෂා කිරීම අනවශ්‍ය යැයි, සිතූ බැවින් ද එම ස්ථානය පරීක්ෂා කිරීමට හදිසි මරණ පරීක්ෂකවරයා නො ගියේ ය.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ තුන්සිය හැත්තෑවේ, උපවගන්ති එක අනුව යම් අයකු අනපේක්ෂිතව මරණයට පත් වූ විට, මරණය සිදුවූ ස්ථානය පරීක්ෂා කිරීම හදිසි මරණ පරීක්ෂකවරයා විසින් කළ යුතුම ය. දිවා හෝ රාත්‍රිය යැයි, නො තකා මරණය සිදුවූ ස්ථානය හදිසි මරණ පරීක්ෂකවරයා විසින් පරීක්ෂා කළ යුතු ය. මෙවැනි පරීක්ෂණයක දී හදිසි මරණ පරීක්ෂකවරයාගේ වගකීම වන්නේ මරණයට හේතුව ස්වාභාවික එකක් ද, නොමැති නම් එය අහඹු සිදුවීමක් ද නැතහොත් සිය දිවි හානි කර ගැනීමක් ද යන්න තීරණය කිරීම පමණකි. සාවද්‍ය මනුෂ්‍ය ඝාතන ( culpable homicide ) පිළිබඳ ව පරීක්ෂණ හදිසි මරණ පරීක්ෂකවරු නො පවත්වති. හදිසි මරණ පරීක්ෂකවරයකු මරණ පරීක්ෂණයක් පවත්වා ගෙන යන ඕනෑම අවස්ථාවක එය මනුෂ්‍ය ඝාතනයක් යැයි, සැක කිරීමට තරම් සාක්ෂි ඉදිරිපත් වුවහොත් එකී පරීක්ෂණය වහාම අත්හිටුවා පොලිසිය මගින් පළාතේ මහේස්ත්‍රාත්වරයා වෙතට එය වහාම යොමු කළ යුතු ය. යම් කිසි අයකුගේ මරණය පිළිබඳව වගකිම තව කෙනෙකුට පැවරීම හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ නීතිමය කාර්යභාරයක් නො වේ. එහි වගකීම පැවරී ඇත්තේ මහේස්ත්‍රාත්වරයෙකුට පමණි.

නිමල්ගේ මරණ පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ කරුණු අපැහැදිලි වූ හෙයින්, වෛද්‍ය පරීක්ෂණයක් ( post mortem examination / autopsy ) පවත්වා, මරණයට හේතුව දැන්වීමට හදිසි මරණ පරීක්ෂකවරයා අධිකරණ වෛද්‍යවරයාට නියම කළේ ය.

නිමල්ව ඇතුලත් කරන ලද මහ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයකු සේවයේ යෙදී නො සිටි බැවින්, අධිකරණ වෛද්‍ය කටයුතුවල නිරත වූයේ අධිකරණ වෛද්‍ය සේවය පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධියක් හෝ පුහුණු වීමක් නො ලැබූ, ශ්‍රේණිගත වෛද්‍යවරයෙකි ( grade medical officer ). මළසිරුර බාහිරව පරීක්ෂා කොට අභ්‍යන්තර ඉන්ද්‍රියයන් විච්ඡේදනය (post mortem dissection



කිරීමෙන් පසුව හෘදයාබාධයක් සෑදීම නිසා නිමල්ගේ මරණය සිදු වී ඇති බව එම වෛද්‍යවරයා හදිසි මරණ පරීක්ෂකවරයාට වාර්තා කළේ ය. ඒ අනුව, ස්වාභාවිකව හට ගන්නා හෘදයාබාධයක් සෑදීමෙන් නිමල් මරණයට පත්ව ඇති බව, හදිසි මරණ පරීක්ෂකවරයා තීන්දු කළේ ය. තීන්දුවෙන් පසු නිමල්ගේ මළසිරුර කුණුවීම වැලැක්වීම පිණිස ෆෝමලීන් එන්නත් කිරීම නොහොත් එම්බාම් කිරීම ( embalm ) සිදු කොට, භූමදානය කරන ලදී.

සති හයකට පසුව, නිමල් සේවය කළ සමාගමේ මිනින්දෝරු කණ්ඩායම ඉදිකරන ලද එම වේල්ලේම වෙනත් ස්ථානයක මිනුම් කටයුතුවලට සහය වෙමින් සිටි තවත් කම්කරුවෙකු සිහිසන් නොමැතිව ඇද වැටුණි. ඒ අවස්ථාවේ දී එම කම්කරුවා වේදනාවෙන් ඔහුගේම පපුවට අතින් ගසමින් කෑ ගැසී ය. එම කම්කරුවා ද ඉහත කී රෝහලටම වහාම රැගෙන යන ලදී. එම අවස්ථාවේ දී බාහිර රෝගීන්ගේ අංශයේ සේවයේ යෙදී සිටි වෛද්‍යවරයාට දක්නට ලැබුණේ එම කම්කරුවාගේ අත පිළිස්සී ඇති බව ය. එම කම්කරුවා වැටුණු ස්ථානයට ඉහළින් වෝල්ටීයතාවය හතළිස් දාහකින් යුත් අධිබලවේග ( high voltage ) විදුලි රැහැන් ( cables ) කීපයක් විහිදී ඇති බව එම කම්කරුවා වැටුණු ස්ථානය පරීක්ෂා කිරීමට ගිය පොලිස් නිලධාරියාට දක්නට ලැබිණි. එම විස්තරය රෝහලට දැන් වූ විට එම කම්කරුවාට විද්‍යුත්හනනය ( electrocution ) වීම නිසා අත පිළිස්සී ඇති බව නිගමනය කිරීමට රෝහලේ වෛද්‍යවරුන්ට හැකි විය. සති තුනක් පමණ රෝහල්ගතව ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසුව එම කම්කරුවා සුවය ලබා රෝහලෙන් පිටව ගියේ ය. මෙම සිද්ධිය නිමල්ගේ වැඩිමහල් සහෝදරයාට ආරංචි විය. ඔහුගේ මල්ලීට ද විද්‍යුත්හනනයෙන් මරණය සිදුවන්නට ඇත් දැයි, ඔහුට සැකයක් පහල විය. ඒ පිළිබඳව තම ඥාතින් සමග සාකච්ඡා කිරීමෙන් පසුව ඔහු හඳුනන නීතිඥ මහත්මයෙකු හමුවීමට ගියේ ය. නිමල්ගේ මරණයට සත්‍ය හේතුව ස්වාභාවිකව හටගත් හෘදයාබාධයක් නොව, විද්‍යුත්හනනය වීමක් බව ඔප්පු කළ හැක්කේ, එම මරණය පිළිබඳව, මූලික පරීක්ෂණය පැවැත් වූ පොලිසියට පැමිණිල්ලක් කොට, එම පොලිසිය මගින් හෝ පුද්ගලික නීතිඥවරයකු මගින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ තුන්සිය හැත්තෑ තුනේ උපවගන්ති එක සහ දෙක යටතේ සිද්ධිය වූ පළාතේ මහේස්ත්‍රාත්වරයාගෙන්, නියෝගයක් ලබා ගෙන, මළසිරුර ගොඩ ගෙන ( exhumation ),



Scanned with CamScanner

අධිකරණ වෛද්‍ය විශේෂඥවරයෙකු ලවා දෙවන වරටත් පරීක්ෂා කිරීම බව නිමල්ගේ අයියාට නීති උපදෙස් ලැබුණි. ඒ අනුව, නිමල්ගේ අයියා තම මල්ලීගේ මළසිරුර නැවත ගොඩ ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු කරන ලදී. ඒ අනුව, නිමල්ගේ මළසිරුර ගොඩ ගෙන අධිකරණ වෛද්‍ය විශේෂඥවරයෙකු වෙත යොමු කර පරීක්ෂණ පවත්වා මරණයට හේතුව කුමක් දැයි, වාර්තා කිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේ ය. ඒ අනුව, මහේස්ත්‍රාත්වරයාගේ සහ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාගේ අධීක්ෂණය යටතේ, මිහිදන් කොට තිබූ නිමල්ගේ මළසිරුර වළලා තිබූ ස්ථානය, ඥාතීන් විසින් හඳුනා ගැනීමෙන් පසුව ගොඩ ගන්නා ලදී ( exhumation ). දෙවැනි වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීමට පෙර නිමල්ගේ පළමු වරට පැවැත් වූ හදිසි මරණ පරීක්ෂණයේ දී ලබා ගත් සියලු සටහන් විමර්ශනය කොට නිමල් වැටුනු ස්ථානය හා එම අවස්ථාවේ දී නිමල් පාවිච්චි කරන ලද මිනුම් රිට ද අධිකරණ වෛද්‍යවරයා පරීක්ෂාවට ලක් කළේ ය.

මිනුම් කටයුතු කිරීමේ දී නිමල් පාවිච්චි කොට තිබුණේ කොටස් කීපයකින් සමන්විත සම්පතනය කළ හැකි ( collapsible ) ඇලුමිනියම් මිනුම් රිටකි. එහි උඩ කෙළවරේ සිදුරු කිපයක් තිබූ බව, එම මිනුම් රිට පරීක්ෂාවට භාජනය කළ අධිකරණ වෛද්‍යවරයා හඳුනා ගත්තේ ය. තවද, නිමල් මිනුම් රිට අල්ලා සිටි ස්ථානයට ඉහළින් අධිබලවේග විදුලි රැහැන් කීපයක් විහිදී ඇති බව එම ස්ථානය පරීක්ෂා කිරීමට ගිය විශේෂඥ වෛද්‍යවරයාට දක්නට ලැබිණි. විදුලිබල මණ්ඩලයට දන්වා එම විදුලි රැහැන්වල විදුලිය සැපයීම තාවකාලිකව විසන්ධි කොට ( disconnected ) නිමල්ගේ උසට සමාන අයකු ලවා නිමල් පාවිච්චි කළ මිනුම් රිට ඔහුගේ හිසට උඩින් සෘජුව අල්ලා තැබුවත් ඉහළින් විහිදී ගිය විදුලි රැහැන් ඇලුමීනියම් රිටට ස්පර්ශ නො වන බව වෛද්‍යවරයාට දක්නට ලැබුණි. නිමල් රාජකාරියේ යෙදී සිටින අවස්ථාවේ දී එම ඇලුමිනියම් රිට නිමල් විසින්ම ඔහුගේ හිසට උඩින් අල්ලා ගෙන සිටියත් නිමල්ගේ හිසට ඉහළින් විහිදී ගිය අධිබල විදුලි රැහැන්වල ( high tension cables ) විදුලිය සක්‍රීයව තිබුණත් ඇලුමිනියම් රිට විදුලි රැහැන්වල ස්පර්ශවීම සිදුවිය නො හැකි බව මෙයින් පෙනී ගියේ ය. නිමල්ගේ මරණය පිළිබඳව නිමල් සේවය කළ සමාගමෙන් වන්දියක් ඉල්ලීමට ( compensation ) හැකියාව තිබූ නිසා එම ස්ථානයේ දී විශේෂඥ අධිකරණ



වෛද්‍යවරයා විසින් කරන ලද විමර්ශන සියල්ලම ඡායාරූපගත කිරීමෙන් ( still photography ) පසුව වීඩියෝගත කරන ලදී ( video recording ). නිමල් වැටී සිටි ස්ථානය අධිකරණ වෛද්‍යවරයා පරීක්ෂා කිරීමෙන් පසුව නිමල්ගේ පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය මෘතශරීරාගාරයේ දී පවත්වන ලදී.

ඒවන විටත් නිමල්ගේ මළසිරුර එම්බාම් කොට සති දහයක් පමණ කාලයක් මිහිදන් කොට තිබුණ බැවින්, ශරීරයෙහි අපිචර්මය ( epidermis ) ගැල වී තිබුණි. අත්වල ඇඟිලි මදක් රත් පැහැති වී ( red ) තද වී ( hard ) වියළිව ( dried ) හැකිළී ( wrinkled ) තිබුණි. එම්බාම් කළ විට ශරීරය කළු පැහැති වී තද වුවත් සමෙහි හැකිලීමක් ඇති නො වේ. සෙන්ටිමීටර් දෙකක පමණ විශ්කම්භය සහිත ගල් තැලුම් වැනි සිදුරු කීපයක් මළසිරුරේ යටිපතුල් දෙකෙහිම විය. සෙරෙප්පු පාවිච්චි කළත් ඇතැම් අයට ගල් තැලුම් හට ගනී. නිමල් සෙරෙප්පු පාවිච්චි කරන අයකු වුවත් ඔහුට ද ගල් තැලුම් ඇති විය හැකි බව වෛද්‍යවරයාට වැටහුණි. නිමල්ගේ යටි පතුල්වල තිබූ තුවාල ගල් තැලුම් තුවාල ද, නැතහොත් විද්‍යුත්හනනයෙන් පසුව විද්‍යුත් ධාරාව යටි පතුල තුළින් පිට වී යාමේ දී සිදු වූ තුවාල ද ( exit wounds ) යන්න නිශ්චිතව වෛද්‍යවරයාට දැන ගැනීමට අවශ්‍ය විය. අනතුර සිදු වූ දින නිමල් සෙරෙප්පු කුට්ටමක් පාවිච්චි කළේ නම් ඒවා ද තමා වෙත ඉදිරිපත් කරන ලෙසට වෛද්‍යවරයා පොලිසියට උපදෙස් දුන්නේ ය. නිමල් පාවිච්චි කරන ලද සෙරෙප්පු කුට්ටම ඔහුගේ නිවසේ තිබී සොයා ගන්නා ලදී. ඒවා රබර් සෙරෙප්පු බවත් එහි සමහර ස්ථානවල රබර් උණු වී තිබුණ බවත් වෛද්‍යවරයාට පෙනුණි. රබර් සෙරෙප්පු උණු වී තිබූ ආකාරය අනුව නිමල්ගේ යටි පතුල්වල ඇත්තේ ගල් තැලුම් තුවාල නොව විද්‍යුත් ධාරාවක් යටි පතුලෙන් පිට වී යාමෙන් ඇති වූ සිදුරු ( exit wound ) බව වෛද්‍යවරයා අනුමාන කළේ ය. වෛද්‍යවරයාගේ අනුමානය තහවුරු කර ගැනීම සඳහා නිමල්ගේ මළසිරුරේ යටිපතුල්වල තිබූ සිදුරුවලින් ලබා ගත් කොටස් පටකවේද පරීක්ෂාවට ( histopathological examination ) භාජනය කරන ලදී.

පශ්චාත් මරණ පරීක්ෂණයේ දී මරණයට හේතුව සොයා ගැනීම සඳහා අවශ්‍ය කරන මස්තිෂ්ක, මොළ කඳ, කුඩා මොළය, හෘදය වස්තුවේ කර්ණිකා, හෘදය වස්තුවේ කුන්දිකා, හෘදය වස්තුවේ ආවාරය,



Scanned with CamScanner

පෙනහැලි, අධිවෘක්ක ග්‍රන්ථි, අග්න්‍යාශය, අක්මාව, වකුගඩු සහ සැකිලි මාංශ පේශිවල කොටස් ලබා ගනු ලැබේ. සෙන්ටි මීටර් එකක් දිග, එකක් පළල සහ මිලිමීටර් තුනක් ඝනකම සහිත කුඩා කැබලි ෆෝමලින් ද්‍රාවණයක ( solution ) අවම වශයෙන් දින තුනක්වත් තැබීමෙන් පසුව යන්ත්‍රයක ( hostokinette ) ආධාරයෙන් ක්‍රමයෙන් සාන්ද්‍රණය වැඩිවන ඊතයිල් මධ්‍යසාරය ( ethyl alcohol ) තුළ බහාලීමෙන් පසුව, ක්ලොරෝෆෝම්වල ( choloroform ) බහා ඉන් පසුව ඉටිවල තැබිය යුතු ය. එසේ ප්‍රසරය ( processed ) කරන ලද පටක මයික්‍රොටෝම යන්ත්‍රයක ( microtome ) ආධාරයෙන් මියු (micron) පහක හෝ හයක ඝනකමකින් යුත් තුනී තීරුවලට කපා ඊට පසුව හෙමොටොක්ස්සලින් ( haemotoxyalin ) සහ ඉයොසින් (eosin) රසායනික ද්‍රව්‍යවලින් වර්ණ ගන්වා ( staining ) අන්වීක්ෂයකින් පරීක්ෂා කරනු ලැබේ ( microsiopic examination ). මෙයට පටකවේද පරීක්ෂාව යැයි ( histopathological examination ) කියනු ලැබේ.

විද්‍යුත්ඝාතනය වූ විට විදුලි ධාරාව ශරීරයට ඇතුල් වූ විට හෝ පිට වූ විට එම ස්ථානවල අපිචර්මයෙහි ඇති සෛලවල සහ පටකවල ස්වාභාවික පිහිටීම වෙනස් වී දියපට්ටා (micro blisters) වැනි කුඩා බුබුලු අපිචර්මයෙහි ( epidermis ) හට ගනී. අපිචර්මයෙහි පිහිටා ඇති සෛල පේළින් ස්වාභාවිකව පිහිටා ඇත්තේ සමට (dermis) සමාන්තරව ය. විද්‍යුත්ඝාතනය වූ විට විදුලි සැරය ශරීරයට එක් ස්ථානයකින් ඇතුල් වුවත් ස්ථාන කීපයකින් පිටවිය හැකි ය. එලෙස ඇතුල් වූ ස්ථානයෙහි හෝ පිට වූ ස්ථානයෙහි අපිචර්මයේ සෛලවල ස්වාභාවික පිහිටීම වෙනස් වී අපිචර්මයෙහි සෛල පේළි සමට සෘජුකෝණාකාරව ( pallisading ) වැටක ඉනි සිටුවා ඇති ආකාරයට පිහිටනු ලැබේ. මීට අමතරව අපිචර්මයේ සහ චර්මයේ දියපට්ටා වැනි කුඩා බුබුලු ( micro blisters ) දක්නට ලැබේ. නිමල්ගේ යටි පතුලේ සිදුරුවලින් ලබා ගන්නා ලද කොටස් පටකවේද පරීක්ෂාවට ලක් කිරීමෙන් පසුව ඒවා අන්වීක්ෂයක ආධාරයෙන් පරීක්ෂා කිරීමෙන් ( when examined under the microscope ) මෙම ලක්ෂණ පැහැදිලිව දක්නට ලැබුණි. විද්‍යුත් ධාරාවක් නිමල්ගේ යටි පතුලෙන් පිට වී ගොස් ( exit ) ඇති බව ඔප්පු කිරීමට පටකවේද පරීක්ෂාව උපයෝගී විය.

නිමල්ගේ අතෙහි ඇඟිලි රත් පැහැති වී, තද වී, සම හැකිලී,



වියළී තිබුණි. විදුලි ධාරාවක් අත්වල ස්පර්ශ වීමෙන් එවැනි ලකුණු හට ගනී. එහෙත්, නිමල්ගේ අතට විදුලි ධාරාවක් ස්පර්ශ වූ බවට සාක්ෂි නො තිබුණි. තවද, නිමල් පාවිච්චි කළ ඇලුමිනියම් මිනුම් රිට මිනුම් කටයුතු කිරීම සඳහා ඔහුගේ හිසට උඩින් උස්සා ගෙන සිටියත් ඉහළින් විහිදී ගිය අධිබලවේග විදුලි රැහැන්වල මිනුම් රිටේ නො ගැවුණේ නම් විද්‍යුත් ධාරාව නිමල්ගේ ශරීරයට ඇතුල් වූ ආකාරය ඔප්පු කිරීමට අවශ්‍ය වී තිබුණි.

නිමල්ගේ පළමු වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයා එකී මරණයට හේතුව වූයේ ස්වාභාවිකව හටගත් හෘදයාබාධයක් බව නිගමනය කර තිබීම තව ගැටළුවක් වී තිබුණි. පළමු වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයා නිමල්ගේ හෘදයේ කිරීටක ධමනි විච්ඡේදනය කොට නො තිබුණි. විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා විසින් එම කිරීටක ධමනි විච්ඡේදනය කිරීමෙන් පසුව ඒවාවල අතරෝමා රෝගය ( atherosclerosis of coronary arteries ) සෑදී නොමැති බවත්, කිරීටික ධමනි අවහිර වී නොමැති බවත්, දැක ගැනීමට හැකි විය. කිරීටක ධමනි විච්ඡේදනය කර නොමැතිව හෘදයාබාධයකින් යම් අයෙකු මියගිය බව නිගමනය කිරීම අධිකරණ වෛද්‍යවරයෙකු විසින් කරන ලද බලවත් වරදකි. දියුණු රටවල නම් මෙවැනි ක්‍රියාවන්වල යෙදෙන වෛද්‍යවරුන්ට නො සැලකිලිමත්කමට ( medical negiligence ) එරෙහිව වන්දි නඩු පැවරීමේ හැකියාව ඥාතීන්ට ඇත. විද්‍යුත් ධාරාවක් අත්වලින් ඇතුල් වී යටි පතුල් වලින් පිට වූ බව පැහැදිලිව ඔප්පු කිරීමට විශේෂඥ වෛද්‍යවරයාට පහසු වූයේ නිමල්ගේ මළසිරුර එම්බාම් කර තිබූ නිසා ය. නමුත් තවත් එක් කරුණක් පමණක් ඔප්පු කිරීමට තිබුණි. එනම් නිමල් පාවිච්චි කළ ඇලුමිනියම් මිනුම් රිට ඔහුගේ හිසට උඩින් උස්සා ගෙන සිටියත් විහිදී ගිය විදුලි රැහැන්වල එම මිනුම් රිට ස්පර්ශ නො වූයේ නම් විද්‍යුත් ධාරාව මිනුම් රිට ඔස්සේ නිමල්ගේ සිරුරට ඇතුල් වූ ආකාරය පැහැදිලි කිරීමයි. අධිබලවේග ( high tention electricity cables ) විදුලි රැහැන්වල ලෝහමය වස්තුවක් ස්පර්ශ නො වුවත් එවැනි වස්තුවක් සක්‍රීය අධිබලවේග විදුලි රැහැනකට එක්තරා ප්‍රමාණයකට ආසන්න වූ විට එවැනි විදුලි රැහැන්වලින් පිටවෙන විද්‍යුත් ධාරා අවට ඇති ලෝහමය වස්තූන්වලට චාපනය ( arcing ) නොහොත් පනින බව විද්‍යාත්මකව ඔප්පු කොට ඇති කරුණකි. එය පැහැදිලි කර



Scanned with CamScanner

ගැනීමට භෞතික විද්‍යාඥයකුගේ ( physicist ) මතය වෛද්‍යවරයාට ලබා ගැනීමට සිදු විය. නිමල් පාවිච්චි කළ ඇලුමීනියම් රිටේ උඩ කෙළවරේ තිබූ සිදුරු කීපය ද විදුලි ධාරා ඇලුමීනියම් රිට ඔස්සේ වාපනය වීමෙන් ඇති වූ ඒවා බව භෞතික විද්‍යාඥයා වාර්තා කළේ ය.

ඉහත සඳහන් සියලු කරුණු සලකා බැලූ විශේෂඥ වෛද්‍යවරයාගේ නිගමනය වූයේ නිමල් මිය ගියේ ස්වාභාවිකව හටගත් හෘදයාබාධාවකින් නොව අධිබලවේග විද්‍යුත් ධාරා ඇලුමීනියම් රිට මගින් ශරීරයට වාපනය වීමෙන් හෘද ස්පන්දනය නැවතීම ( cardiac arrest ) නිසා බව ය. එබැවින් ස්වාභාවිකව හටගත් හෘදයාබාධයකින් නිමල්ගේ මරණය සිදු වී නොමැති බව විශේෂඥ වෛද්‍යවරයා මහේස්ත්‍රාත්වරයාට වාර්තා කළේ ය. විශේෂඥ අධිකරණ වෛද්‍ය වාර්තාව සහ පොලිසිය මගින් ඉදිරිපත් කරන ලද පරිවේෂණීය සාක්ෂි ( circumstanital evidence ) අනුව නිමල් මිනුම් රිට අල්ලා ගෙන සිටින අවස්ථාවේ දී අධිබලවේග විදුලි රැහැන්වලින් පිට වූ විද්‍යුත් ධාරා වාපනය වීමෙන් නිමල්ගේ මරණය සිදු වී ඇති බවට අධිකරණය අවසානයේ දී තීන්දු කරන ලදී.

යම් අයෙකු රබර් පාවහන් පැළඳ නොමැති අවස්ථාවක, එම තැනැත්තාගේ පාද පොළවේ තබා ගෙන සිටින විට, විදුලිය රැගෙන යන කම්බියක් නොහොත් විදුලි සන්නායකයක් ( conducting material ) ඇල්ලූ විට හෝ එම තැනැත්තාගේ සිරුරේ වෙනයම් ස්ථානයක විදුලි සන්නායකයක් ස්පර්ශ වූයේ නම් හෝ විදුලි ධාරාව හෘදයට සහ සුෂුම්නාවට සන්නයනය ( conducted ) වී අවසානයේ දී යටි පතුල්වලින් පොළවට සන්නයනය වනු ඇත. මෙයට විද්‍යුත්හනනය ( electrocution ) යැයි කියනු ලැබේ. යම් අයෙකුට විද්‍යුත්හනනය වීමට ගතවන්නේ මිලි තත්පරයක් ( milli second ) වැනි ඉතාමත්ම සුළු කාලයකි. විද්‍යුත්හනනයෙන් ඇතැම් අවස්ථාවල මරණය පවා සිදු වේ. විද්‍යුත්හනනය වූ විට හෘද ස්පන්දනය ක්ෂණිකව නැවතීමෙන් ( cardiac arrest ) හෝ ස්වසනය අක්‍රිය ( respiratory failure ) වීමෙන් මරණය සිදුවිය හැකි ය. විද්‍යුත්හනනයට ලක්වූවන්ගේ හෘද ස්පන්දනය නැවතී තිබුණත් කෘතීම හෘද පුප්පුසීය ප්‍රතිෂ්ඨාපනය (cardio pulmonary resuscitation - C P R) නොනවත්වා විනාඩි තිහක කාලයකටවත් පැවැත්වීමෙන් නැවත වරක් හෘද ස්පන්දනය ක්‍රියා



කිරීම ආරම්භ වීමේ හැකියාව ඇත. විද්‍යුත් ධාරාවක් සන්නයනය වන වස්තුවක් බොහෝ විට අතින් ස්පර්ශ කළ විට විද්‍යුත්හනනය ඇති වන නිසා විදුලිය ස්පර්ශ වූ ස්ථානයේ දිය බුබුලක් (blister) හෝ දාරිත තුවාලයක් ( laceration ) හෝ පිළිස්සුණු තුවාලයක් (burn) හෝ සම හැකිලුණු ( puckered ) ස්වභාවයක් දක්නට ලැබේ. බොහෝ අවස්ථාවන්වල සක්‍රීය විදුලි සන්නායකයක් අල්ලන නිසා මෙවැනි තුවාල බොහෝ විට හටගන්නේ අල්ලෙහි හෝ පිටි අල්ලෙහි ය. එවැනි තුවාලයක් ඇඟිලි දෙකක් අතර ඇති ස්ථානයේ ( inter digital fold ) හටගත් විට ඒවා හඳුනා ගැනීම දුෂ්කර ය. එමනිසා විද්‍යුත්හනනයෙන් මියගියේ යැයි සැක කරන අයෙකුගේ වෛද්‍ය පරීක්ෂණය පවත්වන විට ඇඟිලි අතර ඇති ස්ථාන අත් කාචයකින් පරීක්ෂා කිරීම ඉතාම වැදගත් වේ. මළසිරුරේ හටගන්නා මෘත කඨිනය නිසා ඇඟිලි හැකිලෙන බැවින් එම ඇඟිලි දැඩි පරිශ්‍රමයකින් පසු විවෘත කොට විද්‍යුත්හනනය වීමෙන් ඇතිවන දිය බුබුලක්, රවුම් තුවාලයක් ( ව්‍රණයක් / ulcer ), පිළිස්සීගිය දාරිත තුවාලයක් ඇත් දැයි වෛද්‍යවරයා පරීක්ෂා කළ යුතු ය. විද්‍යුත් ධාරාවක් සිරුරෙන් පිට වූ විට යටිපතුල්වල ද එවැනිම ලක්ෂණ දක්නට හැකි ය. විද්‍යුත්හනනය වලක්වා ගැනීමට නම් විදුලිය සමග කටයුතු කරන අය රබර් අත්වැසුම් ( gloves ) සහ රබර් සපත්තු (half boots) හෝ සෙරෙප්පු පැලඳිය යුතු ය. එසේ නොමැති නම් විදුලිය සමග වැඩ කරන විට අවම වශයෙන් තෙතමනය නොමැති වියළි ලෑල්ලක් මත සිට කටයුතු කළ යුතු ය.

නිමල්ගේ මරණ පරීක්ෂණයේ අවසාන තීන්දුවේ සහතික පිටපතක් නිමල්ගේ සොහොයුරා විසින් වන්දියක් ලබා ගැනීම සඳහා අධිකරණයෙන් ලබා ගන්නා ලදී. සේවකයෙකු රාජකාරියේ යෙදී සිටින අවස්ථාවේ දී වැඩ බිමේ, කම්හලක, කාර්යාලයයක් තුළ මියගියහොත් මරණයට හේතුව මියගිය තැනැත්තා කළ රාජකාරියට සෘජුව හෝ වක්‍රව අදාල බව වෝහාරක ව්‍යාධිවේදී ක්ෂේත්‍රය ( Forensic pathology service ) උපයෝගී කර ගනිමින් මියගිය අයගේ යැපෙන්නන්ට දිසා අධිකරණයක නඩුවක් ගොනු කරමින් වන්දි මුදලක් ලබා ගැනීමේ හැකියාව ඇත. සේවා යෝජකයා (employer) විසින් සේවකයා වෙත ලබා දී ඇති ආරක්ෂක උපකරණ (safety insturments) හෝ මෙවලම් පාවිච්චි නො කර හෝ ඒවා අපරීක්ෂාකාරීව පාවිච්චි කිරීම නිසා අනතුරකට හෝ මරණයට



Scanned with CamScanner

පත්වුයේ නම් එම අවස්ථාවන්වල දී සේවායෝජකයාට වගකීමක් නොමැත. රබර් අත්වැසුම් ( rubber gloves ) සහ රබර් සපත්තු ( rubber boots ) පාවිච්චි නො කොට විදුලි කාර්මික කටයුතුවල යෙදීමේ දී සේවකයකු විද්‍යුත්ඝාතනය වී තුවාල ලැබුවහොත් හෝ මරණයට පත්වුවහොත් ඔහු වෙනුවෙන් ඔහුගෙන් යැපෙන්නන්ට වන්දි මුදලක් අධිකරණයකින් බොහෝ දුරට නො ලැබීමට පුළුවන. නිමල් සේවය කළ විදේශීය සමාගමෙන් ඔහු වෙනුවෙන් වන්දි මුදලක් ඉල්ලීමට නිමල්ගේ සොහොයුරා විසින් කටයුතු කරන ලදී. නිමල් සේවය කළ විදේශීය සමාගමේ සියලුම සේවකයින් එම සමාගම විසින් රක්ෂණය කර තිබූ බැවින් රක්ෂණ සමාගම මගින් නිමල් වෙනුවෙන් රුපියල් ලක්ෂයක වන්දි මුදලක් නිමල්ගේ භාර්යාව වෙත ලැබුණි.

ඉදිකරමින් පවතින වේල්ලේ මිනුම් කටයුතු කරන විට තවත් කම්කරුවෙකුට දෙවැනි වරටත් විද්‍යුත්ඝාතනය නො වුණේ නම්, නිමල් මිය ගියේ, විද්‍යුත් ධාරාවක් ශරීරයට වාපනය වීමෙන් බව සදාකල්ම හෙළි නො වනු ඇත. එසේ වූයේ නම් නිමල්ගේ ඥාතීන්ට වන්දි මුදලක් ද නො ලැබෙනු ඇත. පළමු වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයා විසින් නිමල් මියගියේ ස්වාභාවිකව හටගත් හෘදයාබාධාවකින් බවට සාවද්‍ය නිගමනයකට පැමිණියේ ඇයි? එයට හේතුව නිමල්ගේ පළමු අධිකරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයා නිසියාකාරව හෘදය වස්තුවේ කිරීටික ධමනි විච්ඡේදනය නො කිරීමයි. නිමල්ගේ අත්වල තිබූ පිළිස්සුනු තුවාල සහ යටි පතුල්වල තිබූ සිදුරු රෝහලේ බාහිර අංශයේ වෛද්‍යවරයා විමර්ශනය නො කළේ මන්ද? රෝහලට ඇතුල් කරන විට නිමල් මිය ගොස් තිබූ බැවින් මළසිරුර බාහිරව නිසියාකාරව පරීක්ෂා නො කොට මරණය පමණක් සහතික කිරීම මෙයට හේතුවයි. යම් හෙයකින් බාහිර අංශයේ සේවය කළ වෛද්‍යවරයා නිමල්ගේ අතෙහි තිබූ පිළිස්සීම් සහ යටිපතුල්වල තිබූ සිදුරු විමර්ශනය කොට එම තොරතුරු නිමල්ගේ හදිසි මරණ පරීක්ෂණය පැවැත් වූ පොලිස් නිලධාරියාට දැන්වූයේ නම් පළමුවැනි පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයාට මරණයට හේතුව සොයා ගැනීමට ඉමහත් පිටුවහලක් වීමට ඉඩ තිබුණි. බාහිර රෝගීන්ගේ අංශයේ දී නිමල්ව පරීක්ෂා කළ වෛද්‍යවරයාත්, පළමු පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ වෛද්‍යවරයාත් යන දෙදෙනාම ඉහත



සඳහන් ලකුණු විමර්ශනය නො කළේ මන්ද? ඊට පහසුවෙන් දිය හැකි පිළිතුර නම් හෘදයාබාධවලින් පිරිමින් හදිසියේ මියයාම සුලබව සිදුවන දෙයක් නිසාත්, නිමල් අධික ලෙස දුම්පානය කරන කෙනෙකු බව පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයාට දැන ගැනීමට ලැබුණු නිසාත් ය. සූක්ෂමව හා ප්‍රවේශමෙන් පශ්චාත් මරණ පරීක්ෂණය නො පවත්වා පසුබිමෙන් ( history of incident ) දැනගත් අධික දුම්බීමේ පුරුද්ද ගැන පූර්ණ විශ්වාසය තබා මරණයට හේතුව හෘදයාබාධයක් බව පළමු පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයා උපකල්පනය කොට ඇත. වෛද්‍ය හාරක ව්‍යාධිවේදය ( forensic pathology ) පිළිබඳව ගැඹුරු දැනුමක් සහ මනා පළපුරුද්දක් නොමැති ශ්‍රේණිගත වෛද්‍යවරු ඇතැම් විට මෙවැනි වැරදි නිගමන වලට එළඹෙති. අධිකරණ වෛද්‍ය සේවයේ යෙදී සිටින ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන්ට අධිකරණ වෛද්‍ය සේවය පිළිබඳව පශ්චාත් උපාධි පුහුණුවක් නොමැතිවීම නිසා ඇතැම් විට ඔවුන් මෙවැනි සාවද්‍ය නිගමනවලට පැමිණේ. එහෙත් වෛද්‍යවරුන් ගනු ලබන එවැනි තීරණවලට මහජනයා වන්දි ගෙවිය යුතු ද?

නිමල්ගේ යටි පතුල්වල තිබූ ගල් තැලුම් වැනි සිදුරු, එම සිදුරුවල තිබූ ශෛලවල අසාමාන්‍ය පිහිටීම ( morphology ), මිනුම් රීටේ උඩ කෙළවරේ තිබූ කුඩා සිදුරු සහ නිමල් පාවිච්චි කර තිබූ රබර් සෙරෙප්පු පිළිස්සී තිබීම නිමල්ගේ මරණයට හේතුව සොයා ගැනීමට ප්‍රයෝජනවත් වූ " නිහඬ සාක්ෂි " වේ.



Scanned with CamScanner

# මරු කැඳ වූ ආදරය

ඈන් සහ මේරි එකිනෙකාට ඉතාම හිතවත්ව ඇසුරු කළ කළණ මිතුරියන් දෙදෙනෙකු වූ අතර ඔවුන් දෙදෙනාම පුද්ගලික ආයතනයක සේවය කළෝ ය. ඈන් යතුරු ලේඛිකාවක වූ අතර මේරි දුරකථන ක්‍රියාකරවන්නියක විය. ඈන්ගේ නිවස පිහිටියේ එංගලන්තයේ මැන්චෙස්ටර් නගරයේ ය. මේරි ලංඩන්වල හැදුනු වැඩුනු යුවතියකි. එක් සිකුරාදා දිනයෙක ස්වකීය සේවය අවසන් කොට ඔවුන් දෙදෙනාම ආයතනයෙන් පිටව ගියේ සති අන්තය විවේකයෙන් ගත කොට නැවත සඳුදා රාජකාරියට එන අටියෙනි.

ඈන්ගේ දෙමාපියන් බැලීම සඳහා සති අන්තයේ, ඈන් මැන්චෙස්ටර්වලට පිටත් වන විට මේරිට දන්වා සිටීම සාමාන්‍ය සිරිතකි. සුපුරුදු පරිදි සඳුදා ඈන් සේවයට නො පැමිණියා ය. මැන්චෙස්ටර්වල පිහිටා ඇති ඈන්ගේ නිවසට ඇය සති අන්තයේ ගිය විට සමහර අවස්ථාවල දින දෙකක් හෝ තුනක් ඇයගේ දෙමාපියන් සමග ගත කොට පැමිණෙන නිසා ඈන් සේවයට නො පැමිණීම පිළිබඳව මේරි සොයා නො බැලුවා ය. එහෙත්, මෙවර ඈන් තමාට නො දන්වා මැන්චෙස්ටර්වල පිහිටි නිවසට යාම ගැන මේරි කල්පනා කළා ය. අඟහරුවාදා දිනත් ඈන් සේවයට නො පැමිණි බැවින් ඒ ගැන මේරි තරමක් කලබලයට පත් වූවා ය. ඈන් නවාතැන් ගත් ලන්ඩන් නුවර ඇයගේ කාමරයේ දුරකථනයට මේරි වහාම කතා කළත් දුරකථනයේ රිසීවරය පසෙකට තබා ඇති බව ඇයට වැටහුණි. ඊට පසුව, මේරි වහාම මැන්චෙස්ටර්වල පිහිටි ඈන්ගේ නිවසට දුරකථනයෙන් අමතා, ඇයගේ මවගෙන් තොරතුරු විමසුවා ය. සති දෙකකට පමණ පෙර ඇය තමා බැලීමට පැමිණි බවත්, පසුගිය සති අන්තයේ ඈන් තමා බැලීමට නො පැමිණෙන බව සිකුරාදා දුරකථනයෙන් දැන් වූ බවත් ඈන්ගේ මව මේරිට පැවසුවා ය. එය අසා මේරි මහත් භීතියට පත්ව, ඈන්ගේ පෙම්වතා වන රිචඩ්ට වහාම දුරකථනයෙන් කථා කොට ඈන් ගැන විමසුවා ය. අවසන් වරට තමාට ඈන්ව හමු වූයේ ඉකුත් සිකුරාදා බවත්, දෙදෙනාම අවන්හලකින් රාත්‍රී ආහාරය ගෙන ඈන් නවාතැන් ගෙන සිටි කාමරයට ඇරලූ බවත් රිචඩ්ගේ පිළිතුර විය. නියත වශයෙන්ම ඈන්ට කිසියම් අනතුරක් සිදු වී ඇති බව



වටහා ගත් රිචඩ් සහ මේරි වහාම පොලිසියට ගොස් ඈන්ගේ හදිසි අතුරුදහන්වීම ගැන පැමිණිල්ලක් කළ හ. වහාම ක්‍රියාත්මක වූ පොලිසිය ප්‍රථමයෙන් ම කළේ රිචඩ් සහ මේරි සමග ලන්ඩන් නුවර ඈන් ජීවත් වුණු කාමරයට යෑම යි. එකී කාමරය වසා තිබිණි. දොරෙහි සීනුව නාද කළත් කිසිදු ප්‍රතිචාරයක් නො ලැබුණු හෙයින් දොර කඩා කාමරයට ඇතුල් වීමට පොලිසියට සිදු විය. එහිදී ඔවුන්ට දැක ගත හැකි වූයේ සිත් කම්පා කරවන දර්ශනයකි. ඈන්ගේ අඩනිරුවත් නිසල සිරුර ඇඳක් මත තිබූ අතර, කාමරයේ බඩු බාහිරාදිය ද ඒ මේ අත පෙරළී තිබුණි. කුඩා මල් පෝච්චියක බිඳුනු කැබලි කීපයක් ද කාමරයේ සී සී කඩ විසිරී තිබුණි. කාමරයේ තිබූ අල්මාරිය ද විවෘතව තිබුණු අතර එහි තිබූ ඇඳුම් ද ඒ මේ අත විසිරී තිබිණ. කෑම කන මේසය මත වීදුරු දෙකක විස්කි ස්වල්පයක් ඉතුරු වී තිබුණි.

ඉන් අනතුරුව, පොලිසිය විසින් ව්‍යවහාරක විද්‍යාඥයා ( Forensic scientist ), අධිකරණ වෛද්‍යවරයා ( Judicial Medical Officer/ Forensic pathologist ) සහ පොලිස් ඡායාරූප ශිල්පියා (police photographer) ඈන්ගේ කාමරය පරීක්ෂා කිරීම සඳහා කැඳවන ලදී. අප රටේ නම් මේ සඳහා කැඳවනු ලබන්නේ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකි. කාමරයේ තිබූ සියල්ල පොලිස් ඡායාරූප ශිල්පයා විසින් ඡායාරූපගත කිරීමෙන් ( still photography ) පසු වීඩියෝ ( video recording ) ගත කළේ ය. ලන්ඩන් නුවරට මෙම කාලය හිම වැටෙන සීත ඍතුව ( winter ) බැවින් ඈන්ගේ සිරුර කුණු වී නො තිබුණි.

මළසිරුරක් මදක් කුණු වී තිබුණත්, බාහිරව පරීක්ෂා කොට අභ්‍යන්තර ඉන්ද්‍රියයන් විච්ඡේදනය කර ඒවා පරීක්ෂා කිරීමෙන් පසුව අවශ්‍ය වූ විට පටකවේද පරීක්ෂාවට ( histopathological examination ) ලක් කිරීමෙන් ද, විෂ වර්ග සඳහා මළසිරුරෙන් ලබා ගත් රුධිරය, මුත්‍රා, පිත්තාශයේ ඇති තරලය ( bile ), අක්ෂි ගෝල තුළ ඇති සික්ෂ්‍ය සාර්ද්‍රය ( vitreous humor ), ආමාශයේ සහ කුඩා බඩවැල්වල අන්තර්ගත දෑ, අක්මාවේ සහ වකුගඩුවේ කොටස් විශ්ලේෂණය කිරීමෙන් ( toxicological analysis ) ද මරණයට හේතුව සොයා ගත හැකි ය. මළසිරුරක් දැඩිව කුණු වී තිබුණ හොත් මරණයට හේතුව සොයා ගැනීම අසීරු ය. අධිකරණ වෛද්‍ය



Scanned with CamScanner

වාර්තාව සහ ඉදිරිපත් කරනු ලබන සියලු සාක්ෂි සලකා බලා මරණය සිදු වී ඇත්තේ ස්වාභාවික හේතුවකින් ද, අහඹු සිදුවීමකින් ද, සිය දිවි හානි කර ගැනීමකින් ද නැතහොත් මනුෂ්‍ය ඝාතනයකින් ද යන්න, මහේස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් තීරණය කරනු ලබන්නේ ය.

ඇන්ගේ මුහුණ සහ නියපොතු දම් පැහැති වී තිබිණි. අල්පෙනෙත්තක හිස ප්‍රමාණයේ ලේ ලප (petechial haemorrhages) ඇස්පිල්ලන්, නළල, කම්මුල් යන ස්ථාන මත සහ කන්පෙතිවල පිටුපස තිබූ අතර මුහුණ ද ඉදිමී තිබුණි. නියපොතුවලින් සිදු වූ සීරීම් ( abrasions ) සහ ඇඟිලි තුඩුවලින් සිදු වූ ශත විසි පහේ කාසියක ප්‍රමාණයේ තැලුම් තුවාල ( contusion ) කීපයක් ද, බෙල්ලේ ඉදිරිපස විය. බෙල්ලේ ඉදිරිපස නිකටට යටින් පිහිටා ඇති ඉංග්‍රීසි "U" ( English letter U ) අකුරේ හැඩැති බන්ධක අස්ථිය ( hyoid bone ) කැඩී තිබීමත්, බෙල්ලේ තිබූ තැලුම් තුවාලත් නිසා ඇයගේ ගෙල මිරිකා ඇති බවට වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෝහාරක ව්‍යාධිවේදී වෛද්‍යවරයා නිගමනය කළේ ය.

යම් අයෙකුගේ බෙල්ල මිරිකීමේ දී ( mannual strangulation ) ගෙලෙහි තිබෙන ශිරා තදවීම නිසා මුහුණ දම් පැහැති විය හැකි අතර ඇල්පෙනෙත්තක හිස ප්‍රමාණයේ ලේ ලප මුහුණේ ඇති වේ. ගෙල මිරිකීමේ දී බෙල්ලෙහි දෙපැත්තෙහි තිබෙන මන්‍යා ශිරා තද වීමෙන් ඒවා තුළ ඇති පීඩනය ( pressure ) වැඩි වී කේශනාලිකා ( capillaries ) තුළට එම පීඩනය සම්ප්‍රේෂිත වීමෙන් ( transmitted ) කේශනාලිකා තුළින් රුධිරය පිටතට යාමෙන් ලේ ලප හට ගනී. ඇන් සුදු ජාතික කාන්තාවක් වූ බැවින් මුහුණේ තිබූ ලප සහ දම් පැහැති වීමේ ලකුණු පැහැදිලිව පෙනෙන්නට තිබුණි.

තම දුඹුරු පැහැති ආසියානුවන් සහ තම කළු පැහැති නීග්‍රෝ ජාතිකයින් ගෙල මිරිකීමෙන් මරණයට පත් වූ විට මුහුණේ ලේ ලප සහ මුහුණ දම් පැහැති වීමේ ලක්ෂණ පැහැදිලිව දක්නට නො ලැබේ. එවැනි අය ගෙල මිරිකීමෙන් මරණයට පත් වූ විට අක්ෂි පටලය ( conjunctiva ) සහ අභ්‍යන්තර ඉන්ද්‍රියයන් වන ස්වරාලය, පෙනහැලි සහ හෘදය වස්තුව මත ( epicardium ) ලේ ලප දක්නට ලැබෙන නිසා එම ඉන්ද්‍රියයන් සූපරීක්ෂාකාරීව අධිකරණ වෛද්‍යවරයා



විසින් පරීක්ෂා කළ යුතු ය. බෙල්ල මත තිබූ සත විසිපහේ කාසියක ප්‍රමාණයේ තැල්ම හට ගන්නේ ඇඟිලි තුඩුවලින් ( finger-tips ) බෙල්ල තද කිරීම නිසා ය. තවද, සීරීම් ඇති වී ඇත්තේ ගෙල මිරිකීමේ දී නියපොතු ( nails ) වලින් බෙල්ල තද කිරීම නිසාය. මීට අමතරව ඇන්ගේ දකුණු පියයුරෙහි සපා කෑමේ ( bite mark ) තුවාලයක් ද තිබුණි. වුල් කමිසයක කෙඳි කීපයක් තදින් මිට මෙල වූ ඇන්ගේ අතෙහි ඇඟිලි අතර හිරවී තිබෙන බව (cadaveric spasm) දුටු වෝහාරක විශේෂඥයා එහි ඡායාරූපයක් ගැනීමෙන් පසුව එම කෙඳි ඉවත් කොට ඒවා රසායනාගාර පරීක්ෂණ සඳහා ඉදිරිපත් කළේ ය. ඇන්ගේ කොණ්ඩයේ කැටි ගැසී තිබූ කොණ්ඩ ගස් කීපය ද ගලවා ( plucked ) ගෙන ඒවායේ ශුක්‍රාණු (sperms) සහ ශුක්‍ර තරලය ( seminal fluid ) තිබේ දැයි, සොයා ගැනීමට සහ කොණ්ඩ ගස් මුල්වල පිහිටා ඇති සෛලවල ඩී. එන්. ඒ. ප්‍රතිරූපය ( D. N. A. profile ) පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයට ඉදිරිපත් කළේ`ය.

ජීවත් වී සිටි කාලයේ දී ඇන් ලිංගික සංසර්ගයේ යෙදී ඇති කාන්තාවක් බව ඇන්ගේ කන්‍යා පටලය ( hymen ) ඉරී ( torn ) තිබුණ ආකාරය අනුව පැහැදිලි විය. ඒ අනුව, ඇය කන්‍යාවක් නො වන බව නිගමනය කිරීමට හැකි විය. ඇන්ගේ කන්‍යා පටලයේ තිබූ ඉදිමීම් සහ රත් පැහැතිවීම් අනුව ඇය මිය යාමට ස්වල්ප වේලාවකට පෙර පිරිමියකු බලහත්කාරයෙන් ඇය සමග ලිංගික සංසර්ගයේ යෙදී ඇති බවට වෛද්‍යවරයා නිගමනය කළේ ය. කන්‍යාවක් නො වන කාන්තාවක් සමග කිසියම් පිරිමියකු ඇයගේ කැමැත්ත ඇතිව ලිංගික සංසර්ගයේ යෙදුනේ නම්, එකී කාන්තාවගේ යෝනි පටලයේ ඉදිමීම් මෙන්ම රත්පැහැතිවීම් ද ඇති නො වේ. ඊට හේතුව ස්ත්‍රියකගේ කැමැත්ත ඇතිව ලිංගික සංසර්ගයේ යෙදෙන විට යෝනියේ ඇතිවන විස්තරනයවීම ( dialation ) සහ ස්නේහක තරලය ( lubricating fluid ) හට ගැනීමයි. ඇන්ගේ යෝනිය තුළ ශුක්‍රාණු ( sperms ) සහ ශුක්‍ර තරලය ( seminal fluid ) තිබූ බව රසායානාගාර පරීක්ෂණවලින් සොයා ගෙන තිබූ නිසා ඇන් මිය යාමට පෙර ඇය ලිංගික සංසර්ගයේ යෙදී ඇති බව තහවුරු විය. උෂ්ණ කලාපීය ( tropical climate ) රටවල වාසය කරන කාන්තාවන් ලිංගික සංසර්ගයේ යෙදීමෙන් පසුව පැය දොළහක හෝ පැය විසි හතරක කාලයක් ඇතුළත දී යෝනිය තුළින් ගන්නා

ලද පිස්න අන්වීක්ෂයකින් පරීක්ෂා කිරීමෙන් පසුව ශුක්‍රාණු හඳුනාගත හැකි ය. නමුත්, සෞම්‍ය ( temperate climate ) උෂ්ණත්වයක් ඇති යුරෝපීය රටවල ශීත ඍතුවේ දී ( winter ) පැය හැත්තෑ දෙකකට වැඩි කාලයක් ගත වුවත් ලිංගික සංසර්ගයේ යෙදීමෙන් පසුව යෝනියෙන් ලබා ගන්නා ලද පිස්නවල ශුක්‍රාණු හඳුනාගත හැකි ය. ඊට හේතුව උෂ්ණ කලාපීය රටවල පවතින දැඩි උෂ්ණත්වය නිසා ශුක්‍රාණු විනාශ වී යාම යි. ඇන්ගේ කොණ්ඩයේ කැටි වී තිබුණු කොණ්ඩ ගස් කීපයෙහි සහ යෝනියෙන් ලබා ගත් පිස්නවල ශුක්‍රාණු සහ ශුක්‍ර තරලය ඇති බව රසායනාගාර පරීක්ෂණවලින් වාර්තා විය. මේ අනුව, යම් අයකු ඇන්ව දූෂණය කිරීමෙන් පසුව ඇයගේ ගෙල මිරිකා ඇති බව වෝහාරක ව්‍යාධිවේද වෛද්‍යවරයා නිගමනය කළේ ය.

කාමරයේ කැම මේසය මත තිබූ වීදුරු දෙකෙන්, එක් වීදුරුවක, ඇන්ගේ තොලේ සලකුණු ( lip print ) සහ ඇඟිලි සලකුණු විය. අනෙක් වීදුරුවේ ඇන්ගේ ඇඟිලි සලකුණුවලට අසමාන ඇඟිලි සලකුණු තිබිණි. විස් කැබැල්ලක් කා දැමීමෙන් ඉතිරි වූ කොටසක් මේසය මත තිබුණි. ඇන්ගේ ආමාශය තුළ කුඩා චීස් කැබලි තිබූ බවත් ආමාශය තුළ අන්තර්ගත දෑ වලින් පිළුනු මධ්‍යසාර ( stale alcohol ) ගඳ වහනය වූ බවත් වෝහාරක ව්‍යාධිවේදියාට දැන ගැනීමට හැකි විය. චීස් කැබැල්ල සපා තිබුණු ආකාරය ඇන්ගේ දත්වල පිහිටීමේ හැඩය ( dental impression ) සමග සන්සන්දනය කර බැලීමේ දී වෙනස් බව පැහැදිලි විය. මේ අනුව ඇන් මරණයට පත්වීමට පෙර තදුරුන් හෝ ඇය දන්නා හඳුනන පිරිමියකු සමග එක්ව චීස් කා විස්කි බී ඇති බවත් දන්ත ශල්‍ය වෛද්‍යවරයා ( dental surgeon ) වාර්තා කළේ ය.

පශ්චාත් මරණ පරීක්ෂණයේ දී ඇන්ගේ සිරුරෙන් ලබා ගත් රුධිරයෙහි, රුධිරය මිලිග්‍රෑම් සියයකට ඊතයිල් මධ්‍යසාරය මිලිග්‍රෑම් හැටක් අඩංගු වී තිබූ බව රස පරීක්ෂක වාර්තා කොට තිබුණි. වෙරි වීමට බොහෝ අයට අවම වශයෙන් රුධිරය මිලිලීටර් සියයකට ඊතයිල් මධ්‍යසාරය මිලිග්‍රෑම් එකසිය පනහක ප්‍රමාණයක් රුධිරයේ තිබිය යුතු ය. එම නිසා, ඇන් මරණයට පත් වන විට මත් පැන් පානය කර තිබුණත් වෙරි වී නො සිටි බව වෛද්‍යවරයා නිගමනය කළේ ය.



ඇන්ගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් ඇයගේ පෙම්වතා වන රිචඩ් පොලිසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී. ඇන් මිය යාමට පෙර ආහාර ගත් තැනැත්තා ඇයගේ කාමරයට ඇතුල් වීමේ දී දොර හෝ ජනේල කඩා නො තිබීම ඊට හේතු විය. ඇන් සමග තමා ප්‍රේම සම්බන්ධයක් පවත්වා ගෙන ගිය බවත්, ඇය විවාහ කර ගැනීමට පොරොන්දු වී ඇති බැවින් ඇතැම් අවස්ථාවල ඔවුන් දෙදෙනා අඹුසැමියන් වශයෙන් හැසිරී ඇතත්, ඇයගේ මරණය සිදු වූ සතියේ සඳුදා ඇන්ගේ ඔසප්වීම සිදු වී තිබීම නිසා එවැනි සම්බන්ධවීමක් නො තිබූ බවත්, තමා ඇන්ගේ මරණය සිදු නො කළ බවත්, රිචඩ් ස්ථිරවම පොලිසියට කියා සිටියේ ය. රිචඩ්ගේ නිර්දෝෂී භාවය ඔප්පු කිරීම සඳහා D.N.A. ප්‍රතිරූප පරීක්ෂාව සඳහා ඔහුගේ රුධිර සාම්පලයක් ( blood sample ), තොලේ මුද්‍රාවක් ( lip print ) සහ දන්ත මුද්‍රිතයක් ද ( dental impression ) ඔහුගේ කැමැත්ත ( consent ) ඇතිව පොලිසිය විසින් ලබා ගත්තේ ය.

කැමැත්ත ( consent ) නොහොත් අනුමැතිය, යටහත් වීමක් (submission ) පමණක් නො වේ. යම්කිසි ක්‍රියාවක් කරන තැනැත්තකු හෝ එම තැනැත්තාට වෙන අයකු කරන ක්‍රියාව පිළිබඳව නියම දැනුමක් ( proper knowledge ) නොමැති නම්, කැමැත්ත දිය නො හැකි ය. එම නිසා, මන්දබුද්ධික තැනැත්තන්ට ( mentally subnormal persons ) හෝ මානසික රෝගයකින් ( mental illness ) පෙළෙන තැනැත්තන්ට කැමැත්ත දිය නො හැකි ය. යම් අයෙකුට මන්දබුද්ධික භාවයක් හෝ මානසික රෝගයක් නො තිබුණත් මානසික වර්ධනයේ නොමේරු භාවයක් ( mental immaturity ) නිසා වුව ද ඔවුන් විසින් දෙනු ලබන කැමැත්තෙහි වලංගු භාවයක් නැත. ළමයින්ගෙන් ලබා ගන්නා කැමැත්ත මේ ගණයට අයත් වේ. බලය පිළිගැනීම (acceptance of authority), යටහත් පැවැත්ම ( obedient conduct ), යටත්වීම ( surrender ), විරුද්ධත්වයක් නො පෑම ( abstinence from resistance ) සහ යටහත් භාවය ( yielding ) යන ඒවා කැමැත්ත ප්‍රකාශ කිරීම නො වේ.

චීස් කැබැල්ල සපා කා තිබුණේ රිචඩ් නො වන බවත්, විස්කි වීදුරුවේ තිබූ තොල් මුද්‍රාව රිචඩ්ගේ නො වන බවත්, පරීක්ෂණවලින් පැහැදිලි විය. තවද, D.N.A. පරීක්ෂාවට අනුව ඇන්ගේ කොණ්ඩයේ කැටි වී තිබුණු ශුක්‍ර තරලය සහ යෝනියෙන් ලබා ගත් ශුක්‍රාණු



Scanned with CamScanner

රිචඩ්ගේ නො වන බව රසායනාගාර පරීක්ෂණවලින් තහවුරු විය. ඒ අනුව, ඈන් ඝාතනය කළ පුද්ගලයා රිචඩ් නො වන බව ඔප්පු වූ හෙයින් පොලිසිය ඔහුව නිදහස් කළේ ය.

ඈන්ගේ ඝාතකයා අත් අඩංගුවට ගැනීමට පොලිසියට දැඩි උත්සාහයක් දැරීමට සිදු විය. ඈන් මරණයට පත්වීමට පෙර ඇය දන්නා හඳුනන අයකු සමග විස් කා විස්කි බී තිබූ බැවින් ඈන් ඇසුරු කළ පිරිමින් ගැන පොලිසිය මේරිගෙන් විමසී ය. රිචඩ් හමුවීමට පෙර ඈන්, ඖෂධවේදියකු ( pharmacist ) සමග ප්‍රේම සම්බන්ධයක් ඇති කර ගෙන තිබූ නමුත් එම සම්බන්ධය නවතා දැනට අවුරුදු එකහමාරක් පමණ වන බවත්, එහෙත් මෑතක සිට ඔහු දුරකථනයෙන් කිප වරක් ඈන්ට කථා කළ බව ඇය තමාට පවසා ඇති බවත්, මේරි පොලිසියට ප්‍රකාශ කළා ය. ඔහුගේ නම විල්සන් විය. ඈන්ගේ කාමරයේ තිබූ මේස ලාච්චුවක් පරීක්ෂා කිරීමෙන් පසුව පරණ දින පොතක තිබී විල්සන්ගේ ඡායාරූපයක් පොලිසිය විසින් සොයා ගන්නා ලදී. ඒ අනුව, ඈන්ගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු වශයෙන් විල්සන් අත් අඩංගුවට ගත් අතර, ඈන් සමග ප්‍රේම සම්බන්ධයක් තිබුණත් දැනට අවුරුදු එක හමාරකට පෙර සිට එය අත්හල බවත් ඊට පසුව ඈන් හමු නො වූ බවත් විල්සන් පොලිසියට ප්‍රකාශ කළේ ය. විල්සන්ගේ උඩු ඇන්දේ ඉදිරි මධ්‍ය කෘන්තක ( incisor ) දත් අතර පරතරයක් ඇති බව පරීක්ෂණය පැවැත් වූ පොලිස් නිලධාරියාගේ උකුසු ඇසට පෙණුනි. ඈන්ගේ මළසිරුර තිබූ කාමරයේ මේසය මත කොටසක් සපා තිබූ විස් කැබැල්ලේ හැඩයත්, විල්සන්ගේ දත් පිහිටි ආකාරයත් සමාන බව එම පොලිස් නිලධාරියාට ඒත්තු ගියේ ය. එම නිසා, ඈන්ගේ ඝාතකයා විල්සන්ම විය හැකි යැයි, පොලිස් නිලධාරියාට සැක සිතිණි. එහෙත්, එම සැකය පොලිස් නිලධාරියා විල්සන්ට හැඟ වූයේ නැත.

මිනිසුන් සියයට අසූවකගේ රුධිර වර්ගය, ( blood group ) ඔවුන්ගේ කෙළවල සහ ශුක්‍ර තරලයේ තිබෙන බව පර්යේෂණවලින් සොයා ගෙන ඇත. යම් අයකු සපා කෑ විට එයින් ඇති වන තුවාලය මත එම තැනැත්තාගේ කෙළ ( sputum ) තැවරේ. එබැවින් යම් අයකු සපා කෑ විට ඉන් ඇති වන තුවාලයෙන් පිස්නයක් ලබා ගෙන පරීක්ෂා කිරීමෙන් පසුව සපා කෑ තැනැත්තාගේ රුධිර වර්ගය



සොයා ගැනීමෙන්, සපා කෑ තැනැත්තා හඳුනා ගැනීමට හැකි වේ. ඒ අනුව, ඈන්ගේ දකුණු පියයුරෙහි තිබූ සපා කෑමෙන් ඇති වූ තුවාලයෙන් ( bite mark ) වෛද්‍යවරයා ලබා ගත් පිස්නයේ ( swab ) රුධිර වර්ගය කුමක් දැයි, රසායනාගාරයෙන් වාර්තා කර ගෙන තිබිණ. අනතුරුව, අධිකරණ නියෝගයක් මත විල්සන්ගේ රුධිරය සහ කෙළ ලබා ගෙන එහි වර්ගය රසායනාගාර පරීක්ෂණ වලින් හඳුනා ගන්නා ලදී. විල්සන්ගේ තොල්වල සහ දත්වල සලකුණු ( dental impression ) ද දන්ත වෛද්‍ය විශේෂඥයකු ලවා වාර්තා කර ගන්නා ලදී. විල්සන්ගේ රුධිරයේ සුදු රුධිරානුවල ( white blood corpuscle ) න්‍යෂ්ටියෙහි ඇති D.N.A. ප්‍රතිරූපය (pro-file) නොහොත් පිහිටීම, ඈන්ගේ කොණ්ඩ ගස්හි මුල්වල තිබූ සෛලවල D.N.A. පිහිටීම සහ ඇයගේ යෝනියෙන් ලබා ගත් තරලයේ තිබූ ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූප සමාන බව රසායනාගාර පරීක්ෂණ වලදී හෙළි විය. යම් අයකු සපා කෑ විට ඉන් ඇති වන තුවාලයේ සමීප ඡායාරූපයක් ( close up ) ලබා ගෙන සැකකරුගේ දත්වල ද ඒ හා සමාන ප්‍රමාණයේ සමීප ඡායාරූපයක් ලබා ගෙන සෘණ ඡායා පටල ( negatives ) එක මත එක තබා අධිෂ්ඨාපන ප්‍රතිබිම්බ රූප ( superimposition photo graphs ) පරීක්ෂා කිරීමෙන් සැකකරුගේ දත්වල පිහිටීම හඳුනා ගත හැකි ය. එලෙස පරීක්ෂා කිරීමෙන් ඈන්ගේ ඝාතකයා විල්සන් බව තහවුරු විය. අධිකරණ නියෝගයක් මත විල්සන් ඇඳ සිටි ලොම් ( woollen ) කමිසයේ කෙඳි ස්වල්පයක් ලබා ගෙන එම කෙඳි ඈන්ගේ අතෙහි රැඳී තිබුණු ලොම් කෙඳි සමග අධිවිශාලන අන්වීක්ෂයකින් ( high magnification ) පරීක්ෂා කොට සංසන්දනය කළේ ය. ඒ අනුව, විල්සන් ඇඳ සිටි කමිසයේ ලොම් සහ ඈන්ගේ අතේ රැඳී තිබුණු ලොම් සමාන බව ද, රසායනාගාර පරීක්ෂණ වාර්තාවලින් හෙළි විය.

සියලු පරීක්ෂණවල ප්‍රතිඵල විල්සන්ට දැන්වීමෙන් පසු ඔහු සියල්ල සිදුවූ ආකාරය පිළිබඳව පොලිසියට පාපොච්චාරණයක් කළේ ය. ඈන් සමග තිබූ ප්‍රේම සම්බන්ධය අවසන් වීමෙන් පසුව හුදකලා වූ තමා දැඩි මානසික අවපීඩනයට ( mental depression ) පත් වූ බවත්, ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙස ඈන්ගෙන් කිහිප වාරයක් ඉල්ලා සිටි බවත් විල්සන් කියා සිටියේ ය. ප්‍රථමයෙන් ඈන් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළත්, තමන්ගේ නිරන්තර ඇවිටිලි නිසා ලන්ඩන් නුවර පිහිටි ඈන්ගේ කාමරයට



Scanned with CamScanner

සෙනසුරාදා පැමිණීමට ඇය ආරාධනා කළ බවත්, තමා ඇන්ගේ
කාමරයට පැමිණෙන විට විස්කි බෝතලයක් රැගෙන පැමිණි බවත්
විල්සන් කිවේ ය. ඇන් සමග පැවැත් වූ ප්‍රේම සම්බන්ධය නිසා
තමා ලැබූ තෘප්තිය ගැන සාකච්ඡා කිරීමෙන් පසුව ඇය සමග
විවාහ වීමට යෝජනා කළ බවත්, එයට ඇය අකමැති වූ විට තමා
ආදරය පෙන් වූ බවත් ඇ සමග ලිංගික සංසර්ගයේ යෙදීමට උත්සාහ
කළ බවත් එයට ඇන් ඉඩ නො දුන් බවත් විල්සන් තවදුරටත් කියා
සිටියේ ය. ලිංගික ආශාව යටපත් කර ගැනීමට අපොහොසත් වූ
තමා බලහත්කාරයෙන් ඇන් සමග ලිංගික සංසර්ගයේ යෙදීමට
උත්සාහ කළ විට කෝපයෙන් වියරු වැටුනු ඇය කෑ ගසමින් ළඟ
තිබූ කුඩා මල් පෝච්චියකින් ඔහුගේ හිසට දමා ගැසූ බවත්, එම
පහරින් තමාට තුවාලයක් සිදු නො වූ බවත් ඔහු පැවසී ය. ඒ
අවස්ථාවේ ඇති වූ පොර බැදීමෙන් ස්වල්ප වේලාවකට පසුව ඇන්ගේ
නිසල සිරුර ඇඳ මත වැටුණු බවත්, ඇ මරණයට පත් වී ඇති බව
තමාට වැටහුනු බැවින් ඇන්ගේ කාමරයට සොරෙකු ඇතුල් වූ බව
පෙන්වීමට අල්මාරිය විවෘත කොට ඇඳුම් සී සී කඩ වීසි කර බඩු
බාහිරාදිය පෙරළා වහාම තිවසෙහි විදුලි බල්බ නිවා දොර ද වසා
දමා කාමරයෙන් පිට වී තමාගේ මෝටර් රථයෙන් මැන්චෙස්ටර්
නගරයට පැමිණි බවත් විල්සන් පොලිසියට පැවසී ය.

ඇන් සමග ලිංගික සංසර්ගයේ යෙදීමට ඔහු උත්සාහ කළ බව
නඩු විභාගයේ දී විල්සන් පිළිගත්තේ ය. එනමුත්, ඇන්ගේ යෝනි
පටලය ඉදිමී රත් පැහැති වී තිබීම සහ ඇයගේ යෝනිය තුළ
විල්සන්ගේ ශුක්‍රාණු තිබීමෙන් විල්සන් බලහත්කාරයෙන් ඇන් සමග
ලිංගික සංසර්ගයේ යෙදුනු බව ස්ථිරවම නිගමනය කළ හැකි විය.
සියලු සාක්ෂි අධිකරණයේ දී ඉදිරිපත් කිරීමෙන් පසු පැමිණිල්ලේ
නීතිඥවරයා විසින් ජූරිය අමතන අවස්ථාවේ දී මෙම කරුණු ජූරියේ
දැඩි අවධානයට ලක් කරන ලදී.

සියලු වෛද්‍ය සාක්ෂි ( medical evidence ) සහ පරිවේෂණී
සාක්ෂි ( circumstantial evidence ) සැලකිල්ලට භාජනය කළ ජූරිය
විල්සන්ට ඇන්ව මරා දැමීමට චේතනාවක් ( intention ) නො තිබුණ
බැවින්, මිනීමැරීමක් නොවන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් ( man
slaughter / culpable homicide not amounting to murder ) සිදු කෝ
ඇන්ගේ මරණය සිදු කිරීමේ වරදට විල්සන් වැරදිකරු බව තීරණ



කළේ ය. විනිසුරු විසින් අවුරුදු දහයක බරපතල වැඩ සහිතව සිර දඬුවමක් විල්සන්ට නියම කරන ලදී.

යම් අයකු සිතා මතා පූර්ව චේතනාවකින් ( intention ) යුතුව ( with prior knowledge ) යම් ක්‍රියාවක් සිදු කොට තව කෙනෙකුගේ මරණය සිදු කරන්නේ නම් හෝ එම ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් එම තැනැත්තා මිය ගිය විට හෝ අප රටේ පවත්නා දණ්ඩ නීති සංග්‍රහයේ ( penal code ) දෙසිය අනූ හතර වන වගන්තිය අනුව එය මිනීමැරීමේ වරදක් ( murder ) වන්නේ ය. යම් අයෙකුගේ පූර්ව චේතනාව තිබෙන්නේ මනසේ බැවින් පූර්ව චේතනාව දෘශ්‍යමාන වන්නේ එම තැනැත්තා කරන ක්‍රියාවන් අනුව ය. එම නිසා, යම් අයකු තවත් අයෙකුගේ මරණය සිදු කිරීමට පාවිච්චි කරන ආයුධය, සිරුරේ තුවාලය හෝ තුවාල සිදු කරන ස්ථානය සහ පහරවල් ගණන යනාදිය සහ වෙනත් ඇසූ දුටු සාක්ෂි ( testiomonial evidence ) සලකා බලා අධිකරණයක් මගින් පූර්ව චේතනාව පිළිබඳව තීරණයකට එළඹෙනු ලැබේ. මිනීමැරීමේ වරදට දණ්ඩ නීති සංග්‍රහයේ දෙසිය අනූ හය වැනි වගන්තිය අනුව වරදකරුට මරණීය දණ්ඩනය ( capital punishment ) නියම කළ යුතු ය. අප රටේ පවත්නා සාපරාධී නීතිය ( criminal law ) අනුව කෙනෙකු මනුෂ්‍ය ඝාතනයකට ලක් වූ විට පවත්වනු ලබන පොලිස් පරීක්ෂණ අනුව පොලිසිය විසින් එම මනුෂ්‍ය ඝාතනය පිළිබඳව නීතිපතිවරයාට ( attorney general ) දැන්වීමෙන් පසුව, සැකකරුට එරෙහිව මිනීමැරීමේ චෝදනාවක් හෝ මිනීමැරීමක් නොවන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් හෝ කිරීමේ චෝදනාවක් ඕනෑම කාලයක් තුළ දී නීතිපතිවරයාට මනුෂ්‍ය ඝාතනය සිදු වූ ප්‍රදේශයේ මහාධිකරණයට ඉදිරිපත් කළ හැකි ය.

එනමුදු, එංගලන්තයේ පවත්නා සාපරාධී නීතිය අනුව මිනීමැරීමේ චෝදනාවක් ඉදිරිපත් කළ හැක්කේ මරණය සිදු වී අවුරුද්දකුත් එක් දිනක් ඇතුළත දී පමණකි. පූර්ව චේතනාවක් නොමැතිව ( without prior knowledge ) යම් අයෙකු යම්කිසි ක්‍රියාවක් කිරීමෙන් තව කෙනෙකුගේ මරණය සිදු කරන්නේ නම් හෝ එම ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් එම තැනැත්තාගේ මරණය සිදු වූ විට දණ්ඩ නීති සංග්‍රහයේ දෙසිය අනූපස්වන වගන්තිය යටතේ එම වරද මිනීමැරීමක් නො වන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් ( culpable homicide not amounting



Scanned with CamScanner

to murder ) වන්නේ ය. මිනීමැරීමක් නො වන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් කිරීමේ වරදට, වැරදිකරුට දණ්ඩ නීති සංග්‍රහයේ දෙසිය අනූහත්වන වගන්තිය අනුව අවුරුදු විස්සක උපරිම සිර දඬුවමක් අධිකරණයක් මගින් නියම කළ හැකි ය.

ඉඩම් ආරවුලක් පිළිබඳව සුනිල් සහ නිමල් අමනාපයෙන් පසු වූ අතර එක් දිනක නිමල් ගෙදර එන විට ඔහු ගෙදර එන තෙක් බලා සිටි සුනිල්, ගසකට මුවා වී නිමල්ට වෙඩි තබන ලදී. ඒ අයුරින් නිමල්ගේ මරණය සිදු කිරීම, මිනීමැරීමේ වරදට උදාහරණයක් වශයෙන් දැක්විය හැකි ය. සුනිල් විසින් සිතා මතා නිමල්ගේ මරණය සිදු කළ නිසා එම ක්‍රියාව මිනීමැරීමක් වේ. නිමල් පාරේ ගමන් කරන විට සුනිල් හමු වී ඔවුන් අතර තිබූ පැරණි විරුද්ධවාදිකමක් පිළිබඳව වචන හුවමාරුවක් ඇති වීමෙන් පසුව සුනිල් විසින් නිමල්ට, ගලකින් හිසට ගසා නිමල් මරා දැමීම මිනීමැරීමක් නො වන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයකට උදාහරණයක් වේ. සුනිල් විසින් නිමල්ව මරණයට පත් කළත් නිමල්ගේ මරණය සිදු කිරීමට පූර්ව චේතනාවක් සුනිල්ට නො තිබීම නිසා මෙම ක්‍රියාව මිනීමැරීමක් නො වන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් වේ.

එකම පවුලේ සහෝදරයන් දෙදෙනකු වන කමල් සහ ප්‍රියන්ත තම පියාගේ මුදලය බෙදා දීම ගැන හිත් අමනාපයෙන් සිටියත් දෙදෙනාම එකිනොවුන්ගේ නිවෙස්වලට යාම් ඊම් නතර කළේ නැත. මේ අතර ප්‍රියන්තට සෙංගමාලය සෑදී රෝහලකට ඇතුළත් කරන ලදී. සෙංගමාලය සෑදීමට හේතුව ආසාධන යකෘත් ප්‍රදාහය ( infective hepatitis ) නමැති රෝගය බව රෝහලේ දී සොයා ගන්නා ලදී. ප්‍රියන්ත රෝහල්ගත වී සිටින දිනවල දවල් ආහාරය රැගෙන ඒමට කමල් එකඟවූ අතර එම ආහාරයට පාෂාණම් (arsenic) ස්වල්ප වශයෙන් ඔහු මිශ්‍ර කළේ ය. ප්‍රියන්තගේ රෝගී තත්ත්වය ක්‍රමයෙන් උත්සන්න වී සති දෙකක කාලයකින් පසු ප්‍රියන්තගේ අක්මාව අකර්මන්‍ය වීමෙන් ( liver failure ) ඔහුගේ මරණය සිදු විය. අධිකරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව ආමාශය, අක්මාවේ කොටසක්, වකුගඩුවේ කොටසක්, නියපොතු ස්වල්පයක්, මොළයේ කොටසක්, කොණ්ඩ ගස් ස්වල්පයක් සහ මාංශ පේශීන් ස්වල්පයක් රස පරීක්ෂක වෙත යැවීමෙන් පසුව එම ඉන්ද්‍රියයන්හි සාමාන්‍ය ප්‍රමාණයන්ට වඩා පාෂාණම් විශාල ප්‍රමාණයක්



තිබූ බව සොයා ගන්නා ලදී. ඒ අනුව, ප්‍රියන්ත මිය ගියේ යකෘත් ප්‍රදාහය සෑදී නොව, පාෂාණම් ශරීරගත වීම නිසා අක්මාව අකර්මන්‍ය වීමෙන් බව හෙළි විය.

යම් අයකුගේ රුධිරයේ මිලි ලීටර් සියයකට පාෂාණම් මිලි ග්‍රෑම් හතක් ද, අක්මාවේ කිලෝ ග්‍රෑමයකට මිලි ග්‍රෑම් අනූ දෙකක් ද, වකුගඩුවේ කිලෝ ග්‍රෑමයකට මිලි ග්‍රෑම් හැට අටක් ද, නියපොතු ග්‍රෑමයකට මිලි ග්‍රෑම් එකසිය හැත්තෑවක් ද, කෙස් ග්‍රෑමයකට මිලි ග්‍රෑම් එක සිය අනූ දෙකක් සහ මොළයේ කිලෝ ග්‍රෑමයකට මිලි ග්‍රෑම් විසි පහක් උපරිමව පාෂාණම් තිබෙන බව පරීක්ෂණවලින් සොයා ගෙන ඇත.

කමල් සහ ප්‍රියන්ත අතර තිබූ අමනාපකම නිසා ප්‍රියන්තව ජීවිතක්ෂයට පත් කිරීමේ පූර්ව චේතනාවෙන් ප්‍රියන්තගේ ආහාර වේලට කමල් විසින් පාෂාණම් මිශ්‍ර කිරීමෙන් ප්‍රියන්තගේ මරණය සිදු කිරීම, මිනීමැරීමක් සිදු කිරීමට අවශ්‍ය සියලුම කරුණු වන චේතනාව, මරණය සිදු කිරීමට කළ ක්‍රියාව සහ එම ක්‍රියාවෙන් ප්‍රියන්ත මරණයට පත්වීම යන කරුණු මෙම නිදසුනෙන් පැහැදිලි වේ.

ප්‍රියන්තගේ මරණය සිදු වූයේ යකෘත් ප්‍රදාහය සෑදී අක්මාව අකර්මන්‍ය වීමෙන් යැයි සිතා ප්‍රියන්තට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා විසින් මරණ සහතිකය නිකුත් කළේ නම්, මිනීමැරීමක් නො වන බවට මෙම සිද්ධිය සදාකාලිකව පවතිනු ඇත. මරණය ගෙන දිය හැකි තුවාල සිදු වී රෝහලකට ඇතුල් කරන අයගේ හැර ( මෙම සිද්ධීන්වල දී තුවාල වූ අන්දම පිළිබඳව පසුබිම ලබා ගනු ලබන්නේ, සිද්ධිය සිදු වූ ප්‍රදේශයේ පොලිස් නිලධාරියකු විසින්ය ). අසනීප වීමෙන් පසුව රෝහලකට ඇතුල් කරන අයගේ අසනීප තත්ත්වය පිළිබඳව ( history of present illness ), රෝගියාට මීට පෙර වැළඳී තිබූ රෝග, ( history of past illness ), පවුලේ අයගේ රෝග තත්ත්වයන් ( history of illness in the family menmbers ), සහ රෝගියාගේ පවුලේ ආර්ථික හා සමාජීය තත්ත්වය ( social and economic status of family ) යනා දී විස්තර රෝග විනිශ්චය කිරීමට පෙර වෛද්‍යවරයා විසින් ලබා ගැනීම බටහිර වෛද්‍ය විද්‍යාවේ අවශ්‍ය මූලික පදනම වේ. කළ යුතු ආකාරය මෙසේ වුවත් අප



Scanned with CamScanner

රටේ රෝහල්වලට ඇතුල් කරන රෝගී සංඛ්‍යාව ඉමහත් නිසා ඉහත කී අන්දමට ක්‍රියා කිරීමට ප්‍රායෝගිකව නො හැකි වුවත් රෝගී තත්ත්වයකින් පසුව ඇතුල් කළ අයකු මිය ගිය විට, මරණ සහතිකයක් ( death certificate ) නිකුත් කිරීමට පෙර රෝගය ස්ථිර වශයෙන් විනිශ්චය කර නොමැති නම් මරණ සහතිකයක් නිකුත් නො කොට හදිසි මරණ පරීක්ෂකවරයා වෙත මරණය පිළිබඳව දැන්විය යුතු ය.

රෝහලකට ඇතුල් කරන විට මිය ගොස් තිබූ අයකු පිළිබඳව හෝ රෝග විනිශ්චයක් නො කොට දින කීපයක් රෝහල් ගත වී සිටි අයකුගේ හෝ මරණයට හේතුව ( cause of death ) වෛද්‍යවරයා නො දන්නා විට හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්වීමට එරෙහිව ඥාතීන් විසින් දැඩි පරිශ්‍රමයක් දරනු ලබන අවස්ථා බොහෝ ය. ඇතැම් විට හදිසි මරණ පරීක්ෂකවරුන්ට බලපෑම් කොට මළසිරුරු රෝහලෙන් ගෙන යාමට උත්සාහ කර ඇති අවස්ථා ද බොහෝ ය. යම් අයෙකුට විෂ වර්ගයක් ශරීරගත කිරීමෙන් හෝ කොට්ටයක් මුහුණට තබා තද කිරීමෙන් මරණයට පත් කොට හෝ අංශභාගය වැළඳී සිටින රෝගියෙකුට හෝ දුබල තත්ත්වයකින් සිටින වයස්ගත තැනැත්තෙකුගේ හුස්ම හිර කිරීමෙන් යනාදී ක්‍රමවලින් මරණය සිදු කොට මළසිරුරු රෝහලට ගෙන ඒමේ හැකියාව ඇත.

මුස්ලිම් ජාතික තරුණයෙකු ඔහුගේ මිතුරෙකු වූ තවත් මුස්ලිම් ජාතික තරුණයෙකුට පොල්ලකින් හිසට පහර දී මරණයට පත් කොට මළසිරුර දුම්රිය මාර්ගයේ තබා එම මළසිරුර හඳුනා ගැනීමට සහ සිද්ධිය පිළිබඳව සාක්ෂි දීමට එම තරුණයාම ඉදිරිපත් විය. මළසිරුර හඳුනා ගත් තැනැත්තා විසින්ම මෙම මනුෂ්‍ය ඝාතනය සිදු කළ බව හෙළි වූයේ අධිකරණ වෛද්‍යවරයා විසින් පැවැත් වූ පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසුව ය. මෙම මළසිරුර වෛද්‍ය පරීක්ෂණයකට භාජනය නො කොට ඉදිරිපත් වූ සාක්ෂි අනුව හදිසි මරණ පරීක්ෂණයක් පමණක් පැවැත්වීමෙන් පසුව මළසිරුර ඥාතීන්ට භාර දුන්නේ නම්, මෙම මනුෂ්‍ය ඝාතනය සදාකල් රහසක්ව පවතිනු ඇත. මියගිය තරුණයා මුස්ලිම් ජාතිකයකු වූ බැවින්, වෛද්‍ය පරීක්ෂණයක් නො පවත්වා හදිසි මරණ පරීක්ෂණයක් පමණක් පැවැත්වීමෙන් පසුව මළසිරුර ඉතා කඩිනමින් භාර ගැනීමට ඥාතීන් විසින් දැඩි පරිශ්‍රමයක් දරන ලදී. පරීක්ෂණය භාර පොලිස් නිලධාරියාගේ ඥානාන්විත පියවර නිසා එය වැළැක්විණි. වාණිජමය,



සංකීර්ණ සහ කරදරකාරී සමාජයක ජීවත් වන විට දුබලයන් (infirmed) රහසිගතව මරා දමා ඔවුන් ස්වාභාවික ලෙස මිය ගිය බව පෙන්වීමට උත්සාහ දරා ඇති අවස්ථා ද වාර්තා වී ඇත.

බටහිර වෛද්‍ය විද්‍යාවේ ( western allopathic medicine ) මූලික වස්තු බීජය නොහොත් හරය වන්නේ ව්‍යාධිවේදී විද්‍යාවයි ( pathology ). රෝගයක් විනිශ්චය කිරීමට ( diagnosis ) පෙර එම රෝගය සෑදෙන මූලික කරුණු පිළිබඳව දැනුමක් නොහොත් ව්‍යාධිජනකත්වය ( pathogenesis ) පිළිබඳව ගැඹුරු දැනුමක් වෛද්‍යවරයෙකුට තිබිය යුතු ය. එසේ නොමැති වෛද්‍යවරයෙකුට නිසියාකාරව රෝගියෙකුට ප්‍රතිකාර කිරීමට නො හැකි වන අතර, එවැනි වෛද්‍යවරයෙකුට වෝහාරක ව්‍යාධිවේද ක්ෂේත්‍රයේ සාර්ථකව කටයුතු කිරීමට නො හැකි ය. ලෝක පූජිත වෝහාරක ව්‍යාධිවේදයෙක් වූ ලංඩන් විශ්වවිද්‍යාලයේ හිටපු අධිකරණ වෛද්‍ය විද්‍යා මහාචාර්යවරයෙකු වූ ශ්‍රීමත් කීත් සිම්සන් ( Professor Keith Sismpson ) මහතා එක්දහස් නවසිය පනස් හයේ දී ලංකාවට පැමිණි අවස්ථාවේ දී පැවැත් වූ දේශනයක දී මේ බව දැඩි ලෙස අවධාරනය කළේ ය. එහෙත් අප රටේ සේවය කරන ඇතැම් වෛද්‍ය විශේෂඥයන් සහ වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැලී සිටින මහාචාර්යවරුන් පවා වෝහාරක ව්‍යාධිවේදී ක්ෂේත්‍රය අවතක්සේරුවටත් උපහාසයටත් ලක් කළ අවස්ථා දක්නට ලැබේ.

මතබේදයට ලක් වී ඇති කරුණු හෝ සිද්ධිය (point in issue) නිරූපනය කිරීම ( demonstrate ) සඳහා හෝ පැහැදිලි කිරීමට ( make it clear ) ගන්නා පියවර සාක්ෂි ( evidence ) වශයෙන් බැල්ක්ස්ටොන් ( Blackstone ) නමැති නීති විශාරදයා පැහැදිලි කොට ඇත. එකෙලී සාක්ෂි ( direct evidence ) සහ පරිවේෂනීය ( circumstantial evidence ) සාක්ෂි යනුවෙන් කොටස් දෙකකට ප්‍රභේද කළ හැකි ය. යම්කිසි අයකු දුටු දෙයක්, හෝ ඇසූ දෙයක් හෝ ඇල්ලූ දෙයක් හෝ එම තැනැත්තාට දැනුන දෙයක් යන ඒවා ඒකෙලී සාක්ෂි සනයට අයත් වේ. මහා මාර්ගයේ වැරදි පැත්තේ වාහනයක් ධාවනය වීම යම් අයෙකු දැකීම හෝ ලේ තැවරුනු ලේන්සුවක් නඩු විභාගයක දී ඉදිරිපත් කිරීම එකෙලී සාක්ෂි සනයට අයත් වේ. මතභේදයට ලක් වූ සිද්ධිය හෝ කරුණු ඍජුව ඔප්පු නො කොට වක්‍රව වෙනත් සාක්ෂි ඉදිරිපත් කිරීම පරිවේෂනීය සාක්ෂිවල ලක්ෂණයකි. වාහන ටයරයක ලකුණු පාරේ වැරදි පැත්තේ සටහන්ව



Scanned with CamScanner

තිබිම. රියදුරු විසින් වැරදි පැත්තේ වාහනය ධාවනය කළ බව ඔප්පු කිරීමට උපයෝගී කර ගත හැකි පරිවේෂනීය සාක්ෂියකි.

මනුෂ්‍ය ඝාතනයක් සිදු කළ අවස්ථාවක දී එම මළසිරුර සොයා ගැනීමට නො හැකි වුවත්, පරිවේෂනීය සාක්ෂි ඇත්නම් මිනීමැරීමක් සිදු වූ බව පැමිණිලි පක්ෂය ඔප්පු කළහොත් මිනීමැරීමක් සිදු වූ බව ජූරි සභාවට හෝ විනිසුරු මඩුල්ලට පිළිගත හැකි ය. එසේම සාක්ෂිවල දී අධිකරණය සෑහීමකට පත්විය යුත්තේ සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන සාක්ෂිවල ඇති විශ්වාසනීය භාවය ගැන පමණක් ය. නමුත් පරිවේෂනීය සාක්ෂිවල දී සිද්ධිය පිළිබඳ ව උකුව පෙන්වන ලද අනුමේය ( inference ) භාවයේ සත්‍යතාව හෝ අසත්‍යතාව පිළිබඳව ද අධිකරණය අමතර සැලකිල්ලට භාජනය කළ යුතු ය. වාචික (oral ), ලේඛණගත ( documentary ) සහ තථ්‍ය (real) යනුවෙන් අධිකරණයකට ඉදිරිපත් වන සාක්ෂි වර්ග තුනක් ඇත. සාක්ෂිකරුවකු විසින් බයිබලය මත හෝ කෝරානය මත දිවුරුම් දීම හෝ සත්‍ය ප්‍රකාශ කරන බවට ප්‍රතිඥාවක් දීමෙන් පසුව විත්ති කූඩුවට නැග අධිකරණයක දී වාචික සාක්ෂි දෙනු ලැබේ. ඇසුවුදු ( testimonial ) සහ ප්‍රවාදක ( hearsay ) යනුවෙන්, වාචික සාක්ෂි වර්ග දෙකක් ඇත. සාක්ෂිකරුවකු විසින්ම ඇසුදුටු හෝ දැනුන දෙයක් පිළිබඳව විස්තරයක් කිරීම ඇසුදුටු සාක්ෂි ගනයට ඇතුළත් වේ. වෙනයම් කෙනෙකුට ප්‍රකාශ කළ දෙයක් හෝ පෙන්වා දුන් දෙයක් තව කෙනෙකු විසින් ප්‍රකාශ කිරීම ප්‍රවාදක සාක්ෂි වශයෙන් සලකනු ලබේ. වෛද්‍ය වාර්තාවක්, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවක් හෝ ලියකියවිල්ලක් හෝ එක්ස් කිරණ පටලයක් හෝ ඡායාරූපයක් යනාදිය ලේඛණගත සාක්ෂි ගනයට අයත් වේ. නඩු විභාගයක දී ඉදිරිපත් කරන පිහියක්, තුවක්කුවක්, කඩුවක්, ලේ තැවරුණු පැදුරක්, ලියුමක්, විස බෝතලයක් යනාදිය තථ්‍ය සාක්ෂි ගනයට ඇතුලත් වේ. මේවාට නඩු භාණ්ඩ ( productions) යැයි, හඳුන්වනු ලැබේ.

නඩු විභාගයේ දී පැමිණිල්ලේ නීතිඥයාට හෝ විත්තියේ නීතිඥයාට ඇසුදුටු සාක්ෂිකරුවෙකුගෙන් හරස් ප්‍රශ්න ( cross examination ) ඇසීමේ අවස්ථාව ඇත. ප්‍රවාදක සාක්ෂිවලට එරෙහිව හරස් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් නොමැත. එම නිසා නඩු විභාගයක දී ප්‍රවාදක සාක්ෂිවල පිළිගැනීමක් නොමැත. තුවාලකරුවෙකු හෝ



රෝගියෙකු විසින් කරන ලද මරණාසන්න ප්‍රකාශනයක් ( dying decleration ), සාක්ෂිකරුවකු විසින් පහළ උසාවියක දී ( මහේස්ත්‍රාත් උසාවිය - magistrate court ) දෙන ලද සාක්ෂියක්, සාක්ෂිකරුවෙකුගේ ඇවසියක් ( උදාහරණ:- සාක්ෂිකරුවකු විසින් වරද පිළිගැනීමක් - admission of guilt ) සහ දෝෂාවාවරනයක් ( confession ) යනාදි සාක්ෂි, ප්‍රවාදක සාක්ෂි ගනයට ඇතුළත් වුවත් එවා අධිකරණයක දී පිළිගනු ලැබේ. යම් අයකු අත් අඩංගුවේ සිටින අවස්ථාවේ දී එම තැනැත්තා රඳවා ගෙන ඇති බලධාරියා විසින් කිසිදු පොරොන්දුවක් ( promise ), බලපෑමක් ( influence ) , තර්ජනයක් (threat), දඬුවමක් ( punishment ), කායික හෝ මානසික බිය වැද්දීමක් හෝ පහර දීමක් නො කොට දෝෂාවාවරනයක් ලබා ගන්නේ නම් පමණක්, එය නීතියට අනුකූල වේ.

සෑම වූදිතයෙකුම වරදක් කළ බව සාධාරණ සැකයෙන් තොරව පැමිණිලි පක්ෂය විසින් (රජයේ නීතිඥ / state counsel හෝ පොලිසිය) අධිකරණයක දී ඔප්පු කරන තුරු වූදිතයා නිර්දෝෂී බව සෑම අධිකරණයක් මගින්ම පූර්ව නිගමනයකට පත් විය යුතුම ය. මෙම සිද්ධාන්තය අප රටේ පවත්නා සාපරාධී නීති සංග්‍රහයේ රන්වන් රේඛාවක් ලෙස නීති විශාරදයන් විසින් හඳුන්වා දී ඇත.

වූදිතයෙකු මානසික රෝගයකින් පෙළෙන බව අධිකරණයේ දී ඔප්පු කිරීම මෙම සිද්ධාන්තයට ඇති එකම ව්‍යතිරේකය (exception) වේ. යම් කිසි කරුණක් සියලු සැකයෙන් තොරව ඔප්පු කිරීම සාධාරණ සැකයෙන් තොරව ( beyond reasonable doubt ) ඔප්පු කිරීමක් නො වේ. වූදිතයෙකු පිළිබඳව පැමිණිල්ල විසින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂි ඉතා ප්‍රබල නම්, එම තැනැත්තා එම වරද නො කළ බවට ඇත්තේ සුළු ප්‍රවණතාවක් නම් ( least probability ) පැමිණිල්ල විසින් වූදිතයාට එරෙහිව ඇති වරද සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇති බව අධිකරණයක් මගින් පිළිගන්නවා ඇත.

මහාධිකරණයක දී පවත්වනු ලබන සාපරාධී නඩු විභාගයක දී විත්තිකරුවකු වෙනුවෙන් පෙනී සිටීම සඳහා පෞද්ගලික නීතිඥයෙකුට හෝ නීති ආධාර ( legal aid ) යටතේ රජය මගින් ලබා දෙන නීතිඥයෙකුට පෙනී සිටිය හැකි ය.



Scanned with CamScanner

යම් මනුෂ්‍යයෙකු විසින් තවත් මනුෂ්‍යයෙකුගේ මරණය සිදු කිරීම මනුෂ්‍ය ඝාතනයක් ( homicide ) වේ. ඇතැම් අවස්ථාවල දී මනුෂ්‍ය ඝාතනයක් කළ තැනැත්තා නීත්‍යානුකූලව වැරදිකරුවකු වන අතර ( culpable homicide ) අනෙකුත් අවස්ථාවල දී නීත්‍යානුකූලව ද වරදකරුවකු නො වේ ( non culpable homicide ). නීතියට අනුකූලව මිනීමැරීම ( murder ) සහ මිනීමැරීමක් නො වන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් ( culpable homicide not amounting to murder ) යනුවෙන් සාවද්‍ය මනුෂ්‍ය ඝාතන කොටස් දෙකක් ඇත. කැරැල්ලක් මැඩලීම සඳහා පොලිසිය හෝ ත්‍රිවිධ හමුදාව මගින් මනුෂ්‍ය ඝාතනයක් කිරීම, ආත්මාරක්ෂාව සඳහා මනුෂ්‍ය ඝාතනයක් කිරීම, නඩු විභාගයෙන් පසුව විනිසුරුවෙකු විසින් වරදකරුට මරණ දණ්ඩනය නියම කිරීම සහ යුද්ධයක් ප්‍රකාශ කර තිබිය දී මනුෂ්‍ය ඝාතන සිදුවීම යන ඒවා සාවද්‍ය නො වන මනුෂ්‍ය ඝාතනවලට අයත් වන නමුත්, එවැන්නක් සාවද්‍ය නො වන මනුෂ්‍ය ඝාතන බව තීරණය කිරීමේ අයිතිය තිබෙන්නේ අධිකරණයට පමණි.

අප රටේ පවත්නා දණ්ඩ නීති සංග්‍රහය අනුව, විත්තිකරුවකු මිනීමැරුමක් කළ බවට හෝ මිනීමැරීමක් නො වන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් කළ බවට තීරණය කරනු ලබන්නේ ජූරි සභාවක් හෝ මහාධිකරණ විනිසුරුවරයෙකු හෝ විනිසුරු මඩුල්ලක් (trial at bar) විසින් ය. ජූරි සභාවක්, ජූරි සභිකයින් හත් දෙනකුගෙන් සමන්විත වේ. සිද්ධිමය කරුණු පිළිබඳව ජූරි සභිකයින් පරම විනිසුරුවන් ( judges of facts ) වන අතර, නීතිය පිළිබඳව ( judges on law ) අවසාන තීරණය දෙනු ලබන්නේ විනිසුරුවන් වන අතර, විනිසුරුවන් විසින් නීතිය පිළිබඳ දෙන ලද තීරණ පිළිගැනීමට ජූරි සභිකයන් නීතියෙන් බැඳී ඇත. සාමාන්‍ය ජූරි සභාවකට ( ordinary jury ) තෝරා ගනු ලබන්නේ සිද්ධිය වූ ප්‍රදේශයේ මනා කල්ක්‍රියාවකින් වාසය කරන රජයේ හෝ සංස්ථාවල සේවකයන් ය ( public servants ). ඇතැම් නඩු විභාගවල දී විශේෂ දැනුමකින් යුතු පුද්ගලයින් ජූරි සභාවකට කැඳවනු ලැබේ. මෙයට විශේෂ ජූරියක් ( special jury ) යැයි කියනු ලැබේ. සංකීර්ණ කරුණු පිළිබඳව නඩු විභාගයක දී සිද්ධිමය කරුණු පිළිබඳව තීරණ ගැනීමට තිබෙන අවස්ථාවන්වල දී අදාල ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ දැනුමකින් යුත් පුද්ගලයන් එවැනි විශේෂ ජූරියකට කැඳවනු ලැබේ. මෙවැනි විශේෂ ජූරියක් .



විනිසුරුවරයාගෙන් ඉල්ලා සිටීමට පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටින නීතිඥයාට හෝ විත්තිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥයාට අවකාශ ඇත. විනිසුරුවරයා විසින් හෝ ජූරි සභාව මගින් මරණීය දණ්ඩනය නියම කිරීම සඳහා ජූරි සභාව ඒකමතිකව හෝ හයයි එකක හෝ පහයි දෙකක බහුතරයකින් විත්තිකරු වරදකරුවෙක් වන බව ඔප්පු කළ යුතු ය.

ජූරි සභාවක් විසින් හතරයි තුනක බහුතරයකින් විත්තිකරුවකු වරදකරුවකු වූ විට, ජූරි සභාවේ තීරණය නැවත සලකා බැලීමට විනිසුරුවරයා විසින් නියම කරනු ලැබේ. ජූරි සභාව දෙවන වරටත් එම තීන්දුවම දෙනු ලබන්නේ නම් නඩු විභාගය නැවත වරක් පවත්වනු ඇත. මහාධිකරණයකින් නියම කරන ලද තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකා ජනරජයේ අභියාචන අධිකරණය ( court of appeal ) වෙත වරදකරුට අභියාචනයක් ( appeal ) ඉදිරිපත් කළ හැකි ය. මහාධිකරණයක දී නඩුව විභාග කිරීමේ දී ක්‍රියාත්මක වූ ආකාරයට එරෙහිව වරදකරුට අභියාචන අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. මහාධිකරණයක් විසින් දෙන ලද තීන්දුව පිළිබඳව අභියාචන අධිකරණය සලකා බලා වරදකරු නිදහස් කිරීමටත්, නැවත නඩු විභාගයට ගැනීමටත්, කළ හැකි අතර ඇතැම් අවස්ථාවල දඬුවම ලිහිල් කිරීම ද කරනු ලැබේ. අභියාචන අධිකරණයේ තීන්දුවට එරෙහිව නීතිමය කරුණු පිළිබඳව වරදකරුට උපරිමාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. උපරිමාධිකරණයේ තීන්දුව අවසාන තීරණය වන්නේ ය.

ඇන්ගේ අතෙහි ඇහිලි අතර දැඩි ලෙස හිර වී තිබුණු ලොම් කෙඳි, ඇයගේ පයෝද්දරයෙහි තිබූ සපා කෑමේ තුවාලයෙහි හැඩය හා එම තුවාලයේ තැවරී තිබූ කෙළවල තිබූ රුධිර වර්ගය ද, ඉතිරිව තිබූ වීස් කැබැල්ලෙහි සපා කෑමේ දී සටහන්ව තිබූ හැඩය, විස්කි ඉතිරිව තිබූ වීදුරුවල තිබී සොයා ගත් ඇඟිලි සලකුණු සහ තොල් මුද්‍රිත සහ ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූපය යනාදී විද්‍යාත්මක සාධක " නිහඬ සාක්ෂි " වශයෙන් සැලකිය හැකි අතර සාපරාධී ක්‍රියාව සිදු කළ තැනැත්තා හඳුනා ගැනීමට ඒවා බෙහෙවින් උපකාරී විය.



Scanned with CamScanner

# හිරමන තලයේ සැඟවී තිබූ රහස

සෝමලතා අවුරුදු තිහක් පමණ වයසැති පියකරු පෙනුමෙන් යුත් විවාහක කාන්තාවකි. දිගු වරලසකින් සහ ආකර්ශනීය නෙත් යුවලකින් යුත් ඇයගේ දිගැති තලඑලළු වර්ණයෙන් යුත් මුහුණ කාගෙත් සිත් ගත්තේ ය. ඇයගේ අත ගැනීම සඳහා ගමේ තරුණයින් කිප දෙනෙක් උත්සාහ කළත් දෛවයට ඉඩ දෙමින් ඇය පියදාස සමග විවාහ වූවා ය. ඇයගේ සැමියා වූ පියදාස රැකියාව වශයෙන් කළේ කුලී වැඩ කිරීම ය. එකම ගමෙහි පදිංචිකරුවන් වූ මේ දෙදෙනා විවාහ වූයේ වසර ගණනක් පවත්වා ගෙනගිය පෙම් සබඳතාවයකින් පසුව ය. පියදාසගේ සහ සෝමලතාගේ විවාහයට ඇයගේ දෙමාපියන් පළමුව විරුද්ධ වුවත්, ඔවුන් දෙදෙනාගේ දැඩි අධිෂ්ඨානය නිසා අවසානයේ දී දෙමාපියන්ගේ ආශිර්වාදයත් සමග විවාහ වීමට ඔවුනට අවකාශ ලැබිණ. විවාහයට පෙර ඉදහිට කසිප්පු බීමට සහ සූදුවට පියදාස පුරුදු වී සිටියේ ය. විවාහ දිවියට පත්වීමෙන් පසුව පියදාසගේ බීමත්කම සහ සූදුව දිනෙන් දිනම වැඩි විය. එම නිසා ගෙදර ආර්ථික අගහිඟකම් ද වැඩි වන්නට පටන් ගත්තේ ය. මේ නිසා ඔවුන් අතර අඬ දබර ද වරින් වර ඇති විය. මේ අතරතුර සෝමලතාට පුතෙක් ලැබුණි. පියෙක් වීමෙන් පසුව වුවත් තම බේබදුකම සහ සූදුව ඔහු අත්හැරියේ නැත. පියදාස උපයන මුදල් ගෙදර වියදමටවත් ප්‍රමාණවත් නො වී ය. එබැවින් පියදාසගේ පවුලේ එදිනෙදා වියදමට සෝමලතාගේ දුප්පත් දෙමාපියෝ උදව් කළෝ ය.

පෙම් සටන ජය ගත්තත්, පියදාසත් සමග දිවි සටන නම් ජය ගැනීම පහසු නො වන බව කල් යාමේ දී සෝමලතාට වැටහිණ. ඒ නිසා දරුවා මවට හදා ගැනීමට දී ගෘහ සේවිකාවක ලෙස විදේශගත වීමට සෝමලතා තීරණය කළා ය. සෝමලතාගේ විදේශ ගමනට පියදාස මුල දී විරුද්ධ වුවත් ගෙදර අඩුපාඩුකම් දිනෙන් දින වැඩි වීමත්, ඔවුන් දෙදෙනා වාසය කළ කැඩී බිඳී අබලන් වූ පොල් අතු සෙවිළි කළ කටු මැටි නිවස වෙනුවට, උළු සෙවිළි කළ නිවසක් තනා ගැනීමට ඇති ආශාවත් නිසා සෝමලතාගේ ගමනට ඔහු පසුව කැමති විය. සෝමලතා මුදල් ණයට ගෙන විදේශගත වීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කළා ය.



සෝමලතා විදේශ ගතවීමට සතියකට පෙර, එක් රැයක, පියදාස සෝමලතාගේ මහ ගෙදරට කලබලයෙන් පැමිණ, සෝමලතා විසින් දරුවා මරා දමා, ඇය ද බාල්කයේ එල්ලී ඇති බව, ඇයගේ දෙමාපියන්ට හඬමින් පැවසී ය. එය ඇසූ සෝමලතාගේ දෙමාපියෝ භීතියටත් කලබලයටත් පත්වූ හ. පසුව පියදාස, සෝමලතාගේ දෙමාපියන් ද සමග පොලිසියට ගොස්, සිද්ධිය පිළිබඳව පැමිණිල්ලක් කළේ ය.

පොලිස් නිලධාරීන් වහාම පියදාසගේ නිවසට පැමිණ, නිවසෙහි ඉදිරිපස සහ පිටුපස දොරවල් සහ සියලුම ජනේල් වසා දමා නියමිත පරිදි නිවස ආරක්ෂා කොට සිද්ධිය පිළිබඳව මහේස්ත්‍රාත්වරයාට සහ අධිකරණ වෛද්‍යවරයාට දැන්වී ය. ඔවුහු පෙරවරු දහයට සෝමලතාගේ නිවසට පැමිණියෝ ය. මහේස්ත්‍රාත්වරයා, අධිකරණ වෛද්‍යවරයා සහ ඔහුගේ සහායකයින් හා පොලිස් නිලධාරීන් යන සියලු දෙනාම සෝමලතාගේ නිවසට පැමිණි වහාම, අත්වලට අත් වැසුම් ( surgical gloves ) සහ සපත්තු මත ආවරණ ( over shoes ) පැළඳ ගත් හ. පරීක්ෂණ කණ්ඩායමේ ඇඟිලි සලකුණු ( finger prints ) සහ පාද සලකුණු ( foot prints ) එම ස්ථානයේ රැඳවීම වැළැක්වීමට මෙම පියවර ගන්නා ලදී. ඉන් පසුව, සෝමලතා එල්ලී සිටි ආකාරය සහ ඇයගේ දරුවා මැරී සිටි ආකාරය ඉතා සුපරීක්ෂාකාරීව අධිකරණ වෛද්‍යවරයා පරීක්ෂා කළේ ය.

සෝමලතා සහ දරුවා මිය ගිය වේලාව දැන ගැනීම සඳහා අධිකරණ වෛද්‍යවරයා විසින් සෝමලතාගේ සහ දරුවාගේ ගුද මාර්ග තුළින් උෂ්ණමාපක දෙකක් ඇතුල් කොට විනාඩි පහක කාලයක් එහි තබා එම මළසිරුරුවල ගුද මාර්ගයන්හි උෂ්ණත්වය සටහන් කර ගන්නා ලදී. සෝමලතා එල්ලී තිබුණ පරාලයේ සිට බිමටත්, මළසිරුර අසල වැටී තිබුණු පුටුව මත සිට පරාලයටත් ඇති උස මැන්නේ ය. සෝමලතාගේ මළසිරුර මත කිසිම බාහිර වස්තුවක් නො වී ය. රුධිරය ස්වල්පයක් මළසිරුර අවට බිම වැටී තිබුණි. ඒවා ප්ලාස්ටික් බෝතලයකට ලබා ගෙන රස පරීක්ෂක වෙත යැවීම සඳහා පරීක්ෂණ භාර පොලිසියට භාර දෙන ලදී. සෝමලතා බිම සිට ගෙන හෝ පුටුවක්, බංකුවක් හෝ මේසයක්, එල්ලී ඇති ස්ථානයට පහළින් තබා, ඒ මත නැග, දැත් ළං කොට



Scanned with CamScanner

ඉහළට එසවීමෙන් වුවත් ඇයට කොහු ලණුව පරාලයේ බඳින්නට නො හැකි බව, මළසිරුර එල්ලී තිබුණ ස්ථානය පරීක්ෂා කළ අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. සෝමලතාගේ උරහිසේ සිට මැණික් කටුව දක්වා දිග ප්‍රමාණය සහ ඇයගේ උරහිසේ සිට පාදය දක්වා දිග ප්‍රමාණය එකතු කළ විට, බිම සිට ලණුව බැඳ තිබූ වහලේ පරාලය දක්වා ඇති උසට වඩා එම උස අඩු නිසා වෛද්‍යවරයා එම නිගමනයට පැමිණියේ ය. යම් කෙනෙකු ගෙල වැලදා ගෙන සිය දිවි හානි කර ගන්නා විට, ලණුවකින් හෝ රෙද්දකින් හෝ වැලකින් හෝ වෙනයම් එවැනි දෙයකින් තොණ්ඩුවක් ( ligature ) නොහොත් මලපුඩුවක් නොහොත් බන්ධකයක් සාදා ගෙන, එම තොණ්ඩුව බෙල්ලට දමා, ලණුවේ හෝ රෙද්දෙහි අනිත් කෙළවර ගසක අත්තක හෝ වෙනත් සුදුසු ආධාරකයක ගැට ගසා ඊට පසුව, පුටුවක්, බංකුවක්, මේසයක් මතට හෝ ගසක අත්තකට නැග, බිමට පනිනු ලැබේ. ඒ ආකාරයට සිය දිවි හානි කර ගත් විට බෙල්ලේ සටහන් විය හැක්කේ එක් දාරයක් පමණි. මෙවැනි දාරයක විශේෂ ලක්ෂණයක් ඇත. එනම්, තොණ්ඩුවේ ගැටය ඇති පැත්තට විරුද්ධ පැත්තේ ගෙල සිරවීම නිසා, එම පැත්තෙහි දාරය ගැඹුරු වීමයි. තොණ්ඩුවක් ගෙලට දමා එල්ලී මියයන විට ගෙල පිටුපස හෝ ගෙලෙහි දකුණු පැත්තෙහි හෝ වම් පැත්තෙහි කන් පෙත්තට ඉදිරියෙහි හෝ පිටුපසින් පමණක් ගැටය පිහිටනු ඇත.

බෙල්ලෙහි හැඩය ( anatomical shape ) අනුව යම් අයකු එල්ලීමෙන් සිය දිවි හානි කර ගැනීමේ දී තොණ්ඩුවේ ගැටය නිකට්ට යටින් හෝ බෙල්ලෙහි දකුණු පැත්තේ හෝ බෙල්ලෙහි වම් පැත්තේ කන් පෙත්තට ඉදිරියෙන් හෝ කන් පෙත්තට පිටුපසින් පිහිටනු ලැබේ. මේ ආකාරයට එල්ලුන විට දාරයේ ගැඹුරුම ස්ථානය පිහිටන්නේ ගැටයට ප්‍රතිවිරුද්ධ පැත්තේ ය. දාරයේ ගැඹුර ක්‍රමයෙන් හිස දිසාවට අඩු වේ. මෙම ලකුණු බෙල්ලේ පෙනෙන්නේ ඉංග්‍රීසි "V" අකුර උඩුමැලි අතට පිහිටි ආකාරයට ය ( inverted English letter V ). බෙල්ලට තොණ්ඩුව දමා පනින විට ශරීරයේ බර නිසා ශරීරය පහළට වැටීමත් තොණ්ඩුව හිස දිසාවට යාමත් නිසා බෙල්ල සිරවීමෙන් දාරය ඇති වේ. එල්ලී මැරෙන අවස්ථාවල දී තොණ්ඩුවේ ගැටය නිකට්ට යටින් පිහිටීම විරල වුවත් එවැනි අවස්ථාවන් වාර්තාගත වී ඇත. මොළයට රුධිරය සපයන ගෙලෙහි දෙපැත්තෙහි පිහිටා ඇති කැරොටිඩ ධමනි දෙක



තදවීම නිසා මේ ආකාරයෙන් එල්ලුනත් මරණය සිදු වේ. තොණ්ඩුව බෙල්ලට සිරවීම නිසා මුහුණ ඉදිමීම, මුහුණ දම් පැහැති වීම (cyanosis) සහ මුහුණේ ලේ ලප ( petechial heamorrhages ) හට ගනී. බෙල්ලෙහි පිහිටා ඇති දාරයේ සිට හිස දිසාවට ඇති ප්‍රදේශයේ සම මතුපිට කුඩා ලේ ලප ද හට ගනී. ඇතැම් අවස්ථාවල, තොණ්ඩුවේ ගැටය තිබෙන පැත්තෙන් මුඛයෙහි කෙළවරින් වියළී ගිය කෙළ වැගිරී ඇති බවට සලකුණක් (dried drip mark of saliva) ඇති වේ. ඇතැම් අවස්ථාවල ශිෂ්ණයේ කෙළවරින් ශුක්‍ර තරලය පිට වී ඇති බවට ද දක්නට ලැබේ. ගැටයෙන් බෙල්ල තදවීම නිසා ස්වතන්ත්‍ර ස්නායු පද්ධතිය ( autonomic nervous system ) උත්තේජනය වීම නිසා, කෙළ වැගිරීමත් ශුක්‍ර තරලය පිටවීමත් සිදු වේ. තවද, ඇතැම් අවස්ථාවල නාසයෙන් හෝ කනෙන් ලේ ගැලීම ද සිදු විය හැකි ය. පහරදීමෙන් ඇති වූ තුවාල නිසා මෙවැනි ලේ ගැලීම් සිදු වී ඇති බව මහජනයා සහ පොලිස් නිලධාරීන් ද සිතීමට පුළුවන. ගෙල වැලදා සිය දිවි හානි කර ගන්නා තැනැත්තෙකුගේ තොල් දම් පැහැති වේ. මියගිය තැනැත්තාට දත් ඇත්නම් දිව පිටතට නෙරා තිබීම ( protrusion ) නිසා දිවෙහි කෙළවර දත්වලට තදවීම නිසා, දිවෙහි අග දම් පැහැති වේ. බෙල්ල සිරවීමේ දී මුහුණේ පිහිටි ශිරා ( vein ) තුළ ඇති වන පීඩනය වැඩි වීම නිසා ඉහත සඳහන් ලකුණු ඇති වේ.

එල්ලී සිය දිවි හානි කර ගන්නා ඇතැම් අයගේ ඉහත සඳහන් කර ඇති ලකුණු කිසිවක් දක්නට නො ලැබෙන අවස්ථා ද ඇත. ඉහත කී ලකුණු වැඩිපුර ඇති වන්නේ ස්ථූල ශරීරයක් ඇති අයකු, පාද බිම නො ගැටෙන ආකාරයට එල්ලී මිය යන අවස්ථාවල දී ය. මෙයට හේතුව ගෙල සිර කිරීමට ශරීරයේ සම්පූර්ණ බර උපයෝගී වීමයි. මෙයට සම්පූර්ණ අවලම්භනය ( complete suspension ) යැයි කියනු ලැබේ. එල්ලෙන තැනැත්තාගේ පාද බිම ගැටෙන විට ශරීරයේ මුළු බරම බෙල්ල සිරවීමට උපයෝගී නො වේ. එල්ලෙන තැනැත්තාගේ එක් පාදයක් හෝ පාද දෙකම හෝ දනහිස් බිම ගැටෙන්නේ නම් ගෙල සිරවීම සඳහා ශරීරයේ මුළු බරම උපයෝගී නො වන නිසා මෙයට අසම්පූර්ණ අවලම්භනය ( incomplete suspension ) යැයි කියනු ලැබේ. බෙල්ලෙහි පිහිටා ඇති කැරොටිඩ ධමනිය ( carotid artery ) බෙදෙන ස්ථානය මත පිහිටා ඇති කැරොටිඩ දේහය ( carotid body ) බන්ධකයෙන් ( ligature ) තද



Scanned with CamScanner

වීම නිසා හෘද ස්පන්දනය නැවතී ක්ෂණිකව මරණය හට ගනී (sudden death). සම්පූර්ණ හෝ අසම්පූර්ණ අවලම්බනයෙන් හෘද ස්පන්දනයේ නැවතීම සිදු විය හැකි ය. කැරෝටික දේහය තදවීම නිසා මරණය ඉතාම ක්ෂණිකව සිදු වූ විට ගෙල සිරවීමක දී හටගන්නා ඉහත සඳහන් කර ඇති කිසිදු බාහිර සලකුණක් ඇති නො වේ. අධිකරණ වෛද්‍ය නිලධාරීන් පවා එසේ එල්ලී මැරී සිටින අයගේ මළසිරුරු පරීක්ෂා කිරීමෙන් පසුව සිය දිවි හානි කර ගෙන නොමැති බවට සාවද්‍ය නිගමන වලට පත්විය හැකි ය. අසම්පූර්ණ අවලම්බනයෙන් ගෙල වැලදා ගනිමින් සිය දිවි හානි කර ගැනීම් බොහෝ විට සිදු වුවත්, කෙනෙකු මරණයට පත් කොට පසුව එල්ලා තැබීමෙන් එම අවස්ථාව සිය දිවි හානි කර ගැනීමක් සේ පෙන්වීමට උත්සාහ දරා ඇතැයි බොහෝ අය සිතීමට පුළුවන. පහරදීමකින් හෝ බන්ධකයකින් ගෙල සිර කොට ( strangulation of the neck by the ligature ) මරණයට පත් කිරීමෙන් පසුව මිය ගිය තැනැත්තා ගෙල වැලදා ගෙන එල්ලීමෙන් සිය දිවි හානි කර ගෙන ඇති බව පෙන්වීම සඳහා ඇතැම් අවස්ථාවල මළසිරුර එල්ලා තබනු ලැබේ. සිය දිවි හානි කර ගැනීමට එල්ලීමේ දී ගෙලෙහි පිහිටා ඇති කැරෝටික ධමනිය තදවීම නිසා මොළයට රුධිරය සැපයීම නතරවීම මරණයට පත් වීමේ ප්‍රධානතම හේතුවයි. මෙය සිදු වූ විට මුහුණ පුදුමැලි වේ.

මීට අමතරව ගෙල වැලදා ගැනීමේ දී මරණය සිදු වන ආකාර ( mechanisms ) තුනක් ඇත. බන්ධකයෙන් ගෙල සිරවීම නිසා දිව හිස දිසාවටත් බෙල්ලෙහි පිටු පසටත් තල්ලු වීම නිසා ස්වරාලය වැසී ආශ්වාස ප්‍රශ්වාස කිරීමට නො හැකි වීමයි ( respiratory failure ). දෙවන ක්‍රමය නම් ගෙල දෙපැත්තෙහි පිහිටා ඇති අභ්‍යන්තර මන්‍යා ශිරාව ( jugular vein ) තදවීම නිසා එල්ලී මැරෙන ඇතැම් අයගේ මුහුණ ඉදිමීමත් දම් පැහැති වීමත් සිදු වේ. තුන් වැනි ක්‍රමය නම් ගෙලෙහි පිහිටා ඇති පළවන හා දෙවන කශේරුකා භග්නය වීම නිසා එම කශේරුකා අවසන්ධි වී ( fracture dislocation of atlas and axis vertebrae ) සුෂුම්නාව තුවාල වීමයි. මරණීය දණ්ඩනයට ලක් වූ අයකු එල්ලා මරා දමන විට ( judicial execution ) හෝ ගෙල වැලදා ගෙන ඉතා උසකින් පැනීමේ දී සුෂුම්නාව තුවාල වීම සිදුවිය හැකි ය. බෙල්ල තද වීමට අවශ්‍ය වන්නේ වර්ග අඟලකට රාත්තල් පහක් වැනි බලයක් ය. අසම්පූර්ණ අවලම්භනයෙන්



ගෙල වැලදා මියගිය අයෙකුගේ මළසිරුර දැඩි ලෙස කුණුවීමෙන් පසුව වෛද්‍ය පරීක්ෂණයට භාජනය කළහොත් එම තැනැත්තා ගෙල වැලදා සිය දිවි හානි කර ගත්තා ද නැතහොත්, එම තැනැත්තා මරණයෙන් පසුව එල්ලුවා ද, යන්න සොයා ගැනීම (differentiate) ඉතාම දුෂ්කර ය. එවැනි අවස්ථාවන් හඳුනා ගත හැක්කේ මළසිරුර තිබූ ස්ථානය නො වෙනස්ව තිබියදීම පරීක්ෂාවට භාජනය කිරීමෙනි. යම් අයකු එල්ලී මිය ගොස් සිටින විට ලණුව හෝ කඹය හෝ එවැනි ආධාරකයක් කපා, මළසිරුර බිමට බෑම ඥාතීන් විසින් බොහෝ අවස්ථාවල කරනු ලැබේ.

යම් අයකු එල්ලී මිය ගොස් සිටින ස්ථානයකට වෛද්‍යවරයා සහ හදිසි මරණ පරීක්ෂකවරයා පැමිණෙන තෙක් ඥාතීන් හෝ පොලිස් නිලධාරින් විසින් මළසිරුරේ බන්ධකය කපා බිමට බෑම සුදුසු නො වේ. ඇතැම් හදිසි මරණ පරීක්ෂකවරුන් එල්ලී මැරී සිටින තැනැත්තන්ගේ බන්ධකය ගෙලෙන් ඉවත් කොට පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ අවස්ථා ඇත. එසේ කළ යුතු නො වේ. වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කරනු ලබන මළසිරුරු නො වෙනස්ව වෛද්‍ය පරීක්ෂණය සඳහා එවිය යුතු ය. වෛද්‍ය පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට පෙර මළසිරුරේ ඇඳුම් ඉවත් කොට මළසිරුර සෝදා වෛද්‍ය පරීක්ෂණයට ඉදිරිපත් කළ අවස්ථා පිළිබඳව ද වාර්තා වී ඇත. ඇතැම් අවස්ථාවල මහේස්ත්‍රාත්වරුන්ගේ උපදෙස් මත මළසිරුරේ ඇඳුම් ඉවත් කොට වෛද්‍ය පරීක්ෂණයට මළසිරුර ඉදිරිපත් කළ අවස්ථා ද වාර්තා වී ඇත. හදිසි මරණ පරීක්ෂකවරුන් සහ මහේස්ත්‍රාත්වරුන් විසින් ඉහත කී පියවර ගැනීමට පොලිසියට උපදෙස් නො දිය යුතු ය. මළසිරුරේ ගෙලෙහි ඇති බන්ධකය ඉවත් කිරීම සහ මළසිරුරෙහි ඇති ඇඳුම් ඉවත් කිරීමට උපදෙස් දීමේ වගකීම පැවරී ඇත්තේ අධිකරණ වෛද්‍යවරයාට පමණක් බව අවධාරනයෙන් කිව යුතු ය.

සාපරාධී ක්‍රියාවකින් මරණයට පත් වූ අයෙකුගේ මරණයට හේතුව සොයා ගැනීම සහ එම තැනැත්තා ස්වාභාවික හේතුවකින් මියගියේ ද, නැතහොත් අහඹු සිදුවීමකින් මියගියේ ද නැතහොත් සිය දිවි හානි කර ගත්තේ ද එසේ නැත්නම් එම තැනැත්තා මනුෂ්‍ය ඝාතනයකට ලක්වූවේ ද යන්න තීරණය කිරීමට මළසිරුරේ බාහිර පරීක්ෂාව ඉතාම වැදගත් පියවරක් වන්නේ ය. මළසිරුරේ ඉදිරිපස



Scanned with CamScanner

හා පිටුපස ද සෑම අවස්ථාවක දී ම අනිවාර්යයෙන්ම සුපරීක්ෂාකාරීව පරීක්ෂා කළ යුතුම ය. මරණය සිදු කළ ආයුධයේ ස්වභාවය, (nature of weapon), පහර දුන් දිසාව ( direction of assault ) සහ අනෙකුත් වැදගත් කරුණු මළසිරුරේ බාහිර පරීක්ෂණය සුපරීක්ෂාකාරීව සිදු කිරීමෙන් සොයා ගත හැකි ය. මළසිරුර විච්ඡේදනය කොට අභ්‍යන්තර ඉන්ද්‍රියයන් පරීක්ෂා කිරීම ඉක්මණින් නො කර මළසිරුරේ බාහිර පරීක්ෂණය ක්‍රමානුකූලව සහ දැඩි සුපරීක්ෂාකාරිත්වයෙන් කළ යුතු බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

ප්‍රථමයෙන් ශරීරයේ ඇඳුම් ඇඳ තිබෙන ආකාරය පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. සිරුරේ සම මත පිහිටා ඇති උපන් ලප, කැලැල්, අස්වාභාවික පැල්ලම්, පිළිස්සීම්, නියපොතුවල වර්ණය, යනාදිය ඇත් නම් ඒවා ද පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. අවශ්‍ය වුවහොත් අත් කාචයකින් ( hand lens ) ද එවැනි සලකුණු පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. හිසේ සිට පාදය දක්වා දිග සහ ශරීරයේ බර මැනිය යුතු ය. සමේ වර්ණය, අධෝස්ථිය පිහිටා ඇති ආකාරය මුහුණ සහ තොල්වල දම් පැහැකිවීම, ශරීරයේ වර්ණයේ වෙනස්වීම, ශරීරයේ සන්ධිවල හැඩය, වළලුකර ඉදිමීම, ශරීරයේ පෝෂණීය තත්ත්වය යනා දී සියල්ල පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. වෙඩි තැබීමකින් පසුව සිදු වූ සිදුරු හෝ දාරිත තුවාල හෝ ආයුධවලින් සිදු වූ කැපුම් තුවාල හෝ ඇනුම් තුවාල හෝ තැල්ම හෝ භග්න අත්වල හා ශරීරයේ තිබේ දැයි, විශේෂයෙන්ම පරීක්ෂා කොට ඒවා ද සටහන් කර ගත යුතු ය. විද්‍යුත් හනනයෙන් මියගිය විට පියවි ඇසට නො පෙනන ඉතා කුඩා තිත් වැනි පිළිස්සීම් තුවාල අල්ලෙහි හෝ පිටිඅල්ලෙහි තිබීමට පුළුවන. මුඛය තුළ බෙහෙත් පෙති, කුඩු හෝ තරලය වැනි ද්‍රව්‍ය තිබේ දැයි පරීක්ෂා කොට බැලිය යුතු ය. මුඛයෙහි හෝ නාස් පුඩුවල විස වර්ගවල ගඳ හෝ සුවඳ සහ මුඛයේ වමනය තිබේ දැයි පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. ඒවා තිබේ නම් එයින් සාම්පල ලබා ගෙන ඒවායේ විස වර්ග හඳුනා ගැනීම සඳහා රජයේ රස පරීක්ෂක වෙත පොලිසිය මගින් ඉදිරිපත් කළ යුතු ය. යෝනියෙන්, ගුද මාර්ගයෙන් සහ කන්වලින් රුධිරය හෝ සැරව හෝ දියර පිටවෙනවා දැයි ද පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. ශිෂ්ණයේ කෙළවර ශුක්‍ර තරලය තිබේ දැයි ද පරීක්ෂා කළ යුතු ය. වෘෂණ කෝෂවල තැල්ම තිබේ දැයි, පරීක්ෂා කර බලා සටහන් කළ යුතු ය. අත්වල,



කකුල්වල සහ සන්ධිවල තදවීම ( fixation ) සහ මුහුණෙහි බෙල්ලෙහි සහ ගාත්‍රාවල පේශිවල තදවීම නොහොත් මෘතකඨිනය ( rigor mortis ) කෙතරම් ප්‍රමාණයකට සිදු වී ඇද් දැයි, පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. මළසිරුර මත තිබෙන අලුත් හා පැරණි තුවාල සියල්ල පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීමේ දී පාවිච්චි කරනු ලබන ශරීරයේ රූප සටහන්වල ( anatomical diagrams ) සටහන් කර ගත යුතු ය. විශේෂයෙන්ම ඇස් පරීක්ෂා කළ යුතු ය. අක්ෂි ගෝල ( eye balls ), ස්වච්ඡ මණ්ඩලය ( cornea ), අක්ෂි පටලය ( conjcunctiva ) සහ ඇස් පිහාටු ( eye lids ) යන කොටස් මත ලේ ලප තිබේ දැයි, අත් කාචයකින් පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. අපස්මාරයෙන් මියයන අයගේ දිවේ තැලුම් හෝ දාරිත තුවාල තිබීමට පුළුවන. නාස් පුඩුවල හෝ මුඛයේ සියුම් පෙන තිබේ දැයි, පරීක්ෂා කළ යුතු ය. කැලැල් හෝ අලුත් තුවාල ගුද මාර්ගයේ තිබේ ද යන්න සහ ගුද මාර්ගය සාමාන්‍ය ප්‍රමාණයට වඩා විස්තරනය වී ඇද් දැයි, විශේෂයෙන් පරීක්ෂා කොට සටහන් කළ යුතු ය. සමෙහි නියපොතු අග ලේ පැල්ලම් හෝ වෙනයම් බාහිර වස්තුවක් තිබේ දැයි, අත් කාචයකින් පරීක්ෂා කොට ඒවා ඇත්නම් පාවිච්චි නො කරන ලද දත් කටුවකින් (tooth pick) ඉවත් කොට ඒවා හඳුනා ගැනීම සඳහා පොලිසිය මගින් රජයේ රස පරීක්ෂක වෙත යැවිය යුතු ය.

මනා පළපුරුද්දක් ඇති විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන් අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් කිරීමට වැය කරන කාලයෙන් සියයට හත්තෑ පහටත් අසූවටත් අතර ප්‍රමාණයක් බාහිර පරීක්ෂාව සඳහා ගත කරන බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුම ය. පළපුරුද්දක් නොමැති වෛද්‍යවරුන් මළසිරුරේ බාහිර පරීක්ෂාව සඳහා වැය කරන කාලය ප්‍රමාණවත් නො වන බව සඳහන් කළ යුතු ය. මළසිරුර විච්ඡේදනය කොට සියලු අභ්‍යන්තර ඉන්ද්‍රියයන් පරීක්ෂා කිරීමෙන් පසුව, මරණයට හේතුව පිළිබඳව නිගමනයකට පැමිණීමට පෙර නැවත වරක් මළසිරුරේ බාහිර පරීක්ෂණය පැවැත්වීම පළපුරුදු අධිකරණ වෛද්‍යවරුන් විසින් අනුගමනය කරනු ලබන පිළිවෙතකි. අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව මරණයට හේතුව ඒ අවස්ථාවේ දී ම සොයා ගැනීමට නො හැකි වන අවස්ථා ද ඇත. එවැනි අවස්ථාවල දී මරණයට හේතුව සොයා ගැනීමට අවශ්‍ය කොටස් වන රුධිරය, මූත්‍රා, පිත, ආමාශය, ආමාශයේ



Scanned with CamScanner

අන්තර්ගත දෑ, කුඩා බඩවැල් සහ එහි අන්තර්ගත දෑ, අක්මාව සහ වකුගඩු යනාදිය පොලිසිය මගින් රස පරීක්ෂක වෙත යැවීමට සිදු වේ. එවැනි අවස්ථාවල මරණයට හේතුව තීරණය කිරීමට මාස තුනක් පමණ ගත වේ. ඇතැම් විට ශරීරයේ කොටස් පටකවේද පරීක්ෂාවට භාජනය කර මරණයට හේතුව දන්වන අවස්ථා ද ඇත. සාමාන්‍යයෙන් පටකවේද පරීක්ෂාව කිරීමට දින පහක පමණ කාලයක් ගත වේ.

මළසිරුරු තිබූ ස්ථානයත් සෝමලතාගේ සහ ඇයගේ දරුවාගේ බාහිර පරීක්ෂණයත් ( external examination ) පැවැත්වීමෙන් අනතුරුව මෘත ශරීරාගාරයේ දී වෛද්‍ය පරීක්ෂණය ආරම්භ කරන ලදී. පළමුවෙන්ම සෝමලතාගේ සහ ඇයගේ දරුවාගේ බර කිලෝ ග්‍රෑම්වලින් මනින ලදී. මළසිරුරු තිබූ ස්ථානයේ දී සෝමලතාගේ හා ඇයගේ දරුවාගේ ගුද මාර්ගවල උෂ්ණත්වය සහ මළසිරුරු තිබූ කාමරයේ උෂ්ණත්වය සටහන් කර තිබූ බැවින් එම උෂ්ණත්වයන් සහ මළසිරුරුවල කිලෝ ග්‍රෑම් බර උපයෝගී කර ගෙන, හෙන්සන්ගේ අභිලම්භ ආදර්ශය ( Henssge's nomogram ) පාවිච්චි කොට සෝමලතා සහ ඇයගේ දරුවා මිය ගිය වේලාවන් (time of death) උපකල්පනය කර ගන්නා ලදී. ඒ අනුව, සෝමලතා සහ ඇයගේ දරුවා මිය ගොස් ඇත්තේ එකම වේලාවේ දී බව වෛද්‍යවරයා විසින් නිගමනය කරන ලදී. එනම් සෝමලතා සහ ඇයගේ දරුවා මිය ගොස් ඇත්තේ පෙරදින රාත්‍රී නවයත් එකොළහත් අතර බවට වෛද්‍යවරයා විසින් තීරණය කරන ලදී. හෙන්සන්ගේ අභිලම්භ ආදර්ශ ක්‍රමය පාවිච්චි කිරීමෙන් යම් අයෙකුගේ මරණය සිදු වූ වේලාව උපකල්පනය කිරීමේ හැකියාව මරණය සිදු වූ සත්‍ය වේලාවට පැය දෙකයි දශම අටකට අඩු හෝ වැඩි වීමට හැකි ය.

එකිනෙකට හරස් වී ගිය දාර දෙකක් සෝමලතාගේ බෙල්ලේ තිබූ අතර ඊට අමතරව මුහුණ දම් පැහැති වීම, ඉදිමීම, නාසයෙන් ලේ ගැලීම සහ මුහුණේ ලේ ලප ද දක්නට තිබිණි. බෙල්ලෙහි ඉදිරිපස තිකටට යටින් පිහිටා ඇති කණ්ඨක අස්ථිය (hyoid bone) භග්නය වී තිබිණි. ගෙල මිරිකීමේ දී හෝ ගෙල පැගීමේ දී යන අවස්ථාවල පමණක් කණ්ඨක අස්ථිය භග්නය වන අතර තොණ්ඩුවක් දමා ගෙන ගෙල වැලදා ගැනීමේ දී කණ්ඨක අස්ථිය භග්නය නො වේ. ජාත්‍යන්තර කීර්තියට පත් වූ දිවංගත ව්‍යවහාරක ව්‍යාධිවේදියෙක්



වූ මහාචාර්ය ශ්‍රීමත් සිඩ්නි ස්මිත් මහතා විසින් ලියන ලද අධිකරණ වෛද්‍ය ග්‍රන්ථයේ මෙම කරුණ විශේෂයෙන් සඳහන් කර ඇත. මෙවැනි සිද්ධීන්වල දී මරණයට හේතුව ( cause of death ) පිළිබඳව අවසාන තීරණය ඉදිරිපත් කිරීමට වගකීම පැවරී ඇත්තේ අධිකරණ වෛද්‍යවරයා වෙත ය. රළු ස්වභාවයෙන් යුතු එකිනෙකට හරස්ව පිහිටා තිබූ සිරවීමේ බන්ධක ලකුණු දෙකක් සෝමලතාගේ බෙල්ලෙහි දක්නට තිබීම නිසා, කොහු ලණුවකින් ගෙල සිර කර මරණයට පත් කිරීමෙන් පසුව, ඇයගේ සිරුර බාල්කයේ එල්ලා ඇති බව වෛද්‍ය පරීක්ෂණය සුපරීක්ෂාකාරීව කිරීමෙන් අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. ඒ අනුව, සෝමලතා සිය දිවි හානි කර ගෙන නොමැති බව අධිකරණ වෛද්‍යවරයා විසින් පොලිසියට වාර්තා කරන ලදී. ඉන්පසුව අධිකරණ වෛද්‍යවරයා දරුවාගේ සිරුර ද පරීක්ෂණයට භාජනය කළේ ය. දරුවාගේ මුහුණ දම් පැහැති වී තිබීමත්, මුහුණේ ලේ ලප තිබීමත් සහ බෙල්ල සිර කොට රෙදි පටියකින් බැඳ තිබීමත් නිසා, ඔහුගේ බෙල්ල රෙදි පටියකින් හිර කර මරා දමා ඇති බවට වෛද්‍යවරයා නිගමනය කළේ ය. ඒ අනුව, මෙය ද්විත්ව මිනීමැරීමක් බැවින් මෙය සිදු කළ අපරාධකරු හෝ අපරාධකරුවන් අත් අඩංගුවට ගැනීමට කටයුතු කිරීමට පොලිසියට සිදු විය.

සෝමලතාගේ සැමියා වන පියදාසව සැක කිරීමට තරම් පොලිසියට සාක්ෂි නො තිබුණත් ඔහුගේ හැසිරීම සම්බන්ධව අවධානයට ලක්වූ කරුණු දෙකක් තිබිණි. ඉන් එක කරුණක් නම්; ප්‍රථමයෙන් සිද්ධිය පිළිබඳව පැමිණිල්ල ඉදිරිපත් කිරීමට පියදාසගේ නිවසේ සිට සැතැප්ම කාලක් දුර පිහිටා තිබූ පොලිසියට නො ගිය පියදාස ඔහුගේ නිවසේ සිට සැතැප්ම දෙකක් ඈතින් තිබූ නැන්දම්මාගේ නිවසට යෑම ය. අනෙක් කරුණ නම්; පියදාසගේ දකුණු අතේ තිබූ ලේ ගලන කැපුම් තුවාලයයි. නැන්දම්මාගේ නිවසට යන විට කම්බි වැටකින් රිංගා යෑමේ දී අත තුවාල වී ඇති බව පියදාස කීවත්, පොලිසිය ඒ ගැන සැක සිතීම නිසා, ප්‍රශ්න කිරීමට ඔහු පොලිස් අත් අඩංගුවට ගෙන, වෛද්‍ය පරීක්ෂණය සඳහා අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළේ ය.

පියදාසගේ දකුණු අතේ තිබූ ලේ ගලන තුවාලය අත් කාචයකින් පරීක්ෂා කිරීමෙන් පසුව එය කම්බි කටුවකට ඉරී ( tear/laceration )



Scanned with CamScanner

ඇති වන තුවාලයක් නොව, තියුණු තැපෙන තලයකින් කැපීමෙන් ඇති වන තුවාලයක් නොව. තියුණු තැපෙන තලයකින් කැපීමෙන් ඇති වූ, දිනක් පරණ කැපුම් ( incised ) තුවාලයක් බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. තම්බි තලුවක කෙළවර උල් වී තිබුණත් එයින් තුවාල වූ විට සමෙහි ඉරීමක් ( laceration ) පමණක් ඇති වන අතර මුවහත් තියුණු තැපෙන තලයකට කැපුන විට කැපුම් තුවාලයක් ( incised wound ) ඇති වේ. ඒ බව වෛද්‍යවරයා පොලිසියට දැන්වී ය. ඊට මෙතරම් පියදාසගේ වම් අතේ මැද ඇඟිල්ලෙහි සහ අත්ලෙහි දවසක් පමණ පරණ වූ දියපට්ටා තුනක් ඇති බව වෛද්‍යවරයා දුටුවේ ය. යම්කිසි රළු වස්තුවක් තද කොට ඇල්ලීමෙන් අල්ලෙහි දිය පට්ටා හට ගනී. සෝමලතා මනුෂ්‍ය ඝාතනයකට ලක් වී ඇති බව මේ වන විට වෛද්‍යවරයා විසින් නිගමනය කර තිබූ බැවින් සහ ඒ පිළිබඳව පියදාස ප්‍රබල සැකකරුවකු වූ නිසා පියදාසගේ අතේ තිබූ කැපුම් තුවාලය සහ ඔහුගේ වම් අතේ තිබූ දිය පට්ටා යනාදිය නඩු විභාගයේ දී ලේඛනගත සාක්ෂි ( documentary evidence ) වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ වෛද්‍යවරයාගේ උපදෙස් මත පරීක්ෂණ භාර පොලිසිය විසින් වර්ණ ඡායාරූප ගත කරන ලදී.

පියදාසගේ අතේ නියපොතුවල අග, ඇතුලේ පොල් කුඩු වැනි දෙයක් රැඳී තිබෙන බව ද කවදුරටත් පරීක්ෂා කරන විට දක්නට ලැබුණි. අත් කාචයක් ආධාරයෙන් පරීක්ෂා කිරීමෙන් පසුව ඒවා පොල් කුඩු බව තහවුරු විය. මේ සියලු විස්තර වෛද්‍යවරයා විසින් පොලිසියට වාර්තා කරන ලදී. ඒ අනුව, පියදාසගේ නිවස වැඩිදුරටත් පරීක්ෂා කිරීමේ දී කුස්සියේ තිබූ හිරමන තලයේ ලේ තැවරී ඇති බව දක්නට ලැබුණි. හිරමන තලයෙන් ලබා ගත් රුධිර සාම්පලය රස පරීක්ෂකවරයාට ඉදිරිපත් කිරීමෙන් පසුව, පියදාසගේ රුධිරයේ වර්ගයක් හිරමන තලයේ තැවරී තිබූ රුධිරයේ වර්ගයක් එක හා සමාන ඒවා බව රස පරීක්ෂක වාර්තාවෙන් දැන ගැනීමට හැකි විය. පියදාසගෙන් ප්‍රශ්න කිරීමේ දී බොහෝ කාලයකින් පොල් ගා නොමැති බව ඔහු පොලිසියට පැවසී ය. පොල් ගාමින් සිටි සෝමලතා සමග පොර බැදීමේ දී පොල් කුඩු පියදාසගේ නියපොතු තුළ තැවරී ඇති බවත්, සෝමලතාගේ ගෙල කොහු ලණුවෙන් සිර කොට, ඇය මිය ගිය පසුව ඇය ගෙල වැලදා ගෙන සිය දිවි හානි කර ගෙන ඇති බව පෙන්වීම සඳහා එම ලණුවෙන්ම ඇගේ සිරුර උඩට ඇදීමේ දී ඔහුගේ අතේ දියපට්ටා හට ගෙන



ඇති බවත් වෛද්‍යවරයා නිගමනය කළේ ය. වෛද්‍ය පරීක්ෂණයේ දී හෙළි වූ සියලු කරුණු වෛද්‍යවරයා විසින් පොලිසියට වාර්තා කරන ලදී. මෙම කරුණු පොලිසිය විසින් පියදාසට දැන්වූ විට ඔහු පොලිසියට සිද්ධිය මෙසේ විස්තර කළේ ය.

තමා රාත්‍රී දහයට පමණ තම නිවසට පැමිණ දොර විවෘත කරන ලෙස සෝමලතාට කීවත් ඇය දොර විවෘත නො කොට අසැබි වචනයෙන් තමාට බැන වැදුනු බවත්, ඒ අවස්ථාවේ ඉවසාගත නො හැකි කෝපයක් තමාට ඇති වූ බවත්; ඉන් පසුව තමාගේ එකම දරුවා සෝමලතා විසින්ම මැරූ බව ඇය පැවසීමත් සමග තමාගේ කෝපය ඉහවහා ගිය බැවින් තමා බිරියට පහර දී ඇයගේ ගෙල කොහු ලණුවකින් සිර කොට මරා එම ලණුවෙන්ම ඇයව බාල්කයේ එල්ලූ බවත්, පියදාස කියා සිටියේ ය.

මත් පැන් වලට සහ සූදුවට ඇබ්බැහි වීම නිසා තමන්ට මෙම ඉරණම අත්වූ බවත්, ස්වාමිපුරුෂයාගේ කොතරම් වැරදි තිබුණත් ආත්ම ගෞරවය කෙලෙසන අන්දමට භාර්යාවන් තම ස්වාමි පුරුෂයාට කථා කිරීම සුදුසු නොවන බවත්; ඒ නිසා ඇයට එම අවාසනාවන්ත ඉරණම අත් වූ බවත්; සමාජයේ ජීවත්වන අය මෙයින් පාඩමක් ඉගෙන ගත යුතු බවත්, ක්ෂණික කෝපය ( grave and sudden provocation ) දරුණු ක්‍රියාවන් වලට හේතුවන බවත්, පියදාස අවසාන වශයෙන් හඬමින් පොලිසියට පැවසුවේ ය. තමාගේ බිරිය ජීවිතක්ෂයට පත් කළේ ඒ මොහොතේ තමාගේ මනසට ඇතුල් වූ යක්ෂයා මිස තමා නො වන බවත් තමාගේ එකම පුතා ඔහු නොමැරූ බවත් පියදාස කඳුළු සලමින් පැවසී ය. ඒත්, එම කඳුළු වලින් ඔහු කළ පාපයට වන්දි ගෙවිය හැකි ද?

අවුරුදු හතරක් වයසැති දරුවා, සෝමලතා විසින් මරා දමන ලද්දේ ද? නැතහොත් පියදාස විසින්ම මැරුවේ ද යන්න දන්නේ පියදාස පමණී. මනුෂ්‍යයකු මරණයට පත් කිරීමට හේතුවක් සහ චේතනාවක් ( intention ) තිබිය යුතු ය. එසේ නැත්නම් දරුණු මානසික රෝගයකින් පෙළෙන මනෝවිකාරී පුද්ගලයෙකුට ( psycho-pathic personality ) පමණී. පියා විසින් තම මව මරා දමනු දුටු දරුවා, පියාට අනාගතයේ දී තර්ජනයක් විය හැකි බැවින් දරුවා මරා දැමීමේ අවශ්‍යතාව තිබුණේ පියදාසට ය. ගෘහ සේවිකාවක



Scanned with CamScanner

වශයෙන් විදේශගත වී රැකියාවක් කිරීමට අවශ්‍ය සියලු කටයුතු නිම කොට තිබූ සෝමලතාට දරුවා මරා දැමීමට අවශ්‍යතාවක් නොමැති බව සාධාරණ සැකයෙන් තොරව යම් අයකුට සිතිය හැකි ය.

සෝමලතා එල්ලී සිටි ස්ථානය වෙනස් වීමට පෙර පරීක්ෂා කිරීම නිසාත්, වෛද්‍ය පරීක්ෂණය නිසියාකාරව පැවැත්වීම නිසාත් සෝමලතා සිය දිවි හානි කර ගෙන නොමැති බවත් ඇයගේ ගෙල ලණුවකින් සිර කොට මරා දමා ඊට පසුව ඇය එල්ලා ඇති බවත් සොයා ගැනීමට හැකි විය. පියදාසගේ අතේ තිබූ කැපුම් තුවාලය ගැන පොලිසිය සැලකිලිමත් වීමෙන් පසුව පියදාසව අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට ඉදිරිපත් කිරීම නිසා පියදාස, සෝමලතා මරණයට පත් කළ බව හෙළි කිරීමට හැකි විය. පියදාසගේ අතේ තිබූ තුවාලය ගැන සැලකිල්ලක් නො දක්වා, සෝමලතා දරුවා මරා පසුව ඇය ගෙල වැලලා එල්ලී සිය දිවි හානි කර ගත් බවට පූර්ව නිගමනයකට පත්ව වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූයේ නම් මෙම අපරාධය සදාකාලිකව ම පියදාස පමණක් දන්නා රහසක් වනු ඇත. එම නිසා, ඕනෑ ම සිද්ධියක දී සියලු පරීක්ෂණ අවසාන වනතුරු අධිකරණ වෛද්‍යවරුන් පූර්ව නිගමනවලට පත් නො විය යුතු බව මෙම සිද්ධියෙන් මනාව පැහැදිලි වේ. සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් සිදු වූ විට පොලිස් නිලධාරීන්, රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ( ව්‍යවහාරක විද්‍යාඥයින් ), පොලිස් ඡායාරූප ශිල්පියා සහ අධිකරණ වෛද්‍ය නිලධාරියා යන අය කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීමෙන් අබිරහසේ පුලුමුල සොයා ගැනීමට හැකි වන බව මෙම කථාවෙන් පැහැදිලි වේ.

පියදාසගේ අතේ තිබූ කැපුම් තුවාලය, ඔහුගේ නියපොතු අග රැඳී තිබූ පොල් කුඩු, අතෙහි හට ගෙන තිබූ දිය පට්ටා, හිරමන තලයේ තැවරී තිබූ රුධිරය සහ සෝමලතාගේ බෙල්ලෙහි එකිනෙකට හරස්ව තිබූ දාර දෙක, මරණයට හේතුව සහ මිනීමරුවා සොයා ගැනීමට උපකාරී වූ " නිහඬ සාක්ෂි " වශයෙන් සැලකිය හැකි ය.



# අසම්මත, ප්‍රේමයෙන් හටගත් දරුවා

වේලාව සවස පහට පමණ විය. උත්සවයකට සහභාගි වූ තරුණියක් ආහාර විෂ වීම නිසා ප්‍රාදේශීය රෝහලක බාහිර රෝගීන්ගේ අංශය වෙත, පිරිමියකු සහ කාන්තාවක විසින් රැගෙන එන ලදී. එකී තරුණිය පරීක්ෂා කළ වෛද්‍යවරයා ඇය මරණයට පත්වී ඇති බව, ඔවුනට දැන්වී ය. තරුණිය රැගෙන ආ තැනැත්තිය සහ ඇය සමග සිටි පිරිමියා ඒ පුවත අසා නැඟූ විලාපයෙන් මුළු බාහිර රෝගීන්ගේ අංශයම කම්පාවට පත් විය.

මරණයට පත්වී ඇත්තේ තමාගේ ඥාති සහෝදරියක වන රෝහිණී අබේකෝන් නමැත්තිය බවත්, උත්සවයක දී දිවා ආහාර ගැනීමෙන් පසුව ඇය අසනීප වූ බවත්, එම ආහාර අනුභව කළ තවත් කීප දෙනෙකුම රෝගාතුර වී ඉන් සමහරකු පළාතේ ග්‍රාමීය රෝහලට ඇතුල් කළ බවත්, තරුණිය රැගෙන ආ තැනැත්තිය විසින් බාහිර රෝගීන්ගේ අංශයේ වෛද්‍යවරයාට වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියා ය. මියගිය රෝහිණීගේ කරාබු කුට්ටම, මාලය සහ අත් ඔරලෝසුව බාර ගැනීමට කැමති දැයි, වෛද්‍යවරයා තරුණිය රැගෙන ආ තැනැත්තියගෙන් විමසී ය. ඊට කැමැත්ත ප්‍රකාශ කළ හෙයින් එම ආභරණ ඇයට භාරදී බාහිර රෝගීන් ඇතුල් කරන නාම ලේඛණයේ ( O.P.D. register ) ඇයගේ අත්සන සහ ලිපිනය සඳහන් කර ගන්නා ලෙස සහායට සිටි උපස්ථායිකාවට වෛද්‍යවරයා උපදෙස් දුන්නේ ය. එම ආභරණ බාර ගත් ඇය මරණය පිළිබඳව ඥාතීන්ට දැන්වීමට යන බව පවසා, තමන් සමග පැමිණි පිරිමියා ද කැටුව රෝහලෙන් නික්ම ගියා ය.

දෙදිනක් ගත වුවත් මියගිය තැනැත්තියගේ මළසිරුර බාර ගැනීමට කිසිවෙක් රෝහලට නො පැමිණිය හ. මියගිය තරුණිය රෝහලට ඇතුල් කළ අය, ඇයගේ මරණය ඥාතීන්ට දන්වා යවන බව පැවසුවත් නැවත නො පැමිණීම රෝහල් පොලිසියට කුතුහලයක් විය. රෝහලට ඇතුල් කරන අවස්ථාවේ දී මරණයට පත්වී ඇති අය පිළිබඳව ද හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍යම නියමයක් බැවින්, රෝහිණීගේ මරණය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා, බාහිර රෝගී අංශය විසින් ඒ බව රෝහල් පොලිසිය වෙත දැනුම්



Scanned with CamScanner

දෙන ලදී. මියගිය තැනැත්තිය රෝහලට ඇතුල් කළ පුද්ගලයකු විසින් ලබා දී තිබූ ලිපිනයෙහි සඳහන් නිවස සොයා පොලිස් නිලධාරියකු ගිය නමුත් එම ලිපිනයේ සඳහන් භාරකරුගේ නම ව්‍යාජ එකක් බව පසුව දැන ගැනීමට ලැබුණි.

යම් කෙනෙකුගේ මරණය සිදු වී ඇත්තේ මනුෂ්‍ය ඝාතනයකින් නම්, ඝාතකයින් අත් අඩංගුවට ගැනීම සඳහා මළසිරුර හඳුනා ගැනීම බෙහෙවින් උපකාරී වන්නේ ය. නාඳුනන මළසිරුරු හඳුනා ගන්නා තෙක් ඒවා රෝහලේ මෘත ශරීරාගාරයේ ශීතකරණයක තැබිය යුතු ය. මෘතශරීරාගාරවල ශීතකරණ නොමැති නම් අභිරහස් ලෙස මරණයට පත්ව ඇතැයි සැක කරන මළසිරුරු හඳුනා ගැනීමටත්, පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීම සඳහාත්, ශීතකරණ පහසුකම් ඇති විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියකු සේවය කරන මහ රෝහලකට යැවිය යුතු ය

මියගිය තැනැත්තිය හඳුනා ගත යුතුව තිබූ බැවින්, ඇයගේ ඡායාරූප සහිත විස්තරයක් පුවත්පත්වල පළ කරවන ලදී. සතියකට පසුව මියගිය තැනැත්තියගේ මව, රෝහලට පැමිණ, මළසිරුර හඳුනා ගත්තා ය. මරණයට පත්වී ඇත්තේ රෝහිණී අබේකෝන් ලෙස ව්‍යාජ නමකින් රෝහලට ඇතුළත් කොට ඇති තමාගේ දියණිය වන සමන්ති කලංසූරිය බව ඇය රෝහල් පොලිසියට කියා සිටියා ය. සමන්ති අසනීප වී රෝහලට ඇතුළත් කළ බවට සිරිල් නම් අයකු තමන් වෙත මීට සතියකට පෙර විදුලි පුවතක් මගින් දැනුම් දීමෙන් පසුව රෝහලට පැමිණ සොයා බැලූ නමුත් තමාගේ දියණිය රෝහලේ නො සිටි බවත්, එම කාන්තාව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියා ය. ඉන් පසුව, තම දියණිය නවාතැන් ගෙන සිටි කාමරයට පැමිණ, ඇයගේ මිතුරියන්ගෙන් සමන්ති පිළිබඳව විමසූ විට, ඔවුන් ප්‍රකාශ කර සිටියේ, ඇය දින තුනක නිවාඩු ලබා ගෙන මංගල උත්සවයකට සහභාගිවීම සඳහා ඇයගේ නිවසට යන බව පවසා පිටත් වූ බව ය. ඒ අතරතුරේ දී, පුවත්පතක පළවූ තම දියණියගේ ඡායාරූප සහිත විස්තරයක් කියවීමෙන් පසුව වහාම රෝහලට පැමිණ ඇයගේ මළසිරුර හඳුනා ගත් බවත් කඳුළු සලමින් මව වැඩිදුරටත් පැවසුවා ය.

එම සාක්ෂි අනුව සමන්තිගේ මරණය සැක කටයුතු එකක් බව



නිගමනය කළ මහේස්ත්‍රාත්වරයා, වෛද්‍ය පරීක්ෂණයක් ( post mortem examination ) පවත්වා මරණයට හේතුව ( cause of death ) වාර්තා කිරීමට විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාට නියම කළේ ය. අධිකරණ නියෝගයක් මත වෛද්‍ය පරීක්ෂණයක් සිදු කරන විට ඥාතියෙකු හෝ මිත්‍රයෙකු විසින්, මියගිය අයගේ අනන්‍යතාව ( identification ) තහවුරු කිරීම සඳහා අධිකරණ වෛද්‍යවරයා ඉදිරිපිට දී මියගිය තැනැත්තා හඳුනා ගැනීම කළ යුතු වේ.

සමන්තිගේ මව හා ඇයගේ සහෝදරයා විසින් මළසිරුර හඳුනා ගැනීමෙන් පසුව වෛද්‍ය පරීක්ෂණය පවත්වන ලදී. සමන්තිගේ සිරුර අඩි පහයි අඟල් තුනක් උස් වූ අතර, බර රාත්තල් එකසිය දහයක් විය. මනාව වැඩුනු සිරුරකින් සමන්තිගේ දේහය සමන්විත විය. මුහුණ රතු වී ලේ ලපවලින් ( petechial haemorrhages ) පිරී තිබුණි. එම ලේ ලප දුටු අය, ඇය මරා දමා ඇති බවට සැක කළ හ. ගෙල මිරිකීමෙන් ( strangulation of neck ), අතින් මුහුණ වසා හුස්ම ගැනීමට අපහසු කරවීම නොහොත් නිග්‍රාහය ( smothering ) ඇති කරවීමෙන්, ලේ විෂ වීමෙන් ( toxaemia ), විෂක් ශරීරගත වීමෙන් ( poisoning ), හෝ හෘදයාබාධයක් ( heart attack ) ඇති වීමෙන් යනාදි හේතුන්වලින් මරණය සිදුවූ විට මුහුණේ ලේ ලප ඇති වේ.

තන පටක් හෝ යට සායක් හෝ යට කලිසමක් හෝ එකී මළසිරුරේ නො තිබිණි. ඇය ඇඳ සිටි හැට්ටය සහ සාය ද සමන්තිගේ නො වන බව මළසිරුර හඳුනා ගත් ඇයගේ මිතුරියෝ පැවසූ හ. එම හේතුන් නිසා ද සමන්තිගේ මරණය ස්වාභාවිකව සිදුවූ මරණයක් නො වන බවට තිබූ සැකය, තවදුරටත් තහවුරු විය. සමන්තිගේ දකුණු අතේ වැලමිට හන්දියේ ඇතුල් පැත්තේ සම මතුපිට එන්නත් කිරීමෙන් හටගත් දුඹුරු පැහැති පැල්ලමක් ( intra venous injection mark ) විය. රුධිරය ගලායන ශිරාවකට ( vein ) එන්නතක් ( injection ) කිරීමේ දී මෙවැනි පැල්ලම් ඇති වන බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. පැල්ලමේ වර්ණය අනුව එන්නත සිදු කොට ඇත්තේ මරණයට පැය විසිහතරකට පෙර බව වෛද්‍යවරයාට උපකල්පනය කිරීමට හැකි විය. බාහුවේ පේශියකට එන්නතක් ( intra muscular injection ) කළ විට මෙවැනි ලේ ලප ඇති නො වේ. පේශියකට එන්නතක් කළ විට මළසිරුරේ ඒ බවට



Scanned with CamScanner

සලකුණු හඳුනා ගැනීම ඉතාම අසීරු ය.

මාස පහක හෝ හයකට ආසන්න කාලයකට ගර්භාෂය වර්ධන වීම නිසා එය විශාල වී තිබුණි. ඊට අමතරව ගර්භාෂය රෑ පැහැති වී තිබුණි. විශාල වූ ගර්භාෂය තුළ මාස පහක හෝ හය ප්‍රමාණයකට වර්ධනය වූ භ්‍රෑණයක ( foetus ) හිස පමණක් තිබුණ අක්ෂි ගෝල ( eye balls ), ඇස් පිල්ලම් ( eyelids ), නාසය ( nose සහ මුඛය ( mouth ) යන ඒවා භ්‍රෑණයෙහි පහසුවෙන් හඳුනා ගැනීම හැකි විය. ගර්භාෂයේ ගැබ් ගෙල ( cervix ) මෘදු වී තිබුණ තුවාල වී තිබූ ගැබ් ගෙල නොහොත් ග්‍රීවයේ, සිදුර ( internal os විශාල වී තිබුණි. ගැබ් ගෙලෙහි ඇතුල් පැත්තෙහි දික් අත ඉරීගිය ( දාරිත - laceration ) තුවාල කිපයක් තිබිණි. එම තුවාලවල ස්වභාවය, වර්ණය සහ සනත්වය ( consistency ) අනුව ඒවා සිදු වී ඇත්තේ මරණයට පැය විසි හතරකට පෙර බව වෛද්‍යවරයා නිගමනය කළේ ය.

එය සනාථ කිරීම සඳහා එම තුවාල සිදු වී ඇති ස්ථානවලින් ලබා ගත් කොටස් පටකවේද පරීක්ෂාවට (histopathological studies) භාජනය කළ විට, එහි තිබූ ප්‍රදාහක ප්‍රතික්‍රියා ( inflammatory reaction ) අනුව එම තුවාල සිදු වී ඇත්තේ, මරණය සිදු වීමට පැ විසි හතරක් ඇතුළත දී හෝ ඊට ආසන්න කාලයක දී බව තවදුරටත් ස්ථිර කිරීමට හැකි විය. විස්තරණය වී ( dilated ) තිබූ යෝනි ( vagina ) තුළට රුධිරය වහනය වී ( extravasated ) රත් පැහැති තිබිණි. යුතික ප්‍රදේශය ( pubic area ) මත පිහිටා ඇති රෝම ඉවත් කර නො තිබිණි. වෛද්‍යමය හේතුවකට රෝහලක දී ගබ්සාව කරන විට යුතික ප්‍රදේශයේ රෝම ඉවත් කරනු ලැබේ. යුතික ප්‍රදේශය මත ඩෙටෝල් හෝ වෙනත් විෂබීජ නාශක සුවඳක් නො ය. යෝනි මුඛය මත රුධිරය වහනය වී තිබුණි. යෝනි මාර්ග තුළ ලේ කැටි ස්වල්පයක් විය. ඉන්ද්‍රියයන් සියල්ලෙහිම රෝග ලක්ෂණ ( pathological diseases ) නො තිබූ නමුත්, ඒවා සුදුමැලි තිබූ අතර එහි රුධිරය නො තිබුණි. මෙයට හේතුව අධික ලේ රුධිරය වහනය වී කම්පනය හට ගැනීම ය. කම්පනය ( shock ) ඇති වූ විට අභ්‍යන්තර ඉන්ද්‍රියයන් සුදුමැලි වන අතර ඒවා තු රුධිරය නො මැත. පෙනහැලි ද හැකිළී තිබුණි. පෙනහැලිවල රුධිරය නො තිබුණු අතර, අක්මාව සහ ආන්ත්‍රයන් සුදුමැලි



තිබුණි. මෙම ඉන්ද්‍රියයන්වල ද රුධිරය නො තිබුණි.

මේ අනුව, මාස පහකට හෝ හයකට ආසන්නව වර්ධනය වූ ගර්භාෂයේ හටගත් භ්‍රෑණයක් යෝනි මාර්ගය තුළින් ඉවත් කිරීමේ දී ගැබ් ගෙල තුවාල වීම නිසා ඒ තුළින් අධික ලෙස රුධිරය ගැලීමෙන් ඇති වූ කම්පනයෙන්, සමන්තිගේ මරණය සිදු වී ඇති බව වෛද්‍යවරයා නිගමනය කළේ ය.

අධිකරණ වෛද්‍ය වාර්තාව ( medico legal report ) සැලකිල්ලට භාජනය කිරීමෙන් පසුව, නීති විරෝධී ගබ්සාවක් කිරීමෙන් මෙම තරුණියගේ මරණය සිදු වී ඇති බව මහේස්ත්‍රාත්වරයා තීන්දු කළ අතර එම ක්‍රියාවන් සිදු කළ තැනැත්තා හෝ තැනැත්තන් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස පොලිසියට නියෝග කළේ ය. ඒ අනුව, මෙම තරුණියගේ ගබ්සාව සිදු කළ පුද්ගලයා හෝ පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම පොලිසියට භාර විය.

අසනීප වූ තරුණිය රෝහලට රැගෙන ආ භාරකරුවන් රෝහලට ලබා දී තිබූ ව්‍යාජ නම සහිත ලිපිනයෙහි සඳහන් ප්‍රදේශයේ වෑන් රථ රියදුරන්ගෙන් මෙම මරණය පිළිබඳව පොලිසිය විසින් ප්‍රශ්න කරන ලදී. අසනීප වූ තරුණියක් තමන්ගේ වෑන් රථයෙන් පිරිමින් දෙදෙනෙකු සහ කාන්තාවක විසින් මීට සති දෙකකට පමණ පෙර සවස් වරුවේ රෝහලට රැගෙන ආ බව එම ප්‍රදේශයේ වෑන් රථ රියදුරෙක් පොලිසියට පැවසුවේ ය. අසනීප වූ තරුණිය සිටි නිවස ද එම රියදුරා විසින්ම පොලිසියට පෙන්වන ලදී. වෑන් රථයේ පැමිණි පිරිමින් දෙදෙනාගෙන් එක් අයකු සහ කාන්තාව ද එම නිවසේ දී ම වෑන් රථයේ රියදුරා විසින් හඳුනා ගනු ලැබී ය. ඒ අනුව, මෙම සිද්ධිය පිළිබඳව ප්‍රශ්න කිරීම සඳහා එම යුවල පොලිස් අත් අඩංගුවට ගන්නා ලදී. තරුණිය රෝහලට ඇතුළත් කරන අවස්ථාවේ වෑන් රථයේ නතරවී සිටි අනෙක් තැනැත්තා එම නිවසේ නො සිටි බව රියදුරා පොලිසියට පැවසී ය.

තවද, නිවස හා අවට පරීක්ෂා කිරීමේ දී, මෑතක දී පුළුස්සා දමන ලද ගවුමක කොටස් එම නිවස අසල තිබූ මඩුවක දී පොලිසියට සොයා ගැනීමට ද හැකි විය. පෙට්ටියක බහා පිදුරු ගොඩක සඟවා තිබූ, අත්ඔරලෝසුවක්, කරාබු කුට්ටමක් සහ මාලයක් ද එම



Scanned with CamScanner

මඩුවේ තිබී පොලිසිය විසින් සොයා ගන්නා ලදී. එම ආභරණ සහ ඇඳුම් ද සමන්තිගේ බව ඇයගේ මව විසින් පසුව හඳුනා ගැ ලැබුවා ය. වෛද්‍යවරයෙකු විසින් කාන්තාවකගේ යෝනිය පරීක්ෂ කිරීම සඳහා භාවිතයට ගනු ලබන උපකරණ ( vaginal speculum කිපයක් ද එම නිවසේ කාමරයක තිබී හමු විය. එම උපකරණ පරීක්ෂා කොට වාර්තාවක් ලබා ගැනීමට පොලිසිය විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. එම උපකරණ මත රුධිරය ස්වල්පයක් තැවරී තිබෙන බව අධිකරණ වෛද්‍යවරයා දැක ගත හැකි විය. එම උපකරණවල තැවරී ඇති රුධිරය මනුෂ්‍ය රුධිරය ද යන්නත්, එම රුධිරයේ වර්ගයත් ( blood grouping සොයා ගැනීමට, ඒවා රජයේ රස පරීක්ෂක වෙත අධිකරණය මඟින් ඉදිරිපත් කරන ලදී. සමන්තිගේ රුධිර වර්ගය ද දැන ගැනීම ඇයගේ වෛද්‍ය පරීක්ෂණයේ දී ලබා ගත් රුධිර සාම්පලයක් ද පරීක්ෂක වෙත අධිකරණය මගින් ඉදිරිපත් කෙරිණ. උපකරණ මත තැවරී තිබූ රුධිර වර්ගය සහ සමන්තිගේ රුධිර වර්ගය එක සමාන ( similar ) බව රස පරීක්ෂකගේ වාර්තාවේ සඳහන් විය.

මෙසේ පරීක්ෂණවලින් සොයා ගෙන තිබූ තොරතුරු පොලිස විසින් අත් අඩංගුවට ගත් යුවලට දන්වන ලදී. නිහාල් නමැත්තා සමන්ති නම් තම බිරියගේ ගබ්සාව කරන ලෙසට ඔවුන්ගෙ ඉල්ලීමක් කළ බවත් ඒ අනුව, සමන්තිගේ ගබ්සාව ඔවුන් විසින් සි කළ බවත් ඔවුහු පොලිසියට පැවසූ හ.

මියගිය සමන්ති අවිවාහක කාන්තාවක බවත්, ඇයට නිහා නම් ප්‍රේමවන්තයෙකු සිටි බවත්, ඇයගේ දෙමාපියන් පොලිසිය පවසා තිබුණි. ඒ අනුව, නිහාල්ව පොලිස් අත් අඩංගුවට ගෙ ප්‍රශ්න කරන විට හෙතෙම කඳුළු සලමින් මෙසේ ප්‍රකාශ කළේ ය.

" මා පෞද්ගලික ආයතනයක ආරක්ෂක නිලධාරියෙක් ලෙ සේවය කරනවා. මීට අවුරුදු දෙකකට පෙර ඇඟලුම් කම්හල සේවය කළ සමන්ති මට හමු වුණා. අප දෙදෙනාම එකම පළාතේ අය බව දැන ගත් විට ඉතාම කුළුපග වූ අතර, අපගේ මිත්‍රත්ව සෙනෙහසකටත් දැඩි ආදරයකටත් පෙරලුණා. කල්යාමේ දී අ විවාහ වීමට තීරණය කළ අතර, නිවාඩු දිනවල දී විනෝද ගම ද ගියා. එසේ ගිය විට අපි අඹුසැමියන් වශයෙන් ද හැසිරුනා.



අතරතුර සමන්තිගේ ඔසප්වීම සිදු වූයේ නැහැ. මුත්‍රා පරීක්ෂා කිරීමෙන් පසුව ඇය ගැබ් ගෙන ඇති බව අප දැන ගත්තා. සමන්තිට ඇඟලුම් කම්හලෙන් පුහුණුවක් සඳහා විදේශගත වීමට තිබුණ නිසාත්, විවාහ වීමෙන් පසුව ඉක්මණින් දරුවන් හැදීමට බලාපොරොත්තු නො වීමත් නිසා, ගැබ් භාවය ඉවත් කිරීම ගැන අප සාකච්ඡා කළා. ගැබ් භාවය ඉවත් කිරීමට අන්නාසි ගැට කෑම සහ දැඩි ශාරීරික ව්‍යායාම් කිරීම් සමන්ති කළත් එය සාර්ථක වුණේ නැහැ. ගැබ් කාලයේ දී බොහෝ කාන්තාවන්ට ඇති වන වමනය, ක්ලාන්තය, හෝ කරකැවිල්ල වැනි ලක්ෂණ සමන්තිට තිබුණේ නැහැ. එම නිසා, ඇයගේ ගැබ් භාවය රහසක් වශයෙන් තබා ගෙන දැඩි මානසික පීඩනයෙන් පෙළෙමින් ඇය රැකියා කටයුතු කර ගෙන ගියා. ක්‍රමයෙන් ඇයගේ ගැබ් භාවයට තුන් මසක් ගත වුණා. ගැබ් භාවය ඉවත් කර ගැනීමට ඇය ඉස්ට්‍රජන් පෙති *(oestrogen tablets)* ද බිව්වා. ඒවා ගිලින විට තදබල ලෙස වමනය කළත් ගබ්සාව සිදු වුණේ නැහැ. දරු ගැබට මාස පහක් ගත වූ නිසා, සමන්තිගේ උදරයේ පහත කොටස මදක් ඉදිරියට නෙරා ඇවිත් ඇති බව මට පෙනුණා. මේ පිළිබඳව අප දෙදෙනා සාකච්ඡා කිරීමෙන් පසුව, එය වසන් කිරීමට ඇය යට සාය තදට අඳින්නට වුණා. එන්න එන්නම ප්‍රශ්නය උග්‍ර වී ගෙන එන බව දැන ගත් ඇය, කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳව මා සමග සාකච්ඡා කළා. අවසානයේ දී ගබ්සාවක් කිරීමට අප තීරණය කළා. ගබ්සා කරන ස්ථාන පිළිබඳව සෙවීමට අප පටන් ගත්තා. එවැනි ස්ථානයක් තිබෙන බවත් ඒ සඳහා රුපියල් තුන් දාස් පන්සීයයක් වැය වන බවත් මට දැන ගන්නට ලැබුණා. මේ බව මා සමන්තිට පැවසුවා. ගබ්සාව කර ගැනීම සඳහා සමන්තිගේ මිතුරියන්ට බොරුවක් කියා අප දෙදෙනා ඇයගේ බෝඩිමෙන් පිටත් වුණා. ඇයගේ මිතුරියන්ට ඇය කීවේ විවාහ මංගල්‍ය උත්සවයකට යන්නට තිබෙන බවයි. ගබ්සාව කරන නිවස පිහිටියේ පිටිසර පළාතක. එම නිවසේ සිටියේ රැකියාවෙන් නෙරපූ උපස්ථායකයෙක්. සමන්තිව කාමරයකට රැගෙන උඩුබැලි අතට ඇඳ මත හාන්සි වීමට ඔහු කීවා. සිදුවූ සියල්ල මා බලා සිටියා. සමන්තිගේ කලවා පළල් කොට ඇයගේ යෝනිය තුළට සුදු පැහැති යකඩ බටයක් වැනි උපකරණයක් ඇතුල් කළා. ඊට පසුව එම බටය තුළින් කූරක් ඇතුල් කොට කැරකෙව්වා. සමන්තිට දැඩි වේදනාවක් දැනෙන බව ඇය මට කිවුවා. කරකියා ගත නො හැකිව ඒ සියල්ල සමන්ති ඉවසා සිටි අතර මම ද සිදු වන්නේ



Scanned with CamScanner

කුමක් දැයි භීතියෙන් බලන් සිටියා. සමන්තිගේ යෝනියෙන් රුධිර
ගැලීම ආරම්භ වී පැය භාගයකට පසු ඇයට සිහිය නැතුව ගියා
දැඩි ලෙස කලබල වූ උපස්ථායකයා උණු අළු පොට්ටනියකින්
සමන්තිගේ බඩ තැව්වා. ඊට පසු සමන්තිට සිහිය ආවා. සිහිය ආ
විගසම ගබ්සාව අවසන් කර ඇත්දැ යි සමන්ති උපස්ථායකයාගෙ
ඇසුවා. ගබ්සාව ආරම්භ කොට ඇතත් භ්‍රෑණය ඉවත් කිරීමට නො
හැකි වූ බව උපස්ථායකයා පැවසුවා. පැය කීපයකින් පසු
භ්‍රෑණය ගර්භාෂයෙන් ඉවත් වී පිටතට එන බව උපස්ථායකයා
සමන්තිට පැවසුවා. යෝනිය තුළින් උපස්ථායකයාගේ අත සම
අඩුවක් ගර්භාෂයට ඇතුල් කළා. යෝනිය තුළින් භ්‍රෑණයේ කැ
ඉවතට ගෙන එය සමන්තිට පෙන්නුවා. එම අවස්ථාව වන වි
සමන්තිට දැඩි ලෙස ඩහදිය දමා සුදුමැලි වී තිබුණා. එවි
උපස්ථායකයා සමන්තිගේ අතට එන්නතක් විද්දා. සමන්තිට සේලයි
බෝතලයක් එන්නත් කිරීමෙන් පසුව ඇයගේ දකුණු අතට බෙහෙත
විද්දා. මේ වන විට සමන්තිට දැඩි ලෙස ඩහදිය දමා තිබුණා
ඇය වෙවුලමින් දොඩවන්නට පටන් ගත්තා. ඇයගේ ශරීරය සීතල
වී ඇති බව මට දැනුනා. ඇයගේ මුහුණ දම් පැහැති වී තිබුණා
සමන්තිගේ තත්ත්වය බරපතල බවත් වහාම රෝහලට ඇතුල් කළ
යුතු බවත් උපස්ථායකයා මට කීවා. සමන්තිව රෝහලට ඇතුල්
කිරීමට මා බිය වුණා. එම නිසා මට පමණක් සමන්තිව රෝහල
ඇතුල් කිරීමට නො හැකි බව මම උපස්ථායකයාට කීවා
උත්සවයකට සහභාගි වී ආහාර ගැනීමෙන් පසුව හදිසියේ අසනී
වූ බව දන්වා රෝහලට ඇතුල් කළ යුතු බව අප තීරණය කර
ගත්තා. එම තීරණයට පැමිණීමෙන් පසුව කුලියට වෑන් රථයක්
ලබා ගෙන උපස්ථායකයා, ඔහුගේ බිරිඳ සහ මමත් සමන්ති රැගෙන
පළාතේ රෝහලට ආවා. අතරමග දී වෑන් රථය නවත්වා
උපස්ථායකයා, ඔසුහලකට ගොස් එන්නතක් ලබා ගෙන වෑන් රථ
තුළදීම සමන්තිගේ අතට විද්දා. සවස පහට පමණ සමන්ති
පළාතේ රෝහලේ බාහිර රෝගීන්ගේ අංශයට ඇතුල් කළා. බාහිර
රෝගීන්ගේ අංශයේ රෝගීන් ඇතුල් කිරීමේ වෛද්‍යවරයා, සමන්
පරීක්ෂා කිරීමෙන් පසුව, ඇය මිය ගොස් ඇති බව ප්‍රකාශ කළ
සමන්ති මරණයට පත්වී ඇති බව දැන ගත් මා දැඩි කම්පනයටත්
කලබලයටත්, වේදනාවටත් සහ භීතියටත් පත්ව කරකියා ගත හැකි
දෙයක් නොමැතිව රෝහලෙන් පිටවී ගියා. සමන්තිගේ මරණ
වාවා ගැනීමට මට නො හැකි වූ නිසා ඇය අසනීප වී රෝහල



ඇතුල් කළ බව දන්වා, සමන්තිගේ දෙමාපියන්ට විදුලි පණිවුඩයක් ව්‍යාජ නමකින් යැව්වා".

මේ අවස්ථාවේ පොලිසියට ප්‍රකාශයක් කළ උපස්ථායකයා තීවේ රැකියාව නොමැතිව ජීවිකාව ගෙන යාමට අපහසු බැවින් තමා ඉතා දුකසේ කල් ගෙවන බවත්, ආදායමක් නොමැති නිසා ගබ්සා කිරීම මුදලට කරන බවත් ය. තවද, එසේ කිරීම නීතිවිරෝධි වුවත් අනවශ්‍ය ලෙස ගැබ් ගන්නා කාන්තාවන්ට තමා කරන්නේ සේවාවක් නො වේ දැයි? ඔහු පොලිසියෙන් ප්‍රශ්න කළේ ය. සිය කැමැත්තෙන්ම ගැබ්භාවය ඉවත් කර ගන්නා කාන්තාවන්ට තමා පිටුවහලක් වුවත් ඒවා ලංකාවේ නීතියට පටහැනි බව පොලිසිය ඔහුට පහදා දුන්නේ ය.

ලංකාවේ පවතින දණ්ඩ නීති සංග්‍රහයේ තුන්සිය එකොළහ ඡේදය ( penal code ) අනුව ගබ්සාවක් කළ හැක්කේ ගැබ් භාවය ඇති කාන්තාවකගේ ජීවිතයට අන්තරාදායක තත්ත්වයක් ( endangering life ) ඇත්නම් පමණි.

ගැබ්ගත් කාන්තාවගේ ජීවිතයට අන්තරාදායක තත්ත්වයක් ( endangering life ) තිබේද යැයි යන්න වෛද්‍යවරයා විසින්ම තීරණය කළ යුතු ය. වෛද්‍යමය හේතුවක් මත ගබ්සාවක් කිරීමට නම් ගැබ්ගත් කාන්තාවගේ ජීවිතයට තිබෙන අන්තරාදායක තත්ත්වය ඉතාම ආසන්නව තිබිය යුතු යැයි ඇතැම් රටවල සලකන අතර, සමහරක් රටවල ගැබිනියගේ ජීවිතයට අන්තරාදායක තත්ත්වය ආසන්නව තිබීම කොන්දේසියක් නො වේ. ගැබිනියගේ ජීවිතයට ඇති විය හැකි අන්තරාදායක තත්ත්වයේ සම්භාව්‍යතාවය ( probability ) පසුව ඇති වීමේ හැකියාව තිබියදීත් වෛද්‍යවරයෙකුට ගබ්සාවක් කළ හැකි ය. ගැබ්භාවය ඉදිරියට පවත්වා ගෙන යෑමෙන් ගැබිනියගේ ජීවිතයට අන්තරාවක් ගෙන දිය හැකි වෛද්‍යමය හේතූන් සීඝ්‍රයෙන් අඩු වී ඇත. පෙනහැලිවල ක්ෂය රෝගය ( pulmonary tuverculosis ), ගැබ්භාවයේ දී හට ගන්නා පාලනය කළ නො හැකි අධික වමනය ( hyperemesis gravidarum ) යන හේතූන්, එක්දහස් නවසිය විස්සේ සිට එක්දහස් නවසිය තිහ දක්වා කාලය තුළ ගැබිනියකගේ ජීවිතයට අන්රාදායක තත්ත්වයන් ලෙස සැලකුවත්, පසුගිය දශක පහ තුළ ධාත්‍රිවේදී සේවයේ ( obstetric services ) සීඝ්‍ර

වර්ධනය වීම නිසා වර්තමානයේ දී ඉහත සඳහන් රෝග ගැබිනියකගේ ජීවිතයට අන්තරාදායක තත්ත්වයන් ගෙන දිය හැකි රෝග බවට සලකනු නො ලැබේ. පාලනය කළ නො හැකි අධික රුධිර පීඩනය ( uncontrollable high blood pressure ), හෘදයේ කපාට වලට හානිකරන රූමැටික රෝග ( Rheumatic valvular diseases ), හෘද පේශිරෝගය ( cardiomyopathy ), පේශිරුත්තත්තු ප්‍රදාහය ( myocarditis ), වකුගඩු (වෘක්ක) රෝග ( renal diseases ), පියයුරු පිළිකා ( breast cancer ) යනාදී රෝග, ගැබිනියකට වැළඳී ඇත්නම් වෛද්‍යමය හේතූන් මත ගබ්සාව කිරීමට හැකි රෝග ලෙස ද වර්තමානයේ දී පවා බොහෝ රටවල සලකනු ලැබේ. මනා කායික ( physical ), මානසික ( mental ) සහ සමාජීය ( social ) තත්ත්වයෙන් ජීවත්වීම නිරෝගී සෞඛ්‍යය යනුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය ( World Health Orgamisation - WHO ) අර්ථ නිරූපනය කොට ඇත. එම නිසා ගැබිනියකගේ කායික සෞඛ්‍ය තත්ත්වය ගැන පමණක් නො සලකා ඇයගේ මනා සෞඛ්‍ය වර්ධනයට මානසික තත්ත්වයත් අවශ්‍ය බව වර්තමානයේ දී වෛද්‍යවරුන් සලකනු ලැබේ. එබැවින් ගැබ්බාවය තවදුරටත් පවත්වා ගෙන යාම නිසා දොම්නස් මානසික තත්ත්වයන් ( mental depression ) ගැබිනියකට ඇති වූ විට සිය දිවි හානි කර ගැනීමේ ප්‍රවණතාවය ( suicidal tendancy ) වැඩි වන නිසා වෛද්‍යමය හේතූන් මත ගබ්සා කිරීම් සීඝ්‍රයෙන් වැඩි වන බව පෙනේ.

සාපරාධී ගබ්සාවක් යනුවෙන් හැඳින්වෙන්නේ ගැබ්ගත් කාන්තාවකගේ ජීවිතයට අන්තරාවක් නොමැතිව තිබිය දී එම කාන්තාව ස්වෙච්ඡාවෙන් ( voluntarily ) ඇය විසින්ම හෝ වෙනයම් අයෙකු ස්වෙච්ඡාවෙන් කුමන ක්‍රමයකින් හෝ ගැබ්භාවයේ කුමන අවස්ථාවක දී හෝ කාන්තාවගේ සිරුරෙන් ගැබ් භාවය ඉවත් කිරීමයි. ගබ්සාවක් කර ගැනීමට ආරක්ෂිතම කාලසීමාව ගැබට සති දොළහක් වීමට පෙරයි. අවිවාහක තරුණියකට දරුවෙක් ලැබීම කිසිසේත්ම ලාංකික සමාජය අනුමත නො කරන නමුත්, නීති විරෝධී ගබ්සාවක් කොට දරු ගැබ ඉවත් කිරීම ලංකාවේ ප්‍රබලව සිදුවන දෙයකි. කීමත්කමට ඇබ්බැහි වූ ස්වාමිපුරුෂයන් සිටින පවුල්වල ද දිළිඳුකමින් පෙළෙන තුගත් පවුල්වල ද දරා ගැනීමට නො හැකි දරුවන් ප්‍රමාණයක් උපදින විට මවගේ සෞඛ්‍යයට බලවත් හානි සිදුවන අතර උපදින දරුවන්ට සෞඛ්‍ය වර්ධනයක් නො ලැබීම නිසා



මන්දපෝෂණය ද හට ගනී. සුදුසු අධ්‍යාපනයක් ද එම දරුවන්ට නො ලැබේ. එවැනි පවුල්වල කාන්තාවන් ද නීතිවිරෝධී ගබ්සාවන් කර ගැනීමට නිරතුරුව පෙළඹේ.

රාජ්‍ය නොවන සංවිධාන කීපයක අනුග්‍රහය යටතේ ඇතැම් පෞද්ගලික රෝහල් තුළත් ලියාපදිංචි වූ වෛද්‍යවරුන් පවා නීතිවිරෝධී ගබ්සා කිරීම රහසක් නො වේ. ඊට අමතරව සමහර නිවෙස්වල ද රහසිගතව ලියාපදිංචි නොවූ වෛද්‍යවරුන් මහා පරිමාණයෙන් ගබ්සාවන් සිදු කරන බව රහසක් නො වේ. නීතිය කෙසේ වුවත් ආර්ථික හා සමාජීය බලපෑම් නිසා ශ්‍රී ලංකාවේ වර්ෂයකට නීතිවිරෝධී ගබ්සාවන් දෙ ලක්ෂයක් පමණ සිදු කරන බව නිල නො වන වාර්තාවලින් හෙළි වී ඇත.

ගබ්සාව කිරීමට පෙර, කාන්තාවක් ගැබ්ගෙන ඇත්දැ යි දැන ගැනීම සඳහා ග්‍රැවින්ඩෙක්ස් ( Gravindex test ) නැමැති වීදුරු කදා පරීක්ෂණය ( glass slide test ) පවත්වනු ලැබේ. ගැබ්ගෙන ඇතැයි සැක කරනු ලබන කාන්තාව රාත්‍රී නින්දට ගොස් අවදිවීමෙන් පසුව (පළමුවෙන්ම) ලබා ගන්නා මුත්‍රාවලින් කොටසක් ( first morning sample of urine ) මෙම පරීක්ෂණය සඳහා භාවිතා කරනු ලැබේ. ගැබ්ගත් දින සිට සති තුනකින් පසුව මෙම පරීක්ෂණය පැවැත්වුවහොත් එම කාන්තාව ගැබ් ගෙන ඇති බව නිගමනය කළ හැකි ය. ගැබ්ගත් දිනය කාන්තාව නොදන්නා බැවින් ඇයගේ අවසාන ඔසප්වීම සිදු වී සති හයකින් පසුව ග්‍රැවින්ඩෙක්ස් පරීක්ෂණය කර ගැනීමෙන් පසුව එම කාන්තාව ස්ථිර වශයෙන්ම ගැබ් ගෙන ඇත්දැ යි දැන ගැනීමට හැකි ය. ගැබ්ගත් කාන්තාවගේ ඔසප්වීම අවසාන වූ දින සිට අට දවසකින් පසුව වුවත් ඇයගේ මුත්‍රා පරීක්ෂා කිරීමෙන් ඇය ගැබ් ගෙන ඇති බව අනුමාන වශයෙන් (presumptive evidence ) කිව හැකි නමුත් ස්ථිරවම ඇය ගැබ් ගෙන ඇති බව දැන ගැනීමට නම් සතියකින් පසුව නැවත වරක් ග්‍රැවින්ඩෙක්ස් පරීක්ෂාව කළ යුතු ය.

එංගලන්තයේ අවුරුදු අසූ හතරක් පමණ පැවතුණු දැඩි ගබ්සා නීතිය ( abortion law ) වර්ෂ එක් දහස් නවසිය හැට හතේ දී ලිහිල් කරන ලදී. එක්දහස් නවසිය හැට හතේ දී පුද්ගලික පනතක් (private members bill) වශයෙන් සම්මත කර ගන්නා ලද නව

Scanned with CamScanner

ඉංග්‍රීසි ගබ්සා නීතිය ( medical termination act of pregnancy ) ලිහිල් කිරීමට මහජනතාවගෙන් කොටසක් ප්‍රබල ලෙස ඉල්ලීම් කර තිබුණත්, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට එම පනත ඉදිරිපත් කරන ලද්දේ එවකට බ්‍රිතාන්‍ය පාලනය කළ ආණ්ඩු පක්ෂය නොව ලිබරල් පක්ෂ නායක ගරු ඩේවිඩ් ස්ටීල් නැමති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසිනි. ගබ්සාව නීතිගත කිරීම පිළිබඳව දැඩි විරුද්ධ මතවාදීන් බ්‍රිතාන්‍යයේ පවා සිටි බැවින්, ආණ්ඩු පක්ෂයෙන් නව පනත ඉදිරිපත් නො කොට ලිබරල් පක්ෂයේ මන්ත්‍රීවරයෙකු එය ඉදිරිපත් කිරීමෙන් පසුව පාර්ලිමේන්තුවේ සම්මත වීම වාර්තාගත සිද්ධියක් විය.

ගැබ්ගත් කාන්තාවකගේ ශාරීරික සහ මානසික සෞඛ්‍යයට ( physical & mental health ) හානියක් ඇති වීමේ හැකියාවක් ඇත්නම් හෝ තවත් දරුවෙක් ඉපදීම නිසා ඇයට සිටින්නා වූ අනෙක් දරුවන්ට ශාරීරික හෝ මානසික සෞඛ්‍යට හානියක් ( eugenic ) ඇති වේ නම් හෝ බිහිවීමට සිටින දරුවාට ශාරීරික හෝ මානසික ආබාධයක් ( physicaly & mentally handicapped ) ඇති වීමේ හැකියාව ඇත්නම් හෝ ලියාපදිංචි වෛද්‍යවරයෙකුට නීත්‍යානුකූල ගබ්සාවක් කළ හැකි ආකාරයට බ්‍රිතාන්‍යය ගබ්සා නීතිය ලිහිල් කළේ ය.

වර්තමානයේ පවතින්නා වූ අධිතාක්ෂණික ක්‍රම ( high technology ) මගින් මවගේ ගර්භාෂය තුළ භ්‍රෑණය තිබෙන කාලයේ දී ම දරුණු සහජ රෝග ( severe congenital diseases ) තිබේදැ යි හඳුනාගත හැකි ය. දරුණු මන්දබුද්ධික තත්ත්වයන් ඇති කරවන ටේසැක්ස් රෝගය ( Tay Sach`s disease ) සහ හන්ටින්ටන් කොරියා රෝගය ( Hungtinton chorea ), සහ උරහිසේ, උකුලේ සහ ගාත්‍රාවල ඇති පේශීන් ( muscular ) කල්යාමේ දී දුර්හරනය ( dystrophy ) වීමෙන් පක්ෂාගාතය ඇති කරවන රෝග, සුව කිරීමට නො හැකි ගනයේ සමහරක් රෝග වන්නේ ය. මෙම රෝගවලින් පෙළෙන මවකට දරුවන් ඉපදීමෙන් පසුව ඔවුන් හදා වඩා ගැනීම දෙමාපියන්ට ඉමහත් හිරිහැරයක් වන අතර, එවැනි දරුවන් බිහිවීමෙන් සමාජයට අවැඩක් ද සිදුවේ. එමනිසා එවැනි දරු ගැබ් ගබ්සා කිරීම, ඇතැම් රටවල නීත්‍යානුකූල කර ඇත.

ගැබ්ගත් කාන්තාවකට එවැනි භ්‍රෑණයක් තිබේදැ යි සොයා ගැනීම සඳහා භාවිතා කරන එක් ක්‍රමයක් නම්, අධිසංඛ්‍යාත අතිධ්වනික තරංග භාවිතා කර උදරය ස්කෑන් කිරීමයි ( high frequency ultra sound scanning ). මෙම ක්‍රමය එතරම් සතුටුදායක ප්‍රතිඵල ලබා දෙන්නක් නො වේ. මීට වඩා සාර්ථක ප්‍රතිඵල ලබා දෙන අනෙක් ක්‍රම දෙක නම්, කලලාවාරික ශතට ක්‍රමය ( amniocentesis ) සහ කෝරියම් අංගුලිකා ( chorionic villi sampling ) නියැදි ක්‍රමයයි. කලලාවාරික ශතට ක්‍රමයෙන් කරනුයේ, දිග ඉදිකටුවක් ගර්භණී කාන්තාවගේ උදරය තුළින් ඇම්නියණය ( amnion ) තුළට ඇතුළු කර ඇම්නියන කුහරයේ තිබෙන තරලයේ ( amniotic fluid ) සාම්පලයක් ගනු ලැබීම ය. භ්‍රෑණයෙන් ගැලවී ආ එම තරලයේ ඇති ශෛල සති දෙකක් හෝ හතරක් පමණ කාලයක් තුළ රෝපණය ( culture ) කොට ඒවා පසුව වර්ණදේහ අසාමාන්‍යකම් ( chromosome abnormality ) සඳහා පරීක්ෂා කරනු ලැබේ. මෙය හැඳින්වෙන්නේ න්‍යෂ්ඨික වර්ණ කිරීම ( karyotyping ) ලෙස ය.

කලලාවරික ශතක ක්‍රමය පාවිච්චි කිරීමෙන් සියයට එකක ගබ්සා වීමේ අවදානමක් ඇත. කෝරියම් අංගුලිකා සාම්පල ක්‍රමය ( chorionic villi sampling ) මීට වඩා නවීන ක්‍රමයකි. මෙහිදී ද ගර්භනී කාන්තාව නිර්වින්දනය කොට ඇයගේ ගර්භාෂයේ ගැබ් ගෙල තුළින් නලයක් ඇතුල් කොට අංගුලිකා සාම්පලයක් ලබා ගෙන න්‍යෂ්ඨික වර්ණ කිරීම කරනු ලැබේ. මෙම ක්‍රමයේ දී පැය විසි හතරකින් ප්‍රතිඵල ලබා ගත හැකි වුවත්, සියයට පහත් විස්සත් අතර ප්‍රමාණයේ ගබ්සා වීමේ අවදානමක් ඇත.

අනාරක්ෂිත ක්‍රම ( aseptic ) භාවිතා කරමින් ආලෝකය ( lighting ) සහ වාතාශ්‍රය ( ventilation ) නොමැති, අපිරිසිදු කාමර තුළ වර්ෂයකට නීතිවිරෝධී ගබ්සා මිලියන තිහක් පමණ ඉන්දියාවේ ද සිදු කරන බවට නිල නො වන වර්තාවල සඳහන් වී තිබේ. එවැනි නීති විරෝධී ගබ්සා කිරීමෙන් පසුව කාන්තාවන් මිලියන දහයක් පමණ ඉන්දියාවේ දී මිය යන බව වාර්තා වී ඇත. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ දී වර්ෂ එක් දහස් නවසිය හැටහතේ දී සම්මත කර ගන්නා ලද නව ගබ්සා නීතිය වර්ෂ එක්දහස් නවසිය හැත්තෑ එකේ දී ඉන්දියානු පාර්ලිමේන්තුව මගින් ද සම්මත කර ගන්නා ලදී.

Scanned with CamScanner

එක්දහස් නවසිය අනූපහේ දී අධිකරණ සහ ව්‍යවස්ථා කටයුතු අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාවේ දැනට පවතින ගබ්සා නීතිය ලිහිල් කිරීමට වර්ෂ එක්දහස් නවසිය අනූපහේ සැප්තැම්බර් දහ නවවෙනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට යෝජිත පනතක් ( bill ) ඉදිරිපත් කරන ලදී. විවිධ ආගම් අදහන අය සහ ගබ්සා කිරීමට විරෝධ කණ්ඩායම් ( anti abortionist ) මගින් දැඩි විරෝධතාවන් එල්ල වූ නිසා ඇමැතිවරයා විසින් ගබ්සා නීතිය ලිහිල් කිරීමට ඉදිරිපත් කරන ලද යෝජිත පනත පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස් කර ගන්නා ලදී.

සති දොළහක කාලසීමාවකට වැඩි භ්‍රෑණයන් ගබ්සාවක් කිරීමෙන් ඉවත් කරන විට එම භ්‍රෑණයේ දැඩි දැඟලීමත්, හෘද ස්පන්දනය මිනිත්තුවකට දෙසීයයත් ( සාමාන්‍යයෙන් කළලයේ හෘද ස්පන්දනය මිනිත්තුවකට එකසිය විස්සයි ) දක්වා ඉහළ යන බවත් භ්‍රෑණයේ මුඛය නො නවත්වා විවෘතවන බවත් ගබ්සාව කරනු ලබන අවස්ථාවේ දී ගනු ලැබූ ස්කෑන් පරීක්ෂාවේ දී ( ultra sound scan ) සොයා ගෙන තිබේ. ගබ්සා කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා භ්‍රෑණය විසින් කරනු ලබන නිශ්ශබ්ද විරෝධතාවයන් ( silent protest ) ලෙස ඉහත සඳහන් ලක්ෂණ ( features ) ගබ්සාව ලිහිල් කිරීමට විරුද්ධ කණ්ඩායම් විසින් පෙන්වා දී ඇත.

ශිෂ්ඨ සම්පන්න සමාජයක පවත්නා සිරිත් අනුව සහ විවිධ ආගම්වල මූලධර්ම අනුව ජීවිතයක් විනාශ කිරීම පිළිනොගන්නාවූ පිළිකුල් සහගත ක්‍රියාවකි. එනමුත්, දූෂණයකින් ( rape ) හෝ නීතිවිරෝධී ඥාති ලිංගික සම්බන්ධතාවයකින් ( incest ) ඇතිවන ගැබ්භාවයක් හෝ ඉපදීමට ඇති දරුවා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙළෙන්නෙකු යැයි ගැබ් කාලය තුළ දී සොයා ගත් විට හෝ **පමණක්** ගබ්සා කිරීම් සුදුසු බව ගබ්සා නීතිය ලිහිල් කිරීමට උද්ඝෝෂනය කරන අය පෙන්වා දී ඇත. එබැවින්, ගබ්සාවලින් සිදුවන මරණ සංඛ්‍යාව සහ කාන්තාවන්ට එයින් සිදුවන අතුරු ආබාධ අවම කර ගැනීමට නම් ශ්‍රී ලංකාවේ ද සුදුසුකම් ලැබූ විශේෂඥ වෛද්‍යවරයෙකු ලවා විවාහක කාන්තාවන්ට ගබ්සාවන් සිදු කර ගැනීමට නීත්‍යානුකූල අවසරය සහ පහසුකම් ලබා දිය යුතු බව ද එසේ කිරීමෙන් අප රටේ ඉපදෙන සෑම දරුවෙකුම සුජාත ( wanted child ) දරුවෙකු වන අතර ඔවුන් රටට අවශ්‍ය සම්පතක්



වන බව ද ගබ්සා නීතිය ලිහිල් කිරීමට උද්ඝෝෂණය කරන කණ්ඩායම්වල මතය වී තිබේ.

නීත්‍යානුකූල ගබ්සාවක් කළ හැක්කේ ලියාපදිංචි කළ වෛද්‍යවරයෙකුට පමණකි. පහසුකම් ඇති රජයේ රෝහලක හෝ පෞද්ගලික රෝහලක පුහුණු වෛද්‍යවරයෙකු විසින් කාන්තාව නිර්වින්දනය ( under general anasthesia ) කිරීමෙන් පසුව ශල්‍යාගාරයේ දී ගැබ් ගෙල විස්තරණය කොට ගැබ්භාවය ඉවත් කරනු ලැබේ. එයට "ඩී ඇන්ඩ් සී" ( dilatation & curettage ) හෝ "ඩී ඇන්ඩ් ඊ" ( dilatation & evacuation ) යැයි භාවිතා කරනු ලැබේ. මේ සඳහා ගැබ් කාලය අනුව රුපියල් පහළොස් දාහේ සිට විසිපන්දාහ අතර මුදලක් පෞද්ගලික රෝහල් විසින් අය කරනු ලැබේ. මෙවැනි විශාල මුදලක් වියදම් කළ හැක්කේ ධනවත් අයට පමණි.

දිළිඳු භාවයෙන් පෙළෙන කාන්තාවන් ගබ්සාවක් කර ගැනීමට යන්නේ ලියාපදිංචි නොවූ සුදුසුකම් නොමැති අයවලුන් වෙත ය. නීතිවිරෝධී ගබ්සා කර ගැනීමට පැමිණෙන කාන්තාවන්ට නිර්වින්දනය ( general anaesthesia ) නො කර ඔවුන් විසින් ගබ්සා කරනු ලැබේ. තවද, ජීවානුහරණය ( sterilization ) නො කළ උපකරණ පවා භාවිතා කරමින් ඩී ඇන්ඩ් සී හෝ ඩී ඇන්ඩ් ඊ හෝ රික්ත පොම්ප ක්‍රමය ( vacuum aspiration ) පාවිච්චි කොට ගබ්සා කරනු ලැබේ. බොහෝවිට ගබ්සාවට ලක්වන කාන්තාවන්ට එහි අතුරුඵලයක් වශයෙන් ලේ විෂ වීමෙන් ( septecaemia ) හෝ ගර්භාෂයෙන් රුධිරය වහනය වීමෙන් මිය යෑම සිදු වේ. මෙම ක්‍රම පාවිච්චි කළ හැක්කේ කලලයට සති දොළහට අඩු නම් පමණි. මෙවැනි ගබ්සාවන් කිරීමට රුපියල් හත්සිය පනහේ සිට රුපියල් දාහ දක්වා අතර මුදලක් ඔවුන් විසින් අය කරනු ලැබේ.

සමන්ති වැනි තරුණියකගේ ජීවිතය අකාලයේ විනාශ වූයේ මෙවැනි නීති විරෝධී ගබ්සාවක් කිරීමෙනි. නීති විරෝධී ගබ්සාවක් කිරීමේ දී සමන්තිගේ මරණය සිදුවූ බව වෛද්‍ය පරීක්ෂණයේ දී නිගමනය වූ බැවින්, ඒ පිළිබඳව සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමට හැකි විය.



Scanned with CamScanner

විශාලව විස්තරනය වී තිබූ ගැබ් ගෙල සහ ගැබ් ගෙලෙහි තිබූ තුවාල, ගර්භාෂය තුළ තිබූ භ්‍රෑණයක හිස සහ සමන්තිගේ රුධිරය තැවරී තිබූ යෝනිය පරීක්‍ෂා කිරීමට පාවිච්චි කළ උපකරණය මරණයට හේතුව සහ එය නීති විරෝධී ගබ්සාවක් කිරීමෙන් සිදුවූ බව සොයා ගැනීමට උපකාරී වූ "නිහඬ සාක්ෂි " වශයෙන් සැලකිය හැකි ය.



# අවි ගත්තෝ අවියෙන්ම නසිති

බල්ටි සෝමේ, ඔහුගේ අන්වර්ථ නාමයයි. ලියනපටබැදිගේ සෝමපාල යනු ඔහුගේ නියම නමයි. ඉහළට පැන ප්‍රතිවාදියාට පයින් පහර දීමේ ආත්මාරක්‍ෂක සටන් ක්‍රමය ප්‍රගුණ කළ අයෙකු නිසා සෝමපාලට බල්ටි සෝමපාල යන නාමය පටබැඳී තිබුණි. ඔහු අවුරුදු තිස් දෙකක් පමණ වයස වූ අවිවාහකයෙකි. ඔහු ජීවත් වූයේ, කොළඹ පිහිටි ඉතා ජනාකීර්ණ, දූෂිත ක්‍රියාවලට නම් දරා තිබූ පෙදෙසක් වන බෝල මේසවත්තේ අනවසර බිම් කොටසක ලෑලිවලින් සාදා ගත් කාමරයක ය. එම පැල්පත්වල සිටි බොහෝ දෙනා කටුක ජීවිතයක් ගත කළ හ. එහි ජීවත් වූ බොහෝ තරුණයින් මුදල් උපයා ගැනීමට කළේ පික්පොකට් ගැසීම, හොර අරක්කු විකිණීම, මත්ද්‍රව්‍ය විකිණීම යනාදියයි.

බල්ටි සෝමෙට ගෝල බාල තරුණයින් කීපදෙනෙක්ම සිටිය හ. ආත්ම ආරක්‍ෂක ක්‍රීඩාවක් වූ බල්ටි ක්‍රීඩාවෙහි නිපුණත්වයක් ලැබූ අයකු බවට බල්ටිසෝමේ එම ප්‍රදේශයේ ප්‍රසිද්ධව සිටි බැවින් කවුරුත් ඔහු ගැන එක්තරා බියක් ඇති කර ගෙන තිබුණි. පික්පොකට් ගැසීමට තරුණයන් යෙදවීමෙන් ද හොර අරක්කු ජාවාරමෙන් සහ මත් කුඩු ජාවාරමෙන් ද ලැබූ මුදලෙන් ඔහු එදිනෙදා දිවි පෙවෙත ගෙන ගියේ ය. පාතාල ලෝකයේ සිදුවන විශාල පරිමාණයේ මංකොල්ල කෑම්වලට ඇතැම් විට ඔහු සහභාගි විය. නගරයේ ධනවත් මුදලාලිලා ද, කොන්ත්‍රාත්කරුවෝ මෙන්ම ඇතැම් දේශපාලඥයෝ ද බල්ටිසෝමේව ළඟින්ම ඇසුරු කළෝ ය. බොහෝ විට එවැනි අය බල්ටි සෝමේගේ ආධාරය පැතුවේ ඔහුට මුදල් දී තම හතුරන් ඝාතනය කර දැමීම සඳහා ය.

හිටිහැටියේ බල්ටි සෝමේ අතුරුදහන් විය. බල්ටි සෝමේගේ අතුරුදහන්වීම ගැන බෝලමේස වත්තේ කවුරුත් ප්‍රසිද්ධියේ කථා කිරීමට බියක් දැක්වූ හ. ඔහු පාතාල ලෝකයේ ප්‍රබල සාමාජිකයකු වූ බැවින් ඔහුට යම්කිසි අනතුරක් සිදු වී ඇති බව ඔවුන් සිතන්නට ඇත. බල්ටි සෝමේ බෝලමේස වත්තේ කෙතරම් බලවත්ව තම අනසක පතුරුවා ගෙන සිටියත් ඔහුගේ අතුරුදහන්වීම ගැන පොලිසියට පැමිණිල්ලක්වත් ඉදිරිපත් කිරීමට කිසිවෙකු හෝ ඉදිරිපත්



Scanned with CamScanner

නො වී ය. බල්ටි සෝමේගේ අතුරුදහන්වීම ගැන නම් ඔහුට කප්පම් දෙන කුඩා කඩ හිමියෝ යටි හිතින් සතුටු වූ හ.

බල්ටි සෝමේ අතුරුදහන්වී සති දෙකකට පසුව කොළඹ ප්‍රසිද්ධ ඇළක මළසිරුරක් පාවෙමින් තිබී සොයා ගන්නා ලදී. මියගිය තැනැත්තා හඳුනා ගැනීමට නො හැකි තරමට මළසිරුර දැඩි ලෙස කුණු වී, ඉදිමී, විරූප වී තිබිණ. කමිසයේ, යට කලිසමේ සහ සරමේ ඔජස් සහ කුණු ලේ තැවරී තිබුණි. මළසිරුර බල්ටි සෝමේගේ බව කීපදෙනෙක්ම පොලිසියට දැන්වූ හ. "වැදූ අම්මා බුදු වේවා" යැයි කොටා තිබූ පච්චය පපුවේ ඉදිරියෙහි අපැහැදිලි ලෙස දක්නට තිබුණි. මළසිරුර බල්ටි සෝමේගේ බව හඳුනා ගැනීමට මෙය ද උපකාරී විය. බල්ටි සෝමේගේ චරිතය සහ ජීවනෝපාය මාර්ගය ගැන දන්නා අය ඔහුගේ මරණය ගැන දුක් වූයේ නැත.

බල්ටි සෝමේගේ මරණය පිළිබඳව මහේස්ත්‍රාත්වරයා හදිසි මරණ පරීක්ෂණයක්.පැවැත් විය. වේගයෙන් මාර්ගයේ ධාවනය වූ වාහනයක හැපීම නිසා හිස්කබල කුඩුපට්ටම් වී මොළය දැඩි ලෙස තුවාල වීම නිසා බල්ටි සෝමේගේ මරණය සිදු වී ඇති බවට පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වැඩබලන අධිකරණ වෛද්‍ය නිලධාරියා වාර්තා කළේ ය. කොළඹ පිහිටි එම ඇළට ආසන්නව වාසය කළ පැල්පත් වාසියකු මරණ පරීක්ෂණයේ දී කියා සිටියේ, බල්ටි සෝමේගේ කුණු වූ මළසිරුර හමුවීමට දින හතකට පෙර රාත්‍රී තමා නිවසට එන විට මාර්ගයේ වේගයෙන් ධාවනය වූ වාහනයක යමෙකු හැපෙනු ශබ්දයක් ඇසුනු බවය. හැප්පීමත් සමග වාහනයේ ලයිට් නිවා ටික වේලාවක් නතර කර තිබීමෙන් පසුව නැවත වරක් ගමන ආරම්භ කොට වේගයෙන් ධාවනය වන්නට වූ බවත්, එම සිද්ධිය වන විට තමා සිටියේ ඊට යාර දෙසීය පනහක් පමණ ඈතින් බැවින් ද, එම අවස්ථාව මැදියම් රැය බැවින් ද, නිශ්චය වශයෙන් තමාට ඊට වැඩිය යමක් කිව නො හැකි බව ද මරණ පරීක්ෂණයේ දී හෙතෙම තවදුරටත් කියා සිටියේ ය. එම තැනැත්තාගේ සාක්ෂියත්, වැඩබලන අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් මරණයට හේතුව වශයෙන් ඉදිරිපත් කොට තිබූ වාර්තාවත් සලකා බැලූ මහේස්ත්‍රාත්වරයාගේ තීන්දුව වූයේ මාර්ගයේ වේගයෙන් ධාවනය වූ රථයක බල්ටිසෝමේ හැපීමෙන් පසුව ඔහුගේ සිරුර එම ඇළට දමා ගොස් ඇති බව ය. මරණ පරීක්ෂණය අවසාන වීමෙන් පසුව මළසිරුර භාර ගැනීමට



කිසිවකු නො සිටි බැවින්, " රජකම් කළත් කළකම් පල දෙනවාය " යන කියමන සනාථ කරමින් රජයේ වියදමින් බොරැල්ලේ පොදු සුසාන භූමියේ දී බල්ටි සෝමේගේ මළසිරුර මිහිදන් කෙරිණි.

මළසිරුර භූමදානය කර සතියකට පසු පරීක්ෂණය භාර පොලිසියට නිර්නාමික පෙත්සමක් ලැබුණි. බල්ටි සෝමේ මරණයට පත්වූයේ වාහනයක හැපීමෙන් නොව ඔහු මරා දමා වෑන් රථයකින් ගෙනවිත් කොළඹ පිහිටි එම ඇළට දමා ඇති බව එම පෙත්සමෙහි සඳහන් වී තිබුණි. පරීක්ෂණය භාර පොලිසියේ ස්ථානාධිපතිවරයා එම පෙත්සම ඔහුගේ අධීක්ෂණ නිලධාරියා වූ සහකාර පොලිස් අධිකාරී වෙත ඉදිරිපත් කළේ ය. පෙත්සම නිර්නාමික එකක් වුවත් බල්ටි සෝමේ නම් දරා ඇති පුද්ගලයකු බැවින් මිහිදන් කොට තිබූ මළසිරුර ගොඩ ගෙන විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියකු ලවා දෙවන වරටත් වෛද්‍ය පරීක්ෂණයක් කළ යුතු බවත්, ඒ සඳහා මෝසමක් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලෙසටත් සහකාර පොලිස් අධිකාරීවරයා විසින් පොලිස් ස්ථානාධිපතිවරයාට උපදෙස් දෙන ලදී. ඒ අනුව, බල්ටි සෝමේගේ මළසිරුර ගොඩ ගෙන නැවත වෛද්‍ය පරීක්ෂණයක් කිරීම සඳහා විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කළේ ය.

හදිසි මරණ පරීක්ෂණයක් ( inquest ) පැවැත්වීමෙන් පසුව, මරණය සිදුවූ ආකාරය පිළිබඳව තීන්දුවක් ලබාදීමට නොහැකි වන අවස්ථා ඇත. මරණය සිදුවූ ආකාරය පිළිබඳව තවදුරටත් පරීක්ෂණ මෙහෙයවා වාර්තා කිරීමට එවැනි අවස්ථාවන්හි දී හදිසි මරණ පරීක්ෂකවරයා විසින් පොලිසියට නියෝග කරනු ලැබේ. මෙයට විවෘත තීන්දුවක් ( open verdict ) යැයි කියනු ලැබේ. එවැනි තීන්දුවක් දුන් අවස්ථාවක ඥාතීන්ට මළසිරුර භූමදානය කිරීමට අවකාශ තිබෙන නමුත් ආදාහනය කළ නො හැකි ය. අපරාධ නඩු විධාන සංග්‍රහය ( criminal procedure code ) යටතේ අධිකරණයේ අවශ්‍යතාවක් මත දෙවනවරටත්, මළසිරුරක වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීමට බලය ඇත්තේ, පළාතේ මහේස්ත්‍රාත්වරයාට පමණි. එවන් අවස්ථාවන්වල දී වෛද්‍ය පරීක්ෂණය පවත්වනු ලබන්නේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයෙකු විසින්ම ය. හදිසි මරණ පරීක්ෂකවරයා විසින් ලබා දී ඇති තීන්දුව ගැන සෑහීමකට පත් නො වන අවස්ථාවල දී ඥාතීන්, මහේස්ත්‍රාත් අධිකරණයට දිවුරුම්

Scanned with CamScanner

පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් පසුව නැවත වරක් වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීමට ඉල්ලා සිටින අවස්ථා මෑත කාලයේ සිට සීඝ්‍රයෙන් වැඩිවී ගෙන එන බව දක්නට ලැබේ. ඥාතීන්ගේ එවැනි ඉල්ලීම්වලට මහේස්ත්‍රාත්වරුන් බොහෝ විට ඉඩ දෙනු ලැබේ.

හදිසි මරණ පරීක්ෂකවරුන් ( inquirers into sudden deaths ) පත් කරනු ලබන්නේ අධිකරණ අමාත්‍යවරයා විසින් ය. ජනගහනය අනුව එක් මහේස්ත්‍රාත් අධිකරණ බල ප්‍රදේශයකට හදිසි මරණ පරීක්ෂකවරුන් කීපදෙනකු පත් කරනු ලැබේ. එසේ පත්කරනු ලබන හදිසි මරණ පරීක්ෂකවරුන්ට හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්විය යුතු ආකාරය ගැන සංවිධානාත්මක උපදෙස් මාලාවක් (guidance) අධිකරණ අමාත්‍යාංශය මගින් ලබා නො දීම කණගාටුවකට කරුණකි. හදිසි මරණ පරීක්ෂණයක දී ඉදිරිපත් වන සාක්ෂිවල විශ්වාසනීයභාවය ගැන තක්සේරුවක් කිරීමේ දී පළපුරුද්දක් නොමැති හදිසි මරණ පරීක්ෂකවරුන් අසීරු තත්ත්වයන්ට මුහුණ දෙන අවස්ථා ඇත. හදිසි මරණ පරීක්ෂණයේ දී සාක්ෂි මෙහෙයවීමට අදාල, පොලිසිය විසින් බොහෝවිට පත් කර එවනු ලබන්නේ ද පළපුරුද්ද නොමැති කණිෂ්ඨ උප පොලිස් කොස්තාපල්වරයෙකු ( reserve police constable ) ය. මෙවැනි දුර්වලතා නිසා එක් අවස්ථාවකින් නිම කළ හැකිව තිබූ පරීක්ෂණය නැවත කිරීමට සිදු වූ වාර බොහෝ ය. එවැනි ක්‍රියාවලින් මහජනයා අසීරු තත්ත්වයකට පත්වන ,අතර එය මහජන මුදල් අපතේ යැවීමක් ද වනු ඇත.

ගෙල වැලදා ගෙන එල්ලීමෙන් සිය දිවි හානිකර ගත් එක්තරා ගැහැණියක විසින් මිය යෑමට පෙර ලියන ලද යැයි සැලකූ ලිපියක්, හදිසි මරණ පරීක්ෂණය සිදු කළ අවස්ථාවේ දී ඇයගේ සැමියාට පෙන්වා නො තිබූ නිසාත්, තම භාර්යාවගේ මරණය මනුෂ්‍ය ඝාතනයක් බව ඇයගේ සැමියා අධිකරණයට වාර්තා කිරීමෙන් පසුව, මෙම ස්ත්‍රියගේ මරණය සිදුවූ ආකාරය සොයා ගැනීමට, දෙවැනි වරටත් හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්වීමට සිදු විය. එහිදී හෙළි වූ කරුණු අනුව කලින් සඳහන් ලිපිය ඇය විසින් ලියන ලද්දක් නො වන බව පසුව හෙළි විය. තවද, මෙම ස්ත්‍රිය සිය දිවි හානි කර ගෙන නො තිබූ බවත්, කවුරුන් විසින් හෝ ඇයගේ ගෙල මිරිකා මරණයට පත් කොට පසුව මළසිරුර එල්ලා ඇති බවත්, දෙවැනි වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව තහවුරු විය.



හදිසි මරණ පරීක්ෂණයක් පවත්වන අවස්ථාවේ දී හදිසි මරණ පරීක්ෂකවරයාට මහේස්ත්‍රාත්වරයෙකුට ඇති ඇතැම් බලතල ඇත. විශේෂඥ වෛද්‍යවරයෙකු ඇතුළු ඕනෑම කෙනකු හදිසි මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දීම සඳහා කැඳවීමට හදිසි මරණ පරීක්ෂකවරයාට අවකාශ ඇත. එවැනි නියමයන් පැහැර අරින තැනැත්තෙකු පිළිබඳව පළාතේ මහේස්ත්‍රාත්වරයාට වාර්තා කිරීමෙන් පසුව, හදිසි මරණ පරීක්ෂකවරයා වෙත එම තැනැත්තා ඉදිරිපත් විය යුතු බවට වරෙන්තු නිකුත් කිරීමටද මහේස්ත්‍රාත්වරයාට බලය ඇත. එවැනි නියෝගයකට අවනත නො වන ඕනෑම කෙනෙකු වරදක් කර ඇතැයි සලකා රුපියල් සියයකට නො වැඩි දඩයකට හෝ තුන් මාසයක් බන්ධනාගාර ගත කරවීමට අධිකරණයට බලය ඇත. හදිසි මරණ පරීක්ෂක තනතුරුවලට, පත් කළ යුත්තේ සමාජයේ පිළිගත් සහ අධ්‍යාපන සුදුසුකම් ඇති පුද්ගලයන් විය යුතු ය. කොරනර්වරයකු ( coroner·) ලෙස එංගලන්තයේ පත් කරනු ලබන්නේ දිවුරුම් දීමෙන්, අවම වශයෙන් අවුරුදු පහක් නීතිඥයෙකු වශයෙන් සේවය කිරීමෙන් පසුව ය. එසේ නැතහොත් අවම වශයෙන් එංගලන්තයේ වෛද්‍ය කවුන්සලයේ පූර්ණ ලියාපදිංචිවීම ලබා, අවුරුදු පහක්වත් සේවයේ යෙදී සිටි වෛද්‍යවරයෙකු විය යුතු ය. හදිසි මරණ පරීක්ෂක තනතුරු හුදෙක් රැකියාවක් හෝ නම්බුවක් ලෙස නො සලකා සමාජයේ අත්දැකීම් ඇති ප්‍රභූවරුන් සේ සලකනු ලබන උගත් අය පත්කිරීම බලධාරීන්ගේ වගකීම සහ යුතුකම වන්නේ ය.

කැඩී බිඳී ගිය බල්ටි සෝමේගේ හිස් කැබලි සියල්ලක්ම වතුරෙන් තම්බා වේලා හිස් කබල ස්වාභාවිකව පිහිටා ඇති ආකාරයටම සකස් කොට, මැලියම්වලින් අලවා අධිකරණ වෛද්‍යවරයා පරීක්ෂා කළේ ය. හිස් කබලේ ඉදිරිපස උඩ පිහිටි ලලාට අස්ථියේ ( frontal bone ) මිලිමීටර් නවයක විෂ්කම්භයක් සහිත ආසන්නව පිහිටි සිදුරු දෙකක් දක්නට ලැබිණි. එම සිදුරු දෙකෙහිම දාරයෙහි ( margin ) මිලිමීටරයක් පළල මැකීමට නො හැකි කළු පැහැති දාරයක් විය. එම සිදුරුවල දාර හිස් කබලේ ඇතුළට පට්ටම් වී ( bevelled ) තිබිණි. තවද, හිස් කබලේ පත්ලේ දකුණු පැත්තේ සහ වම් පැත්තේ විශාල අක්‍රමික හැඩය ඇති සිදුරු දෙකක් විය. හිස් කබලේ උඩ ලලාට ප්‍රදේශයෙහි තිබුණේ වෙඩි උණ්ඩ දෙකක් හිස් කබලට ඇතුල් වීමේ දී (entrance) සිදුවූ සිදුරු බවත්, හිස් කබලේ පත්ලේ දෙපැත්තේ තිබූ විශාල සිදුරු දෙක වෙඩි උණ්ඩ පිටවීමේ දී ( exit ) ඇති වුණු



Scanned with CamScanner

ඒවා බවත් විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. හිස්කබල තුළ වෙඩි උණ්ඩ නො වී ය. හිස් කබලේ පතුලේ වෙඩි පහරවල් පිටවීමේ තුවාල තිබුණ නිසා පිට වූ උණ්ඩ කොඳු ඇට පෙළෙහි කශේරුකාවක් තුළ හිරවී (impacted) ඇත්දැයි දැන ගැනීමට මළසිරුරේ කඳ කොටස එක්ස් කිරණ පරීක්‍ෂාවට භාජනය කරන ලදී. පපුවේ දෙවැනි කශේරුකාව තුළ හිරවී තිබූ උණ්ඩයේ ඡායාව එක්ස් කිරණ පටලයේ දක්නට ලැබුණි. ඒ අනුව, කොඳු ඇටයෙහි හිරවී තිබූ වෙඩි උණ්ඩය වෛද්‍යවරයා විසින් ඉවත් කොට පොලිසියට භාර දෙන ලදී. බල්ටි සෝමේ මරණයට පත්වී ඇත්තේ වාහනයකට හැපීමෙන් නොව පිස්තෝලයක් ඔහුගේ හිසට උඩින් ඉතා ආසන්නව තබා දෙවරක් වෙඩි තැබීමෙන් බව අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. තවද, හිස්කබලේ පතුලේ දෙපැත්තෙහිම වෙඩි පහර දෙකෙහිම පිටවීමේ තුවාල දක්නට තිබුණු නිසා බල්ටි සෝමේ බිම හිඳ ගෙන සිටින විට සාහසිකයා ඔහුගේ හිසට උඩින් පිස්තෝලයක් තබා වෙඩි දෙකක් තැබීමෙන් ඔහුගේ මරණය සිදු කර ඇති බව අධිකරණ වෛද්‍යවරයා තවදුරටත් වාර්තා කළේ ය. අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව සලකා බැලූ මහේස්ත්‍රාත්වරයාගේ තීන්දුව වූයේ බල්ටි සෝමේගේ හිසට දෙවරක් වෙඩි තැබීමෙන් පසුව බල්ටි සෝමේගේ සිරුර, මළසිරුර හමු වූ ඇළට දමා ගොස් ඇති බව ය. ඒ අනුව, මෙය මනුෂ්‍ය ඝාතනයක් බවත් ඝාතකයා අැල්ලීමට පියවර ගන්නා ලෙසත් මහේස්ත්‍රාත්වරයා විසින් පොලිසියට නියෝග කරන ලදී.

බල්ටි සෝමේ පාතාල ලෝකයේ සාමාජිකයකු වුවත් ඔහුගේ ඝාතකයා සෙවීමට පොලිසිය යුහුසුළු විය. ඒ සඳහා බල්ටි සෝමේගේ කුළුපඟ මිත්‍රයින්ගෙන් ද පොලිසිය විසින් සාක්ෂි සටහන් කර ගන්නා ලදී. බල්ටි සෝමේ කොන්ත්‍රාත්තුවට මිනීමරණ අයකු බවත් පළාතේ මැර බලය පාවිච්චි කරන මුදලාලි කෙනෙකු වූ සියදෝරිස් මුදලාලි වෙනුවෙන්, කීපවතාවක්ම කොන්ත්‍රාත්තුවට බල්ටි සෝමේ මිනීමරා ඇති බවත් එම සාක්ෂිවලින් එළිදරව් විය. හැඩිදැඩි සියදෝරිස් මුදලාලි පළාතේ චණ්ඩිකම් කරමින් කසිප්පු පෙරීමේ ජාවාරමේ යෙදී සිටි කෙනකු වුවත් පළාතේ පොලිසිය සහ දේශපාලඥයන් සමග මිත්‍රත්වයකින් වාසය කළේ ය. සියදෝරිස් මුදලාලිගේ කසිප්පු ජාවාරාම කරදරයක් නොමැතිව නීතියේ රැහැනින් මිදී කර ගෙන යාම සඳහා මසකට වරක් පළාතේ පොලිසියට රුපියල් විසිපන්දහසක



කප්පමක් ගෙවන බවට ද කට කථා පැතිර තිබුණි. තමාගේ චරිතය ඝාතනය කිරීමට, ඔහුට ඊර්ෂ්‍යා කරන පළාතේ අනිකුත් මුදලාලිලා විසින් බල්ටි සෝමේගේ මරණය තමා වෙත පැවරීමට දරන ලද බොළඳ ප්‍රයත්නයක් බව හෙතෙම කට උත්තරය ගැනීමට ගිය පොලිස් නිලධාරීන්ට දැන්වී ය. ඔහුගේ සාක්ෂි සටහන් කිරීමෙන් පසුව පරීක්‍ෂණය තවදුරටත් ඉදිරියට ගෙන යාමට පොලිසිය එතරම් උද්යෝගයක් දැක්වූයේ නැත. මේ වන විට බල්ටි සෝමේගේ මරණය සිදුවී සති හයක් පමණ ගතවුවත් ඝාතකයා සෙවීමට පළාතේ පොලිසිය උනන්දු නො වන්නේ මෙය සියදෝරිස් මුදලාලිගේම ක්‍රියාවක් නිසා බවත්, ඔවුන් සියදෝරිස් මුදලාලි සමග දැඩි මිත්‍රකම් පවත්වන නිසා බවත් පැවසෙන විවිධ නිර්නාමික පෙත්සම් උසස් පොලිස් නිලධාරීන් වෙත ගලා එන්නට විය. ඉන් පසුව, බල්ටි සෝමේගේ ඝාතකයා සෙවීම රහස් පරීක්‍ෂක දෙපාර්තමේන්තුවට භාර කරන ලදී.

පළමුවෙන්ම රහස් පරීක්‍ෂක දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්‍ෂක නිලධාරීන් විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා හමුවී, බල්ටි සෝමේ මරා දමා තිබූ ආකාරය පිළිබඳව සාකච්ඡා පැවැත්වී ය. බල්ටි සෝමේ නිතර මත් පැන් බොන අයකු බැවින් අධික ලෙස මත් පැන් බී මුත්‍රා කිරීමට වාඩිවී සිටින විට ඔහුගේ හිසට උඩින් ආසන්නව පිස්තෝලයක් තබා දෙවරක් වෙඩි තැබීමෙන් ඔහු මරා, පසුව වාහනයක් තුළ දමා ගෙනවිත් මළසිරුර හමුවූ ඇළට දමන්නට ඇති බවත් අධිකරණ වෛද්‍යවරයා උපකල්පනය කොට රහස් පරීක්‍ෂක නිලධාරීන්ට පැවසුවේ ය. ආත්ම ආරක්‍ෂක සටන් ක්‍රම ප්‍රගුණ කළ බල්ටි සෝමේට එක එල්ලෙහි මුහුණට මුහුණලා වෙඩි තැබීම දුෂ්කර ක්‍රියාවක් බැවින් ද ඔහු මත් පැන්වලට ගිජු වූ අයකු බැවින් ද වෛද්‍යවරයා එම නිගමනයට පැමිණියේ ය. මළසිරුර කොළඹ පිහිටි එම ඇළෙහි තිබුණත් කොළඹ වැනි ජනාකීර්ණ ප්‍රදේශයක හොර රහසේ වෙඩි තැබීමක් සිදු කිරීම දුෂ්කර දෙයක් බව වෛද්‍යවරයාගේ මෙන්ම රහස් පරීක්‍ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ද මතය විය. වෙඩි තබා ඇති තුවක්කුව සොයා ගතහොත් එම තුවක්කුවට වෙඩි උණ්ඩයක් දමා වෙඩි තැබීමෙන් පසුව එම වෙඩි උණ්ඩයේ තිබිය හැකි රැළි, මළසිරුරේ හිරවී තිබුණ උණ්ඩයේ තිබිය හැකි රැළි සමග, සංසන්දන අන්වීක්‍ෂයකින් (comparison microscope) ගිනි අවි විශේෂඥයා (ballistic expert) විසින්



Scanned with CamScanner

පරීක්ෂා කිරීමෙන් පසු වෙඩි තැබූ පිස්තෝලය හඳුනා ගත හැකි බව තවදුරටත් විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් රහස් පරීක්ෂක පොලිස් නිලධාරීනට පෙන්වා දෙන ලදී. එම උපදෙස් අනුව නැවත වරක් සියදෝරිස් මුදලාලිගෙන් සාක්ෂි සටහන් කිරීමට රහස් පොලිසියේ නිලධාරීන් තීරණය කළේ ය. ඒ අනුව, රහස් පොලිසියේ නිලධාරීන් සියදෝරිස් මුදලාලිට අයත් වාහන ගැන ඔහුගෙන් ප්‍රශ්න කළේ ය. සියදෝරිස් මුදලාලිට වෑන් රථ දෙකක් තිබෙන බවත්, ඉන් එකක බොඩිය දිරාපත්වී ඇති බැවින් ටින්කර් වැඩ කිරීම සඳහා කොළඹ ගරාජයකට දමා ඇති බවත් හෙතෙම රහස් පොලිසියේ නිලධාරීන්ට පැවසුවේ ය. පසුව එම වෑන් රථය රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ව්‍යවහාරක විද්‍යාඥයා විසින් පරීක්ෂා කරන ලදී. වෑන් රථයේ තිබූ ගෝනි කීපයක දුඹුරු පැහැති පැල්ලම් කීපයක් ඇති බවත් එම පැල්ලම් මනුෂ්‍ය රුධිරයේ ඒ බී (AB) වර්ගයට අයත් බවත් වාර්තා කොට තිබුණි. ඩයි කරන ලද කෙස් ගස් ස්වල්පයක් ද ගෝනි අතර තිබූ බව රස පරීක්ෂක වාර්තාවෙහි තවදුරටත් සඳහන් වී තිබුණි.

එම වාර්තාවෙන් පසුව බෝලමේස වත්තේ පිහිටි බල්ටි සෝමේ නැවතී සිටි කාමරය රහස් පරීක්ෂක නිලධාරීහු පරීක්ෂා කළෝ ය. එම කාමරයේ තිබී රෝග විනිශ්චය පතක් සොයා ගන්නා ලදී. මීට අවුරුද්දකට පමණ පෙර බල්ටි සෝමෙට පිහියකින් ඇනීමේ සිද්ධියක දී ඔහුව කොළඹ මහ රෝහලට ඇතුල් කර ශල්‍යකර්මයකට භාජනය කිරීමෙන් පසුව AB වර්ගයේ රුධිරය ලබා දුන් බව 'එම රෝග විනිශ්චය පතේ ( diagnosis card ) සටහන් කොට තිබුණි. බල්ටි සෝමේගේ කාමරයේ කණ්නාඩි මේසයේ කොණ්ඩ ඩයි වර්ගයක් ද ඒ සඳහා පාවිච්චි කරන ලද පීරිසියක් සහ දත් බුරුසුවක් ද විය. කාමරයේ තිබූ එම පීරිසිය සහ පනාව ද පරීක්ෂාව සඳහා රස පරීක්ෂක වෙත ඉදිරිපත් කරන ලදී. පනාවේ රැඳී තිබූ හිස කෙස් සහ ගෝනියේ තිබූ කෙස් ගස් මනුෂ්‍ය කෙස් බවත් ඒවා බොහෝ දුරට එකම අයෙකුගේ බවත් වාර්තා කොට තිබුණි. ගෝනියේ තිබූ කොණ්ඩ ගස්වල තැවරී තිබූ ඩයි සහ බල්ටි සෝමේගේ කාමරයේ තිබී සොයා ගන්නා ලද ඩයි එක හා සමාන රසායනික වර්ගයේ ඒවා බව ද තවදුරටත් වාර්තා කොට තිබුණි. තවද, බල්ටි සෝමේගේ මළසිරුර ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා ලද්දේ සියදෝරිස් මුදලාලි ටින්කර් වැඩ සඳහා ගරාජයට දමා තිබූ වෑන් රථය බවට



පොලිසිය සැක කළේ ය. ඒ අනුව බල්ටි සෝමේගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් සියදෝරිස් මුදලාලි පොලිස් අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කරන ලදී. වෑන් රථය පැද වූ රියදුරා ඉදිරිපත් කරන ලෙස සියදෝරිස් මුදලාලිට පොලිස් නිලධාරීහු බල කර සිටිය හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් රියදුරු ඉදිරිපත් කිරීමෙන් පසුව ඔහු සිදුවූ සියල්ල පාපොච්චාරණය කළේ ය.

සියදෝරිස් මුදලාලිගේ ඉල්ලීම අනුව මීට පෙර මියගිය බල්ටි සෝමේ කීප දෙනකුම මරා දමා ඇති බව රියදුරා පැවසී ය. බල්ටි සෝමේ මෑතක සිට සියදෝරිස් මුදලාලිගෙන් නිතරම මුදල් ඉල්ලීමට පටන් ගත් බවත් මුදල් නො දුනහොත් සියදෝරිස් මුදලාලිගේ ඉල්ලීම පරිදි තමා කළ මිනීමැරීම් සහ මංකොල්ලකෑම් පොලිසියට හෙළිදරව් කරන බවත් බල්ටි සෝමේ සියදෝරිස් මුදලාලිට කීප වාරයක් තර්ජනය කරනු තමාට ඇසී ඇති බවත් රියදුරා වැඩිදුරටත් පැවසී ය. සියදෝරිස් මුදලාලිට මෙය හිසරදයක් වූ බැවින් කුලියට මිනීමරණ අයකු ලවා බල්ටි සෝමේ මරා දැමීමට සියදෝරිස් මුදලාලි කටයුතු කළ බව තමා දන්නා බව රියදුරා පොලිසිය ඉදිරියේ ප්‍රකාශ කර සිටියේ ය. රියදුරා හෙළි කළ පරිදි මරණය සිදු කර ඇත්තේ මෙසේ ය.

සියදෝරිස් මුදලාලිගේ හතුරෙකු වන රේස් බුකිකරුවකු වූ ජුවානිස් මුදලාලි මරා දැමිය යුතු බවත් ඒ සඳහා බල්ටි සෝමේගේ ආධාරයට කොන්ත්‍රාත්තුවට මිනීමරණ අයකු එවන බවත් ඔහු සමග එකතු වී මෙය ඉක්මණට කළ යුතු බවත් සියදෝරිස් මුදලාලි දිනක් බල්ටි සෝමේට දැන්වී ය. එම කොන්ත්‍රාත්තුවට අත්තිකාරම් වශයෙන් සියදෝරිස් මුදලාලි රුපියල් දහදාහක් බල්ටි සෝමෙට ලබා දී ඇත. ජුවානිස් මුදලාලි වෙඩි තබා මරා දැමීමෙන් පසුව ඉතුරු රුපියල් පහළොස් දාහ දීමට සියදෝරිස් මුදලාලි බල්ටි සෝමේට පොරොන්දු විය. මුදලට ගිජුවූ බල්ටි සෝමේ රුපියල් දහදාහ දැක එම යෝජනාවට එකඟ විය. කුලියට මිනීමරණ කොන්ත්‍රාත්කරුවාත් බල්ටි සෝමේත් ජුවානිස් මුදලාලිට වෙඩි තබා මරා දැමීම සඳහා සවස හයට පමණ සියදෝරිස් මුදලාලිගේ වෑන් රියට නැග පිටත් වූ හ. අතර මග දී අරක්කු බෝතලයක් ගැනීමට කොන්ත්‍රාත් මිනීමරන්නා බල්ටි සෝමෙට යෝජනා කළේ ය. අරක්කු වලට දැඩි ලෙස ගිජු වූ බල්ටි සෝමේ එයට එකඟ වී දෙදෙනාම පාර අයිනේ



Scanned with CamScanner

තිබෙන අරක්කු බීම හලකට ගොඩවී අරක්කු බෝතලයක් ගෙ පානය කළෝ ය. වෑන් රියට ගොඩ වී නැවතත් ගමන ආරම්භ කොට මද දුරක් ගිය විට මුත්‍රා කිරීමට අවශ්‍ය බව බල්ටි සෝමේ වෙරිමතින් පැවසූ බැවින් වෑන් රථය පාර අයිනේ පාලු ගෙවල් නොමැති පෙදෙසක නැවැත්විය. වෑන් රිය පිටුපසට ගිය බල්ටි සෝමේ ඉදගෙන මුත්‍රා කරන විට කෙසෙල්වත්තේ කොන්ත්‍රාත් මිනීමරුවා බල්ටි සෝමේගේ හිස මතට වෙඩි පහරවල් දෙකක් තැබූ බවත්, සුළු වේලාවකින් බල්ටි සෝමේ මැරී ඇද වැටුනු විට ඔහුගේ මළසිරුර වෑන් රියට දමා පසුව කොළඹට රැගෙන විත් නිවාස නොමැති පෙදෙසක දී ඇළට දැමූ බවත් රියදුරු පැවසී ය. පොලිසිය විසින් පසුව කරන ලද පරීක්ෂණ අනුව සියදෝරිස් මුදලාලිගේ රියදුරා විසින් පෙන්වන ලද බීමහල හඳුනා ගන්නා ලදී. දෙදෙනෙකු වෑන් රථයකින් පැමිණ අරක්කු බෝතලයක් මිළට ගත් බවත් දෙදෙනාම එය පානය කළ බවත් බීමහලේ සේවකයා විසින් සනාථ කරන ලදී.

ඒ අනුව, බල්ටි සෝමේට වෙඩි තැබීමට පාවිච්චි කළ තුවක්කුව සොයා ගැනීමට පොලිසියට අවශ්‍ය විය. නැවත වරක් පොලිසිය සියදෝරිස් මුදලාලිගෙන් ප්‍රශ්න කළ අතර අනතුරුව ඔහුගේ නිවස පරීක්ෂා කරන ලදී. එහි දී පිස්තෝලයක් පොලිසියට අසු විය. එම පිස්තෝලය ළඟ තබා ගැනීමට බලපත්‍රයක් නො මැති වුවත් එය තමාගේ ආරක්ෂාව සඳහා තබා ගන්නා බව සියදෝරිස් මුදලාලි පොලිසියට පැවසී ය. මිලිමීටර් නවයේ උණ්ඩ එම පිස්තෝලයට දමා වෙඩි තැබීමෙන් පසුව එම වෙඩි උණ්ඩ බල්ටි සෝමේගේ මළසිරුරේ තිබී සොයා ගන්නා ලද උණ්ඩය සමග සන්සන්දන අන්වීක්ෂයක් මගින් ගිනි අවි විශේෂඥයා විසින් පරීක්ෂා කරන ලදී. සියදෝරිස් මුදලාලිගේ නිවසේ සඟවා තිබූ පිස්තෝලයට මිලිමීටර් නවයේ උණ්ඩ දමා වෙඩි තැබීමෙන් පසුව ලබා ගන්නා ලද වෙඩි උණ්ඩ මතුපිට තිබූ ඇලිවල සහ බල්ටි සෝමේගේ කොඳු ඇට පෙළෙන් සොයා ගත් උණ්ඩයේ මතුපිට තිබූ ඇලිවල (rifling marks) සමානකම් ( similarities in rifling marks ) ඇති බව ගිනි අවි විශේෂඥයා වාර්තා කොට තිබුණි. ඒ අනුව, බල්ටි සෝමේගේ කොඳු ඇට පෙළෙහි තිබී සොයා ගත් උණ්ඩය පත්තු කොට ඇත්තේ සියදෝරිස් මුදලාලිගේ නිවසේ තිබූ පිස්තෝලයෙන් බව රසායනාගාර පරීක්ෂණවලින් ඔප්පු විය. සියලු විද්‍යාත්මක සාක්ෂි සලකා බැලීමෙන් පසුව සහ සියදෝරිස මුදලාලිගේ වෑන් රථය පැදවූ රියදුරා



නඩු විභාගයේ ... පැමිණිල්ලේ සාක්ෂිකරුවකු වශයෙන් සාක්ෂි දීමෙන් පසුව සියදෝරිස් මුදලාලිට මරණීය දණ්ඩනය නියම විය. අපි ගත්තෝ අපිමයි නසිති යන කියමන බල්ටි සෝමේගේ කථාවෙන් සනාථ විය.

වෙඩි වැදීමෙන් මියගොස් ඇති බව සැක කළ විට කෙතරම් කුණුවී ඇති මළසිරුරක් වුවත් විච්ඡේදනය ( dissection ) කිරීමට පෙර නයිලෝන් බෑග් ( body bag ) එකක දමා එක්ස් කිරණ පරීක්ෂාව සිදු කොට ක්‍රමාණුකූලව හා නිසියාකාරව මුළු ශරීරයම දැඩි ලෙස පරීක්ෂාවට ලක් කරන්නේ නම් බොහෝ අවස්ථාවල මරණය සිදුවූ සත්‍ය ආකාරය අධිකරණ වෛද්‍යවරයාට සොයාගත නැකි බව මෙම සිද්ධියෙන් මොනවට පිළිඹිබු නො වන්නේ ද?

බල්ටි සෝමේගේ පොඩි පට්ටම් වී ගිය හිස් කබලේ තිබූ සිදුරු, එහි වටා තිබූ කළු පැහැති දාරය, සිදුරුවල ඇතුල් පැති පට්ටම් වීම, ක්ශේරුකාවල හිර වී තිබූ උණ්ඩයේ මතුපිට තිබූ කුඩා ඇලි (small grooves on the bullet) සහ සියදෝරිස් මුදලාලිගේ වෑන් රථයේ තිබූ ගෝනියේ තැවරී තිබූ රුධිර පැල්ලම්, රෝග විනිශ්චය පත සහ කෙස් ගස් යන ඒවා බල්ටි සෝමේගේ මිනීමරුවා සහ මරණයට හේතුව සොයා ගැනීමට උපකාරී වූ " නිහඩ සාක්ෂි " ලෙස පැලකිය හැකි ය.



Scanned with CamScanner

# ගුරු ගෙදර යුවතිය

අවුරුදු හතළිස් නවයක් වයසැති විජේසේන ඉස්කෝලෙ මහතාත්, ඔහුගේ බිරිය වන අවුරුදු හතළිස් පහක් වයසැති කුසුමා ඉස්කෝලෙ හාමිනේත්, වාම් දිවියක් ගත කළ යුවලකි. දෙදෙනාම දක්‍ෂ ගුරුවරු වූ අතර පාසල් වේලාවෙන් පසු සවස් වරුවේ හා නිවාඩු දිනවල සිසුන්ට නොමිලේ උපකාරක පංති ද පැවැත්වූ හ. නැතිබැරි අයට උදව් කරමින් ආගමානුකූල ව යහපත් දිවි පෙවෙතක් ගත කළ මෙම ගුරු යුවල, ගමේ කාගේත් ආදරයට හා ගෞරවයට පාත්‍රව සිටිය හ. කාලය මෙසේ ගෙවී යන අතර කුසුමා ඉස්කෝලෙ හාමිනේගේ දුප්පත්, සහෝදරියකගේ අවුරුදු දහඅටක් පමණ වයසැති ස්වර්ණලතා නම් වූ දියණියක් රැකියාවක් සොයා ගැනීමේ අරමුණින් යුතුව, විජේසේන යුවලගේ නිවසේ නතර වීමට පැමිණියා ය. ස්වර්ණලතා දිගැති මුහුණක් ඇති ආකර්ශණීය කෙස් කළඹකින් හා හැඩකාර පෙනුමකින් යුතු තරුණියක විය. දරුවන් නොමැති ඉස්කෝලෙ මහතා ස්වර්ණලතාට දැඩි ආදර කරුණාවක් දැක්වූයේ ය.

ඇය, විජේසේන නිවසට පැමිණ අවුරුදු එකහමාරක් පමණ ගත වීමෙන් පසුව, වරින් වර එම නිවසේ අඬදබර ඇති වන්නට විය. ඊට හේතු වූයේ ස්වර්ණලතාට ඉස්කෝලෙ මහතා දැක් වූ විශේෂ ලෙන්ගතුකම ඔහුගේ බිරිඳගේ නො රිස්සුමට ලක්වීම ය. මේ පිළිබඳව සමහර දිනවල දී, ස්වර්ණලතා ඉදිරිපිට දී පවා ඉස්කෝලෙ මහතාත් ඉස්කෝලෙ හාමිනේත් අතර උණුසුම් වචන හුවමාරුවීම් ඇති විය. ස්වර්ණලතා කෙරෙහි තමා තුළ ඇත්තේ, දියණියකට ඇති සෙනෙහසක් මිස වෙනත් හැඟීමක් නො වන බව ඉස්කෝලෙ මහතා ඔහුගේ බිරිඳට නොයෙක් විට පහදා දුන්නත්, ඇය ඉන් සෑහීමකට පත් නො වූවා ය. තම ස්වාමිපුරුෂයා තවත් ගැහැණියකට සෙනෙහසක් දැක්වීම තමාට දරා ගත නො හැකි බව කුසුමා ඉස්කෝලෙ හාමිනේ තරයේම ප්‍රකාශ කළා ය. ස්වර්ණලතාගේ පැමිණීමෙන් පසු ඔවුන් දෙදෙනා අතර තිබූ සමගිය බිඳ වැටීම පිළිබඳව විජේසේන යුවල සාකච්ඡා කිරීමෙන් අනතුරුව පවුලේ සාමයත්, ගෞරවයත් ආරක්‍ෂා කිරීමට ඇය රැකියාවක් සඳහා තම නිවසින් පිටත් කර යැවීමට ගුරු යුවල තීරණය කළ හ. ඒ අනුව, සංගීත ගුරුවරියන් පුහුණු කරන ලලිත කලා ආයතනයක් කොළඹ



තිබුණු බැවින්, ස්වර්ණලතා එහි යැවීමට ගුරු යුවල කතිකා කර ගත් හ. එහෙත්, එම අදහසට ස්වර්ණලතා දැඩි ලෙස අකමැති වූවා ය. එම යෝජනාවට එකඟ වන ලෙස විජේසේන යුවල ස්වර්ණලතාට බල කරන්නට වූ අතර, ඒ පිළිබඳව ස්වර්ණලතා සතියක පමණ කාලයක් කළ යුත්තේ කුමක් දැයි, කල්පනා කරමින් හුදකලාව ගත කළා ය.

කොළඹ යාමට තිබෙන දිනට පෙර දින රාත්‍රී කෑම මේසයේ දී ස්වර්ණලතාගේ අනාගතය ගැන නැවතත් විජේසේන යුවල සාකච්ඡා කළ හ. ස්වර්ණලතාගේ පියා ඇගේ මව අත්හැර ගොස් තිබුණි. දරුවන් දෙදෙනෙකු සමග ස්වර්ණලතාගේ මව කටුක ජීවිතයක් ගත කරන නිසා සංගීත ගුරුවරියක් ලෙස පුහුණු වීමට ස්වර්ණලතා කොළඹ යෑම සියලුම දෙනාගේ යහපතට හේතු වන බවත් විජේසේන යුවල ඇයට නැවත වරක් පහදා දුන් හ. ඇය යුවතියක් නිසා අනාගතයේ දී පවුල් ජීවිතයක් ගත කිරීම සමාජ චාරිත්‍රයක් බව ද, ඔවුන් නැති වූ දවසක ස්වර්ණලතාට යන එනමං නැති විය හැකි බව ද, එබැවින් සංගීත ගුරුවරියක් වීම ඇයගේ අනාගතයේ සුභ පෙර නිමිත්තක් බව ද විජේසේන යුවල තවදුරටත් ස්වර්ණලතාට පැහැදිලි කර දුන් හ. අසරණ වූ තමාට කාගේ හෝ පිහිටක් නොමැති බැව් ස්වර්ණලතාට ඒත්තු ගියා ය. විජේසේන නිවසට තමාගේ පැමිණීමෙන් ඔවුන්ගේ පවුලේ සාමය බිඳී ඇති බව තේරුම් ගත් ස්වර්ණලතා, අවසානයේ දී සංගීත ගුරුවරියක වශයෙන් පුහුණුවීම සඳහා කොළඹ යෑමට කැමැත්ත ප්‍රකාශ කළා ය.

ඊට පසු දින ස්වර්ණලතා සමග කොළඹ යාම සඳහා දුර ගමන්වල ධාවනය වන බස් රථයක ආසනයක් වෙන් කර ගැනීමට නගරයේ පිහිටි පෞද්ගලික බස් රථ ගාලට ගිය ඉස්කෝලෙ මහතා ගෙදර පැමිණි විට ඔහුගේ නිවස වසා ඇති බව පෙණුනි. දොරට තට්ටු කළ නමුත් නිවසේ කිසිවකු නොවූ බව ඉස්කෝලෙ මහතාට වැටහුණි. එවිටම අසල්වැසියෙක් පැමිණ ස්වර්ණලතා රෝහලට ගෙන ගිය බව ඉස්කෝලෙ මහතාට පැවසුවේ ය. ස්වර්ණලතාගේ කොළඹ ගමනට අවශ්‍ය දෑ සකස් කරමින්, ඉස්කෝලෙ හාමිනේ නිවස ඇගේ කාමරයේ සිටි බවත්, සවර්ණලතා කල්පනා කරමින් නිවස ඉදිරිපිට තණකොළ බිස්සේ ඇවිදිමින් සිටි බවත් ඔහුට සිහිපත් විය. ඒ වන ඉස්කෝලෙ මහතා කලබල වී වහාම රෝහලට ගියේ ය.



Scanned with CamScanner

විට රෝහලේ බාහිර අංශයේ රෝගීන් ඇතුල් කරන වෛද්‍යවරයාට කුසුමා ඉස්කෝලෙ හාමිනේ සිද්ධිය විස්තර කරමින් සිටියා ය. වාට්ටුවට ඇතුළත් කර විනාඩි පහළොවකින් පමණ, වාට්ටුව භාර වෛද්‍යවරයා පරීක්ෂා කිරීමටත් පෙර ස්වර්ණලතා මිය ගොස් තිබුණි.

අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය ( criminal procedure code ) යටතේ, යම් තැනැත්තෙකු සිය දිවි නිසා ගෙන ඇති බවට, හෝ යම් සතකු විසින් මරණයට පත් කරනු ලැබ ඇති බවට හෝ යම් යන්ත්‍රෝපකරණයක් නිසා නැතහොත් යම් අහඹුවක් නිසා මරණයට පත්වී ඇති බවට, හෝ හදිසියේ හෝ නො දන්නා හේතුවකින් හෝ මිය ගොස් ඇති බවට තොරතුරක් ලැබුණු විට, සෑම මරණ පරීක්ෂකවරයෙකුම, එසේ මියගිය තැනැත්තාගේ සිරුර තිබෙන ස්ථානයට නො පමාව යා යුතු ය. හෙතෙම එහි දී පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර, සිරුරේ දක්නට ඇති තුවාල, කැඩුම් බිඳුම්, සීරීම් සහ වෙනත් තුවාල ලකුණු ද ස්වකීය මතය අනුව, මරණයට හේතුව හා සම්බන්ධ විය හැකි ලකුණු, ද්‍රව්‍ය සහ අවස්ථාගත කරුණු ද විස්තර කරමින් සහ පෙනී යන අන්දමට ඒ ලකුණු ඇති වී තිබෙන්නේ කවර ආකාරයකින් ද යන වග සඳහන් කරමින්, මරණය පිළිබඳ දෘශ්‍යමාන හේතුව දැක්වෙන වාර්තාවක් සකස් කළ යුතු ය. මරණ පරීක්ෂණය නිමා කිරීමෙන් පසුව හදිසි මරණ පරීක්ෂකවරයා විසින් එහි සම්පූර්ණ වාර්තාවක් පළාතේ මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කළ යුතු වේ.

ස්වර්ණලතා රෝහලට ඇතුල් කරන විට, සිහිමද ගතියෙන් පසු වූවා ය. වස පානය කළ තැනැත්තකු රෝහලට ඇතුල් කිරීමෙන් පසුව මිය ගියේ නම්, එම තැනැත්තා මිය යාමට පෙර කටඋත්තරයක් ලබා දී තිබුණි නම් වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්විය යුතු ද නැද්ද යන්න තීරණය කරන්නේ හදිසි මරණ පරීක්ෂණයේ දී ( inquest ) ඉදිරිපත් කරනු ලබන සාක්ෂි අනුව ය. එම සාක්ෂිවල විශ්වාසනීයභාවය පිළිගැනීමට නො හැකි වූ විට හදිසි මරණ පරීක්ෂකවරයා විසින් පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණයක් කළ යුතු බවට නියම කරනු ලැබේ. අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ හදිසි මරණ පරීක්ෂකවරයකු හෝ මහේස්ත්‍රාත්වරයකු, රජයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියකුට හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයන්හි අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍යවරයකු ලවා පශ්චාත්



මරණ පරීක්ෂණයක් ( post mortem examination ) පවත්වා මරණයට හේතුව ( cause of death ) ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබේ. මියගිය තැනැත්තා නිසැකව හඳුනා ගැනීම සහ මරණය සිදු වූයේ ස්වාභාවිකව ද, නැතිනම් අහඹුවකින් ද, නැතිනම් සිය දිවි හානි කර ගැනීමකින් ද නැතහොත් වෙනයම් අයකු විසින් ස්වේච්ඡාවෙන් කරනු ලැබූ ක්‍රියාවකින් ද ( act caused voluntarily ), මළසිරුරේ මරණයට පෙර සහ මරණයට පසුව සිදුව ඇති සියලුම බාහිරව සහ අභ්‍යන්තරයේ ඇති තුවාල සටහන් කිරීම සහ ඒවා සිදු වූ ආකාරය ගැන උපකල්පනයන් කිරීම, රුධිරය, මුත්‍රා, පිත, ආමාශයේ සහ කුඩා බඩවැලේ අන්තර්ගත දෑ රජයේ රස පරීක්ෂක වෙත යැවීමට ලබා ගැනීම, සහ පරීක්ෂණය පිළිබඳව වාර්තාවක් පොලිසියට සහ අධිකරණයට ඉදිරිපත් කිරීම යන මේවා අධිකරණය පවත්වන පශ්චාත් මරණ පරීක්ෂණයේ පරමාර්ථයන් වේ.

මරණයෙන් පසුව වෛද්‍යවරයා විසින් මළසිරුර විච්ඡේදනය ( dissection of dead body - මළසිරුර "කැපීම" ) කිරීම ගැන මහජනයා තුළ ඇත්තේ දැඩි අකමැත්තකි. පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීම වැලැක්වීම සඳහා ඥාතීන් දැඩි ලෙස වෙහෙස මහන්සි දැරීම බොහෝ අවස්ථාවල දක්නට ලැබේ. අභිරහස් ලෙස යමෙකු මරා දමා, ගෙල වැලදා ගෙන සිය දිවි හානි කර ගෙන ඇති බව හැඟවීමට හෝ, මියගිය තැනැත්තා රේල් පාරේ ගමන් කරමින් සිටින විට දුම්රියක හැපී මිය ගොස් ඇති බව හැඟවීමට උත්සාහ කර ඇති අවස්ථා අපගේ පරීක්ෂණවල දී හෙළි වී ඇත. තවද, යමකු කර්මාන්ත ශාලාවක හෝ වැඩ බිමක, රාජකාරියේ යෙදී සිටින අවස්ථාවක මියගිය විට, සේවාදායකයාගෙන් වන්දියක් ලබා ගැනීමට නම් මරණය සිදු වී ඇති හේතුව සහ එය සිදු වී ඇති ආකාරය අධිකරණයක දී ඔප්පු කිරීමට අධිකරණ වෛද්‍යවරයෙකු ලවා මළසිරුරක් විච්ඡේදනය කොට මරණයට සත්‍ය හේතුව සොයා ගැනීම හැර වෙන විකල්පයක් නැත.

තම අනියම් පෙම්වතියගේ පුරුෂයා වූ රසල් ඉන්ග්‍රම් නැමති අයකු මරණයට පත් කිරීමේ චේතනාවෙන් ( guilty intention / mens rea ) දේවගැති මැතිව් පීරිස් විසින් දියවැඩියා රෝගය ( diabetes mellitus ) සඳහා පාවිච්චි කරනු ලබන ඉයුග්ලුකෝන් ( euglycon ) නැමති ඖෂධ පෙති රහසිගතව ඉන්ග්‍රම්ට ලබා දීමෙන්, ඉන්ග්‍රම්ගේ



Scanned with CamScanner

මරණය සිදු කොට, ඉන්ග්‍රම් මිය යාමට හේතුව අධික ලෙස ඉන්සුලින් ( insulin ) හෝමෝනය නිපදවන ගෙඩියක් ( tumour ) ඉන්ග්‍රම්ගේ අග්න්‍යාශයේ ( pancreas ) හටගැනීම බව පෙන්වීමට දේවගැති පීරිස් උත්සාහ කළ ආකාරය, අප රටේ මහත් ආන්දෝලනයට පත් වූ නඩු විභාගයක් විය.

ස්වර්ණලතා වස පානය කිරීමෙන් මියගිය බවට සාක්ෂි තිබුණු බැවින් හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්වී ය. හිටිහැටියේම ස්වර්ණලතා අඩමින් තමාගේ කාමරයට දුවගෙන ආ බවත්, ස්වර්ණලතාගේ මුවින් දැඩි ලෙස කෘමි නාශක ගඳ වහනය වූ බවත්, ඇය වස පානය කළ බව පැවසූ බවත්, මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දුන් ඉස්කෝලෙ හාමිනේ පැවසුවා ය. ඉස්කෝලෙ මහතා ඒ වෙලාවෙහි නගරයට ගොස් තිබුණ බවත්, තමන් විසින් ස්වර්ණලතා වත්තම් කර ගෙන වහාම රෝහලට රැගෙන ගිය බවත්, කුසුමා ඉස්කෝලෙ හාමිනේ මරණ පරීක්ෂණයේ දී තවදුරටත් පැවසුවා ය. ස්වර්ණලතාගේ මුඛයෙන් කෘමිනාශක ගඳ වහනය වූයේ දැයි, තමාට නිසැකවම කිව හැකි දැයි හදිසි මරණ පරීක්ෂකවරයා ඉස්කෝලෙ හාමිනේගෙන් සෘජුව ප්‍රශ්න කළේ ය. ඊට පිළිතුරු දුන් කුසුමා ඉස්කෝලෙ හාමිනේ ප්‍රකාශ කළේ, කෘමිනාශක ගඳ දැඩි ලෙස ස්වර්ණලතාගේ මුඛයෙන් වහනය වූ බව ය. ස්වර්ණලතා වස පානය කළ බවට කුසුමා ඉස්කෝලෙ හාමිනේ සාක්ෂි දුන් නමුත්, එය සනාථ කිරීමට වෙනත් සාක්ෂියක් නො තිබුණ නිසාත්, මෙම සිද්ධිය පිළිබඳව කට කථා පැතිර ගොස් තිබුණ නිසාත්, ස්වර්ණලතා රෝහලට ඇතුල් කරන විට සිහිමද ගතියෙන් සිටි නිසාත්, ස්වර්ණලතා විසින්ම වස පානය කළ බවට ඇය විසින් කටඋත්තරයක් ලබා දී නො තිබූ නිසාත්, වෛද්‍ය පරීක්ෂණයක් පවත්වා මරණයට හේතුව වාර්තා කිරීමට හදිසි මරණ පරීක්ෂකවරයා විසින් අධිකරණ වෛද්‍යවරයාට නියම කරන ලදී. ඒ අනුව, අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් ස්වර්ණලතාගේ වෛද්‍ය පරීක්ෂණය පැවැත්වී ය.

ස්වර්ණලතාගේ ආමාශයේ භූමි තෙල් ගඳ වහනය වන සුදු පැහැති ඝණ ද්‍රව්‍යයක් තිබූ බවත්, ආමාශය රත් පැහැති වී එහි ඇතුල් පැත්තේ කුඩා ලේ ලප දක්නට තිබූ බවත්, එම හේතු නිසා කෘමිනාශක පානය කිරීමෙන් ස්වර්ණලතා මිය ගොස් ඇතැයි පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයා වාර්තා කොට



තිබුණි. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව සහ පොලිසිය විසින් ඉදිරිපත් කරන ලද සියලු සාක්ෂි සටහන් කිරීමෙන් අනතුරුව, කෘමිනාශක පානය කිරීමෙන් ස්වර්ණලතා සිය දිවි හානි කර ගෙන ඇති බවට හදිසි මරණ පරීක්ෂකවරයා තීන්දු කිරීමෙන් පසු භූමිදාන කටයුතු සඳහා පවුලේ ඥාතීන් ඉදිරිපත් නොවූ බැවින් ඇයගේ මළසිරුර ඉස්කෝලෙ මහතා වෙත භාර දෙන ලදි.

ස්වර්ණලතාගේ වියෝව ආරංචි වූ පවුලෙන් වෙන්ව සිටි ඇයගේ පියා, ස්වර්ණලතාගේ භූමිදාන කටයුතු සිදු කොට දින දෙකක් ගත වූ පසු අධිකරණය වෙත මෝසමක් ඉදිරිපත් කළේ ය. හදිසි මරණ පරීක්ෂණයට සාක්ෂි දීම සඳහා ස්වර්ණලතාගේ දෙමාපියන්ට දැන්වීමක් විජේසේන යුවල විසින් හෝ පරීක්ෂණය භාර පොලිසිය විසින් කර නො තිබුණ බවත්, තම දියණියට සිය දිවි හානි කර ගැනීමට තරම් හේතුවක් නො තිබුණ බවත්, විජේසේන ඉස්කෝලෙ මහතා ස්වර්ණලතාට තිබූ සෙනෙහස නො රිස්සූ ඉස්කෝලෙ හාමිනේ විසින් තම දියණිය මරා දමා ඇති බවට තමා සැක කරන බවත්, අධිකරණයට ඉදිරිපත් කරන ලද මෝසමෙහි සඳහන් විය.

ස්වර්ණලතාගේ මරණය පිළිබඳව හදිසි මරණ පරීක්ෂණයක් පවත්වා, ඊට අමතරව වෛද්‍යවරයා විසින් පශ්චාත් මරණ පරීක්ෂණයක් ද පවත්වා තිබුණි. එහෙත්, ස්වර්ණලතාගේ දෙමාපියන් සාක්ෂි දීමට හදිසි මරණ පරීක්ෂණයට කැඳවා නො තිබුණි. එම හේතුවෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ ඇති බලතල අනුව ස්වර්ණලතාගේ මළසිරුර ගොඩ ගෙන නැවත වරක් වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විශේෂඥ අධිකරණ වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් කරන ලෙසට අධිකරණය විසින් නියෝග කරන ලදී. ඒ අනුව, විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත ස්වර්ණලතාගේ මළසිරුර ඉදිරිපත් කරන ලදී. එම්බාම් කරන ලද ස්වර්ණලතාගේ මළසිරුරේ අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ඉවත් කොට තිබුණි. මරණයට හේතුව වස ශරීරගතවීමක් නිසා ස්වර්ණලතාගේ අභ්‍යන්තර ඉන්ද්‍රියයන් තුළ වස තිබේ දැයි, සොයා ගැනීම සඳහා, ඒවා වළලා තිබූ ස්ථානයෙන් ගොඩ ගෙන, ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස අධිකරණ වෛද්‍යවරයා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරන ලදී. එම ඉල්ලීමට අධිකරණයෙන් අවසර ලැබුණි. ඒ අනුව පළමු පශ්චාත් මරණ පරීක්ෂණයට සහභාගි වූ කම්කරුවන් ලවාම ස්වර්ණලතාගේ

මළසිරුරෙන් ඉවත් කරන ලද ඉන්ද්‍රියයන් වළලා තිබූ. මෘත ශරීරාගාරය ආසන්නයේම වූ රෝහල් භූමියේ අදාල ස්ථානය කැණීම් කොට, වළලා තිබූ ඉන්ද්‍රියයන් ගොඩ ගෙන, විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට සිදු විය.

එම්බාම් නො කිරීම නිසා ස්වර්ණලතාගේ මළසිරුරෙන් ඉවත් කරන ලද ඉන්ද්‍රියයන් දැඩි ලෙස කුණුවී තිබුණි. පපුවේ ඇති පෙනහැලි සහ හෘදය සහ උදරයේ ඇති, ආමාශය, බඩවැල්, අක්මාව සහ ප්ලීහාව යනාදී සියලුම අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ඉවත් කොට ෆෝමලින් තැවරූ පරණ රෙදි කැබලි උදරයට සහ පපුවට ඇතුල් කොට සීවනය කිරීම එම්බාම් කිරීමේ දී සිදු කරනු ලැබේ. ඉවත් කරනු ලබන ඉන්ද්‍රියයන් වළලා දමනු ලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් පවත්වා තීන්දුවක් දුන් අවස්ථාවල පවා අවමංගල්‍ය මල්ශාලාකරුවන් මළසිරුරක් එම්බාම් කරන විට අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ඉවත් නො කළ යුතු බවට රෙගුලාසියක් නොමැත. එවැනි රෙගුලාසියක් නොමැතිකම අපරාධ නඩු විධාන සංග්‍රහයේ ඇති එක්තරා අඩුපාඩුවක් ලෙස පෙන්වා දිය හැකි ය. හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්වුවත් මරණය සිදු වූයේ මනුෂ්‍ය ඝාතනයකින් ද, නැතහොත් අහඹු සිදුවීමකින් ද, නැතහොත් සිය දිවි හානි කර ගැනීමකින් ද, එසේත් නැත්නම්, ස්වාභාවික හේතුවක් නිසා ද යන්න ඉදිරිපත් වන සාක්ෂිවලින් සෑම අවස්ථාවක දී ම දැන ගැනීමට නො හැකි වන නිසා, එවැනි පරීක්ෂණ පැවැත් වූ අවස්ථාවල ද මළසිරුරු ආදාහනය නො කොට භූමිදානය කිරීම කළ යුතු බව දන්වන්නේ මේ හේතුව නිසා ය.

අභ්‍යන්තර ඉන්ද්‍රියයන් පරීක්ෂා කිරීමෙන් පසු මරණයට පෙර සිදු වූ තැල්මක් හෘදයේ තිබුණ බවත්, ආමාශයේ සිදුරක් තිබුණ බවත්, පළමු වෛද්‍ය පරීක්ෂණයේ දී එම ආමාශය විවෘත කොට නො තිබුණ බවත්, ආමාශය ( stomach ) හෝ ග්‍රහණිය (duodenum) හෝ ශූන්‍යාන්ත්‍රකය ( jejunum ) හෝ ශේෂාන්ත්‍රකය ( ileum ) යන ඉන්ද්‍රියයන්වල කෘමිනාශක ගඳ නොමැති බවත් ඒ අනුව ස්වර්ණලතා මිය ගියේ කෘමිනාශක පානය කිරීමෙන් නොව, උදරයට පහරදීමක් නිසා බවත් විශේෂඥ වෛද්‍යවරයා විසින් නිගමනය කරන ලදී. කෘමිනාශක ශරීරගත වීමෙන් ස්වර්ණලතාගේ මරණය සිදු වී නොමැති බව සනාථ කිරීමට එම්බාම්කර නොමැති ආමාශය, අක්මාව සහ



ග්‍රහණිය, ශූන්‍යාන්ත්‍රකය, සහ ශේෂාන්ත්‍රකය යන කොටස් රස පරීක්ෂක වෙත යවා ඇති බව අධිකරණ වෛද්‍යවරයා විසින් අධිකරණයට වාර්තා කරන ලදී. විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාගේ වාර්තාව සලකා බැලූ අධිකරණය, රස පරීක්ෂකවරයාගේ වාර්තාව ලැබෙන තුරු මරණයට හේතුව තීරණය කිරීම කල් තැබිය යුතු බවට තීන්දු කළේ ය. තුන් මසකට පසුව රස පරීක්ෂකවරයාගේ වාර්තාව ලැබිණි. ආමාශයේ, අක්මාවේ, ග්‍රහණියේ, ශූන්‍යාන්ත්‍රකයේ සහ ශේෂාන්ත්‍රකයේ යන කොටස් වල කෘමිනාශක නොමැති බව එහි වාර්තා කොට තිබුණි. එබැවින්, ස්වර්ණලතා කෘමිනාශක පානය කොට මිය ගොස් නොමැති බවත් උදරයට පහර දීමෙන් ඇයගේ මරණය සිදු වී ඇති බවත් විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. ඒ අනුව, ස්වර්ණලතාගේ මරණය මනුෂ්‍ය ඝාතනයක් බවට තීරණය කරන ලදී.

මරණයට හේතුව වශයෙන් දක්වා ඇත්තේ පහරදීමක් බැවින් ඉස්කෝලෙ හාමිනේගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීම සඳහා අධිකරණ වෛද්‍ය විශේෂඥයකුගේ සහාය අවශ්‍ය බව විත්තිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥයන්ගේ මතය විය. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය විශේෂඥයකුගේ සහාය ලබා ගන්නා ලදී.

විත්තිය වෙනුවෙන් උපදෙස් ලබා දෙන විශේෂඥ වෛද්‍යවරයා (defence expert ) සවර්ණලතාගේ පළමු පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත් වූ ශ්‍රේණිගත වෛද්‍යවරයාගේ වාර්තාවේ සහතික පිටපත ද, ස්වර්ණලතා රෝහලට ඇතුල් කරන විට නිකුත් කරන ලද ඇඳ ඉහපතේ සහතික පිටපත ද, දෙවන වරට විශේෂඥ වෛද්‍යවරයා විසින් පවත්වන ලද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ සහතික පිටත ද, යන වාර්තා අධිකරණය මගින් ලබා ගෙන අධ්‍යයනය කළේ ය.

පළමු පශ්චාත් මරණ පරීක්ෂණයේ වාර්තාවට අනුව ස්වර්ණලතාගේ ආමාශය විච්ඡේදනය ( dissected ) කළ බව සඳහන් වී තිබුණි. ආමාශයේ ඇතුල් පැත්තේ ලේ ලප තිබූ බවත්, එහි ඇතුල් පැත්ත රත් පැහැති වී එහි කෘමිනාශක ගඳ වහනය වූ බවත්, සඳහන් වී තිබුණි. ග්‍රහණියේ, ශූන්‍යාන්ත්‍රකයේ සහ ශේෂාන්ත්‍රකයේ භූමිතෙල් සුවඳ හමන සහ සුදු පැහැති දියරයක් තිබුණ බවත්



Scanned with CamScanner

මරණයට හේතුව කෘමිනාශක ශරීරගතවීම බව ද වාර්තා කොට තිබුණි. මුහුණේ තුවාල හෝ හෘදය වස්තුවේ තැලීම් තිබුණ බවට වාර්තාවේ සඳහන් වී නො තිබුණි. ජීවත්ව සිටින අයකු කෘමිනාශක පානය කළ විට ආමාශයේ ඇතුල් පැත්ත රත් පැහැති වී ලේ ලප ( vital reaction ) ඇති වීම හට ගනී. මරණයෙන් පසුව යමෙකුට වස පෙව්වේ නම් ආමාශය තුළ වස තිබීමට හැකි වුවත් ග්‍රහණිය, ශුන්‍යාන්ත්‍රකය සහ ශේෂාන්ත්‍රකය දක්වා වස ව්‍යප්ත වන්නේ නැත. තවද, ආමාශය ඇතුල් පැත්තේ ලේ ලප ඇති නො වේ. එම නිසා, ස්වර්ණලතා විසින්ම වස පානය කිරීමෙන්ම මරණය සිදු වී ඇති බව විත්තිය වෙනුවෙන් පෙනී සිටි අධිකරණ වෛද්‍යවරයා විසින් විත්තියේ නීතිඥවරයාට පෙන්වා දුන්නේ ය.

ස්වර්ණලතාට නිකුත් කරන ලද ඇඳ ඉහපත අනුව වෛද්‍යවරයා විසින් වාට්ටුවේ හෙදියන්ට උපදෙස් දී ඇත්තේ ආමාශය සේදීමටත් ( stomach wash ) ඇට්‍රොපින් ( atropine ), ප්‍රැලිඩොක්ස්සීම් (pralidoxime ) සහ ලැසික්ස් ( lasix ) යන ඖෂධ එන්නත් කිරීමටත් ය. ඒ අනුව, මඳ සිහියෙන් සිටි ස්වර්ණලතාගේ මුවින් බටයක් ආමාශයට ඇතුල් කොට ආමාශය පිරිසිදු ජලයෙන් කීප වරක් සෝදන ලද බවත්, බටයෙන් පිට වූ ආමාශයේ තිබූ ද්‍රාවනයේ භූමිතෙල් සුවඳ ඇති බවත් ඇඳඉහපතේ සඳහන් විය. මේ අනුව, රෝගියා ඇතුල් කළ බාහිර රෝගී අංශයේ වෛද්‍යවරයාගේ රෝග විනිශ්චය වී ඇත්තේ කෘමිනාශක පානය කළ බව ය. තවද, ඇඳ ඉහපත් සටහනෙහි රෝගියාගේ පෙනහැල්ලේ වතුර ( crepts ) ඇති බව සඳහන් කර තිබුණි. කෘමිනාශක ශරීරගත වීමෙන් උදරය මොලොක් ( soft ) වී, වලිප්පුව හටගෙන පෙනහැලිවල වතුර එකතු වේ. ඒ අනුව, බාහිර රෝගීන්ගේ අංශයේ වෛද්‍යවරයාගේ නිගමනය වී ඇත්තේ ස්වර්ණලතාට කෘමිනාශක පානය කර ඇති බව ය. රෝගියා වාට්ටුවට ඇතුලත් කිරීමෙන් පසු වාට්ටුවේ හෙදියන් විසින් රෝගියාගේ ආමාශය සෝදා ඇති බවට ඇඳඉහපතේ සටහනක් ද කර තිබුණි. ස්වර්ණලතා විසින් කෘමිනාශක පානය කළා ද, නැතහොත් වෙනයම් කෙනකු විසින් සවර්ණලතාට බලෙන් කෘමිනාශක පෙව්වා ද යන්න දැන ගැනීමට බාහිර ලකුණු මළසිරුරේ තිබූ බව හෝ නො තිබූ බව පළමු පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ සඳහන් වී නො තිබුණි.



ඔියලු කරුණු සලකා බැලීමෙන් පසුව විත්තිය වෙනුවෙන් පෙනී සිටි විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාගේ උපදෙස් වූයේ ස්වර්ණලතාගේ ආමාශය සිදුරු වීමට හේතුව පහර දීමක් නොව අධිසාන්ද්‍රණීක (concenttated) කෘමිනාශකයක් පානය කිරීමෙන් ආමාශය තැම්බී දිළිස්සීම නිසා ආමාශය සිදුරුවීම සිදු වී ඇති බව හෝ වෛද්‍ය පරීක්ෂණය කරන අවස්ථාවේ දී ආමාශය ඉවතට ගැනීමේ දී හෝ ආමාශය සේදීමට බටයක් ඇතුල් කිරීමේ දී ආමාශය සිදුරු වී ඇති බව ය. කෘමිනාශක ද්‍රව්‍යයන් බොහෝ විට ආමාශය සිදුරු කරන බවත් විශේෂයෙන්ම ඉතා විශාල ප්‍රමාණයක් පානය කළේ නම් මෙය බෙහෙවින් සිදු වන බවත් රෝගියා ඇතුල් කිරීමෙන් විනාඩි පහළොවක පමණ කාලයකින් පසුව මිය යාමෙන් පෙනී යන්නේ ඉතා විශාල ප්‍රමාණයක් කෘමිනාශක පානය කොට තිබුණ බවත් ය. විත්තියේ විශේෂඥ වෛද්‍යවරයා වැඩිදුරටත් පැහැදිලි කර දුන්නේ ය. හෘදයේ තැල්ම ඇති වීමට හේතු වූයේ ස්වර්ණලතාට මරණාසන්න මොහොතේ දී කෘතිම බාහිර හෘද සම්භාහනය ( external cardiac massage ) ලබාදීම නිසා බවත් එවැනි අවස්ථාවල හෘදය වස්තුවේ තැල්ම පමණක් නොව අක්මාව ද පිපිරී ඇති අවස්ථා ද ඉළ ඇට බිඳීම, උරෝස්ථිය ( sternum ) භග්නය වීම වැනි අවස්ථා විශාල සංඛ්‍යාවක් වාර්තා වී ඇති බව ද තවදුරටත් විත්තියේ විශේෂඥවරයා උපදෙස් දුන්නේ ය. එසේ වූ අවස්ථා අධිකරණ වෛද්‍ය විශේෂඥයන්ගේ පිළිගත් ග්‍රන්ථවල ද වාර්තා කොට ඇති බව විත්තිය වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා විත්තියේ නීතිඥවරයාට පැහැදිළි කර දුන්නේ ය. උදරයට සහ පපුවට පහර දීමෙන් හෘදයේ තැල්මවලින් හා ආමාශයේ පිපිරීමෙන් මරණය සිදුවූ බව පැමිණිල්ලේ විශේෂඥ වෛද්‍යවරයා නිගමනය කොට ඇත. ඇඳඉහපත අනුව ස්වර්ණලතා නිදිබර ගතියෙන් පසු වූ බව සඳහන්ව තිබුණි. ආමාශය පිපිරූ අයෙකුට නිදිබර ගතියක් ඇති නො වේ. එවැනි අයට තදබල කම්පනයක් ඇති වේ. ආමාශයේ සහ අක්මාවේ වස වර්ග නො තිබුණ බව රස පරීක්ෂකවරයා විසින් සොයා නො ගැනීමට හේතුව වූයේ, රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ ස්වර්ණලතාගේ වෛද්‍ය පරීක්ෂණයේ දී ඉවත් කරන ලද අභ්‍යන්තර ඉන්ද්‍රියයන් නොව වෙනත් අයෙකුගේ ඉන්ද්‍රියයන් වීම ය. එට ඇති හොඳම සාධකය නම් පළමු වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයාගේ වාර්තාවේ සටහන් වී තිබුණේ ආමාශය විච්ඡේදනය කළ බවත්, ආමාශයේ ඇතුල් පැත්ත රත් පැහැති වී තිබූ බව සහ



Scanned with CamScanner

ළේ ලප දක්නට තිබූ බවත් ය. දෙවන වෛද්‍ය වාර්තාවේ සටහන් වී තිබුණේ ආමාශය විච්ඡේදනය කර නො තිබූ බවත්, එයට හේතුව ඔහුට ඉදිරිපත් කර තිබුණේ වෙන අයකුගේ ආමාශයක් බවත් විත්තියේ වෛද්‍ය විශේෂඥවරයාගේ උපදෙස් විය. ස්වර්ණලතාගේ නාසය සහ තොල මත සීරීම් තුවාල සිදු වී ඇත්තේ ස්වර්ණලතාගේ ආමාශයට නලයක් ඇතුල් කිරීමට තැත් කිරීමේ දී ඇති විය හැකි සීරීම් බවත් මරණයට පසු එම්බාම් කිරීමේ දී එම සීරීම් පැඩිමකට පෙන්නුම් කිරීම සාමාන්‍ය සිදුවීමක් බවත් විශේෂඥ වෛද්‍යවරයා තවදුරටත් උපදෙස් දුන්නේ ය.

ස්වර්ණලතාගේ වෛද්‍ය පරීක්ෂණය පළමු වැනි වරට පැවැත් වූ ශ්‍රේණිගත වෛද්‍යවරයාගේ ද, පැමිණිල්ල වෙනුවෙන් දෙවැනි වරට ස්වර්ණලතාගේ මළසිරුරේ වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාගෙන් ද, විවෘත අධිකරණයේ දී සාක්ෂි ලබා ගැනීමෙන් පසුව ස්වර්ණලතා කෘමිනාශක පානය කිරීමෙන් සිය දිවි හානි කර ගෙන මරණයට පත් වී ඇති බව තීන්දු කිරීමට උපකාරී වුණු ඇත. අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරී පළපුරුද්ද නොමැතිකම හා නො සැලකිලිමත්කම නිසා වෛද්‍යවරුන් සාවද්‍ය නිගමනවලට එළඹීමෙන් නිර්දෝෂී අය පවා නීතියෙන් දඬුවම් ලැබීමට අවස්ථා උදා විය හැකි බවට මේ සිද්ධිය දැක්විය හැකි ය.

ස්වර්ණලතා රෝහලට ඇතුල් කරන අවස්ථාවේ දී රෝග විනිශ්චය පිළිබඳව ඇඳ ඉහපතේ කර තිබූ සටහන් සහ වාට්ටුවේ දී ස්වර්ණලතාගේ ආමාශය සෝදා ඉවත් කරන ලද ජලයේ කෘමිනාශක ගඳ වහනය වීම, ස්වර්ණලතා කෘමිනාශක පානය කිරීමෙන් සිය දිවි හානි කර ගෙන ඇති බව තීරණය කිරීමට උපකාරී වූ " නිහඬ සාක්ෂි " වශයෙන් සැලකිය හැකි ය.



# පොල් ලෙලි වලෙන් මතු වූ හිස් කබල

කරෝලිස් බාස් තිදරු පියෙකි. ඔහු ජීවිකාව වශයෙන් කළේ කොන්ත්‍රාත් ගෙන ගෙවල් සෑදීමයි. දිනක් නිවසක් තැනීම සඳහා තම නිවසින් පිට වී ගිය කරෝලිස් බාස් සතියකින් ගෙදර පැමිණියේ නැත. පෝය දිනවත් කරෝලිස් බාස් ගෙදර නො පැමිණීම නිසා ඔහුගේ භාර්යාව තරමක් තැති ගත්තා ය. කෙතරම් වැඩ තිබුණත් කරෝලිස් බාස් පෝය දවසට ගෙදර පැමිණීම ඊට හේතුව යි. කරෝලිස් බාස්ගේ වැඩ බිමට ගොස් ඔහු ගැන සොයා බැලූ ඔහුගේ භාර්යාවට එහි සිටි අය කියා සිටියේ, පෝයදාට පෙර දින තම නිවසට යන බව පවසා කරෝලිස් බාස් වැඩ බිමෙන් පිටත් වූ බවයි. ඉඩම් ආරවුලක් නිසා ගමේ එක් පවුලක් ඔවුන් සමග වෛරයෙන් සිටින බව මේ අවස්ථාවේ දී ඇයට සිහිපත් විය. කළ යුත්තේ කුමක් දැයි, කියා ඇය දස අතේ කල්පනා කළා ය. කරෝලිස් බාස් යන එන සෑම ගෙදරකටමත් ඔහු ඇසුරු කරන සෑම කෙනෙකු වෙතත් ගිය ඇය අනතුරුව ඔහුගේ නො පැමිණීම ගැන ළඟම තිබෙන පොලිසියට ගොස් පැමිණිල්ලක් කළා ය. එහෙත් ඉන් ඵලක් වූයේ නැත. ඔහු ගැන තොරතුරක් නැති නිසා ඇය සාත්තරයක් අහන්නට ද ගියා ය. තව ටික දිනකින් කරෝලිස් බාස් ගෙදර එන බව සාත්තරකාරයා පැවසී ය. සාත්තරකාරයා පැවසූ දේ ගැන විශ්වාසය තැබූ ඇය ඔහු ගෙදර එනතෙක් බලා සිටියා ය.

මේ අතර පොල් ලෙලි වලක වැඩ කරන කාන්තාවකට එම වලෙහි තිබී මිනී ඔළුවක් හමු වී තිබුණු අතර, ඒ බව ඇය පොලිසියට පැමිණිලි කර තිබුණි. පොලිස් නිලධාරීන් පැමිණ පොල් ලෙලි වළේ තිබූ, කුණු වී ගිය මළසිරුරක් සොයා ගනු ලැබී ය. පොලිසිය විසින් පළාතේ මහේස්ත්‍රාත්වරයාට සිද්ධිය වාර්තා කිරීමෙන් පසුව පොල් ලෙලි වල අසලදීම මූලික පරීක්ෂණයක් පවත්වා, සාක්ෂි සටහන් කර ගන්නා ලදී. ඉන් පසුව, කුණු වී තිබූ මළසිරුර පිළිබඳව වෛද්‍ය පරීක්ෂණය පවත්වා මරණයට හේතුව වාර්තා කිරීම සඳහා විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත එය යොමු කිරීමට මහේස්ත්‍රාත්වරයා පොලිසියට නියෝග කළේ ය. ඒ අනුව පොලිසිය විසින් වෛද්‍ය පරීක්ෂණය සඳහා අධිකරණ වෛද්‍යවරයා වෙත මළසිරුර ඉදිරිපත් කරන ලදී.



Scanned with CamScanner

මළසිරුර හඳුනා ගැනීමට නො හැකි අන්දමට දැඩි ලෙස කුණු වී එයින් දුගඳ පැතිරෙමින් තිබුණි. එහි ඇඳුම් කිසිවක් තිබුණේ නැත. සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයකට ලක් කොට මළසිරුරක ඇඳුම් ඉවත් කර රහසිගතව සඟවා තබන්නේ මියගිය තැනැත්තා හඳුනා ගැනීම වැලැක්වීමට ය. කුණු වී ගිය මළසිරුරේ බාහිර ලිංගේන්ද්‍රියයන් සතුන් විසින් කා දමා තිබූ බැවින් එය පිරිමියෙකුගේ හෝ ගැහැණියකුගේ බව හඳුනා ගැනීම දුෂ්කර විය. කුණුවීම නිසා සිරුරේ සෑම ස්ථානයකම අපිචර්මය ( epidermis ) ගැල වී තිබුණත්, දකුණු අතේ උරහිසේ කොටියෙකුගේ ඔළුවක් පච්ච කොටා ඇති බව චර්මයෙහි ( dermis ) පෙනෙන්නට තිබුණි.

යම් කෙනෙකු හඳුනා ගැනීමට සිරුරේ කොටා ඇති පච්ච (tattoo) අතිශයින් ප්‍රයෝජනවත් වේ. ද්‍රාව්‍ය නොවන (insoluble) කාබන් ( carbon ), නිල් ( indigo ), රත් හිඟුල් ( vermilion ) සහ පැලැටි යුෂ වැනි සායම් පච්ච කෙටීම සඳහා පාවිච්චි කරනු ලැබේ. මෙවැනි සායම්වලින් කෙටූ පච්ච දීර්ඝ කාලයක් පවතින අතර ඇනිලින් සායම් ( analine dye ) වලින් කෙටූ පච්ච තාවකාලිකව පවතී. මැරයන්, බරවාහන පදවන රියදුරන්, නැවියන්, සොල්දාදුවන් යන අය අතීතයේ දී පච්ච කොටා ගත් නමුත් වර්තමානයේ දී පච්ච කෙටීමේ ප්‍රවණතාව අඩු වී තිබේ. සිංහල සහ මුස්ලිම් කාන්තාවන් බොහෝ විට තම සිරුරේ පච්ච කොටා නො ගන්නා අතර වතුකරයේ ජීවත්වන දෙමළ කාන්තාවෝ අතීතයේ දී තම සිරුරුවල පච්ච කොටා ගත් හ. යමෙකු විසින් තම සිරුරේ කොටා ගන්නා පච්චය ඔහුගේ ජාතිය හා ඔහු ජීවත්වන රටට ආවේනික ඒවා වේ. තම බලය පෙන්වීමටත්, අලංකාර වීම සඳහාත් නිග්‍රෝ ජාතික පිරිමින් ශරීරය පුරාම පච්ච කොටනු ලැබේ. කෙටූ පච්චයක් එම තැනැත්තා මරණයට පත්වන තුරුම තිබේ. යමකුගේ නමහි මුල් අකුරු, හෘදය පසාරු කරගෙන යන ඊතලයක්, රතු ඉන්දියානුවෙකුගේ හිසක්, තිතිස්සක් වටා එතුනු සර්පයෙකු, කිඳුරියක, කොටියෙකුගේ ඔළුව හෝ සම්පූර්ණ කොටියෙකු යන ඒවායේ රූප හෝ වැදූ අම්මා බුදු වේවා, ජීවිතේ දුකයි යන කියමන්, ශ්‍රී ලංකාවේ ජනයා බහුලව කොටනු ලබන පච්ච වේ. නිල්, රතු කළු සහ කොළ පැහැති වර්ණවලින් මෙම පච්ච සමන්විත වේ. ඉහත කී වර්ණවත් සායම් උල් කටුවකින් සම තුළට ඇතුල් කිරීමෙන් පච්ච කෙටීම කරනු ලැබේ. පච්චය කෙටීමේ දී පාවිච්චි කරනු ලබන



සායම් අපිචර්මයට සහ ඊට යටින් ඇති චර්මය තුළ රැඳේ. එම නිසා කුණු වී ගිය මළසිරුරක අපිචර්මය ගැල වී ගියත් ඊට යටින් ඇති සුදු පැහැති සම මතුපිට පච්චය මනා ලෙස දක්නට ලැබේ. පච්චයක් ඉවත් කිරීමට නම් ශල්‍ය කර්මයකින් පච්චය තිබෙන සම ප්‍රදේශය ඉවත් කොට ශරීරයේ වෙනත් ස්ථානයකින් සම් කැබැල්ලක් බද්ධ කළ යුතු ය. බටහිර රටවල තරුණ තරුණියන් අතරේ තම සිරුරේ නොයකුත් අලංකාර පච්ච කොටා ගැනීමේ ප්‍රවණතාව ක්‍රමයෙන් වැඩි වී ගෙන එන බව පෙනේ. සම ලිංගික සම්බන්ධකම් පවත්වන අයවලුන් ඔවුන්ගේ අත්වල පිටි අල්ලේ කුරුල්ලෙකුගේ පිංතූරයක් කොටන අතර අන්තරාදයක ඖෂධවලට ඇබ්බැහිවූවන් දහ තුනේ ඉල්ලකම තොලෙහි යටි පැත්තේ පච්ච කෙටීම කරනු ලැබේ. කුණු වී ගිය, නිරුවත් නාඳුනන මළසිරුරක් හඳුනා ගැනීම සඳහා මෙම පච්ච ඉතා වැදගත් වේ.

මිනිස් ඇටසැකිල්ලේ ඇට දෙසිය හයක් ඇත. මෙම සිරුරේ තිබුණේ උකුල් ඇටය ( pelvis ), කොඳු ඇට පෙළේ කශේරුකා ( vertebrae ), හිස් කබල, උඩු බාහුවට සහ යටි බාහුවට අයත් ඇට සහ ඉල ඇට කීපයක් පමණකි. යටි හනුව තිබුණේ නැත. සොයා ගත් ඇට සියල්ල ජලයෙන් තම්බා ( boiled ), මස් කැබලි ඉවත් කොට සෝඩියම් හයිපොක්ලෝරයිට් රසායනික සංයෝගයෙන් ( sodium hypochlorite ) සෝදා, අව්වේ වේලා අස්ථීන් පරීක්ෂා කිරීමෙන් පසුව විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා විසින් සෑම අස්ථියක්ම එක්ස් කිරණ පරීක්ෂාවට භාජනය කරන ලදී. අස්ථි රෝග ( bone diseases ), මෑතක දී සිදුවූ භග්න ( recent fractures ), සුවවූ පැරණි භග්න ( healed past fractures ), සහජ විකලාංගතාවයන් ( congenital deformities ) හෝ අසමමිතිකතාවයන් ( asymmetry ) වැනි තත්ත්වයන් මෙම අස්ථීන්වල නො වී ය. හිස් කබලේ ලලාට අස්ථිය සහ නාසයේ අස්ථිය සම්බන්ධ වී ඇති ආකාරය, නළලේ හැඩය සහ පිහිටා ඇති අධ්‍යක්ෂිකූප ශිඛාවල (supra-orbital crests) හැඩය, ඇස් කුහර සහ උකුල් ඇටවල පිහිටීම හා හැඩය අනුවත් හිස් කබලේ සීවනවල ( sutures ) ස්වභාවය හා සීවන සන්ධි වී (fusion) තිබෙන ආකාරයත්, උඩු ඇන්දේ දත් මෝදු වී ඇති අන්දමත්, එම දත් ගෙවී ගිය ප්‍රමාණය ( attrition ) අනුවත් සොයා ගන්නා ලද මළසිරුර අවුරුදු හතළිහත්, හතළිස් පහත් අතර වයසැති පිරිමි අයෙකුගේ බව අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. මේ



Scanned with CamScanner

අනුව, පොල් ලෙලි වලේ තිබූ මළසිරුර අතුරුදහන් වූ කරෝලිස් බාස්ගේ බව පොලිසිය සැක කළේ ය. හිස් කබලේ පාර්ශ්වික අස්ථිය සහ අවමූර්ධ අස්ථිය මත අඟල් හතරක් දිගැති කැපුමක් විය. කැපුමේ ඉදිරි කෙළවරෙන් ආරම්භ වූ රේඛීය හැඩය ඇති සපරිකා භග්නයක් ( fissure fracture ) හිස් කබලේ දකුණු ඇස් කුහරය දෙසට විහි දී තිබුණි. කැත්තක් හෝ කඩුවක් වැනි ආයුධයකින් මියගිය තැනැත්තාගේ පිටුපස සිට පහර දී ඇති බව මෙයින් නිගමනය කළ හැකි විය. හිස් කබලේ තිබූ කැපුමේ ස්වභාවය සහ පිහිටීම අනුව මේ තැනැත්තාගේ මරණය සිදු වී ඇත්තේ, පිටුපසින් සිටි අයෙකු කඩුවක් වැනි ආයුධයකින් තදබල පහරක් හිසට ගැසීමෙන්, මොළය තුවාල වීමෙන් බව අධිකරණ වෛද්‍යවරයාගේ මතය වූයේ ය. මරණයෙන් පසුව එම සිරුර පොල් ලෙලි වලේ දමා ඇති බව ද තවදුරටත් අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය.

අධිකරණ වෛද්‍ය වාර්තාව සහ පොලිසිය විසින් ඉදිරිපත් කරනු ලැබූ අනිකුත් සාක්ෂි සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා මෙය මනුෂ්‍ය ඝාතනයක් බව තීන්දු කොට වැඩිදුර පරීක්ෂණ පවත්වා සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස පොලිසියට නියෝග කළේ ය. මියගිය තැනැත්තා ස්ථිර වශයෙන් හඳුනා ගැනීමත් මෙම අපරාධය කළ තැනැත්තා හෝ තැනැත්තන් හඳුනා ගැනීමත් පොලිසියේ වගකීම විය. මහේස්ත්‍රාත් තීන්දුව මත තවදුරටත් පොලිස් පරීක්ෂණ ආරම්භ විය. අධිකරණ වෛද්‍යවරයා විසින් විඛණ්ඩන අන්වීක්ෂයකින් (dissecting microscope) හිස් කබලේ තිබූ කැපුම් තුවාලය පරීක්ෂා කරන ලදී. එම කැපුම් තුවාලයේ කෙස් ගස් දෙකක් රැඳී තිබෙන බව අධිකරණ වෛද්‍යවරයාට දක්නට ලැබුණි. විශාල කරන කාචයක් ( macro lens ) කැමරාවට සවි කොට කෙස් ගස් දෙක රැඳී තිබෙන ආකාරය ඡායාරූප ගත කිරීමෙන් පසුව වෛද්‍යවරයා ඒවා ප්‍රවේශමෙන් ඉවත් කර ගත්තේ ය. හිස් කබලේ තිබූ කැපුම් තුවාලයේ රැඳී තිබූ කෙස් ගස් දෙක මේ අන්දමට ඡායාරූප ගත කිරීමෙන් එය ලේඛණගත සාක්ෂියක් ( documentary evidence ) වශයෙන් අධිකරණයට ඉදිරිපත් කළ හැකි ය. මේ අන්දමේ ලේඛණගත සාක්ෂි ශ්‍රී ලංකාවේ මහාධිකරණවල පවත්වන නඩු විභාගවල දී පිළිගනු ලැබේ. මනුෂ්‍ය ඝාතනවල අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පවත්වන ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්ක රෝහල්වලවල වෛද්‍යවරුන් විසින් ඔවුන් විසින් නිරීක්ෂණ කරන ලද තුවාල ඡායාරූප ගත කිරීමක්



දැනට සිදු කරනු නො ලැබේ. එම වෛද්‍ය නිලධාරීන්ට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කැමරා ලබා නො දීම මෙයට හේතුවයි. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක රෝහල්වල පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණ කිරීමට ඇති මෘත ශරීරාගාරවල තත්ත්වය ඉතාම අසතුටුදායක ය. බොහෝ මෘත ශරීරාගාරවල ශීතකරණ නොමැත. තවද, ඇතැම් මෘත ශරීරාගාරවල වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය ආලෝකය ( light ), වාතාශ්‍රය ( venlilation ), උපකරණ සහ නල ජලය ( running water ) ද නොමැත.

තුවාලය සිදු කළ ආයුධය මත මියගිය තැනැත්තාගේ රුධිරය සහ කෙස් ගස් රැඳී තිබූ බව මෙම මළසිරුරේ වෛද්‍ය පරීක්ෂණය සිදු කළ වෛද්‍යවරයා පොලිසියට වාර්තා කළේ ය. මළසිරුරේ යටි හනුව පොල් ලෙලි වලේ තිබිය හැකි බැවින් එය ද සොයා ගන්නා ලෙස වෛද්‍යවරයා පොලිසියට උපදෙස් දුන්නේ ය. පොල් ලෙලි වලේ තිබෙන වතුර ඉවත් කිරීමෙන් පසුව යටි හනුව පමණක් නොව තවත් ඇට කිපයක් ද සොයා ගත් පොලිසිය ඒවා ද අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළේ ය. යටි හනුවේ තිබූ දත්වල බුලත් කහට සහ දන්ත ශල්‍ය වෛද්‍යවරයකු විසින් ඇමල්ගම්වලින් (amalgum) පුරවන ලද දන්තිය කුහර ( dental cavities ) කිපයක් ද තිබුණි. කරෝලිස් බාස් නිතර බුලත් විට හපන අයකු බවත් මිය යාමට හය මසකට පමණ පෙර පළාතේ මහ රෝහලේ දන්ත ශල්‍ය ඒකකයෙන් ප්‍රතිකාර ගත් බවත්, කරෝලිස් බාස්ගේ භාර්යාවගෙන් ප්‍රශ්න කිරීමේ දී පොලිසියට දැන ගැනීමට ලැබිණි. දන්ත ශල්‍ය වෛද්‍යවරයා කරෝලිස් බාස් වෙත නිකුත් කර තිබූ ප්‍රතිකාර සටහන් පත ද ( diagnosis card ) ඇය විසින් අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කරන ලදී. පොල් ලෙලි වලෙන් සොයා ගත් යටි හනුවේ දන්තිය කුහර පුරවා තිබූ ආකාරය අනුව ඉදිරිපත් කරන ලද දන්ත වෛද්‍ය ප්‍රතිකාර සටහන පරීක්ෂා කර බැලූ විට ප්‍රතිකාර ලබා ගෙන ඇත්තේ මියගිය කරෝලිස් බාස් බව නිගමනය කළ වෛද්‍යවරයා ඒ බව පොලිසියට සහ අධිකරණයට වාර්තා කළේ ය. එම තීරණය තවදුරටත් තහවුරු කිරීමට පොල් ලෙලි වලෙන් සොයා ගත් යටි හනුවේ එක්ස් කිරණ ( x - ray ) රූපයක් ලබා ගෙන, එය දන්ත ශල්‍ය ඒකකයේ දී ලබා ගෙන තිබූ යටි හනුවේ එක්ස් කිරණ රූපයත් සමඟ එකක් මත අනික තැබීමෙන් (supermposition) එක්ස් කිරණ දෙකම එකම අයෙකුගේ යටි හනුවක් බව තහවුරු විය.



Scanned with CamScanner

දන්තීය දත්ත ( dental data ) අනුව මළසිරුර කරෝලිස් බාස්ගේ බව අධිකරණ වෛද්‍යවරයා පොලිසියට වාර්තා කළේ ය. අධික ලෙස කුණු වී ගිය නිරුවත් මළසිරුරක් හඳුනා ගැනීම සඳහා දන්තීය දත්ත ( forensic dentistry ) උපකාරී වන බව මෙයින් පැහැදිලි වේ.

සාධාරණ සැකයෙන් තොරව මිනීමැරීම නඩු විභාගයක දී මියගිය තැනැත්තා හඳුනා ගත් බව අධිකරණයේ දී ඔප්පු කිරීමට අවශ්‍ය නිසා කරෝලිස් බාස්ගේ මංගල ඡායාරූපය ලබා ගෙන එම පිංතූරය ස්වාභාවික ප්‍රමාණයට විශාල කොට එම ඡායාරූපය මත කරෝලිස් බාස්ගේ හිස් කබලේ එක්ස් කිරණ පටලය තබා ( super-imposition ) වෝහාරක ඡායාරූප ශිල්පයා (forensic photographer) විසින් පරීක්ෂා කරන ලදී. පොල් ලෙලි වලේ තිබී සොයා ගත් හිස් කබල කරෝලිස් බාස්ගේ බව ඔප්පු කිරීමට අධිකරණ වෛද්‍යවරයාට එමගින් හැකි විය. කරෝලිස් බාස්ගේ දකුණු උරහිසේ කොටියකුගේ රූපයක් පච්ච කොටා තිබුණ බව ඔහුගේ භාර්යාව පිළිගත්තා ය. දන්තීය දත්ත, අධිෂ්ඨාපන රූප සහ පච්චය යන සියලු සාධක අනුව, පොල් ලෙලි වලේ තිබූ මළසිරුර කරෝලිස් බාස්ගේ බව හඳුනා ගැනීමට හැකි විය.

තවදුරටත් පොලිසියේ වගකීම වූයේ කරෝලිස් බාස්ගේ ඝාතකයන් කවුරුන් ද යනු සොයා ගැනීමයි. ඒ වන විට කරෝලිස් බාස්ගේ මරණය පිළිබඳව ගමේ නොයෙකුත් කටකථා පැතිරී තිබුණි. කරෝලිස් බාස් මැරුවේ එම ගමෙහි පදිංචි දියෝනිස් සහ ඔහුගේ පුතුන් තිදෙනා බවට පොලිසියට නිර්නාමික පෙත්සමක් ලැබුණි. ඒ අනුව, පොලිසිය දියෝනිස් සහ ඔහුගේ පුතුන් දෙදෙනාගෙන් ප්‍රශ්න කළත් නියම තොරතුරක් ලබා ගැනීමට නො හැකි විය. දියෝනිස්ගේ ගෙදර පොලිසිය විසින් දැඩි ලෙස පරීක්ෂා කළත් කඩුවක් වැනි ආයුධයක් සොයා ගැනීමට නො හැකි විය. පරීක්ෂණය භාරව ක්‍රියා කළ පොලිස් නිලධාරියා දියෝනිස් වාසය කළ ගමේ සහ අවට ගම්වල සිටින කම්මල්කරුවන් හමු වී කවුරුන් හෝ අයෙකු කඩුවක් හෝ මන්නයක් වැනි ආයුධයක් සාදවා ගත්තේ ද යන්න ඔවුන්ගෙන් විමසී ය. මාස දහයකට පමණ පෙර නො හඳුනන අයෙකු තමා ලවා කඩුවක් සාදවා ගත් බව එක් කම්මල්කරුවෙක් පොලිසියට කියා සිටියේ ය. අධිකරණයේ අවසරය ඇතිව දියෝනිස් සහ ඔහුගේ පුතුන් දෙදෙනාම උසාවියේ දී හඳුනා



ගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කළේ ය. මාස දහයකට පෙර තමාට කියා කඩුවක් සාදා ගත් පුද්ගලයා දියෝනිස් බව පෙරෙට්ටුවේ දී කම්මල්කරු විසින් හඳුනා ගන්නා ලදී.

දියෝනිස් සහ ඔහුගේ පුතුන් දෙදෙනා වහාම අත් අඩංගුවට ගත් පොලිසිය කඩුව ගැන ඔවුන්ගෙන් විමසී ය. කරෝලිස් බාස්ගේ හිසට කඩුවෙන් පහර දී මැරූ බවත් ඒ සඳහා පාවිච්චි කළ කඩුව නවත් පොල් ලෙලි වලකට වීසි කළ බවත් ඔවුහු පොලිසියේ දී කියා සිටිය හ. සැකකරුවන් ලවා පොල් ලෙලි වල හඳුනා ගෙන එහි තිබූ කඩුව ලබා ගෙන පොලිසිය විසින් අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කරන ලදී. හිස් කබලේ කැපී තිබුණ කොටසට කඩුවේ තලය අනුසි ( fiting ) වන බව නඩු විභාගයේ දී අධිකරණ වෛද්‍යවරයා විශාල කළ ( magnified ) ඡායාරූපය මගින් පෙන්නුම් කළේ ය. කඩුවේ මිට තලයට සම්බන්ධ වන කොටසේ කෙස් ගස් කීපයක් රැඳී තිබුණි. හිස් කබලේ තිබූ කෙස් ගස්වල මුලෙහි (roots) ඇති සෛල සහ මියගිය කරෝලිස් බාස්ගේ ඇට මිදුළු (bone marrow) D.N.A. ප්‍රතිරූපන පරීක්ෂාව සඳහා රසායනාගාරයට ඉදිරිපත් කිරීමට පෙර අධිශීතකරණයේ තබන ලදී. විශේෂයෙන්ම නිරක්ෂ රේඛාව අසල පිහිටි රටවල මෙම ක්‍රියාමාර්ගය අනුගමනය කළ යුතු ය. හිස් කබලේ හිරවී තිබූ කෙස් ගස් හා කඩු මිටේ රැඳී තිබූ කෙස් ගස් කරෝලිස් බාස්ගේ බව D.N.A. ප්‍රතිරූපන පරීක්ෂාවෙන් සාධාරණ සැකයෙන් තොරව අධිකරණ වෛද්‍යවරයාට ඔප්පු කිරීමට හැකි විය. කරෝලිස් බාස් පාවිච්චි කළ පනාවේ රැඳී තිබූ කෙස් ගස් ද D.N.A. ප්‍රතිරූපන පරීක්ෂාවට ලක් කළේ ය. කඩුවේ රැඳී තිබූ, හිස් කබලේ රැඳී තිබූ සහ කරෝලිස් බාස් හිස පීරූ පනාවේ තිබූ කෙස් ගස්, එකම අයෙකුගේ බවත් ඒවා කරෝලිස් බාස්ගේ බවත් අධිකරණයේ දී ඔප්පු කිරීමට මේ අනුව හැකි විය.

සාහසිකයෙකුගේ හෝ ඝාතනයට ලක්වූ පුද්ගලයෙකුගේ ඇඳුම් මත හෝ වෙනත් භාණ්ඩ මත රුධිරය හෝ ඔහුගේ ශරීරය මත කුඩා පටක කැබලි ( pieces of body tissue ) තිබිය හැකි ය. තවද, සාහසිකයාගේ රුධිරය හෝ ඔහුගේ ශරීරයේ කුඩා පටක කැබලි ඝාතනයට ලක්වූ තැනැත්තාගේ ඇඳුම් මත තිබිය හැකි ය. ස්ත්‍රී දූෂණයක දී හෝ ලිංගික අපචාරයට ලක්වූ තැනැත්තෙකුගේ ඇඳුම් මත හෝ ශරීරය මත ප්‍රහාරකයාගේ ශුක්‍ර තරලය (semers ) තිබිය



Scanned with CamScanner

හැකි ය. තැවරුනු රුධිරයෙහි හෝ ශරීරයෙහි පටකවල වර්ගය (group) ප්‍රතිශක්තිකරණ පරීක්ෂණවලින් දැන ගැනීමට පූර්වන සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පරීක්ෂා කරනු ලබන රුධිරය හෝ පටක කොටස්වල සාම්පල අලුත් ( fresh ) ඒවා විය යුතු ය. කුණු වූ රුධිරයෙන් හෝ කුණු වූ ශරීරයේ පටක කොටස්වලින් ප්‍රතිශක්තිකරණ පරීක්ෂණ පැවැත්වීමෙන් රුධිරයෙහි හෝ පටකවල වර්ගය සොයාගත නො හැකි ය. එමනිසා මෙවැනි ප්‍රතිශක්තිකරණ පරීක්ෂණවල අගය සීමාසහිත වේ. තවද, මිනිසුන් අතර සමාන රුධිර වර්ග හෝ සමාන පටක වර්ග ඇති තැනැත්තන් බොහෝ ඇත. එම නිසා රුධිරය හෝ ශරීරයේ පටක වර්ග කිරීමෙන් සාහසිකයකුගේ හෝ සැකකරුවකුගේ නිර්දෝෂීභාවය අධිකරණයක දී ඔප්පු කළ හැකි වුවත් වරදකරුවන් හෝ සැකකරුවන් අධිකරණයක දී වරද කළ බව සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කළ නො හැකි ය. මෙම හිඩැස පිරවීමට ඩී - ඔක්සිරයිබොනිවික්ලික් අම්ල ( ඩී. එන්. ඒ. ) පරීක්ෂණය ( D . N. A. testing / finger printing ) උපයෝගී කරගත හැකි ය. ඩී. එන්. ඒ. තාක්ෂණය පළමුවෙන්ම සොයා ගන්නා ලද්දේ බ්‍රිතාන්‍ය ජාතික නොබෙල් තාග්‍යලාභී මහාචාර්ය ඇලෙක් ජෙෆ්රි ( Alec Jeffrey ) විසිනි. ඩී. එන් . ඒ. ප්‍රතිරූපය පරීක්ෂා කිරීමෙන් පසුව යම් අයෙකු අපරාධයක් කළ බව බොහෝ දුරට අධිකරණයක දී ඔප්පු කළ හැකි ය. සර්වසම නිබුල්ලන් (identical twins) හැර අන් සෑම මනුෂ්‍යයෙකුගේම ඩී. එන්. ඒ. පාදක පිහිටීම ( base sequence ) එකිනෙකාගෙන් වෙනස් වේ. පරිසීමිත බහුරූපී දිගු ඛණ්ඩ විකිරණ ප්‍රස්ථාර තාෂ්‍යණය ( restriction fragment length polymorphism RFLF autoradirgraph ) පාවිච්චි කිරීමෙන් ස්ත්‍රී දූෂකයකු හෝ ඝාතකයා හඳුනාගත හැකි ය. විද්‍යුත් විකිරණය ( eleotrophoresis ) පාවිච්චි කිරීමෙන් ඩී. එන්. ඒ. වල පිහිටා ඇති පරිසීමිත කණ්ඩ ( restriction fragment ) වෙළඳ පොළේ භාණ්ඩ දැක්වෙන සංකේත තීරු ( bands ) වශයෙන් ස්වයං විකිරණ ප්‍රස්ථාරයක ( autoradiograph ) දැකගත හැකි ය. අපරාධයක් සිදුවූ ස්ථානයක තිබී සොයා ගන්නා ලද ද්‍රව්‍යවල හෝ අපරාධයට ලක්වූ තුවාලකරු හෝ මියගිය තැනැත්තාගේ ශරීරය මත තිබී සොයා ගැනීමට හැකි රුධිරය, රුධිර පැල්ලම් ( blood stains ) , ශුක්‍රය (semen), යෝනියෙන් ලබා ගත් තරලය ( vaginal fluid ) හෝ පිස්න හෝ මුඛයෙන් ලබා ගත් පිස්නවල ( swabs ) හෝ පේශී කොටස්වල හෝ සම් කැබලි යනාදි ද්‍රව්‍යවල ඩී. එන්. ඒ. අනුරූපය



සැකකරුගේ රුධිරයේ ප්‍රතිරූපය සමග ඩී. එන්. ඒ. තාක්ෂණය යොදා ගනිමින් සංසන්දනය කිරීමෙන් අපරාධය සිදු කළ තැනැත්තා හඳුනා ගැනීමට හැකි වේ. විකිරණශීලී අභික්ෂණ ( radioactive probes ) මගින් පරිසීමිත බහු රූපී දිගු ඛණ්ඩ කොටස්, සලකුණු (markers) කොට හඳුනාගත හැකි ය. පරිසීමිත බහුරූපී දිගුඛණ්ඩ කුඩා කට්ටලයකින් ( RFLP fragment ) පවා යමෙකුගේ ඩී. එන්. ඒ. ප්‍රතිරූපය හඳුනාගත හැකි වේ. එමනිසා ඩී. එන්. ඒ. ප්‍රතිරූප තාක්ෂණයට ඩී. එන්. ඒ. " ඇඟිලි සලකුණු " යැයි භාවිතා කරනු ලැබේ. දෙදෙනෙකුගේ ඩී. එන්. ඒ. ප්‍රතිරූපය එකහා සමාන වීමේ ප්‍රවණතාවය ලක්ෂයකට එකකි.

ඉඩම් ආරවුලක් නිසා කරෝලිස් බාස් සමග දියෝනිස් හිත් අමනාපයෙන් සිටි බවත් එක් දිනක සවස් යාමේ දියෝනිස් සහ ඔහුගේ පුතුන් දෙදෙනාට කරෝලිස් බාස් පාරේ දී හමුවුණු බවත් එහි දී බහින්බස් වීමක් හටගත් බවත් හිටි හැටියේම ඉනේ තිබූ උල් පිහියක් ඇද ගත් කරෝලිස් බාස් ඔවුනට පිහියෙන් ඇනීමට වෙර දැරූ බවත් ආත්ම ආරක්ෂාවට ඔවුන් කරෝලිස් බාස්ට අතින් පහර දුන් බවත් මහාධිකරණ නඩු විභාගයේ දී ඔවුන්ගේ නිදහසට තිදෙනාම ප්‍රකාශ කළෝ ය.

විත්තිකරුවන් කළ ප්‍රකාශය සත්‍ය නම් කරෝලිස් බාස්ගේ හිසෙහි කැපුම් තුවාල තිබිය නො හැකි බවත්, ඔහුගේ හිස් කබලේ තිබූ කැපුම් තුවාලය අනුව කරෝලිස් බාස්ට කඩුවකින් හෝ මන්නයකින් ඔහුගේ පිටුපසින් සිට පහර දී ඇති බවත් සාමාන්‍යයෙන් මිනිසුන් කඩුවක් රැගෙන එදිනෙදා ගමන් බිමන් නොයන බවත් පැමිණිල්ලේ නීතිඥවරයා ජූරියට පහදා දුන්නේ ය.

කම්මල්කරුගේ සාක්ෂිවලින්, කඩුව දියෝනිස් විසින් තමන් ලවා සාදා ගත් බව ඔප්පු වීමෙන් පසුව සහ වෛද්‍ය සාක්ෂි ද නිසි පරිදි ගැලපීමෙන් දියෝනිස් සහ ඔහුගේ පුතුන් දෙදෙනා සිතා මතා පූර්ව චේතනාවකින් යුතුව කරෝලිස් බාස්ගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් තිදෙනාටම මරණීය දණ්ඩනය නියම විය.

D. .N. A. වැනි සුපිරි තාක්ෂණ ක්‍රම සහ මුහුණේ ඡායාරූපය, හිසෙහි එක්ස් කිරණ පටලය මත අධිස්ථාපනය ( super imposition



Scanned with CamScanner

of photograph of face and skulls ) කිරීම නිසා මෙහි දී මියගිය තැනැත්තා හඳුනා ගැනීමට හැකි විය. මියගිය තැනැත්තා හඳුනා ගැනීමෙන් පසුව පොලිසිය විසින් කරන ලද වැඩිදුර පරීක්ෂණ අනුව කරෝලිස් බාස්ගේ ඝාතකයන් කවුරුන් දැයි සොයා ගැනීමට හැකි විය.

කඩුවේ සහ හිස් කබලේ රැඳී තිබූ කෙස් ගස්, කරෝලිස් බාස්ගේ පනාවේ රැඳී තිබූ කෙස් ගස්, හිස් කබලේ කැපී තිබූ කොටසේ මතුපිට ස්වභාවය, සහ කඩුවේ තලයේ මතුපිට ස්වභාවය මිනීමරුවා සහ මරණයට හේතුව සොයා ගැනීමට උපකාරී වූ "නිහඬ සාක්ෂි" ලෙසයෙන් සැලකිය හැකි ය.



# ආවර්ජනා

අවුරුදු විසිපහක් පමණ වයසැති රූමත් තරුණියක වූ ආවර්ජනා, වැඩිදුර අධ්‍යාපනයක් ලබා විද්‍යා ගුරුවරියක වීමේ අභිලාෂයෙන් විද්‍යා පීඨයකට ඇතුල් වූවා ය. ඇයගේ පියා කුලී වැඩ කරන්නෙකි. ඉන් ඔහු ලැබූ මුදල යම්තමින් එදාවේල පිරිමසා ගැනීමට ප්‍රමාණවත් වුව ද, ආවර්ජනාගේ උසස් අධ්‍යාපනයට වියදම් කිරීමට තරම් මුදලක් ඔහුට නො තිබුණි. ආවර්ජනාගේ ඇවැස්ස මස්සිනා වූ සිරිපාල එළවළු කොරටු වගා කොට ලැබුණු ආදායමින් ඇයගේ උසස් අධ්‍යාපනයට වියදම් කළේ, අනාගතයේ දී ඇය විවාහ කර ගැනීමේ බලාපොරොත්තු ඇතිව ය. සිරිපාලගේ මෙම අනාගත බලාපොරොත්තුව ගැන ආවර්ජනා එතරම් තැකීමක් නො කළත් ඊට විරුද්ධත්වයක් ද නො දැක්වූවා ය. සියල්ල දෛවයට භාර කළ ආවර්ජනා උසස් අධ්‍යාපනයක් ලබා ස්ථිර රැකියාවක් කිරීමේ අරමුණෙන් සිරිපාලගේ උදව් ද ලබමින් ඉගෙනීමේ කටයුතු නො කඩවා සාර්ථකව කර ගෙන ගියා ය.

ආවර්ජනාගේ දුක සැප විමසීමට සිරිපාල මසකට වරක් විද්‍යා පීඨයට පැමිණියේ ය. එසේ පැමිණි විට ආවර්ජනාගේ වියදමට අවශ්‍ය මුදල් ඇයට ලබා දීම සිරිපාලගේ සිරිතක් විය. ආවර්ජනාගේ රූපයට වශී වූ විද්‍යා පීඨයේ තරුණයන් කිහිප දෙනෙක්ම ඇය ගැන උනන්දුවක් දැක්වූවත් සිරිපාලගේ සම්බන්ධය ගැන දැන ගැනීමෙන් පසු ඔවුහු තම අදහස අත්හැර දැමූ හ. නමුත්, අරවින්ද නම් කඩවසම් තරුණයකු ආවර්ජනා පිළිබඳව තදින්ම ඇල්මක් ඇති කර ගෙන ඇයගේ ආදරය දිනා ගැනීමට නො පසුබට උත්සාහයක යෙදිනි. ආවර්ජනා පිළිබඳව අරවින්දගේ තිබූ ආදරය ඔවුන්ගේ සමීප මිතුරු මිතුරියන්ට රහසක් නො වී ය. ඒ පිළිබඳව සමහරු අරවින්දට විහිළු තහළු ද කළෝ ය.

තලඑලළු පැහැයෙන් යුතු කඩවසම් සිරුරක් ඇති අරවින්ද ධනවත් පවුලකින් පැවතෙන්නෙක් විය. ඉගෙනීමට දක්ෂයෙකු වූ අරවින්දගේ ගති පැවතුම් ආවර්ජනාගේ සිත් ගත්තේ ය. එහෙත්, ඒ වන විටත් තමා සමග විවාහ වීමේ බලාපොරොත්තුවෙන් තමාට උදව් උපකාර කළ සිරිපාලට පිටුපෑම ද ආවර්ජනාට කළ නො හැකි බව ඇය



Scanned with CamScanner

මෙනෙහි කළා ය. සුළු වෙළඳාමකින් දිවි පෙවෙත සකසා ගත් ගැමි තරුණයෙකු වූ සිරිපාලත්, උසස් සමාජ තත්ත්වයක් මෙන් ම උගත්කම සහ ප්‍රියමනාප ගති පැවතුම්වලින් අභිබවා ගිය, අරවින්දත්, ආවර්ජනාගේ සිත තුළ නිතර තරඟ කරන්නට විය.

සිරිපාලගේ සම්බන්ධය අත්හලහොත් තම දෙමවුපියන්ගේ හා නෑ හිතමිතුරන්ගෙනුත් ඇසිය හැකි අවලාද ගැන ආවර්ජනා නිතර සිතුවා ය. එසේ කළහොත් ගුණමකු ගැහැණියක යැයි තම හෘද සාක්ෂිය විසින් කරනු ලබන චෝදනා ද ( guilt complex ) තමාට ඉවසා ගත නො හැකි බව ද ආවර්ජනා වරින්වර මෙනෙහි කළා ය. ආවර්ජනාගේ සිත, තරාදියක් මෙන් විටෙක සිරිපාලගේ පැත්තටත්, තවත් විටක අරවින්දගේ පැත්තටත් බර වන්නට වූ අතර, මෙය ආවර්ජනාට දැඩි මානසික පීඩනයක් ගෙන දෙන්නක් විය. තමා මුහුණ පා ඇති ප්‍රශ්නය අමතක කර දමා අධ්‍යාපන කටයුතුවල නිරතවීමට අවසානයේ දී ඇය තීරණය කළා ය. ඉගෙනීමේ කටයුතු අවසන් වන තෙක් ප්‍රේම සම්බන්ධකමක් ඇති කර නො ගැනීමට ආවර්ජනා ගත් තීරණය අරවින්දට දැන්වී ය. එහෙත්, ඇයගේ අදහස අරවින්ද පිළිනොගත්තේ, ආවර්ජනාගේ එම තීරණය තමා අමතක කොට, සිරිපාල සමග එක්වීමට ඈ දරණ උපක්‍රමයක් ලෙස අරවින්ද සිතූ නිසා ය. එබැවින්, සිරිපාලගේ අඩුපාඩුකම් දක්වමින් තමාට ආවර්ජනා නො ලැබුණහොත් තමාගේ අනාගතයම අඳුරු විය හැකි බව කියමින් අරවින්ද නිතර ඇයට ඇවිටිලි කරන්නට විය. විද්‍යා පීඨයේ දී ද ඉන් පිටත දී ද නිතර ආවර්ජනා හමු වූ අරවින්ද ඇයගේ ආදරය ලබා ගැනීමට බලවත් උත්සාහයක යෙදුණේ ය. සියල්ලෙන් මහත් සේ ව්‍යාකූලත්වයට පත්ව සිටි ආවර්ජනාගේ හැසිරීම අන්‍යයන්ට ද රහසක් නො වී ය. " දෙදෙනෙකුට ආදරය කිරීම තිදෙනෙකුට මිනී වල කැපීමක් " යැයි පවසමින් ආවර්ජනාගේ මිතුරියෝ ඇයට කීප වාරයක්ම අවවාද කළ හ. මෙම තත්ත්වය නිසා මහත්සේ කැළඹුනු ආවර්ජනා දිනක් අරවින්දට තම අදහස් පවසමින්, දිර්ඝ ලිපියක් ලියා පසුදින, එම ලිපිය තැපැල් කිරීම සඳහා නවාතැන් ගෙන සිටි නිවසේ අයිතිකාරියට දුන්නා ය. එදින විද්‍යා පීඨයට ද නො ගිය ආවර්ජනා ඇයගේ මිතුරියන්ගෙන් වෙන් වී හුදකලාවම බෝඩිමේ ගත කළා ය. විද්‍යා පීඨයට ආවර්ජනා නො පැමිණීම නිසා ඇය බැලීමට අරවින්ද ඇගේ බෝඩිමට පැමිණියේ ය. මෙහි දී තම අදහස් ගැන දිගින් දිගටම දෙදෙනා



සාකච්ඡා කළ අතර අරවින්ද සමුගත්තේ ආවර්ජනා තමන් වෙත නතු කර ගනිමිනි. ඔවුන් දෙදෙනාගේ මෙම හමුවීම ද බෝඩිම් අයිතිකාරියගේ සහ ඇගේ මිතුරියන්ගේ දැඩි විවේචනයට ලක්විය. මෙයින් ආවර්ජනා නැවතත් මහත්සේ කැළඹුණි. එදින රාත්‍රියේ ද අධ්‍යයන කටයුතුවල නො යෙදුනු ඇය වේලාසනින්ම නින්දට ගියා ය. ඒ වන විටත් ඇයගේ අනිකුත් මිතුරියෝ කාමරයේ පාඩම් කරමින් සිටියෝ ය. එහෙත්, ආවර්ජනාට නින්ද නො ගියේ ය. අරවින්ද පෙර දින හමු වූ ආකාරයත්, සිරිපාලගේ සිතේ ආවර්ජනා පිළිබඳව ඇති දැඩි බලාපොරොත්තුවත්, ඇයගේ සිත මහත් සේ ව්‍යාකූල කරන්නක් විය. සිරිපාල රකුසෙකු මෙන් තමා මරන්නට පනින අයුරුත්, දෙමාපියන් අපවාද නගමින් තමාට දොස් පවරන අයුරුත්, තමාගේ හිත මිත්‍රාදීන් තමාට දොස් පවරන අන්දමත් නින්ද නො ගිය ආවර්ජනාට මුළු රාත්‍රිය පුරාම විටින් විට දර්ශනය වන්නට විය.

ආවර්ජනා සමග එකම කාමරයේ නැවතී සිටි ඇයගේ මිතුරියක වූ මල්කාන්ති පසුදින උදෑසන අවදි වීමෙන් පසුව, ආවර්ජනා ඇගේ ඇඳෙහි නො සිටි බව දුටුවා ය. ඇය කාමරයේ ද පෙනෙන්ට නො සිටි බැවින් වැසිකිළියට ගොස් ඇතැයි සිතූ මල්කාන්ති එදෙසට ගියා ය. එහෙත්, ආවර්ජනා වැසිකිළියේ ද නො සිටි බැවින් එම කාමරයේම නැවතී සිටි ගයනි ද අවදි කරවා ආවර්ජනාගේ අතුරුදහන්වීම ගැන බෝඩිමේ අන් අයට ද දැනුම් දුන්නා ය. සෑම දෙනාම ආවර්ජනා ගැන සෙවුවත් ඇය ආගිය තැනක් සොයා ගත නො හැකි විය. පසුදින උදයෙන්ම විද්‍යා පීඨයට ගිය ගයනි සහ මල්කාන්ති ආවර්ජනාගේ අතුරුදහන්වීම ගැන අනෙකුත් ශිෂ්‍යයන්ට ද විදුහල්පතිට ද දැනුම් දුන් අතර විදුහල්පති සහ ශිෂ්‍යයින් විසින් ආවර්ජනාගේ නිවසට ද ඇයගේ අතුරුදහන්වීම දන්වන ලදී. ආවර්ජනා ඇසුරු කරන සැමගෙන් ද ඇය ගැන විමසුවත් ආගිය තැනක් සොයා ගත නො හැකි වූයෙන් මේ පිළිබඳව, එබැවින් පොලිසියට දන්වන ලදී.

මෙසේ දින දෙකක් ගත වීමෙන් පසු දින උදෑසන තරුණියකගේ අඩනිරුවත් මළසිරුරක් විද්‍යා පීඨය අසල මුහුදු වෙරළේ ඇති බවට ආරංචියක් පැතිරී ගියේ ය. වෙරළට පාවී ආ මළසිරුර ආවර්ජනාගේ බව ඇයගේ මිතුරු මිතුරියන් විසින් හඳුනා ගන්නා ලදී.



Scanned with CamScanner

ආවර්ජනාගේ දෙමාපියන් ද එම මළසිරුර තම දියණියගේ බව හඳුනා ගන්නා ලදී. ඇයගේ දිගු කෙස් වැටියත් කන් පෙතිවල තිබූ කරාබු ජෝඩුවත්; ඇයව හඳුනා ගැනීමට උපකාරී විය.

පොලිස් නිලධාරීන් ආවර්ජනාගේ මළසිරුර සොයා ගත් ස්ථානය පරීක්ෂා කිරීමෙන් පසුව ( protecting the scene where body is discovered ) එම සිද්ධිය මනුෂ්‍ය ඝාතනයක් යැයි සැක කොට පළාතේ මහේස්ත්‍රාත්වරයාට දන්වා එම ස්ථානයේ දී ම මූලික මහේස්ත්‍රාත් පරීක්ෂණයක් පැවැත් විය. මෙහි දී පොලිසිය විසින් ආවර්ජනාගේ දෙමාපියන්ගේ ද ඇය නවාතැන් ගෙන සිටි බෝඩිමේ අයගෙන් ද සාක්ෂි සටහන් කර ගන්නා ලදී.

ආවර්ජනාට සිය දිවි හානි කර ගැනීමට කිසිම හේතුවක් නො තිබූ බවත්, ඇයව දූෂණය කොට මරා දමා ඇති බවත්, ඇයගේ දෙමාපියෝ මහේස්ත්‍රාත් විභාගයේ දී කියා සිටියෝ ය. මෑතක සිට ආවර්ජනා, ඇයගේ අධ්‍යයන කටයුතු ද අතපසු කර ගනිමින් දේශනවලට නො පැමිණ කල්පනා කරමින් දැඩි සිත් තැවුලෙන් සිටි බවත්, අරවින්ද නමැති විද්‍යා පීඨ ශිෂ්‍යයකු නිතර ඔවුන්ගේ බෝඩිමට පැමිණ ආවර්ජනා සමඟ එක දිගට පැය ගණන් කථා කරමින් සිටි බවත්, ඒ සෑම අවස්ථාවකම ආවර්ජනා කඳුළු සලමින් සිට ඇති බවත්, මරණ පරීක්ෂණයේ දී අනාවරණය විය. තවද, අරවින්දගේ පැමිණීම ගැන විරෝධතාව පළ කරමින් බෝඩිමේ අයිතිකාරිය විසින් ආවර්ජනාට දැඩි ලෙස අවවාද කොට ඇති බවත් හෙළි විය. ආවර්ජනා අතුරුදහන් වූ දිනට පෙර දින උදයේ බෝඩිමට පැමිණි අරවින්ද ඇය සමඟ කථා කරමින් සිට හවස හයයි තිහට පමණ බෝඩිමෙන් පිට වී ගිය බව සාක්ෂිවල දී තව දුරටත් හෙළි විය. රාත්‍රී ආහාරයවත් නො ගෙන ආවර්ජනා, අටට පමණ නින්දට ගිය බවත් පසුදා උදෑසන පහට පමණ මිතුරියන් අවදි වී බලන විට ආවර්ජනා කාමරයේ නො සිටි බවත්, බෝඩිමේ අවට සහ වැසිකිළියේ ඇය නොසිටි නිසා බෝඩිමේ අයිතිකරුවන්ට ද ඒ බව දැන්වූ බවත්; තවදුරටත් මිතුරු මහේස්ත්‍රාත් පරීක්ෂණයේ දී කියා සිටිය හ. අරවින්ද නැමැති විද්‍යා පීඨ ශිෂ්‍යයකු නිතර ආවර්ජනාගේ බෝඩිමට පැමිණ පැය ගණන් ඇය සමඟ කථා කරමින් සිටි බවත්, ඒ පිළිබඳව තම අප්‍රසාදය ආවර්ජනාට කීප වරයක් පළ කර ඇති බවත්, බෝඩිමේ අයිතිකාරිය සාක්ෂි දෙමින් පැවසුවා ය. ආවර්ජනා අතුරුදහන් වූ



දිනට පෙර දින ඇය විසින් අරවින්දට ලිපියක් ලියා තැපැල් කිරීමට තමා වෙත භාර දුන් බව ද බෝඩිමේ අයිතිකාරිය තවදුරටත් මහේස්ත්‍රාත් අධිකරණයේ දී සාක්ෂි දෙමින් සඳහන් කළා ය. ඒ අනුව, අරවින්ද වෙත ආවර්ජනා විසින් යවා තිබූ ලිපිය පොලිසිය විසින් තැපැල් කාර්යාලයයෙන් ලබා ගෙන එය මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කරන ලදී. එම ලිපියේ අත් අකුරු ආවර්ජනාගේ බව ඇයගේ දෙමාපියන් විසින් හඳුනා ගන්නා ලදී. ඇය සිය දිවි හානි කර ගන්නා බව සෘජුව එම ලිපියේ සඳහන් කර නොමැති වුවත්, හදබල මානසික පීඩනයකට තමා පත්වී ඇති බවත්, තමාගේ මනස අවුල් වූ නූල් බෝලයක් මෙන් බවත්, ඇයගේ ඉරණම නො සිතූ පරිදි අවසන් විය හැකි බවත් එම ලිපියේ සඳහන් වී තිබුණි. මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දුන් අරවින්ද කියා සිටියේ, අවසන් වරට තමා ආවර්ජනා හමු වූ අවස්ථාවේ ඇය සතුටින් සිටි බවත්, සිය දිවි හානි කර ගැනීමට ඇයට හේතුවක් නො තිබුණු බවත් ය.

සියලු සාක්ෂි සටහන් කිරීමෙන් අනතුරුව, වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීමට මහේස්ත්‍රාත්වරයා විසින් අධිකරණ වෛද්‍යවරයාට නියෝග කරන ලදී. ආවර්ජනාගේ පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය පළපුරුදු අධිකරණ වෛද්‍ය විශේෂඥයකු විසින් පවත්වනු ලැබී ය.

අධිකරණ වෛද්‍ය විශේෂඥවරයා විසින් ප්‍රථමයෙන්ම සියලු පැතිවලින් මළසිරුරේ වර්ණ ඡායාරූප ලබා ගන්නා ලදී. අභිරහස් ලෙස මරා දමා ඇතැයි සැක කරන දැඩි ලෙස කුණු වී ඇති මළසිරුරුවල ස්වභාවයෙන් ඇතිවන වෙනස්කම් ( post mortem changes ) මරණයට පෙර සිදු කරන ලද පහරදීම්වලින් ඇතිවන තැලීම, කැපුම් තුවාල, පිළිස්සීම් වැනි ප්‍රචණ්ඩ ක්‍රියාවලින් සිදුවූ ඒවා බව පොලිසිය සහ මහජනයා සැක කරන නිසා, මළසිරුරු විච්ඡේදනය ( dissection ) කිරීමට පෙර සිරුරේ වර්ණ ඡායාරූප ලබා ගැනීම සිදු කරනු ලැබේ. ආවර්ජනාගේ මළසිරුර ඉදිමී මුහුණ කළු පැහැති වී තිබුණි. එය දුටු බොහෝ අය කියන්නට වූයේ ධීවර බෝට්ටුවල පාවිච්චි කරන ගෑස් ලාම්පුවකින් ආවර්ජනාගේ මුහුණ පුළුස්සා ඇති බව ය. මළසිරුර කුණුවීම නිසා මුහුණ ඉදිමී කළු පැහැතිවීම පිළිස්සීමක් ලෙස බොහෝ දෙනා වරදවා සිතනු ලැබේ. ඉදිමී තිබූ පපුවේ, කළු තන පටිය හිර වී තිබුණු නමුත් එය ඉරී නො තිබුණි. යට කලිසමක් හෝ යට සායක් නොවූ අතර ඒවා



Scanned with CamScanner

ඇඳ සුදු බවට ශරීරයේ ලකුණු නො තිබිණි. තන් පෙතිවල ඇති පිහාටු සහ කොල් යන ඒවා මාළුන් විසින් කා දමා තිබීමේ ලකුණු තිබුණි. අභ්‍යන්තර ඉන්ද්‍රියයන් සියල්ලම කුණු වී තිබුණි. කරාබු කුට්ටම තන් පෙතිවල තිබුණත් ඒවා නැමී තිබුණි. ලෝරුන් සහ විශාල මාළුන් තන් පෙති සපා කෑමේ දී කරාබු කුට්ටම නැමී ඇත. තන් පෙති දාර ද සපා කා තිබීම එය සිදුවූ බවට තවත් නිදසුනකි. තැළුම් තුවාල හෝ පැලුම් තුවාල හෝ ඇනුම් තුවාල මළසිරුරේ නො වී ය. මළසිරුර අභ්‍යන්තරයේ ද තුවාල නො වී ය. බෙල්ලෙහි පිහිටා ඇති කණ්ඨක අස්ථිය ( hyoid bone ) සහ තයිරොයිඩ් කාටිලේජය ( thyroid cartiladge ) කැඩී නො තිබුණි.

ගෙල මිරිකා මරණයට පත් කිරීමේ දී මුහුණ හෝ ගෙලෙහි ලේ ලප නො තිබෙන අවස්ථා ඇති වුවත්, ස්වරාලයේ ඇතුල් පැත්තේ ලේ ලප ( petechial haemorrhages ) හට ගනී. සිරුර කුණු වුවත් මරණයට පෙර හට ගත් එවැනි ලේ ලප සිරුර කුණුවීම නිසා ස්වරාලයේ හට ගන්නා දුඹුරු පැහැති රතු වර්ණයෙන් ( reddish brown discolouration ) පළපුරුදු අධිකරණ වෛද්‍යවරයෙකුට වෙන් කර ගත හැකි ය. ආවර්ජනාගේ මළසිරුරේ කුණු වී තිබූ ස්වරාලයේ, ගෙල මිරිකීමෙන් ඇති වන්නා වූ ලේ ලප නො තිබූ අතර එම ලක්ෂණය ද ඡායාරූපගත කරන ලදි. මරණයට පෙර ආවර්ජනාගේ ගෙල සිර කර නොමැති බව මෙයින් පැහැදිලි විය. ආමාශය තුළ ආහාර කිසිවක් නො තිබුණි. නින්දට යාමට පෙර ඇය ආහාර නොගත් බව එයින් නිගමනය කළ හැකි විය. කුණු වී තිබූ ස්වරාලය, ශ්වාසනාලය සහ ශ්වාසනාලිකා තුළ මුහුදු වැලි තිබුණි. යම් තැනැත්තෙකු මරණයට පත් කිරීමෙන් පසුව එම මළසිරුර මුහුදට හෝ ගඟකට දැමුවත් මුහුදු ජලය හෝ ගඟේ වතුර ස්වරාලය, ශ්වාසනාලය සහ ශ්වාසනාලිකා තුළට ඇතුල් නො වන බව ජාත්‍යන්තර කීර්තියට පත් වෝහාරක ව්‍යාධිවේදී මහාචාර්යවරයෙකු වූ ශ්‍රීමත් සිඩ්නි ස්මිත් ශූරීන් පැවැත් වූ පරීක්ෂණවලින් සොයා ගෙන ඇත. කුණු වී තිබූ යෝනි මාර්ගය ඉදිමී තිබුණි. එහි තුවාල නො වී ය. යෝනිය තුළින් ගන්නා ලද පිස්නවල ශුක්‍රාණු තිබේ දැයි සොයා ගැනීමට යෝනිය තුළින් ලබා ගත් පිස්න අන්වීක්ෂයෙන් පරීක්ෂා කරන ලදී. එහි ශුක්‍රාණු නො වී ය. ආවර්ජනාගේ යෝනියේ ශුක්‍රාණු නො තිබීමෙන් මරණයට පෙර ඇය ලිංගික සංසර්ගයේ යෙදී නො තිබුණ බව කිව හැකි ය. සර්ම කලාපීය



රටවල පැය දොළහත් හැත්තෑ දෙකත් අතර කාලයක් ගතවීමෙන් පසුව යෝනිය තුළ ඇති ශුක්‍රාණු විනාශ වේ. එම නිසා යෝනියෙන් ලබා ගන්නා ලද පිස්නවල ශුක්‍රාණු නො තිබීමෙන් යම් අයකු ලිංගික සංසර්ගයෙහි නො යෙදුනු බවට ස්ථිරවම කිව නො හැකි ය. මරණයට පෙර ඇති වූ තුවාල මළසිරුරේ නො තිබීමෙන් ද, බැඳ තැබීමේ ලකුණු නොමැතිවීම සහ මියගිය තැනැත්තිය රාත්තල් එකසිය පනත් පමණ බර අඩි පහයි අඟල් පහක් උස මනාව වැඩුනු සිරුරක් ඇතිව සිටි බැවින් ද, මළසිරුරේ බාහිර උපද්‍රවයන් සිදු වූ බවට ලක්ෂණ නො තිබූ බැවින් ද ස්වරාලය, ශ්වාසනාලය හා ශ්වාසනාලිකා තුළ මුහුදු වැලි තිබූ බැවින් ද මරණයට හේතුව දියේ ගිලීම බව ද එයට හේතුව සිය දිවි හානි කර ගැනීමක් විය හැකි බව ද අධිකරණ වෛද්‍යවරයා වාර්තා කළේ ය.

අධිකරණ වෛද්‍ය වාර්තාවත් මූලික මහේස්ත්‍රාත් පරීක්ෂණයේ දි ඉදිරිපත් වූ සාක්ෂිත් සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා ආවර්ජනාගේ මරණය පිළිබඳ විවෘත තීන්දුවක් ලබා දුන්නේ ය.

විද්‍යා පීඨ ශිෂ්‍ය බල මණ්ඩලය විසින් මෙම තීන්දුව ප්‍රතික්ෂේප කරන ලදී. ඔවුහු එම තීන්දුවට දැඩි විරෝධය පළ කළෝ හ. විද්‍යා පීඨයේ සිසු සිසුවියනට නේවාසිකාගාර ලබා දීමට නො හැකි වූ අඩුපාඩුව වසා ගැනීමට බලධාරීන්ට මුක්තු ගැසීමට අධිකරණ වෛද්‍ය නිලධාරියා සාක්ෂි වසන් කොට ආවර්ජනා සිය දිවි හානි කර ගෙන යැයි පෙන්වීමට කූට උපක්‍රමයක් ගෙන ඇති බව කියා විද්‍යා පීඨ සිසුහු උද්ඝෝෂණ කරන්නට වූ හ. ආවර්ජනා පැහැර ගෙන ගොස් මරා දමා ඇති බවට කට කථා ඒ සමගම පැතිර යන්නට විය. ආරක්ෂිත නවාතැන් පහසුකම් නො ලැබීම මෙම මරණයට හේතුව බව දක්වමින් විද්‍යා පීඨ ගොඩනැගිලිවල පෝස්ටර් අලවා තිබුණි. ආවර්ජනාගේ මරණය සිදු වූයේ සිය දිවි හානි කර ගැනීමකින් නොව ඇය බෝඩිමෙන් එළියට පැමිණි විට සාහසිකයන් පිරිසක් ඇයව පැහැර ගෙන ගොස්, දූෂණය කිරීමෙන් පසුව බවත්, ඇයව හඳුනා ගැනීමට නො හැකි වනසේ මුහුණ පුළුස්සා ඇයව මරා දමා ඇති බවත්, ඇයගේ ඇඳුම්, කොනු මෝලක තිබී හමු වූ බවත් කියැවෙන ආරංචි මේ අතර ලැව් ගින්නක් මෙන් පැතිර ගියේ ය. එම ආරංචිය අසත්‍යයක් බව පසුව පැවැත් වූ පොලිස් පරීක්ෂණ වලින් හෙළි විය. ආවර්ජනාගේ මුහුණ පුළුස්සා තිබුණේ නම්



Scanned with CamScanner

ඇයගේ කොණ්ඩය සහ ඇහි බැම පිළිස්සී තිබිය යුතුම ය. එවැන්නක් වෛද්‍ය පරීක්ෂණයෙන් හෙළි නො වූ බව වෛද්‍යවරයා පැහැදිලිව ප්‍රකාශ කොට තිබුණි. එය සනාථ කිරීමට අධිකරණ වෛද්‍යවරයා මළසිරුරේ වර්ණ ඡායා රූප ලබා ගෙන තිබුණි. මළසිරුර කුණුවීම නිසා ඉදිමීම සහ කළු වීම සිදු වී ඇති බැවින්, ආවර්ජනා පුළුස්සා ඇති බවට වැරදි නිගමනයකට සමහර දෙනා පැමිණ ඇති බව මෙයින් පැහැදිලි වේ. ආවර්ජනා බෝඩිමේ සිට සැතපුම් කාලක් පමණ දුර ඇති මුහුදු වෙරළට බලහත්කාරයෙන් ගෙන යෑමට ප්‍රයත්න දැරීමේ දී අනිවාර්යෙන්ම ඇය කෑගැසිය යුතු ය. තවද, සාහසිකයින්ගෙන් මිදීමට තැත් කිරීමේ දී ඇයගේ ශරීරයේ සීරීම් සහ තැලුම් තිබිය යුතු ය. එවැනි කිසිම බාහිර තුවාලයක් ආවර්ජනාගේ සිරුරේ නො තිබුණ බව වෛද්‍ය වාර්තාවේ පැහැදිලිව දක්වා තිබුණි. ආවර්ජනාගේ බෝඩිම් කාමරය මුහුදු වෙරළේ සිට සැතපුම් කාලක් පමණ දුරින් පිහිටා තිබූ බැවින් ද, ආවර්ජනා වැනි නිරෝගී තරුණියක ඇයගේ මිතුරියන්ගේ අනුදැනුම නොමැතිව බලහත්කාරයෙන් කෙනෙකුට මුහුදු වෙරළට ගෙන ඒමට නො හැකි වීමත් නිසා ද ඇය දියේ ගිලී සිය දිවි හානි කර ගත් බව පොලිසිය උපකල්පනය කළේ ය.

ආවර්ජනා දූෂණය කොට මරා දමා මුහුදේ ගිල්වා ඇති බවට කථාවක් විද්‍යා පීඨ සිසුන් විසින් පෙන්වීමට හේතු තුනක් විය. එක් හේතුවක් නම් ආවර්ජනා රූමතියක වීම ය. දෙවන හේතුව නම් තන පටය පමණක් ඇයගේ සිරුරේ තිබීම ය. අනෙක් හේතුව නම් ආවර්ජනා සිය දිවි හානි කර ගන්නා බව සෘජුව ඇය අතුරුදහන් වීමට පෙර ලියා තිබූ ලිපියේ සඳහන් නො කර තිබීම ය. ඇය දූෂණය කළා නම් යෝනි මාර්ගයෙන් ලබා ගත් පිස්නයේ ශුක්‍රාණු දක්නට තිබිය යුතු ය. තවද, ඇය දූෂණය කළා නම් තන පටිය ඉරී යාමක් හෝ එය බොහෝ විට සිරුරේ නොමැති වීමටත් ඉඩ තිබිණ. එසේ ම සාහසිකයින් අතින් ආවර්ජනා මරණයට පත්වූයේ නම් ඇය පැළඳ සිටි රත්තරන් කරාබු කුට්ටම් ගලවා ගැනීමටත් ඉඩ තිබුණි. ආවර්ජනාගේ සිරුරේ ඇඳුමක් නො තිබීම කාගේත් කුතුහලයට හේතුවක් විය. රූමත් තරුණියකගේ නිරුවත් ශරීරයක් මුහුදු වෙරළක තිබීමෙන් බොහෝ දෙනා සිතන්නේ ඇයව දූෂණයට ලක් කර ඇති බව ය. මූලික මහේස්ත්‍රාත් පරීක්ෂණයේ දී හෙළි වූ සාක්ෂි අනුව ඇය අතුරුදහන් වීමට පෙර දින රාත්‍රි අටට පමණ



රාත්‍රියට අඳින ගවුමක් ( night dress ) ඇඳ තිබුණද ගොස් ඇත. මුහුදේ සිටින මෝරුන් වැනි ලොකු මාළුන් විසින් ගවුමේ උරහිස් පටි ඉරා දැමීමෙන් හෝ රළු මුහුදේ තපගන්නා දැඩි රළ පහරට හසුවීමෙන් ගල්පරවල පැටලීමෙන් ගවුමේ උරහිස් පටි කැඩී යෑමෙන් ගවුම ශරීරයෙන් ගැලවී යෑමේ හැකියාව ඇත. සිරුරෙන් ගැලවුණු එවැනි ගවුමක් ගල්පර අතර සිරවී තිබීමට ද පුළුවන.

එක්දහස් නවසිය පනස් නවයේ දී ශ්‍රීමත් ස්ඩනි ස්මිත් විසින් ලියන ලද " මෝස්ලි මර්ඩර් " ( Mostly Murder ) නමැති ග්‍රන්ථයේ ඔහු ලියා ඇති කථාවක් මෙහි දී මට සිහිපත් වේ. වෙඩි උණ්ඩයක් හිසට වැදී මියගිය තැනැත්තකුගේ මළසිරුරක් ඊජිප්තුවේ මුහුදු වෙරළේ තිබී සොයා ගත් නමුත් ඒ අසල තුවක්කුවක් නො වී ය. මියගිය තැනැත්තාට සිය දිවි හානි කර ගැනීමට හේතුවක් නො තිබූ බවත් මෙම සිද්ධිය මනුෂ්‍ය ඝාතනයක් බවත් බලධාරීන් විසින් නිගමනය කරන ලදී. මළසිරුරේ පළමුවැනි අධිකරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ වෛද්‍යවරයාගේ මතය වූයේ ද එය මනුෂ්‍ය ඝාතනයක් බව ය. මෙම සිද්ධිය මහත් ආන්දෝලනයකට තුඩු දුන් කරුණක් වූ බැවින් එවකට ඊජිප්තුවේ අධිකරණ වෛද්‍ය සේවයේ යෙදී සිටි ස්ඩිනි ස්මිත් වෛද්‍යවරයාට එම පරීක්ෂණය නැවත කිරීමට භාර දෙන ලදී. දශම තුනයි දෙකේ උණ්ඩයක් හිසෙහි දකුණු පැත්තේ කන් පෙත්තට ඉහළින් ඇති සංඛක ප්‍රදේශයට ආසන්නව තබා මියගිය තැනැත්තා විසින්ම වෙඩි තබා ගැනීමෙන් පසුව මෙම තැනැත්තාගේ මරණය සිදු වී ඇති බව වෛද්‍යවරයා විසින් වාර්තා කරන ලදී. ඔහුගේ මතය බලධාරීන් විසින් පිළිගත් නමුත් මහජනයා සහ මාධ්‍යවේදීන් විසින් ස්මිත් අධිකරණ වෛද්‍යවරයාව දැඩි විවේචනයට ලක් කරන ලදී. ඊට සති ගණනකට පසුව වාසනාවකට මෙන් මියගිය තැනැත්තාගේ හිස පසාරු කර ගෙන ගොස් තිබූ දශම තුනයි දෙකේ වෙඩි උණ්ඩවලට සමාන වෙඩි උණ්ඩ කීපයක් මියගිය තැනැත්තාගේ කාමරයේ තිබී පොලිසිය විසින් පසුව සොයා ගන්නා ලදී. තවද, මියගිය තැනැත්තාට ජීවිතය එපා වී ( fed up and going to finish it ) ඇති බවට අදහස දැක්වෙන ඔහු විසින් ලියන ලද ලිපියකුත් සොයා ගන්නා ලදී. මුහුදු වෙරළේ දී වෙඩි තබා ගෙන සිය දිවි හානි කර ගැනීමෙන් පසු මළසිරුර අසල වැටී තිබූ පිස්තෝලය වෙන අයෙකු විසින් පැහැර ගෙන ඇති බව මින් පැහැදිලි විය.



Scanned with CamScanner

ආවර්ජනා විසින් ලියන ලද ලිපියේ ද සෘජුව ඇය සිය දිවි හානි කර ගන්නා බව ලියා නො තිබුණත් ඇයගේ මනස නූල් බෝලයක් මෙන් අවුල් වී ඇති බව ලියා තිබීම රිපිප්තුවේ මුහුදු වෙරළේ දී වෙඩි තබා සිය දිවි හානි කර ගත් තැනැත්තා ලියා තිබූ ලිපියේ අදහස්වලට සමාන නො වන්නේ ද? ආවර්ජනාගේ සිය දිවි හානි කර ගැනීමත් රිපිප්තුවේ මියගිය තැනැත්තාගේ සිය දිවි හානි කර ගැනීමත් අතර ගැබ් වී ඇති සමානාත්වතාවක් ඇති බවට මෙය එක් උදාහරණයක් වේ. මෙවැනි සිද්ධින් ලෝකයේ වෙනත් රටවල ද කොතෙකුත් වාර්තා වී ඇත. යම් අයෙකු සිය දිවි හානි කර ගැනීමට හේතු පාදක කරුණු අන් අය නො දනිති. ඒවා දන්නේ මානසික අවපීඩනයෙන් ( mental depression ) පෙලෙන සිය දිවි හානි කර ගන්නා තැනැත්තාම ය.

යම් අයෙකු සිය දිවි හානි කර ගන්නා බව සෘජුවම ලිපියක සඳහන් නො කොට මිය යන අවස්ථා බොහෝ ඇත. එවැනි මළසිරුරුවල වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව එය සිය දිවි හානි කර ගැනීමක් බව නිගමනය කිරීමේ දී ඇතැම් ජනමාධ්‍යකරුවන් හා මහජනයා අධිකරණ වෛද්‍ය නිලධාරීන් උපහාසයට ලක් කිරීම කණගාටුවට කරුණකි. ආවර්ජනා සිය දිවි හානි කර ගෙන ඇති බවට අධිකරණ වෛද්‍යවරයා තීරණය කළේ, ඔහු රුපියල් ලක්ෂ පහක පගාවක් ගෙන ඇති බවට රාවයක් ඇති බව වගකීමෙන් තොරව පළකරන එක් ටැබ්ලොයිඩ් ( tabloid ) පුවත්පතක වාර්තාකොට තිබුණි.

"කියන්නා කෙසේ කීවත් අසන්නා සිහිබුද්ධියෙන් ඇසිය යුතුය" යැයි ප්‍රස්ථාපිරුළක් ඇත. ලෝකයේ සිටි ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරුන්ටත් චෝදනා එල්ල කොට ඇත. එසේ නම් විද්‍යාත්මක පදනමක් මත පළපුරුදු ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකුගේ අපක්ෂපාතී නිගමන අභියෝගයට ලක් කිරීම ගැන කම්පා විය යුතු ද ?

මළසිරුරේ ස්වාශනාලය සහ ස්වාශනාලිකා තුළ තිබූ මුහුදු වැලි හා මිය යාමට පෙර ආවර්ජනා විසින් ලියා තැපෑලට භාර දී තිබී පසුව පොලිසිය විසින් සොයා ගන්නා ලද එම ලිපියත් ඇය සිය දිවි හානි කර ගත් බව ඔප්පු කිරීමට උපකාරී වූ "නිහඬ සාක්ෂි" ලෙස සැලකිය හැකිය.



# සරොම් කැබැල්ලේ සාක්ෂිය

හේනක තක්කාලි කඩමින් සිටි ගැහැණියක්, දැඩි ලෙස කුණු වී ගිය මළසිරුරක් දැක, ඒ බව පොලිසියට දැනුම් දුන්නා ය. එම මළසිරුර හඳුනා ගැනීමට කිසිවකුට නො හැකි විය. ඒ අනුව, මළසිරුර පරීක්ෂා කොට මරණයට හේතුව සහ මරණය සිදු වී ඇති ආකාරය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස, විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත අධිකරණයෙන් නියෝගයක් ලැබුණි.

මළසිරුරකින් දුගඳ හැමීම පිම්බීම සහ එහි වර්ණය වෙනස් වීමට පූතිභවනය ( putrefaction ) නොහොත් කුණුවීම යැයි කියනු ලැබේ. මරණයෙන් පසුව සංකීර්ණ ප්‍රෝටීන් ( complex proteins ) සරල සංඝටකයන් ( simplex constituents ) බවට සංජනයවීම (break down) මළසිරුරක් කුණුවීමට හේතුවයි. මරණයට පත්වීමෙන් පසුව සිරුරක හට ගන්නා ස්වයංග්ලන ක්‍රියාව ( autolysis ) සහ බැක්ටීරියාවල ක්‍රියාව ( bacterial action ) නිසා කුණුවීම හට ගනී. මරණයෙන් පසුව සිරුරක් සෙල්සියස් අංශක හතරක ( celsius $4^0$ ) උෂ්ණත්වයක් ඇති ශීතකරණයක හෝ එවැනි උෂ්ණත්වයක් ඇති දේශගුණයක නො තබන්නේ නම්, අප රටේ දී මරණයෙන් පැය දෙකකට පසුව මළසිරුරක කුණුවීම ආරම්භ වේ.

නෝර්වේ, පින්ලන්තය, ස්වීඩනය, නෙදර්ලන්තය, ජර්මනිය, අයිස්ලන්තය, ස්කොට්ලන්තය සහ එංගලන්තය වැනි උතුරු අර්ධගෝලයේ පිහිටි රටවල ශීත සෘතුවේ දී මළසිරුරුවල කුණුවීම ඇති නො වේ. මළසිරුරක් ශීතකරණයක නො තබා අනාරක්ෂිතව එළිමහනේ තිබේ නම්, කුඹියන්, කැරපොත්තන්, මීයන්, බළලුන්, බල්ලන්, වල් ඌරන්, නරීන්, කඹරගොයින් සහ කාක්කන් වැනි සතුන් විසින් කා දමනු ලැබේ. කැරපොත්තන්, කෘමීන් වැනි කුඩා සතුන් විසින් මළසිරුරේ ඇස්, මුඛය, නාසය සහ යෝනිය වටය කා දමනු ලැබේ. මළසිරුරක් ජලයේ තිබෙන විට මාලුන්, කකුළුවන් හා කිඹුලන් වැනි සතුන් විසින් කා දමනු ලැබේ. සතුන් විසින් කා දමන ලද එවැනි ස්ථාන මරණයට පෙර සිදුවූ තුවාල බව ඇතැම් අය සැක සිතීමට පුළුවන. කුණු වූ මළසිරුරු මත මැස්සන් බිත්තර දමන අතර ඊට පසුව එම බිත්තරවලින් පණුවන් හට ගනී. පණුවන්



Scanned with CamScanner

විසින් මළසිරුරේ සම සහ අභ්‍යන්තර ඉන්ද්‍රියයන් කා දමනු ලැබේ. මළසිරුරක උදරයේ පහළ කොටසේ දකුණු පැත්තෙහි සම කොළ පැහැති වී සිරුරෙන් දුගඳක් හැමීම කුණුවීමේ ප්‍රථම ලක්ෂණයන් ය. නිරක්ෂ රේඛාව අවට පිහිටා ඇති ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ අප්‍රිකාවේ සමහර රටවල යම් අයෙකු මරණයට පත්වීමෙන් පැය හයේ සිට දොළහත් අතර කාලයකින් පසුව උදරයේ කොළ පැහැතිවීම ද කුණුවීම නිසා දුර්ගන්ධය පිටවීම ද සිදු වේ. ශීත පළාතක නම් මෙම ලක්ෂණ හටගැනීමට පැය හතළිස් අටක් හෝ පැය හැත්තෑ දෙකක පමණ කාලයක් ගත වේ.

කුණුවීම නිසා රුධිරයේ ඇති වන වෙනස්වීම් නිසා ඉදිමුණු මළසිරුරේ සම මතුපිට රෝස පැහැති වර්ණයක් හට ගනී. ඉදිමී ඇති රෝස පාට වර්ණයෙන් යුතු මෙවැනි ස්ථාන පහරදීම්වලින් සිදුවූ තැල්ම ලෙසින් සමහරු සිතති. පැහැපත් සමක් ඇති තරුණියකගේ මළසිරුරේ බෙල්ලෙහි, මුහුණේ හෝ කදෙහි මෙවැනි රෝස වර්ණ ස්ථාන තිබීම බොහෝ අය සිතනුයේ මේ තැනැත්තිය මරණයට පෙර පහර දීමකට හෝ දබරයකට ලක් වී ඇති බව ය. නුපුහුණු වෛද්‍යවරුන් පවා එවැනි සාවද්‍ය නිගමනවලට පැමිණි අවස්ථා ඇත. නියුනු පිහියකින් මෙවැනි ස්ථාන විච්ඡේදනය (disssection) කිරීමෙන් පසු ඒවා සත්‍ය වශයෙන්ම මරණයට පෙර සිදුවූ තැල්ම ද, නැතහොත් මළසිරුර කුණුවීම නිසා හටගත් රෝස පැහැති වර්ණයන් ද යන්න පළපුරුදු අධිකරණ වෛද්‍ය නිලධාරියෙකුට නිසැකයෙන්ම හඳුනා ගත හැකි ය. මරණයට පෙර සිදු වූ තැල්මක ලේ කැටි වී තිබෙන අතර කුණුවීම නිසා හටගත් ප්‍රදේශයක ලේ කැටිවීමක් ඇති නො වේ. පටකවේද පරීක්ෂාවට භාජනය කිරීමෙන් මෙම වෙනස ස්ථිරවම හඳුනා ගත හැකි ය.

කුණුවීම වර්ධනය වීමත් සමග රුධිරයේ තිබෙන ගෙන්දගම් (sulphur) මෙත්හීමොග්ලොබින් ( methheamoglobin ) සමග සම්බන්ධ වීමෙන් සල්ෆ් මෙත්හීමොග්ලොබින් ( sulph methheamoglobin ) නමැති රසායනික සංයෝගය සෑදීම නිසා සම මතුපිට හා අභ්‍යන්තර ඉන්ද්‍රියයන්වල කොළ පැහැති වර්ණය හට ගන්නා අතර, ක්‍රමයෙන් එම වර්ණය උදරයෙහි සෑම තැනකටම විහිදී යයි. ඒ සමගම උදරය පිම්බීමට පටන් ගනු ඇත. උදරයෙහි සහ පපුවේ කළු පැහැති ඉරි හට ගන්නා අතර, කුණුවීම තවදුරටත් වර්ධනය වීමෙන්



කළු පැහැති ඉරි ගාත්‍රා මතුපිට ද හට ගනී. ක්‍රමයෙන් මුළු ශරීරයම ඉදිමීම සිදු වේ. දුගඳ හමන කොළ පැහැති දියර වලින් පුරවූ බුබුලු ( post mortem blisters ) සම මතුපිට හට ගනී. එම බුබුලු කැඩී අපිචර්මය ගැලවීම ඇති වේ. කුණුවීම නිසා සිරුර අභ්‍යන්තරයෙහි සහ පේශිවල හටගන්නා ඉන්ඩෝල් ( indole), ස්කැටෝල් ( skatole) සහ හයිඩ්‍රජන් සල්ෆයිඩ් ( hydrogen sulphide ) වැනි දුගඳ හමන වායූන් ( gas ) හට ගැනීම නිසා මුහුණ, බෙල්ල, පපුව, උදරය අත් සහ කකුල් යනාදිය ක්‍රමයෙන් පිම්බීම ( bloating ) ඇති වේ. සිරුර දැඩි ලෙස පිම්බීමත්, සම කළු පැහැතිවීමත් නිසා සිරුර හඳුනා ගැනීම දුෂ්කර ය. සම කළු පැහැතිවීම පිළිස්සීම යැයි බොහෝ දෙනා වරදවා සිතනු ලැබේ. මිය යන්නට පෙර මරණකරු ඇඳුම් ඇඳ සිටියේ නම් ඒවා තද වන අතර කිසිදු අවස්ථාවක ඇඳුම්වල ඉරී යාමක් ඇති නො වේ. මරණකරු ඇඳ සිටියේ පරණ ඇඳුමක් නම් මළසිරුර පිම්බීම නිසා ඉරීමේ හැකියාව පුළුල් වශයෙන් ඇති වේ. එම නිසා කුණු වී ගිය මළසිරුරක තිබෙන ඇඳුම්වල ඉරීම් ඇත්නම්, මළසිරුර සතුන් විසින් ඇද දැමීම නිසා හටගත් ඒවා හෝ එම තැනැත්තා මිය යාමට පෙර ගැටුමක දී ඇඳුම්වල ඇති වූ ඉරීම් විය යුතු ය.

සතියක් පමණ ගත වූ විට කොණ්ඩය ගැල වී ඇස් ඉදිරියට නෙරා ඒම, විශාල වූ තොල් අතරින් දිව පිටතට පැමිණීම සහ සම කළු පැහැතිවීම නිසා මළසිරුර නිග්‍රෝ ජාතිකයෙකුගේ බාහිර පෙනුමට සමාන වේ. ගර්භනීව සිටි කාන්තාවකගේ මළසිරුරක් කුණු වූ විට ගර්භාෂය තුළ වායුව හට ගැනීම නිසා ගර්භාෂය තුළින් භ්‍රෑණය පිටතට ඒම, ගුද මාර්ගය පිටතට නෙරා ඒම සහ ආමාශය පිම්බීම නිසා ඒ තුළ අන්තර්ගත ආහාර, ස්වාසනාලය තුළට ඇතුල් වීම යනාදිය සිදු විය හැකි ය. ගර්භාෂය තුළින් භ්‍රෑණය පිටතට ඒම, මියගිය තැනැත්තිය මරණයට පෙර දරු ප්‍රසූතියක් සිදු වී ඇති බවටත්, ස්වාසනාලයේ ආහාර තිබීම මිය යෑමට පෙර එම තැනැත්තියට වමනය හට ගෙන ආමාශයේ තිබෙන ආහාර ස්වාසනාලය තුළ සිරවීමෙන් හුස්ම ගැනීම් අපහසුතාවයට ( ස්වාස රෝධය / asphyxia ) ඇති වී ඇතැයි වෛද්‍යවරුන්ට සාවද්‍ය නිගමනවලට පැමිණිය හැකි ය. කුණු වී ගිය මළසිරුරුවල පයෝධර, ශිෂ්ණය සහ වෘෂණ කෝෂ විශාල වේ. දින දහයක් ගත වූ පසුව කොණ්ඩය සහ අපිචර්මය මළසිරුරෙන් සම්පූර්ණයෙන්ම ගැලවී යයි.



Scanned with CamScanner

මෙවැනි තත්ත්වයක් ඇති වූ විට මළසිරුරක ඇනුම් තුවාල හෝ කැපුම් තුවාල හෝ වෙඩි වැදීමෙන් සිදු වී ඇති තුවාල ඇත්නම් ඒවායේ හැඩය, ප්‍රමාණය සහ ස්වභාවය බොහෝ දුරට වෙනස් වේ. එවැනි අවස්ථාවක දී එම තුවාලවල නිවරදි දිග සහ පළල පිළිබඳ මතයක් ප්‍රකාශ කළ හැක්කේ කුණු වී ඇති මළසිරුවල ඇඳුම් ඇත්නම් ඒවා මත පිහිටා ඇති කැපුම් සැලකිල්ලට භාජනය කිරීමෙන් පසුව ය. ඇඳුම් නො තිබූ විට කුණු වී ඉදිමී ඇති මළසිරුරක ඇති ඇනුම් තුවාලවල දිග සහ පළල ගැන නිවැරදි මතයක් ප්‍රකාශ කිරීම අසීරු ය.

දැඩි ලෙස කුණු වූ මළසිරුරක් ඥාතීන් හෝ මිතුරන්හට හඳුනා ගැනීම දුෂ්කර ය. මළසිරුරු කුණුවීම නිසා හට ගන්නා දුර්ගන්ධය නිසා අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පවත්වන බොහෝ වෛද්‍යවරු බාහිර සහ අභ්‍යන්තර ඉන්ද්‍රියයන්ගේ පරීක්ෂාව සුපරීක්ෂාකාරීව නො කර පරීක්ෂණය ඉක්මණින් අවසාන කිරීමට බොහෝ විට කටයුතු කරති. කුණුවීමේ දී ඇති වන පිම්බීම නිසා මරණයට පෙර සිදු වූ කැපුම් තුවාල, ඇනුම් තුවාල සහ වෙඩි වැදීම්වලින් ඇති වූ තුවාලවල ස්වභාවයේ, ප්‍රමාණයේ සහ හැඩයේ වෙනස්වීම් ඇති වේ. මීට අමතරව අභ්‍යන්තර ඉන්ද්‍රියයන්වල ඇති වන රෝග ලක්ෂණ ද හඳුනා ගැනීම දුෂ්කර ය. පළපුරුදු නොමැති දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන් දැඩි ලෙස කුණු වී ගිය මළසිරුරක වෛද්‍ය පරීක්ෂණය නිසියාකාරව නො පැවැත්වීම නිසා මරණයට හේතුව සහ මරණය සිදුවූ ආකාරය මනුෂ්‍ය ඝාතනයක් බව සොයා නො ගත් අවස්ථා ද ඇත.

හේනේ තිබී සොයා ගත් දැඩි ලෙස කුණු වී ගිය මළසිරුර, අධිකරණ නියෝගය මත විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කරනු ලැබී ය. ඔහු විසින් එම මළසිරුර පරීක්ෂාවට භාජනය කරන ලදී. කබරගොයි, වල් ඌරන් හා නරින් වැනි සතුන් මළසිරුර කා දමා ඇති බවට ලකුණු මළසිරුරේ දක්නට ලැබිණි. ඇඳුම් කිසිවක් මළසිරුරේ නො තිබුණි. නිවසකින් බැහැර වනාන්තරයක හෝ ලන්දක හෝ කුඹුරක යනාදී ස්ථානවල හමුවන මළසිරුරක ඇඳුම් නොමැතිවීම සැකයට භාජනය කළ යුතු කරුණකි. දැඩි සීතල පරිසරයක දී සීතල ( hypothermia ) නිසා මරණයට පත්වීමට සුළු වේලාවකට පෙර මිය යන තැනැත්තා ගේ සිහිය විකල් වීම නිසා ඔහු විසින්ම, ඇඳ සිටින ඇඳුම් සියල්ලම ඉවත්



කොට නිරුවත්ව සිටින බවට වාර්තා වී ඇත. එවැනි අයවලුන් සාපරාධී ක්‍රියාවකින් මනුෂ්‍ය ඝාතනයකට ලක් වී ඇතැයි මහජනයා හා පොලිසිය වැරදි නිගමනවලට එළඹීමට පුළුවන. මෙවැනි අවස්ථා වැඩි වශයෙන් වාර්තා වී ඇත්තේ එංගලන්තය, ස්කොට්ලන්තය, ජර්මනිය හා උතුරු අර්ධගෝලයේ රටවලින් ය. අප රටේ ද නුවරඑළිය වැනි ප්‍රදේශවල දී මෙවැනි තත්ත්වයක් ඇති විය හැකි ය.

විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කරන ලද එම මළසිරුර උසින් අඩි පහයි අඟල් හයක් විය. හිස් කබල මත තැන් තැන් වල කළු හිස් කෙස් දක්නට ලැබුණි. සම දුඹුරු පැහැති වී සණව ඇලී වැටී තිබිණ. මරණයට පෙර සිදුවූ බාහිර තුවාල කිසිවක් නො වී ය. ඝාතනය කිරීමෙන් පසුව මළසිරුර එළිමහනෙහි තද අව්වේ දවස් කීපයක් තිබීමෙන් පසුව එය හමු වූ ස්ථානය වෙත ගෙනවිත් දමා ඇති බව, මළසිරුරේ ස්වභාවය අනුව වෛද්‍යවරයා උපකල්පනය කළේ ය.

හිස් කබලේ පිහිටි අක්ෂි කුහරවලට උඩින් පිහිටා තිබූ ඉදිරියට නෙරා ගිය කොටස ( සුපර්පක්ෂ්මීය මියර - super ciliary ridge ) නිසා මිය ගිය තැනැත්තා පිරිමියෙකු බව කිව හැකි විය. උඩු ඇන්දේ දකුණු පැත්තෙහි සහ වම් පැත්තෙහි රදනක දත් දෙකම ඉදිරියට නෙරා විත් තිබුණි. උඩු ඇන්දේ දත් කුහර (dental socket) පහළොවක් ද, යටි ඇන්දේ දත් කුහර දහසයක් ද විය. ශරීරය කුණුවීමෙන් පසුව උඩු ඇන්දේ සහ යටි ඇන්දේ දත් ගැල වී යාමෙන් මෙම කුහර මතු වී ඇති බව පැහැදිලි විය. මේ අනුව මිය යාමට පෙර මේ තැනැත්තාට උඩු ඇන්දේ දත් පහළොවක් සහ යටි ඇන්දේ දත් දහසයක් තිබූ බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. උඩු ඇන්දේ දකුණු පැත්තේ දත් අටක් ද වම් පැත්තේ දත් හතක් ද විය. උඩු ඇන්දේ වම් පැත්තේ අවසාන වාර්වක දත මෝදු වී (erupted) නො තිබිණි. එම දත උඩු ඇන්ද තුළ ඇති බව හිස් කබල එක්ස් කිරණ ( x - ray ) පරීක්ෂාවට භාජනය කිරීමෙන් පසුව දැන ගත හැකි විය. ඉහත ලක්ෂණ අනුව මියගිය තැනැත්තා අවුරුදු විස්සත් විසි පහත් අතර වයසැති අඩි පහයි අඟල් හයක් උස පිරිමියකු බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. දත්වල දැඩි ලෙස දුඹුරු පාට කහට බැඳී තිබුණ බැවින් මියගිය තැනැත්තා



Scanned with CamScanner

අධික ලෙස දුම්පානය කරන්නකු හෝ බුලත් විට හපන අයකු විය යුතු බව ද අධිකරණ වෛද්‍යවරයා තවදුරටත් වාර්තා කළේ ය.

හිස් කබලේ පිටුපස පැත්තෙන් ද දකුණු පැත්තේ අවමූර්ධ (occipital area) ප්‍රදේශයේ සෙන්ටිමීටර් හයක් දිග සහ සෙන්ටිමීටර් පහක් පළල සිදුරක් තිබූ අතර, එම සිදුරෙහි පර්යන්තය ( circumference ) රැළි ( scalloped ) වී තිබුණි. සිදුරෙහි උඩ දාරයෙන් පටන් ගත් රේඛීය ( fissure ) නැමැති කැඩුම් කීපයක් හිස් කබලේ ඉදිරියට විහිදී තිබිණි. හිසට ආසන්නව කන් පෙත්තට පිටුපසින් පතරොම් තුවක්කුවක් (shot gun) තබා වෙඩිල්ලක් තැබූ විට හිස් කබලේ එවැනි සිදුරක් ඇති වන අතර එම සිදුරෙහි වටය රැළි වී තිබීම සහ සිදුරේ දාරයෙන් රේඛීය කැඩුම් විහිදී යාම සිදු වේ. වෙඩි වැදීමකින් මරණය සිදු වී ඇතැයි සැක කරන විට එම මළසිරුර සහ පොලිතීන් කොළයක ඔතා හෝ සාප්පුවක් ( zip fastner ) තිබෙන තයිලොන් බෑගයක දමා, කොරස් වශයෙන් එක්ස් කිරණ පරීක්ෂාවට භාජනය කිරීමෙන් ශරීරය තුළ මුනිස්සම් හෝ වෙඩි උණ්ඩ තිබේ නම් ඒවායේ සංඛ්‍යාව සහ ඒවා ශරීරයෙහි පිහිටා ඇති ස්ථානය හා ආකාරය, හිස් කබලේ කැඩීම ආදිය එක්ස් කිරණ ඡායා පටලය ( x-ray films ) පරීක්ෂා කිරීමෙන් දැන ගත හැකි ය. එවැනි එක්ස් කිරණ පටල නඩු විභාගයේ දී ඉදිරිපත් කිරීමෙන් මරණයට හේතුව සහ මරණය සිදු වී ඇති ආකාරය ඔප්පු කිරීමට වෛද්‍යවරයාට බොහෙවින් උපකාරී වේ. හිස් කබලේ කැඩී බිඳී ගිය කැබලි එහි කුහරය තුළ තිබුණි. විෂ්කම්භය සෙන්ටිමීටර් එක හමාරක ප්‍රමාණයේ කාඩ්බෝඩ් [illegible] කීපයක්, [illegible] වර්ගයේ මුනිස්සම් කැට දහසයක් සහ [illegible] හිස් කබල තුළ තිබී වෛද්‍යවරයා විසින් සොයා ගන්නා ලදී. පතරොම් තුවක්කුවක [illegible] හිස් කබල කැඩී ඇති බවත් [illegible] අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය.

[illegible] පරීක්ෂණ පවත්වන විට, මරණය [illegible] හඳුනා ගැනීම අවශ්‍ය කාරණයක් වේ. මියගිය [illegible]



විස්තර මෙවැනි පරීක්ෂණවල දී අධිකරණ වෛද්‍යවරයාට පොලිසිය විසින් ලබා දීම අත්‍යවශ්‍ය වේ. මරණයට හේතුව, වෛද්‍යවරයා විසින් නිගමනය කිරීමෙන් පසුව ඉදිරිපත් වී ඇති අනෙකුත් සියලු සාක්ෂි සලකා බලා, සිද්ධිය මනුෂ්‍ය ඝාතනයක් ද ( homicide ), සිය දිවි හානි කර ගැනීමක් ( suicide ) ද, අහඹු සිදුවීමක් (accident) ද, ස්වාභාවික හේතුවක් ( natural cause ) ද යන්න හදිසි මරණ පරීක්ෂකවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින් තීන්දු කරනු ඇත. මෙම සිද්ධිය මනුෂ්‍ය ඝාතනයක් වුවත් මියගිය තැනැත්තා කවුරුන් දැයි හඳුනා ගෙන නො තිබීම නිසා ඝාතකයා සොයා ගැනීම අසීරු කරුණක් වී තිබිණි.

කුණු වී ගිය මළසිරුරක් හඳුනා ගැනීම සඳහා අධිකරණ වෛද්‍ය විද්‍යාවේ දී භාවිච්චි කරන ක්‍රම කීපයක් ඇත. දත්වල පිහිටීමේ ආකාරය ( dental pattern) සහ මිය යාමට පෙර මියගිය තැනැත්තාට දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් කරන ලද ප්‍රතිකර්මවල ස්වභාවය ( nature of dental treatment ) අධ්‍යයනය කිරීම, මියගිය තැනැත්තාගේ ඡායාරූපයක් ලබා ගෙන සොයා ගෙන ඇති හිස් කබලේ ප්‍රතිබිම්බ අධිස්ථාපනය කිරීම ( photo super imposition of face and skull ) ඒ ක්‍රමයකි. මෙම ක්‍රමයට සෑහෙන කාලයක් ගත වේ. රෝජිනාව මරනිව එස්. පින්හාමි නඩු විභාගයේ දී මෙම ක්‍රමය භාවිච්චි කිරීමෙන් පසුව චූදිතයා වරදකරු වූවත්, සාක්ෂි සංග්‍රහයේ තහවුරු කළ ඉගන්තිය අනුව, චූදිතයේ ඡායාරූපය සමඟ හිස් කබලේ එක්ස් කිරණ අධිස්ථාපනය කිරීම විද්‍යාවක් නො වන බවත්, එම පරීක්ෂණය සිදු කළ එවකට කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරී බී එස්. ගුණවර්ධන මහතා සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඡායාරූප ශිල්පියා යන දෙදෙනා සාක්ෂි සංග්‍රහයේ තහවුරු කළ එක ඉගන්තිය අනුව මෙම ක්‍රමයේ විශේෂඥතාවයක් නොමැති අයවලුන් බවත්, නඩු තීන්දුව පුල්ලේ සහ වීරසූරිය යන විනිසුරුවරුන් ඉදිරියෙහි වන් දහස් නවසිය පනස් පහේ දී විභාග වූ අභියාචනයේ දී තීරණය කරන ලදී.

තමුත් පසුකලෙක දී, පැවැත් වූ නඩු විභාගයක දී, මියගිය තැනැත්තාගේ ඡායාරූපයක් සමඟ ඔහුගේ හිස් කබලේ ප්‍රතිබිම්බ අධිස්ථාපනය කිරීමේ මෙම ක්‍රමය (photo super imposition of face and skull) කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරී වෛ. වී. එල් ප්‍රනාන්දු,



Scanned with CamScanner

සහ කොළඹ වෛද්‍ය පීඨයේ පර්යේෂණ කාර්මික නිලධාරි වෙබ්ස්ටර් යන දෙදෙනා විසින් සිදු කරන ලද අවස්ථාවේ දී එය සාක්ෂි සංග්‍රහයේ හතළිස් පහ සහ හතළිස් හය වන වගන්ති අනුව රාජ නීතිඥ තම්බයියා විනිසුරු ඉදිරියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දී එක්දහස් නවසිය හැටහතරේ දී විභාග වූ නඩුවක දී විද්‍යාවක් ලෙස පිළිගන්නා ලදී.

හිස් කබලේ ලලාට කෝටරකය ( frontal sinus ) අධිශ්ඨාපනය කිරීමෙන් ද මියගිය තැනැත්තා හඳුනා ගත හැකි බව එක්දහස් නවසිය හතළිස් තුනේ දී ෂූලර් ( Schuller ) විසින් පෙන්වා දෙන ලදී. ඇඟිලි සලකුණු ක්‍රමයේ නිවැරදි භාවය මෙන්ම මෙම ක්‍රමය ද නිවැරදි නිසා ඇමෙරිකා එක්සත් ජනපදයේ ගුවන් හමුදාවේ පියාසර කරන සෑම සේවකයෙකුගේම හිස් කබලේ කොරෝටකවල එක්ස් කිරණ පටල ලබා ගෙන ඒවා සුරක්ෂිතව තබා ඇත. ගුවන් අනතුරක් සිදුවූ අවස්ථාවක දී හිස් කබලේ එක්ස් කිරණ පටල ලබා ගෙන හමුදාවේ තැන්පත් කර ඇති කොරෝටක සමග අධිශ්ඨාපනය කිරීමෙන් පිළිස්සී කැඩී බිඳී ගිය මළසිරුරු හඳුනා ගැනීම කරනු ලැබේ.

ත්‍රිමාන පරිගණක ප්‍රස්ථාරික ක්‍රමය ( 3 dimensional computer graphics ) පාවිච්චි කොට පරිගණකයක ආධාරයෙන් සොයා ගත් හිස් කබල අයත් තැනැත්තාගේ මුහුණ ප්‍රතිනිර්මාණය කිරීම ( facial reconstruction ) ඉක්මණින් කළ හැකි නව තාක්ෂණික ක්‍රමයකි. ත්‍රිමාන පරිගණක ප්‍රස්ථාරික ක්‍රමය පාවිච්චි කොට පරිගණකයක ආධාරයෙන් සොයා ගත් හිස් කබල අයත් තැනැත්තාගේ මුහුණ ප්‍රතිනිර්මාණය කිරීම මියගිය තැනැත්තාගේ ඡායාරූපයක් සමග ඔහුගේ හිස් කබලේ ප්‍රතිබිම්බය අධිෂ්ඨාපනය කිරීමේ ක්‍රමයට වඩා පහසුවෙන් හා ඉක්මණින් කළ හැකි ය. ත්‍රිමාන පරිගණක ප්‍රස්ථාරික ක්‍රමය පළමුවෙන්ම සොයා ගන්නා ලද්දේ ලංඩන් විශ්වවිද්‍යාලයේ දී ය. මෙහි දී මියගිය තැනැත්තා හඳුනා ගැනීම සඳහා ඔහු ජීවත්ව සිටි කාලයේ දී ලබා ගත් ඡායාරූපයක් අවශ්‍ය නො වේ. හඳුනා ගත යුතු හිස් කබලෙහි වීඩියෝ සහ පරිඝණක ප්‍රතිබිම්භ තාක්ෂණ ක්‍රමය උපයෝගී කර ගෙන හඳුනා ගත යුතු තැනැත්තාගේ මුහුණ නිර්මාණය කිරීම ( video superimposition ) දැනට ඇති නවීනතම ක්‍රමයයි. මෙම ක්‍රමයෙන් සොයා ගන්නා ලද හිස් කබලේ ප්‍රතිබිම්භ



වීඩියෝ කැමරාවක් පාවිච්චි කොට අධිශ්ඨාපනය කිරීම සහ වීඩියෝ කැමරා පිහිටීම සහ ප්‍රතිබිම්බවල ප්‍රමාණය වෙනස් කිරීමෙන් අධිශ්ඨාපන ක්‍රමයෙන් මියගිය තැනැත්තාගේ මුහුණ නිර්මාණය කළ හැකි ය. මුහුණ ප්‍රතිනිර්මාණය කිරීම සහ වීඩියෝ සහ පරිගණක ප්‍රතිබිම්භ තාක්ෂණ ක්‍රමයන් ලංකාවේ දැනට පාවිච්චි කරනු නො ලැබේ. ඊට හේතුව එවැනි තාක්ෂණික ක්‍රමවලට අධික මුදලක් වැය වන නිසා ය. දන්ත ශල්‍ය දත්ත සහ කෝටරක ප්‍රතිශ්ඨාපන ක්‍රමය හැර ඉහත විස්තර කර ඇති නවීන තාක්ෂණික ක්‍රමවලින් මියගිය තැනැත්තා ස්ථිරවම හඳුනා ගත නො හැකි ය. එම ක්‍රමවලින් බොහෝ විට පරීක්ෂණයට ලක් කරන හිස් කබල, මියගිය බවට සැක කරන තැනැත්තාගේ නො වන බව කිව හැකි ය. මෙම ක්‍රමවල ඇති වැදගත්කම නම් ඒවා ඉක්මණින් සිදු කිරීමේ හැකියාවයි. ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ ( Glasgow ) විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුවේ මිනිසුන් හඳුනා ගැනීමේ කේන්ද්‍රයේ දී කරන ලද මෙවැනි පරීක්ෂණවල දී එක් පුද්ගලයෙකු හඳුනා ගැනීම සඳහා එක්දහස් නවසිය අනූහතේ දී රත් පවුම් දාහක් අය කරන ලදී.

හම්බන්තොට ප්‍රදේශයේ ජීවත් වූ සරත් යනුවෙන් හඳුන්වනු ලබන තමාගේ පුරුෂයා අතුරුදහන් වී ඇති බව ඔහුගේ බිරිය දින ගණනකට පෙර පොලිසිය වෙත පැමිණිලි කොට තිබුණි. සරත් නොහොත් පුංචා ලෙස හඳුන්වනු ලබන ඔහු හොරකම් කීපයකට ද සම්බන්ධ අයෙකු බව පොලිස් වාර්තාවලින් දැන ගැනීමට හැකි විය. මළසිරුරෙහි අත් දෙකෙහිම, අත්වැස්මක් ( glove ) ලෙස ගැලවී තිබූ අපිචර්මයෙන් ( epidermis ) ඇඟිලි සලකුණු ලබා ගැනීම සඳහා එම අපිචර්මය ග්ලසරීන් ( glycerine ) ද්‍රාවනයෙහි දමා ඇඟිලි සටහන් මගින් මියගිය තැනැත්තා හඳුනා ගැනීම සඳහා, ඇඟිලි සලකුණු රෙජිස්ට්‍රාර්වරයා ( registrar of finger prints ) වෙත ඉදිරිපත් කිරීමට පරීක්ෂණය මෙහෙය වූ පොලිසියට භාර කරන ලදී.

අධිකරණයකින් ඇඟිලි සලකුණු ලබා ගන්නේ වැරදිකරුවන් වූ අයවලුන්ගේය. එම ඇඟිලි සලකුණු, බියුරෝවේ රෙජිස්ට්‍රාර්වරයා (registrar of finger print bureau) බාරයේ ඇත. මළසිරුරක ඇඟිලි සලකුණු ලබා ගැනීම පරීක්ෂණ බාර පොලිස් නිලධාරියාගේ වගකීම වේ. මළසිරුර කුණුවීම නිසා ගැල වී ගිය අපිචර්මයෙන් ( epider-



Scanned with CamScanner

mis ) හෝ ඇඟිලිවල ඉතිරි වී ඇති චර්මයෙන් ( dermis ) ඇඟිලි සලකුණු ලබා ගත හැකි ය. ගැල වී තිබෙන අපිචර්මය සියයට දහයක ෆෝමලින් ( formalin ) සහ ග්ලසරින් ( glycerine ) හෝ මද්‍යසාරය ( alcohol ) තුළ තබා පොලිසිය මගින් ඇඟිලි සලකුණු ඛ්‍යුරෝවට ඉදිරිපත් කළ යුතු ය. දරණ ( loop ), ආරුක්කු (arch), වලිය ( whorl ) සහ සංයුක ( composite ) වැනි ඇඟිලි සලකුණු ආකාර හතරක් ඇත. දරණය ඇඟිල්ලෙහි එක් දිසාවකට හෝ ප්‍රතිවිරුද්ධ දිසාවට පිහිටීමට හැකි ය. යම් අයකු හඳුනා ගැනීමට වැදගත් වන්නේ ඇඟිලි සලකුණෙහි මුදුනෙහි පිහිටා ඇති කුඩා වෙනස්කම් ය. යම් අයකු ස්ථිර වශයෙන්ම හඳුනා ගැනීමට සංසන්දනය කරන ඇඟිලි සලකුණු දෙකෙහිම අවම වශයෙන් සමානකම් දහසයක්වත් තිබිය යුතු ය. තැනැත්තන් දෙදෙනෙකුගේ එක හා සමාන ඇඟිලි සලකුණු තිබීමේ ප්‍රවණතාවය බිලියන හැට හතර දෙනෙකුගෙන් එක් කෙනෙකුට ය. අබිරහස් ලෙස යම් අයකු මරා දමා ඇති ස්ථානයක ඝාතකයාගේ ඇඟිලි සලකුණු තිබිය හැකි හෙයින් එවැනි ස්ථානයක් පරීක්ෂා කිරීමට පැමිණෙන අධිකරණ වෛද්‍යවරුන්, රෝහාරක විද්‍යාඥයන්, පොලිස් නිලධාරින් සහ පොලිස් ඡායාරූප ශිල්පීන් යන අය එම ස්ථානයේ දී ඉතා ප්‍රවේශමින් තම රාජකාරි කටයුතු කළ යුතු ය. සර්වසම නිඹුල්ලන්ගේ පවා ඇඟිලි සලකුණු වෙනස් ය. ඇඟිලි සලකුණුවලට අමතරව අල්ලෙහි සලකුණු ( palm prints ), යම් කෙනෙකු හඳුනා ගැනීමට ප්‍රයෝජනවත් වේ. හඳුනා ගැනීම සඳහා තොල්වල නැම්මේ පිහිටීම ( lip crease ), කන් පෙත්තේ හැඩය ( ear shape ) සහ පිටඅල්ලෙහි ශිරා පිහිටා ඇති ආකාරය පිළිබඳව දැනට ගවේෂණයන් කර ගෙන යනු ලැබේ.

මියගිය තැනැත්තා සාපරාධී ක්‍රියාවකට බන්ධනාගාරගත කර සිටි අයකු නිසා, ඔහුගේ ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා භාරයේ තිබුණ බැවින් වෛද්‍ය පරීක්ෂණයේ දී වෛද්‍යවරයා ලබා දුන් අපිචර්මයෙහි ඇඟිලි සටහන් සමග ඒවා සංසන්දනය කිරීමෙන්, අතුරුදහන් වූ පුද්ගලයා හම්බන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වූ සරත් නමැති අයගේ බව නිසැකවම හඳුනාගත හැකි විය. මීළඟ පියවර වූයේ සරත්ගේ ඝාතකයා කවුද යන්න සොයා ගැනීමයි. මරණකරුට සතුරන් සිටියේ දැයි ඔහුගේ බිරිඳගෙන් පොලිසිය ප්‍රශ්න කරන විට ඇය පැවසුවේ සයිමන් නමැත්තකු සමග ඉඩම් ආරවුලක් පිළිබඳව පරණ හෝන්තරයක් තිබූ බවත් දෙදෙනා අතර බහින්බස්



වීමක් මෑතදීත් සිදුවූ බවත් ය. ඒ අනුව, පොලිසිය සයිමන්ගේ නිවස පරීක්ෂා කරන විට ඇඳක් යට තිබී පරණ සරොමක් සොයා ගන්නා ලදී. සරොමෙහි කොටසක් ඉරා ඉවත් කර ඇති බව පොලිස් නිලධාරීන්ට පෙනුණි. හිස් කබල තුළ තිබී සොයා ගත් රෙදි කැබලි තුන සම්පූර්ණයෙන්ම දිග හැර එකිනෙකට ආසන්නව තබා සරොමෙහි හිඩසට තැබූ විට; එම සරොම් කැබලි තුන සයිමන්ගේ නිවසේ තිබී සොයා ගත් සරමෙහි ඉතුරු කැබලි බව පෙනී ගියේ ය.

සරත්ගේ මරණය සිදු කිරීම පිළිබඳව සයිමන් පොලිස් අත් අඩංගුවට ගෙන දිගින් දිගටම ප්‍රශ්න කළේ ය. සරොම තමාගේ වුවත් තමා මෙම අපරාධය සිදු නො කළ බව සයිමන් තරයේ පොලිසියට කියා සිටියේ ය. සයිමන්ට තුවක්කුවක් තිබේ දැයි පොලිසිය ප්‍රශ්න කළ විට තමාට තුවක්කුවක් නොමැති බවත්, හේනට එන වල් ඌරන් පලවා හැරීමට " ගල්කටස් " තුවක්කුවක් තමාගේ පුතා වන සිරිපාල ළඟ ඇති බවත් ප්‍රකාශ කළේ ය. ඒ වන විටත් සිරිපාල ගෙදරින් අතුරුදහන් වී සිටියේ ය. සිරිපාලගේ හේනේ තිබූ පැල පරීක්ෂා කිරීමේ දී එම වහලේ සඟවා තිබූ "ගල්කටස්" තුවක්කුවක් පොලිසියට සොයා ගැනීමට හැකි විය. එම තුවක්කුවේ ඇඟිලි සටහන් ඇති බවත් එම ඇඟිලි සටහන් සයිමන්ගේ නො වන බවත් ඇඟිලි සලකුණු විශේෂඥවරයා විසින් වාර්තා කර තිබිණි. ගල්කටස් තුවක්කුවක් සිරිපාලගේ හේනේ සාදා තිබූ පැලේ තිබී සොයා ගත් බැවින් සරත්ට වෙඩි තබා මරා ඇත්තේ සිරිපාල බව පොලිසිය සැක කළේ ය. කාලය ගෙවී ගියත් සිරිපාල පොලිස් අත් අඩංගුවට ගැනීමට නො හැකි විය.

තුන් මසකට පසු කතරගම වැඩිහිටි කන්දේ කැලයේ ගසක එල්ලී මියගිය මිනිසෙකුගේ මළසිරුරක් තිබෙන බව පොලිසියට ආරංචි විය. පොලිසියට එම සිද්ධිය වාර්තා වන විට මළසිරුර දැඩි ලෙස කුණු වී තිබිණි. මියගිය අයගේ කමිස සාක්කුවේ කුණු ඔජස් තැවරී ගිය ලියුමක් විය. සරත් නොහොත් පුංචාට වෙඩි තබා මැරුවේ තමා බවත් එම අපරාධය සිදු කිරීමට හේතුව සරත්ගේ බිරිඳත් තමාත් අතර තිබූ අසම්මත ප්‍රේම සම්බන්ධය බවත් එහි සඳහන් වී තිබුණි. වෙනයම් කෙනෙකු විසින් සිරිපාල මරා ඔහු ලියූ බව පෙන්වීමට ලිපියක් ලියා ඔහුගේ සාක්කුවේ දමා මළසිරුර



Scanned with CamScanner

වැඩිහිටිකන්දේ කැලයේ එල්ලීමට හැකියාව ඇති බව පොලිසිය සැක කළේ ය. එම සැකය දුරු කිරීමට නම් මළසිරුර නිවැරදිව හඳුනා ගැනීම ඉතාම අවශ්‍ය බව පොලිසියට ඒත්තු ගියේ ය. මළසිරුර දැඩි ලෙස කුණු වී තිබුණ නිසා සිරිපාලගේ පියාට එය සිරිපාලගේ බව හඳුනාගත නො හැකි විය. එම නිසා මළසිරුර හඳුනා ගැනීමට විශේෂඥ අධිකරණ වෛද්‍යවරයෙකු වෙත යොමු කරන ලදී. ඒ අනුව, මරණයට හේතුව සොයා ගැනීමට සහ මළසිරුර හඳුනා ගැනීම සඳහා වෛද්‍ය පරීක්ෂණය පවත්වන ලදී.

ගෙලෙහි පිහිටි බණ්ඨක අස්ථිය භග්නය වී නො තිබීමත්, සිරුරේ මරණයට පෙර සිදු වී තිබූ මරණය ගෙන දිය හැකි කැපුම්, ඇනීම්, වෙඩි තැබීම් ආදියෙන් ඇතිවන තුවාල, අස්ථින්වල භග්න නො තිබීම සහ ආමාශයේ සහ කුඩා බඩවැලේ කෘමිනාශක නො තිබීම නිසාත් මරණයට හේතුව ගෙල වැලඳා ගැනීම බව වෛද්‍යවරයා නිගමනය කළේ ය.

ගෙල වැලඳා ගැනීම සිය දිවි හානි කර ගැනීමක් බවට උපකල්පනය කළ නිසා ඊළඟ පියවර වූයේ මියගිය තැනැත්තා ස්ථිරවම හඳුනා ගැනීම ය.

මියගිය තැනැත්තාගේ දකුණු කකුලේ ජංඝාස්ථි ඇටය කලකට පෙර කැඩීමෙන් පසුව සුවවීමේ ලකුණු තිබුණි. එම නිසා, සිරිපාලගේ දකුණු කකුල වම් කකුලට වඩා අඟල් එක හමාරක් කෙටි බවත් සිරිපාල ඇවිදින විට තරමක් තොණ්ඩි ගසන අයකු විය යුතු බවත් විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වාර්තා කොට තිබුණි. පොලිසිය විසින් මේ පිළිබඳව සිරිපාලගේ පියා වන සයිමන්ට දැන්වීමේ දී, අවුරුදු පහකට පමණ පෙර කැලයේ බැඳ තිබූ තුවක්කුවකින් සිරිපාලගේ දකුණු කකුලට වෙඩි වැදී තුවාල වී මාස කිහිපයක් රෝහල්ගත වී සිටි බව සයිමන් ප්‍රකාශ කර සිටියේ ය.

මළසිරුරේ තිබූ කමිස සාක්කුවේ තිබී සොයා ගත් ලිපියේ අත් අකුරු සිරිපාලගේ අත් අකුරු වලට සමාන බව අත් අකුරු විශේෂඥවරයා ( examiner of question documents ) වාර්තා කොට තිබිණි. ලියුමේ අත් අකුරුවලින් සහ මළසිරුරේ අස්ථින්වල සුව වී තිබූ භග්නයෙන් වැඩිහිටිකන්දේ එල්ලී මැරී සිටි පුද්ගලයා සිරිපාල



යැයි හඳුනා ගත් බව පොලිසිය සෑහීමකට පත් වුවත් හඳුනා ගැනීම තවදුරටත් නිශ්චිත කිරීමට පරීක්ෂණ කළ යුතු බව අධිකරණ වෛද්‍යවරයා තීරණය කළේ ය. එක් අයෙකුගේ හිස් කබලේ ලලාට අස්ථීන් තුළ ඇති කෝටරවල ( sinuses ) හැඩය වෙනත් අයෙකුගේ ලලාට ( frontal ) කෝටරවල හැඩයට වෙනස් බවත් ඇඟිලි සලකුණු මෙන්ම යම් අයෙකු හඳුනා ගැනීමට ඒවා ප්‍රයෝජනවත් වන බවත් සොයා ගෙන ඇත. සිරිපාලට වෙඩි වැදී රෝහලට ඇතුළු කළ අවස්ථාවේ ඔහුගේ හිසෙහි එක්ස් කිරණ ඡායා පටල ලබා ගෙන තිබූ බැවින් එම ඡායා පටල පොලිසිය මගින් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. සිරිපාලගේ යැයි හඳුනා ගන්නා ලද හිස් කබලේ ලලාට ප්‍රදේශයේ එක්ස් කිරණ ඡායා පටල ලබා ගෙන සිරිපාල ප්‍රතිකාර ලබා ගත් රෝහලේ දී ගන්නා ලද එක්ස් කිරණ ඡායා පටල සමග එක මත එක තබා පරීක්ෂා කරන ලදි. රෝහලෙන් ලබා ගත් එක්ස් කිරණ ඡායා පටලයෙහි තිබූ ලලාට කෝටරයේ හැඩයත් මළසිරුරෙන් ලබා ගත් එක්ස් කිරණ පටලයේ තිබූ ලලාට කෝටරයේ හැඩයත් සෑම අතින්ම එක හා සමාන විය. ඒ අනුව, වැඩිහිටි කන්දේ එල්ලී මැරී සිය දිවි හානි කර ගෙන ඇත්තේ සිරිපාල බව නිසැකයෙන් ඔප්පු කිරීමට හැකි විය. ඉදිරිපත් කරන ලද විද්‍යාත්මක සාක්ෂි සලකා බලා මියගොස් ඇත්තේ සයිමන්ගේ පුතා වන සිරිපාල බවත් ඔහු ගෙල වැලලා සිය දිවි හානි කර ගෙන ඇති බවටත් හදිසි මරණ පරීක්ෂකවරයා තීන්දු කළේ ය.

අසම්මත ප්‍රේම සම්බන්ධයක් හේතුවෙන් තව කෙනෙකුගේ මරණය සිදු කළ සිරිපාල අධිකරණය ඉදිරියේ දී දඬුවම් නො ලැබුවත් හෘද සාක්ෂිය විසින්ම ඔහුට නියමිත දඬුවම් ලබා දී ඇති බව ඔහු ගේ සිය දිවි හානි කර ගැනීමෙන් පැහැදිලි වේ.

සරත්ගේ කුණුවී ගිය සිරුරේ, හිස් කබල තුළ තිබී සොයා ගත් සරොම් කැබලි තුන, සිරුරේ අත්වලින් ලබා ගත් අපිචර්මයෙහි ඇඟිලි සටහන්, ගල්කටස් තුවක්කුවේ තිබූ ඇඟිලි සලකුණු සහ සරත්ගේ කලකට පෙර කැඩී බිඳී ගිය ජංඝාස්ථිය, කමිස සාක්කුවේ තිබූ ලිපිය, ලලාට කෝටරවල හැඩය සහ බණ්ඨක අස්ථිය නො කැඩීම යන මේවා සරත් සහ සිරිපාල යන අයගේ මරණයට හේතුව සොයා ගැනීම සහ ඔවුන් දෙදෙනා හඳුනා ගැනීමට උපකාරී වූ "නිහඬ සාක්ෂි" ගණයට අයත් වේ.



Scanned with CamScanner

# කුලවාදය සහ ඝාතනය

ශ්‍රියාලතා, උඩරට ගම්මානයක කුලහීන ජන කොටසකට අයත් පවුලක උපන් පැහැපත් වර්ණයක් ඇති රූමත් ගැමි තරුණියකි. කුඩා කලසිටම ඇය ඉගෙනීමට දක්ෂ වූවා ය. ඇයගේ වයස අවුරුදු විසි පහක් විය. උඩරට සමාජයේ ඇතැම් අය තවමත් කුලහීනයන් පහත් සේ සලකති. එයින් මිදීමට තිබෙන එකම මග ඉහළ තනතුරක් දරණ රජයේ රැකියාවක් ලබා ගැනීම බව, වටහා ගත් ශ්‍රියාලතා එම අරමුණ ඉෂ්ට කර ගැනීමට දැඩි ලෙස අධිෂ්ඨාන කර ගත්තා ය. ඇයගේ රූපයට වශී වූ බොහෝ තරුණයින් ඇය සමග ප්‍රේම සම්බන්ධතා ඇති කර ගැනීමට උත්සාහ දැරුවත් ඒ කිසිවෙකුටවත් ඇයගේ කැමත්ත ලබා ගත නො හැකි විය. ශ්‍රියාලතාගේ දෙමාපියෝ ගමේ ප්‍රභූවරයන්ගේ සලු පිලි සේදීමෙන් උපයා ගත් මුදලින් එදිනෙදා ජීවිකාව කරගෙන ගියෝ ය. ඔවුන් ජීවත් වූයේ ගමේ වංශක්කාර පෙළපතකින් පැවත එන හාමු මහත්මයාට අයත් ඉඩමක පාදා ගත් කුඩා කටු මැටි නිවසක ය. හාමු මහත්මයාගේ වලව්වට කුඩා කළසිටම යන එන ශ්‍රියාලතාගේ හුරුබුහුටිකම් සහ දක්ෂකම්වලට වලව්වේ හාමිනේ ඇලුම් කළා ය. ශ්‍රියාලතා ඉගෙනීමට දක්ෂ නිසා අවශ්‍ය පොත්පත් සියල්ලක්ම වලව්වේ හාමිනේගෙන් ඇයට ලැබුණි. ශ්‍රියාලතා තරුණියක වූ පසු වලව්වට පැමිණීම ඇය නතර කළා ය.

හාමු මහත්මයාටත් වලව්වේ හාමිනේටත් හිටියේ මධුමාධව නම් පුතෙක් පමණි. වයස අවුරුදු තිහක් වූ ඔහු අවිවාහකයකු විය. දෙමාපියන්ට අයත් වතුපිටි සහ කුඹුරු පාලනය කර ගෙන ඉන් උපයා ගත් මුදලින් ජීවත් වීමට හැකියාව තිබුණ නිසා රැකියාවක් කිරීමට මධුමාධව උනන්දු නො වී ය. මධුමාධවට ඔහුගේ මාමාගේ දුවක් වන ප්‍රියන්වදා විවාහ කර දීමට දෙපාර්ශවයේම වැඩිහිටියන් දැඩි කැමැත්තක් දැක්වූ හ. එක් අතෙකින් දෙපාර්ශවයම උසස් යැයි සැලකෙන කුලවලට අයත්වීමත්, ඔවුනොවුනට අයත් වූ ඉඩම් අන් අයට අයත් නො වී ඔවුනටම අයත් වීමට ඉන් අවකාශ සැලසෙන නිසාත් මෙම දෙදනාගේ විවාහ එකඟතාවට එය විශේෂ හේතුවක් විය. එහෙත්, මධුමාධව ඊට එතරම් කැමැත්තක් නො දැක්වී ය. දෙමාපියන්ගේ දැඩි බලපෑම නිසාත් පිය උරුමයෙන් තමන්ට ලැබීමට



ඇති දේපල නිසාත් ප්‍රියන්වදා සමග විවාහ වීමට මධුමාධව පසුව කැමැත්ත ප්‍රකාශ කළේ ය. ඒ බව දෙපාර්ශවයම දැන සිටිය හ. විවාහ වනතුරු දෙදෙනා ඉඳහිට හමුවූවත් ඔවුනොවුන් අතර එතරම් ලෙන්ගතුකමක් නො වී ය. දේශපාලනය පිළිබඳවත් සාහිත්‍ය සහ නවකථා පොත් කියවීමටත් මධුමාධව දැඩි කැමැත්තක් දැක්වූයේ ය. කොණ්ඩය කොටට කපා තලඑලළු වර්ණයකින් යුත් ප්‍රියන්වදා ද ප්‍රියමනාප පෙනුමකින් යුතු යුවතියක වූවා ය. ඇය අධ්‍යාපනය ලැබුවේ කොළඹ ප්‍රසිද්ධ කාන්තා විද්‍යාලයක ය. ප්‍රියන්වදාගේ ළමා කාලය බොහෝ කලක් කොළඹ ගත කළ නිසා ඇය ගැමි සිරිත්වලට ඇලුම් කළේ නැත. නගරබද යුවතියන් අඳින නවීන විලාසිතාවලට මැසූ ඇඳුම් ඇඳීමට ඇය බලවත් කමැත්තක් දැක්වූවා ය. මධුමාධව ප්‍රියන්වදාට අකමැතිවීමට බෙහෙවින් මේවා බලපා තිබුණි. ඇය අලුත් විලාසිතාවන් අනුකරණය කරන බටහිර පන්නයට හැඩුනු යුවතියක් නිසා ඇයට තමා සුදුසු නො වන බව මධුමාධව ඔහුගේ දෙමාපියන්ට පැවසුවේ ය.

"අපි හොඳ වංසක්කාරයෝ, ඒ නිසා පුතේ උඹ ප්‍රියන්වදාව බඳින්නම ඕනෑ" යැයි වලව්වේ හාමිනේ පුතාට නිතර නිතර ඇවිටිලි කළා ය. මේ ප්‍රශ්නයට මැදි වී සිටි මධුමාධවට එක් දිනක් වලව්වේ හාමිනේ හමුවීමට පැමිණි ශ්‍රියාලතාව අහම්බෙන් දක්නට ලැබිණි. කුඩා කාලයේ මධුමාධව ඇය දැක ඇතත් තරුණියක වූ පසු මධුමාධවට ඇය -දක්නට නො ලැබුණි. ඔහු දුටු වහාම ඇය, මුව සරසාගත් හිනාවකින් ඔහු දෙස බැලුවා ය. කුඩා කළ ඉඳහිට තමන් සමග සෙල්ලම් කළ ළමයා ද මේ ? කියා මධුමාධවට සිතිණ. කච්චේරියේ විධායක නිලධාරි ශ්‍රේණියේ රැකියාවක් තමන්ට ලැබුණ බවත් පත්වීම භාර ගැනීමට පෙර වලව්වේ හාමිනේ හමු වී ඒ බව ඇයට දැන්වීමට සහ වලව්වේ හාමිනේගේ ආශිර්වාදය ලබා ගැනීමට තමා පැමිණි බවත්, ශ්‍රියාලතා මධුමාධවට ලැජ්ජාවෙන් යුතුව පැවසුවා ය. එවැනි වැදගත් රැකියාවක් ලැබුණේ දේශපාලඥයෙකුගේ බලපෑමකින් ද කියා මධුමාධව විහිළුවට මෙන් ඇයගෙන් ඇසුවේ ය. ශ්‍රියාලතාගේ මුහුණ රතු විය. ඒ පැනය ඇය නොරිස්සුවා ය. කොතරම් අසරණ වුවත් තමන්ටත් ආත්ම ගරුත්වයක් ඇති බවත් රැකියාවක් ලබා ගැනීමට කිසි දිනෙක දේශපාලඥයන්ගේ දෙපතුල් ළඟට යාමට තරම් තමන් පහත් ක්‍රියාවක් කරන අයෙකු නො වන බවත් ඇය දැඩි ස්වරයකින් මධුමාධවට



Scanned with CamScanner

පැවසුවා ය. උසස් පෙළ විභාගය සමත් වීමෙන් පසුව ඇය පේරාදෙණිය සරසවියේ කලා පීඨයට ඇතුළත්ව සිංහල භාෂාවෙන් ගෞරව උපාධියක් ලබා ගත් බවත් ඇයගේ අධ්‍යාපන කටයුතුවලට වලව්වේ හාමිනේ ඉදහිට උදව් උපකර කළ නිසා එයට කෘතගුණ සැලකීම සඳහා වලව්වේ හාමිනේ බැහැ දැකීමට පැමිණි බවත් තවදුරටත් ඇය පැවසුවා ය. තමා මේ කිසිවක් නො දැන සිටි බවත් තමා ඇසූ ප්‍රශ්නය ඉල්ලා අස් කර ගන්නා බවත් එයින් ශ්‍රියාලතාට ඇති වූ සිත් තැවුලට තමා සමාව ඉල්ලා සිටින බවත් මධුමාධව නිහතමානීව ඇය ඉදිරියේ ප්‍රකාශ කළේ ය.

වලව්වේ දෙමහල්ලන් කෙතරම් උඩගු අය වුවත් මධුමාධව මිනිස්කම හඳුනන උදාර ගතිගුණ ඇති නිහතමානී අයකු බව වටහා ගත් ඇය එම සිද්ධිය අමතක කරන ලෙස ඔහුට කීවා ය. ශ්‍රියාලතාගේ තොරතුරු තවදුරටත් දැන ගැනීමට මධුමාධව උත්සාහ කළත් එවේලෙහි වලව්වේ දෙමහල්ලන් නො සිටි බැවින් ශ්‍රියාලතා වලව්වෙන් පිටව ගියා ය. මධුමාධව සමග වකිතයක් නොමැතිව කථා කිරීමට නො හැකි වීම ගැන ඇයටම සිතෙන් දොස් නැඟු ශ්‍රියාලතා ඇයගේ යටි හිතේ මධුමාධව ගැන කැමැත්තක් ඇත් දැයි සිතුවා ය. සමාජ මට්ටමෙන් අහසයි පොළවයි වැනි ඔවුන්ගේ පවුල් දෙක කෙසේවත් නො ගැලපෙන බවත් විශ්වවිද්‍යාලයේ සිටි අවධියේ කිසිම ප්‍රේම සම්බන්ධයකට සිත නොගිය තමාට දැන් කුමක් සිදු වී ඇත් දැයි, සිතූ ඇය ඇයටම දොස් පැවරුවා ය.

මෙසේ කාලය ගෙවී යද්දී මධුමාධව අමතක කිරීමට ඇය කෙතරම් උත්සාහ කළත් වෙරළට ගසන රැල්ල මෙන් නැවත නැවතත් මධුමාධව ඇයට මතක් වන්නට විය. රැකියාවට යාමට පෙර වලව්වේ හාමිනේ බැලීමට ඇය ගිය බවත් එහි දී මධුමාධව හමුවුණ බවත් ශ්‍රියාලතා ඇයගේ මවට කීවා ය. මධුමාධවට ශ්‍රියාලතාගේ හිතේ ඇති කැමැත්ත ඉවෙන් මෙන් වටහා ගත් ශ්‍රියාලතාගේ මව මෙසේ කීවා ය. " දුවේ අපි කුලහීන මිනිස්සු, මධුමාධව අප්පොලා වැදගත් වංසක්කාරයෝ, ඒ උත්තමයෝ සමග හාදකම් පවත්වනවා එහෙම නොවෙයි " කියා ඇයගේ මව ශ්‍රියාලතාට අවවාද කළා ය. අම්මාගේ ඔවදන ඇයගේ සවන් පත්වල රැව් පිළිරැව් දෙන්නට විය. මවු මුවින් නොකී දෙය දෙනෙතින් ශ්‍රියාලතාගේ මව වටහා ගෙන ඇති බව ඇය තේරුම් ගත්තා ය. අම්මා ඇයට පහදා දුන්නේ



සමාජ යථාර්ථය බවත් සදහටම තමා මධුමාධව අමතක කරන බවටත් ශ්‍රියාලතා අවසානයේ දී තීරණය කළා ය.

අලුත් රැකියාවේ වැඩ භාරගෙන හය මසක පුහුණුව සඳහා ශ්‍රියාලතා කොළඹ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පුහුණුවීමට ගියා ය. එම අවදියේ ඇය නැවතී සිටියේ කොළඹ කාමරයක ය. ශ්‍රියාලතා නො සිතූ පරිදි ඇය හමුවීමට එක් දිනක් සවස මධුමාධව ඇයගේ බෝඩිමට පැමිණියේ ය. ශ්‍රියාලතාට ඇයගේ දෑස් අදහාගත නො හැකි විය. කථා බහ කිරීමට බෝඩිම සුදුසු ස්ථානයක් නො වන බව සිතූ ඇය ඔහු සමග අවන්හලකට ගියා ය. නො දන්වා ශ්‍රියාලතා හමුවීමට පැමිණීම ගැන සමාව ඇයද සිටි මධුමාධව තමා බරපතල ප්‍රශ්නයකට මුහුණ පා සිටින බැවින් ඒ පිළිබඳව අවසාන තීරණයක් ගැනීමට පෙර ශ්‍රියාලතා හමුවීමට පැමිණි බවත් ඇයට පහදා දුන්නේ ය. ප්‍රියන්වදා නැමති ඔහුගේ ඇවැස්ස නැනා විවාහ කර ගැනීමට ඇයගේ පාර්ශවයෙන් සහ මධුමාධවගේ පාර්ශවයෙන් දැඩි බලපෑම් තිබෙන බවත් එම විවාහයට දැනටමත් තමා කැමැත්ත දී ඇති නමුත් ප්‍රියන්වදා ඔහුට නො ගැලපෙන කෙනකු බව දැන් තමාට වැටහෙන බවත්, ශ්‍රියාලතාගේ චිත්ත ධෛර්ය, නො පසුබට උත්සාහය සහ ආත්ම සංයමය දැඩි ලෙස අගය කරන නිසා ශ්‍රියාලතාව විවාහ කර ගැනීමට තමා කැමති බවත් මධුමාධව ඇයට පහදා දුන්නේ ය. විවාහවීමට කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසුව එම ගිවිසුම කඩ කිරීම කිසිසේත් නො කළ යුතු දෙයක් බව ශ්‍රියාලතා මධුමාධවට පහදා දුන්නා ය. මව ඇයට කී දෙය හොඳින් මතක තබා ගෙන සිටි ශ්‍රියාලතා තමා හමුවීමට කාර්යාලයට හෝ බෝඩිමට මීට පසුව කිසි දිනක නො පැමිණෙන ලෙසට මහත් දයාවෙන් යුතුව ඔහුගෙන් ඉල්ලා සිටියා ය. ශ්‍රියාලතාගේ වදන්වලට ඇහුම්කන් දුන් මධුමාධව නිශ්ශබ්දව කිසිවක් කර කියා ගත නො හැකිව ඇය දෙස බලා ගෙන සිටියේ ය. ශ්‍රියාලතා මධුමාධව කෙතරම් අධෛර්ය කළත්, ගිනි සිළුවකට ඇදෙන පළගැටියකු මෙන් මධුමාධව ශ්‍රියාලතාට ළංවී ය. මධුමාධවගේ සිත වෙනස් කිරීමට ඇය දැඩි වෙහෙසක් ගත්තා ය. එහෙත් ඒවා අසාර්ථක විය. ශ්‍රියාලතාගෙන් මධුමාධව ඉවත් කිරීමට ඇති එකම පියවර ගැනීමට, අවසානයේ දී ඇය තීරණය කළා ය. ඇයගේ කාර්යාලයේ සේවය කරන නුවන් සමග හාදකමක් ශ්‍රියාලතා ඇති කර ගත්තා ය. මධුමාධවට තමා එපාවීමට මෙවැනි පියවරක් ගත්තේ අකමැත්තෙන් වුවත් එම අවස්ථාවේ දී



Scanned with CamScanner

ගැනීමට තිබූ එකම පියවර එය බව ඇය තීරණය කළා ය. තුවන් සමග යතුරුපැදියේ නැග යන අතර තුවන්ගේ බඳ වටා අත් දෙකම දවටා ගෙන ඇයගේ ගමට ආවා ය. මේ දර්ශනය දැකීමෙන් මධුමාධවට තමා පිළිබඳව වෛරයක් හටගෙන ඇයව ඔහු සදහටම අමතක කිරීමට හැකිවේ යැයි ඇය සිතුවා ය. නිවසේ සිටි මධුමාධව මෙය දුටුවේ ය. මෙම දර්ශනය ඔහුට ඉවසාගත නො හැකි විය. සිත් වේදනාව ඉවසා ගත නො හැකිව අවසානයේ දී ශ්‍රියාලතා පිළිබඳව තමාගේ ඇති ආදරය මධුමාධව ඔහුගේ මවට පැවසී ය. එය ඇසූ වලව්වේ හාමිනේ දැඩි කලබලයටත් කෝපයටත් පත්ව, හාමු මහතාට සියල්ල නො වලහා කීවා ය. මෙය ඇසූ හාමු මහතා දණ්ඩෙන් පහර ලත් නයකු මෙන් කෝපයෙන් වියරු විය. වංශවත් පවුලකට අයත් වූ මධුමාධව වැනි තරුණයකු ශ්‍රියාලතා වසඟයට ගෙන ඇති බවත් ඔහුගේ පනකෙන්ද තිබෙන තුරු ඔවුන් දෙදෙනාට විවාහ වීමට ඉඩ නො දෙන බවත් පවසා ඔහු ගිගුලේ ය. හිත් වේදනාව ඉවසා ගත නො හැකි වූ මධුමාධව අසනීප වී අංගොඩ මානසික රෝහලට ඇතුළත් කරන ලදී.

මධුමාධව ඇයගෙන් වෙන් කිරීමට ශ්‍රියාලතා කළ ක්‍රියාව විනාශයකට මුල බව ඇය වටහා ගත්තේ ඔහු අංගොඩ මානසික රෝහලට ඇතුළත් කළ බව දැන ගත් පසුව ය. මධුමාධව බැලීමට මානසික රෝහලට ඇය දවසක් ගියා ය. මධුමාධවට ඇයව හඳුනා ගැනීමටවත් නො හැකිව කථාබහක් නොමැතිව ක්ෂිතිජය දෙස (horizon) බලා ගෙන සිටියේ ය. තමා කළ දෙය ගැන දැඩි කලකිරීමට පත් ශ්‍රියාලතා සදහටම අවිවාහකව සිටීමට තීරණය කළා ය. හය මසක පුහුණුවීම් කාලය අවසන් කළ ශ්‍රියාලතා දෙපාර්තමේන්තුවක සහකාර අධ්‍යක්ෂකවරියක වශයෙන් උඩරට පළාතක කච්චේරියට සේවයට පැමිණියා ය. මානසික රෝහලේ හය මසක් නේවාසිකව සිටීමෙන් පසුව මධුමාධව තම නිවසට පැමිණියත් බැලූ දිහාවක බලා ගොළුවෙක් මෙන් ( mute ) ගත කළ ජීවිතය ගැන හාමු මහතාට දැඩි කෝපයකුත් කණගාටුවකුත් ඇති විය. පරම්පරාව තවදුරටත් ගෙන යාමට සිටි එකම පුතා සදහටම මානසික රෝගියකු වූයේ ශ්‍රියාලතාගේ ක්‍රියාවෙන් බව සිතා කෝපයෙන් වියරු වූ හාමු මහත්තයා ඇයගෙන් පළිගැනීමට අදිටන් කර ගත්තේ ය.

ශ්‍රියාලතා වැඩ නිම වී දිනපතාම බස් රථයක සැතැප්ම තුනක්



පමණ දුර ගිය පසු වත්තක් මැදින් ගමන් කොට තම නිවසට පැමිණෙන්නී ය. කාලය මෙසේ ගෙවී ගොස් එක් දිනක රාත්‍රී හතයි හිත වුවත් ඇය නිවසට නො පැමිණි බැවින් ඇයගේ දෙමාපියෝ තරමක් කලබල වූවෝ ය. රාජකාරි බහුල දිනවල කාර්යාලයේ නිල රථයකින් ශ්‍රියාලතා ගෙදරට පැමිණෙන නිසා ඇයට උපද්‍රවයක් වී ඇතැයි ඔවුහු නො සිතුවෝ ය. රාත්‍රී අටයි තිහ වුවත් ශ්‍රියාලතා ගෙදර නො පැමිණි බැවින් ඇයගේ පියා ඇය සෙවීමට ගොස්, කඩපිල්වල සිටි අයගෙන් ඇය බසයෙන් බහිනවා දුටුවේ දැයි විමසුවේ ය. වෙනදා මෙන්ම සවස හයයි තිහට පමණ බස් රථයකින් බැසගත් ඇය වත්ත හරහා ගමන් කළ බව තමන් දුටු බව කඩයේ බඩු කිරන තැනැත්තා ශ්‍රියාලතාගේ පියා සමග කීවේ ය. නිසැකයෙන්ම ශ්‍රියාලතාට අකරතැබ්බයක් සිදු වී ඇති බව වටහාගත් ඔහු වහාම පළාතේ පොලිසියට ගොස්, ඇයගේ අතුරුදහන්වීම ගැන පැමිණිල්ලක් කළේ ය.

එවෙලෙහි පොලිසියෙහි තිබෙන ජීප් රථයෙන් කාර්ය භාර නිලධාරී වෙනත් රාජකාරි කටයුත්තකට පිට වී ගොස් ඇති බවත්, අවිවාහක තරුණියක්, මේ කාලයේ අතුරුදහන් වූ පලියට දෙමාපියන් කලබල නො විය යුතු බවත් උපහාසාත්මකව පවසා පොලිස් නිලධාරියා ඔහුගේ පැමිණිල්ල සටහන් කරගත්තේ ය. පසුදින උදෑසන ද ඇය ගෙදර නො පැමිණියහොත් පොලිසියට නැවත එන්නට යැයි පොලිස් නිලධාරියා ඔහුට උපදෙස් ද දුන්නේ ය. ශ්‍රියාලතගේ අතුරුදහන්වීම ගැන සෙවීමට පොලිසියෙන් උපකාරයක් නො ලැබෙන බව දැන ගත් ඇයගේ පියා, අසල්වාසීන් සමග එකතුව මුළු රාත්‍රියේම විදුලිපන්දම්, පැට්රෝල්මැක්ස් ලාම්පු සහ හුළුඅතු ආධාරයෙන් ඇයගේ නිවසට යන පාර සහ අවට ප්‍රදේශය දැඩි පරීක්ෂාවට ලක් කළත් ඇය ගැන කිසිම හෝඩුවාවක් දැන ගත නො හැකි විය. තමා ඇස් දෙක මෙන් ප්‍රවේශම් කළ එකම දුව නැතිවීමේ ශෝකයෙන් හෘදයාබාධයක් සෑදී ශ්‍රියාලතාගේ මව මහ රෝහලට ඇතුල් කිරීමට සිදු විය.

මේ අතර, ශ්‍රියාලතාගේ නිවසට නුදුරින් පිහිටි තේ වත්තක කඳු වැටියක් පාමුල කුණු වී ගිය මළසිරුරක්, ශ්‍රියාලතා අතුරුදහන් වී දින තුනකට පසුව, තේ දළු නෙලමින් සිටි ගැහැණියක විසින් දැක ඒ බව පොලිසියට දන්වන ලදී. මළසිරුර ගැහැණියකගේ බව

හඳුනාගත් පොලිසිය මළසිරුර අතුරුදහන් වූ ශ්‍රියාලතාගේ විය හැකි නිසා, ශ්‍රියාලතාගේ පියා කැඳවා මෘත ශරීරාගාරයේ දී මළසිරුරේ තිබූ සාරිය සහ හැට්ටය ඔහුට පෙන්වී ය. ඒවා තම දියණියගේ බව හඳුනා ගත් ඔහු මළසිරුර ද තම දියණියගේ බවට හඳුනා ගත්තේ ය. මෙය මනුෂ්‍ය ඝාතනයක් බව සැක කළ මහේස්ත්‍රාත්වරයා වෛද්‍ය පරීක්ෂණයක් පවත්වා මරණයට හේතුව සහ වෙනත් අදාල කරුණු වෙතොත් අධිකරණයට වාර්තා කිරීමට අධිකරණ වෛද්‍යවරයාට නියෝග කරන ලදී.

මදවශයෙන් කුණු වූ ශ්‍රියාලතාගේ මළසිරුර විරූප වී තිබුණි. අත් සහ පාවල සතුන් සපා කෑමේ ලකුණු නො වී ය. කුණු වූ මළසිරුරක් දින තුනක් එළිමහනෙහි ගම්මානයක තිබෙන විට අනිවාර්යයෙන්ම මළසිරුරේ කොටස්, විශේෂයෙන්ම අත් පා සතුන් විසින් කා දමා තිබිය යුතු ය. මළසිරුරේ කොටස් සතුන් කා නොමැති වීමෙන් හැගෙන්නේ මේ තැනැත්තිය යම් ස්ථානයක දී මරා දමා මළසිරුර වන සතුන්ගෙන් ආරක්ෂා වන ස්ථානයක තැබීමෙන් දින කිපයකට පසුව එළිමහනෙහි, එය සොයා ගත් ස්ථානයට ඝාතකයන් විසින් රැගෙන ඇවිත් එම ස්ථානයෙහි තබා ඇති බව ය. මෙසේ කරන්නේ පොලිසිය නොමග යැවීමට ය. කකුල් දෙකෙහිම කොහු ලණුවකින් සිර කොට බැඳ තැබීම නිසා ඇතිවුන දාරය වළලුකර ප්‍රදේශයේ විය. හැට්ටය සහ සාරිය මළසිරුරේ දවටා තිබුණත් යට කලිසමක්, තන පටක් සහ යට සායක් මළසිරුරේ නො තිබිණි. ඇඟිලිවල නියපොතු ද උල් වී තිබුණි.

කෙනෙකු මරණයට පත් වූ පසු රුධිර සංසරණය ( blood circulation ) නැවතීම නිසා ගුරුත්වාකර්ෂණය හේතුවෙන් මළසිරුරේ පහළම කොටසේ ඇති රුධිර වාහිනී තුළ රුධිරය එකතු වේ. රුධිරය මේ ආකාරයට එකතුවීම නිසා මළසිරුරේ පහළම කොටසේ ඇති සම රත් පැහැති වේ. මෙයට අධෝස්ථිය ( hypostasis) යැයි කියනු ලැබේ. පැහැපත් වර්ණයක් ඇති අයගේ අධෝස්ථිය මනා ලෙස දැකිය හැකි ය. තද දුඹුරු හෝ කළු වර්ණයකින් යුතු අයගේ එය නිරීක්ෂණය ( observe ) කිරීමට අපහසු ය. එවිට වෛද්‍යවරයා කළ යුත්තේ පෙනහැලිවල අධෝස්ථිය පිහිටා ඇති ආකාරය නිරීක්ෂණය කොට මළසිරුර මරණයෙන් පසුව තිබූ ආකාරය



උපකල්පනය කිරීමයි. රුධිරය කැටි වූ පසු අධෝස්ථිය හටගත් ස්ථානවල රත් පැහැතිවීම වෙනස් නො වේ. ( ස්ථාපිතවීම ) අධෝස්ථිය ස්ථාපනය වූ පසුව මළසිරුර තිබූ ආකාරය වෙනස් කොට තැබුවත් ස්ථාපනය ( fixed ) වූ අධෝස්ථිය වෙනස් වීමක් ඇති නො වේ.

මළසිරුරේ ඉදිරි පැත්තේ අධෝස්ථිය පිහිටා තිබුණත්, පොලිසිය විසින් ගන්නා ලද ඡායාරූපවලට අනුව මළසිරුර සොයා ගත් ස්ථානයේදීම මළසිරුරේ අධෝස්ථිය පිහිටා තිබුණේ උඩුබැලි අතට ය. ගුරුත්වාකරෂණයට ප්‍රතිවිරුද්ධ පැත්තක අධොස්ථිය පිහිටීමෙන් වෛද්‍යවරයා තේරුම් ගත්තේ මරණයෙන් පසු සිරුර මුහුණින් අතට එක දිගට පැය දහ අටකට ආසන්න කාලයක් තබා ඇති බව ය. අභිරහස් ලෙස මරා දමා තිබෙන මළසිරුරක් හමු වූ ස්ථානය වෙනස් වීමට පෙර අධිකරණ වෛද්‍යවරයා, රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ පොලිස් පරීක්ෂණ කණ්ඩායම සාමූහිකව ( as a team ) පරීක්ෂා කොට ප්‍රථමයෙන් කළ යුත්තේ කළු සුදු සහ වර්ණ සේයාපටලවලින් අවශ්‍ය ඡායාරූප ගැනීම ය. පහසුකම් ඇත්නම් වීඩියෝ ගත කිරීම වඩාත් සුදුසු ය. සංවර්ධිත රටවල සැක කටයුතු සියලුම මරණ පරීක්ෂා කිරීමේ දී මෙම පිළිවෙත පිළිගත් ක්‍රමයක් වශයෙන් කරනු ලැබේ. මළසිරුරු සොයා ගත් ආකාරය ජූරි සභාවට සහ විනිසුරුවරයාට නඩු විභාගයේ දී විස්තර කිරීමට මෙලෙස ගන්නා ලද ඡායාරූප සහ වීඩියෝ පටි උපයෝගී කරගත හැකි ය.

ශ්‍රියාලතා මරණයට පත් කොට එම ස්ථානයේම ඇයගේ සිරුර උඩුබැලි අතට අවම වශයෙන් එක දිගටම පැය දහ අටක් තිබෙන්නට හැර පසුව හමු වූ තේ වත්තේ කන්ද පාමුලට සිරුර රැගෙනවිත් ඇති බවත් අධිකරණ වෛද්‍යවරයා පොලිසියට දැන්වී ය. ශ්‍රියාලතා මරණයට පත් කළ අය මිනීමැරුම කළ ස්ථානයෙන් වෙනත් ස්ථානයක තැබීමෙන් බලාපොරොත්තු වූයේ පොලිසිය නොමග යැවීම ය.

බෙල්ලේ වම්පස සිට පිටුපසට විහිදී ගිය ගැඹුරු කැපුම් තුවාල දෙකක් එකිනෙකට ආසන්නව හා සමාන්තරව දක්නට තිබුණි. ගෙලෙහි තුන්වැනි සහ හතරවැනි කශේරුකා කැපී තිබුණි. බෙල්ලේ



Scanned with CamScanner

පිටුපස සහ වම් පැත්තේ තිබූ ගැඹුරු කැපුම් තුවාල නිසා ඇය මරණයට පත් වී ඇති බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. ඇයගේ යෝනි ප්‍රදේශයේ ලේ පැල්ලම් කීපයක් විය. ස්ත්‍රී ලිංගයේ ගරීය අධරය ( labia majora ) සහ කනීය අවරය ( labia minora ) ඇතුළුව යෝනි මුඛය සහ යෝනිය බරපතල ලෙස තුවාල වී තිබුණි. බලහත්කාරයෙන් වුවත් දිගෙන් දිගටම කෙටි වේලාවක් තුළ දී පිරිමින් කණ්ඩායමක් විසින් ශ්‍රියාලතා දූෂණය කළත් මෙවැනි බරපතල තුවාල ඇති විය නො හැකි බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. ලී කැබැල්ලකින් කීප වාරයක් ඇයගේ යෝනියට ඇනීමෙන් එම තුවාල සිදු වී ඇති බවට වෛද්‍යවරයා නිගමනය කළේ ය. ශ්‍රියාලතාගේ දකුණු අතේ තදට නැමුණු ඇඟිලි අතරේ නූල් කැබැල්ලක් සහිත ලෝහ බොත්තමක් හිර වී තිබිණි. ඒවා අල්ලෙන් ඉවතට ගැනීමට නො හැකි අන්දමට හිර වී තිබුණි. බොත්තම සහ නූල් කැබැල්ල දැඩි පරිශ්‍රමයකින් ඉවත් කළ වෛද්‍යවරයා ඒවා රස පරීක්ෂක වෙත යවා වාර්තාවක් ලබා ගැනීමට පරීක්ෂණ භාර පොලිසියට භාර දුන්නේ ය.

මරණය සිදුවන මොහොතේ සිරුරේ පේශීන්වල හටගන්නා වූ ක්ෂණික තදවීම නොහොත් කඨිනතාවය ( instantaneous rigidity ) ශවක හුසය ( cadaveric spasm ) යනුවෙන් හැඳින්වේ. ස්නායු පද්ධතිය ( nervous system ) හෝ සංසරණ පද්ධතිය (circulatory system ) හෝ හෘදය හෝ පෙනහැලි තුවාල වූ විට හෝ ස්නායු ආතතිය ඇති වූ අවස්ථාවක මරණය සිදුවූ විට ශවක හුසය ඇති වේ. සිරුරේ හට ගන්නා වූ මේ ආකාරයේ කඨිනතාවය මුළු ශරීරයේම ( generalised ) හෝ අත්වල පමණක් ( localised ) ඇති විය හැකි ය. මරණය සිදුවන මොහොතේ අල්ලා ගෙන සිටි වස්තුව ( object ) මරණයෙන් පසුව වුව ද දැඩි ලෙස ඇඟිලිවල තදව සිර වී තිබෙන්නට පුළුවන. ශවක හුසය ඇතිවීම නිසා වල් පැලෑටි හෝ ලී කැබැල්ලක් අතේ ඇඟිලිවලට ඉතා දැඩි ලෙස සිරව තද වී තිබීම ඇතැම් විට දියේ ගිලී මිය යන තැනැත්තන්ගේ ද අත්වල දක්නට ලැබේ. ගිනි අවියකින් වෙඩි වැදී හෝ පපුවේ ඇනුම් තුවාලයකින් හෝ බෙල්ලෙහි සැපුම් තුවාලවලින් මිය ගිය තැනැත්තන්ගේ ද අතෙහි මරණය සිදු කළ පිස්තෝලය හෝ උල් පිහිය හෝ දැලි පිහිය හිර වී තිබීමෙන් මියගිය තැනැත්තා සිය දිවි හානි කර ගෙන ඇති බව සැකයෙන් තොරව ඔප්පු කළ හැකි ය. අතෙහි ඇඟිලිවල



හටගන්නා වූ තදවීම් ශවක හුසය නිසා හටගෙන ඇත් ද නැතිනම් මරණයෙන් පැය කීපයකට පසුව මාංශ පේශීන්වල හටගන්නා වූ තද වීමෙන් ද යන්න වෙනස් කර ගත යුතු ය. මරණයෙන් පැය කීපයකට පසුව පේශීන්වල හටගන්නා වූ තදවීම මෘත කඨිනය (rigor mortis) යැයි හඳුන්වනු ලැබේ. ශවක හුසය ඇතිවීම නිසා ඇඟිලි නැමී තද වී අල්ලෙහි ගැවී තිබෙන අතර මෘත කඨිනය ඇති වූ විට ඇඟිලි තුඩු අල්ලෙහි ස්පර්ශ නො වේ ( the tips of finger are firmly burried in the palm in cadaveric sparm where as in rigor mortus tips of fingers do not make contact with the palm ). මළසිරුරේ කුණුවීම ( putrefaction ) හටගත් විට පේශීන් බුරුල් වන නිසා ශවක හුසය සහ මෘත කඨිනය යන සංසිද්ධීන් දෙකම එකනෙකින් වෙන් කර ගැනීම දුෂ්කර ය. සම්පූර්ණයෙන්ම නැවී ඇති ඇඟිලි අතරේ ( among completely flexed fingers ) යම් වස්තුවක් හිර වී ඇත්නම් එම සංසිද්ධිය කුණු වී ඇති සිරුරක වුව ද ශවක හුසය ලෙස හඳුනා ගත හැකි ය. එම නිසා ශ්‍රියාලතාගේ කුණු වී තිබුණ සිරුරේ ඇඟිලි අතර හිර වී තිබූ ලෝහ බොත්තම සහ නූල් කැබැල්ල, ඝාතකයන්ගේ ඇඳුම්වලින් ඇය මිය යන මොහොතේ දී මර බියෙන් පොර බැදීමේ දී හිර වී ඇති බව නිගමනය කළ හැකි විය.

ශ්‍රියාලතාගේ යෝනියේ රුධිරය ස්වල්පයක් තිබුණි. යෝනියෙන් ලබා ගත් පිස්නවල ( යම්කිසි ස්ථානයක් මත තැවරී ඇති තරලයකට පිස්නයක් යැයි කියනු ලැබේ ) ශුක්‍රාණු ( sperms ) සහ ශුක්‍ර තරලය ( seminal fluid ) නො තිබුණු බව රස පරීක්ෂකගේ වාර්තාවේ සඳහන් වී තිබුණි. තියුණු කැපෙන ආයුධයකින් ශ්‍රියාලතාගේ ගෙල දෙවරක් කැපීම නිසා හටගත් ලේ ගැලීමෙන් ඇය මිය ගොස් ඇති බවත්, මිය යාමෙන් කෙටි වේලාවකට පසුව ලී කැබැල්ලකින් ශ්‍රියාලතාගේ යෝනියට ඇනීමෙන්, ශ්‍රියාලතාව දූෂණය කොට ඇති බව පෙන්නුම් කොට පොලිසිය නොමග යැවීමට ප්‍රයත්නයක් කර ඇති බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. තවද, ශ්‍රියාලතා මිය යාමෙන් පැය දහ අටකින් පසුව මළසිරුර හමු වූ ස්ථානයට රැගෙනවිත් ඇති බවත් තන පටය, යට කලිසම සහ යට සාය ඉවත් කොට උඩුබැලි අතට තබා ගොස් ඇති බවත් වෛද්‍යවරයා අධිකරණයට වාර්තා කළේ ය. ඝාතකයන් විසින් ශ්‍රියාලතා මරා දමා ඇති බැවින් ඔවුන් පිළිබඳව හෝඩුවාවක් ලැබෙන තුරු මළසිරුර ශීතකරණයේ තැබිය යුතු බව වෛද්‍යවරයා අධිකරණයට නිර්දේශ



Scanned with CamScanner

කළේ ය. මනුෂ්‍ය ඝාතනවල දී වෛද්‍ය පරීක්ෂණය කර අවසාන වුවත් ඇතැම් අවස්ථාවල දී මළසිරුර ඥාතීන්ට භාර නොදී එය තවදුරටත් පරීක්ෂා කිරීමට ශීතකරණයක තබා ගැනීමට සිදු වේ. මරණයට පත් තැනැත්තා මියගිය ආකාරය හෝ සිරුරේ තුවාල සිදු වී ඇති ආකාරය උපකල්පනය කිරීමට නො හැකි වූ විට හෝ මරණකරු හඳුනා ගෙන නොමැති අවස්ථාවල පමණක් මළසිරුර ශීතකරණයේ තබා ගනු ලැබේ. සවුදි අරාබියේ දී මිය ගිය හෙලන් ස්මිත් නැමැති ඉංග්‍රීසි ජාතික හෙදියගේ සිරුර අවුරුද්දකට ආසන්න කාලයක් අධි ශීතකරණයේ තබන ලදි. ශ්‍රියාලතාගේ යෝනියේ තිබූ තුවාල අසාමාන්‍ය ස්වරූපයක් තිබූ නිසා ඇයගේ සිරුර ශීතකරණයේ තබා ගන්නා ලදි. වෛද්‍ය වාර්තාව අනුව ශ්‍රියාලතාගේ මරණය සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් බව මහේස්ත්‍රාත්වරයා තීන්දු කළ අතර නැවත දන්වන තුරු මළසිරුර ශීතකරණයක තැබීමට නියෝග කළේ ය. ඝාතකයන් ඇල්ලීමට පොලිසිය යුහුසුළු විය.

මේ අතරතුර හාමු මහත්තයාගේ වත්තේ වැඩ කරන සිමියොන්ට මුත්‍රා අමාරුවක් සෑදී පළාතේ රෝහලට ඇතුල් කරන ලදි. සිමියොන්ගේ කම්මුල් දෙකෙහිම නියපොතුවලින් සීරීමේ දී මෑතක දී ඇති වූ තුවාල ( scratches ) ඇති බව ඔහුට ප්‍රතිකාර කළ වාට්ටුවේ වෛද්‍යවරයා දුටුවේ ය. එම තුවාල කෙසේ සිදු වූයේ දැයි වෛද්‍යවරයා සිමියොන්ගෙන් ප්‍රශ්න කළ විට කලබල වූ ඔහු කියා සිටියේ, කම්බි වැටකින් රිංගා යෑමට තැත් කිරීමේ දී ඒවා සිදුවුණ බව ය. කම්බි වැටකින් රිංගන විට බිම බලා ගෙන යන බැවින්, තුවාල මුහුණේ සිදුවිය නො හැකි බව තේරුම් ගත් වෛද්‍යවරයාට සිමියොන් ප්‍රකාශ කළේ බොරුවක් බව ද වැටහී ගියේ ය. ශ්‍රියාලතාගේ මරණය ඒ වන විට මුළු පළාතම කම්පාවට පත් කළ දෙයක් වී තිබුණි. මේ අනුව, සිමියොන්ගේ කම්මුල් දෙකෙහි ඇති සීරීම් ද ඔහු හාමු මහත්තයාගේ නිවසේ සේවකයකු වීම ද යන කරුණු ගැන මදක් කල්පනා කළ වෛද්‍යවරයා වහාම රෝහල් පොලිසියට සිමියොන් ගැන දන්වන ලදී. අනතුරුව තුවාල පරීක්ෂා කිරීම සඳහා ඔහු විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරවන ලදී.

සිමියොන්ගේ මුහුණේ තිබූ තුවාල වෛද්‍යවරයා විසින් ඡායාරූප ගත කරන ලදි. තුවාල වර්ගවලින් ඉතා සරලම තුවාල වශයෙන්



සීරීම් තුවාල ( abrasion ) සැලකීමට හැකි ය. මළසිරුරක් බාහිරව පරීක්ෂා කිරීමේ දී සීරීම් තුවාල නිරීක්ෂණය කිරීම අධිකරණ වෛද්‍යවරයෙකුට ඉතාම වැදගත් වේ. සීරීම් තුවාලයේ ස්වරූපය අනුව එය සිදු කළ ආයුධය ( weapon ) හෝ වස්තුව බොහෝවිට උපකල්පනය කළ හැකි ය. නියපොතුවලින් සිදු කරන ලද සීරීම් තුවාල රේඛාවක ( linear ) හැඩය, හෝ වක් හැඩයක් ( curved ) ගනු ලැබේ. නිය පොතුවලින් සිදුවූ සීරීමක් අපිචර්මය පමණක් සිදුරු කරන අතර කම්බි කටුවකින් සිදු වන තුවාල සමෙහි ගැඹුරට ඇති වේ.

සිමියොන්ගේ මුහුණේ තිබුණේ සම මතු පිට තිබූ රේඛීය හැඩ ඇති සීරීම් තුවාල බව අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. සිමියොන්ගේ කම්මුල්වල ඇති තුවාල කම්බි කටුවලට සීරීමෙන් සිදු වූ ඒවා නොව, උල් නියපොතුවලින් ඔහුගේ මුහුණ කවුරුන් විසින් හෝ සීරීමේ දී සිදුවූ තුවාල බව අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. ඒ අනුව, ශීතකරණයේ තිබූ ශ්‍රියාලතාගේ සිරුරේ ඇඟිලි නැවත පරීක්ෂා කළේ ය. උල්ව තිබූ ඇයගේ නියපොතු යට යම්කිසි දෙයක් රැඳී ඇති බව අත් කාචයකින් පරීක්ෂා කරන විට වෛද්‍යවරයාට දක්නට ලැබුණි. එම ද්‍රව්‍යවල රුධිරය ඇද්ද, ඇත්නම් ඒවා මිනිස් රුධිරය ද, එසේ නම් ඒවා කුමන වර්ගයේ ද යන්න දැන ගැනීමට රජයේ රස පරීක්ෂක වෙත අධිකරණය මගින් ඉදිරිපත් කරන ලදී. ශ්‍රියාලතාගේ නියපොතුවල රැඳී තිබුණේ මිනිස් රුධිරය බවත් එහි වර්ගය AB වර්ගයට අයත් බවත් රස පරීක්ෂක වාර්තා කොට තිබුණි. සැකපිට අත් අඩංගුවට ගත් සිමියොන්ගේ රුධිරය සාම්පලයක් අධිකරණයේ අවසරය ලබා ගෙන රස පරීක්ෂක වෙත ඉදිරිපත් කිරීමෙන් සිමියොන්ගේ රුධිරය ද දුර්ලභ AB වර්ගයේ රුධිරය බව සොයා ගන්නා ලදී. ඉදිරිපස කරපටියට පහළ, බොත්තමක් නොමැති කමිසයක් සිමියොන්ගේ නිවස පරීක්ෂා කළ පොලිසියට සොයා ගැනීමට හැකි විය. කමිසයේ තිබූ ඉතිරි බොත්තම් ද ලෝහ ඒවා විය. එම කමිසයේ බොත්තම නැති වූයේ කෙසේ දැයි සිමියොන්ට විස්තර කිරීමට නො හැකි විය. ශ්‍රියාලතාගේ අතෙහි රැඳී තිබුණ ලෝහ බොත්තම සිමියොන්ගේ එම කමිසයේ තිබූ අනික් බොත්තම්වලට සමාන බව රස පරීක්ෂකවරයා වාර්තා කොට තිබුණි. පොලිසිය විසින් මේ සියලු විස්තර සිමියොන්ට දැන් වූ පසුව ශ්‍රියාලතාගේ මරණය සිදු වූ අන්දම ඔහු විස්තර කළේ ය.



Scanned with CamScanner

මධුමාධව මානසික රෝගියකු බවට පත්කළ ශ්‍රියාලතාගෙන් පළිගැනීමට ඇයට දසවද දී මරා දැමිය යුතු බව හාමු මහත්තයා තමාට පැවසූ බවත් ඒ සඳහා ශ්‍රියාලතා සවස කාර්යාලයේ වැඩ නිම කොට නිවසට එන විට ඇයගේ ගෙල කපා මරා දැමිය යුතු බව හාමු මහත්තයා සිමියොන්ට යෝජනා කළ බවත් ඔහු පැවසුවේ ය. ඒ සඳහා සිමියොන් උපකාර කළහොත් ඔහුට රුපියල් විසිපන්දාහක් දීමට හාමු මහත්තයා පොරොන්දු වූ බවත්, පොලිසියේ උසස් නිලධාරීන් සහ ප්‍රබල දේශපාලඥයින් තමා ළඟින් ඇසුරු කරන හෙයින් තමා ආරක්ෂා කිරීමට ඔවුන්ගේ උපකාරය ලබා ගැනීම සුළු දෙයක් බව ද හාමු මහත්තයා තමාට කී බව ඔහු කීවේ ය. ඉන් පසුව ඇය මරා දැමූ බවත් ඔවුන් කළ දෙය සඟවා පොලිසිය නොමඟ යැවීමට ශ්‍රියාලතාව දූෂණය කොට ගෙල කපා මරා ඇති බව පෙන්වීමට කෝටුවක් උපයෝගී කොට ගෙන ඇයගේ යෝනි මාර්ගයට හාමු මහත්තයා විසින් තුවාල කළ බව සිමියොන් පොලිසියට ප්‍රකාශ කළේ ය. ශ්‍රියාලතා නිවසට යන විට පාලු පෙදෙසක දී ඇයගේ කට වසා බෑවුමකට ඇදගෙන විත් මුහුණින් අතට ඇයව බිම පෙරලා කෑගැසීම නැවැත්වීමට තමා ඇයගේ මුහුණ තුවායකින් ගැටගැසූ බවත් දැඟලීම නැවැත්වීමට හාමු මහතා ඇයගේ කකුල් දෙක තදින් අල්ලා ලණුවකින් බැන්ද බවත් සිමියොන් වැඩිදුරටත් කියා සිටියේ ය. මේ සියල්ල සිදු කිරීමට පෙර හාමු මහතා දුන් අරක්කු බෝතල් භාගය තමා විසින් පානය කළ බවත් පැවසී ය. ශ්‍රියාලතා මරා දැමූ ස්ථානය අසල තිබූ කොස් ගසකට නැග සිටි ගුණපාල නමැති ගොවි තරුණයකු සියල්ල දුටු බවත් ගසෙන් බැස්සූ ඔහුට තර්ජනය කොට ඔහු දුටු සිද්ධිය කිසිවකුටත් නො දන්වන ලෙස පොරොන්දු කර ගත් බවත් ඒ බව හැඟවුවහොත් මරණ බවට තර්ජනය කළ බවත් සයිමන් පොලිසියට කීවේ ය. ශ්‍රියාලතාගේ ගෙල කැපූ පිහිය පාළු ළිඳකට වීසි කළ බවත් තවදුරටත් හෙතෙම පොලිසියට දැන්වී ය. එම ළිඳේ පතුලේ තිබුණ තියුණු කැපෙන පිහිය පොලිසිය විසින් සොයා ගන්නා ලදී. රජයේ නීතිපතිවරයාගේ උපදෙස් පරිදි ගොවි තරුණයා පැමිණිල්ලේ සාක්ෂිකරුවකු කරන ලදී. නඩුවිභාගයේ දී ගොවි තරුණයාගේ සාක්ෂි මෙහෙයවන ලද්දේ අඳ ගොළු බිහිරි පාසලේ සේවය කරන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ය. ශ්‍රියාලතාගේ ගෙල කැපීමට පාවිච්චි කරන ලද්දේ පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද තියුණු කැපෙන පිහිය බව ශ්‍රියාලතාගේ කශේරුකාවල තිබූ කැපුම් තුවාලවල කැපුමේ



මතුපිට ( cutting surface ) විශාල කළ ඡායා රූපයක් (magnified) ඇයගේ ගෙල කැපීමට පාවිච්චි කළ පිහිතලයේ මතුපිට ඡායාරූපයක් ඒහා සමානව විශාල කොට, අධිකරණ වෛද්‍යවරයා විසින් නඩු විභාගයේ දී පෙන්වා දෙන ලදී.

සියලු සාක්ෂි සලකා බලා ගෙල කපා ශ්‍රියාලතාගේ මරණය හාමු මහතා සහ සිමියොන් විසින් කළ බව ජූරිය තීරණය කරන ලදී. ඒ අනුව, විනිසුරු විසින් දෙදෙනාටම මරණීය දණ්ඩනය නියම කරන ලදී.

අභිරහස් ලෙස කණ්ඩායමක් විසින් යම් තැනැත්තෙකු මරණයට පත් කොට සිද්ධිය වසන් කිරීමට කොතරම් උත්සාහ කළත් මළසිරුර තුණු වී තිබිය දී හමුවූවත් පළපුරුදු අධිකරණ වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ කැපවීමෙන් වැඩකරන පොලිස් පරීක්ෂණ කණ්ඩායමක් පරීක්ෂණ පැවැත්වුවොත් ඝාතකයන් නීතියේ රැහැනට හසුකර ගැනීමට අපහසු වන්නේ නැත.

ශ්‍රියාලතාගේ නියපොතු අඟ රැඳී තිබූ රුධිරය, වළලුකර ප්‍රදේශයේ තිබූ දාර, මරණාසන්න මොහොතේ දී ඇයගේ අතේ රැඳී තිබුණු සිමියොන්ගේ කමිසයේ ලෝහ බොත්තම, මළසිරුරේ අධෝප්‍රිය පිහිටීම සහ ගෙල කැපීමට උපයෝගී කර ගත් පිහිතලයේ මතුපිට ස්වභාවය කශේරුකාවල කැපී තිබූ ප්‍රදේශයේ මතුපිට ස්වභාවයට සමානවීම ශ්‍රියාලතාගේ අභිරහස් මරණයට හේතුව සහ මිනීමරුවන් සොයා ගැනීමට උපකාරී වූ " නිහඬ සාක්ෂි " වශයෙන් සැලකිය හැකි ය.



Scanned with CamScanner

# ධීවර යාත්‍රාවේ සිදු වූ ඝාතනය

අවුරුදු විස්සක් පමණ වයසැති විදේශීය ජාතික තරුණයකු වූ ටොමීමා, ධීවර යාත්‍රාවක ( fishing trawler ) ධීවරයෙකු වශයෙන් සේවය කලේ ය. ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා ධීවරයන් කණ්ඩායමක් සමග පිටත් වන ටොමීමා සති තුනක හෝ හතරක කාලයක් ගැඹුරු මුහුදේ ගත කරයි. එක් දිනක් රාත්‍රියේ අනිකුත් ධීවරයන් සමග ආහාර ගැනීම සඳහා ධීවර යාත්‍රාවේ ආපන ශාලාවට ටොමීමා පැමිණ සිටියේ නැත. එයට හේතුව සොයා බැලීමේ දී කපිතාන්වරයාට දැන ගන්නට ලැබුණේ, ධීවර යාත්‍රාවේ ටොමීමාගේ නිදන කුටියේ ( cabin ) ඇඳ මත, ඔහු මැරී සිටින බව ය. ජාත්‍යන්තර නාවික රෙගුලාසි අනුව ධීවර යාත්‍රාවක සේවකයෙකු මිය ගිය විට එම අවස්ථාවේ යාත්‍රාව තිබෙන ස්ථානයට ආසන්නවම ඇති වරායකට එම යාත්‍රාව යාත්‍රා කළ යුතු ය. ඒ වන විට එම ධීවර යාත්‍රාවට ආසන්නවම තිබූ රට ශ්‍රී ලංකාව විය. ටොමීමා මිය ගොස් ඇති බව දැන ගත් අවස්ථාවේ දී ධීවර යාත්‍රාව ශ්‍රී ලංකාවෙන් නාවික සැතපුම් ( nautical miles = අඩි 6080 යි ) හාරසියයක් පමණ ඈතින් තිබුණ බැවින්, යාත්‍රාවේ කපිතාන්වරයා විසින් ටොමීමාගේ මළසිරුර කුණු වී යාම වැළැක්වීම සඳහා, සෙල්සියස් අංශක ඍණ පනස් දෙකක් ( one minus celsiu 52$^{0}$ ) ඇති, මාළුන් දමන අධි ශීතකරණයේ තබන ලදී.

දින පහකට පසුව ධීවර යාත්‍රාව ශ්‍රී ලංකාවේ වරායකට ළඟා විය. නාවික නීති රීති අනුව වරායකට ඇතුල් වන සෑම විදේශීය යාත්‍රාවක්ම සහ එහි සේවකයින් කොරන්ටීන් වෛද්‍ය පරීක්ෂණයකට ( quarantine examination ) භාජනය කළ යුතු ය. කොරන්ටීන් වෛද්‍ය පරීක්ෂණයක් යනු, නැවක් විදේශීය රටකින් තවත් රටකට පැමිණි විට එම රටට ආවේනික නොවූ බෝවෙන රෝග වැළඳී සිටින අය එම නැවේ ඇත්දැයි පරීක්ෂා කිරීම ය. ඒ අනුව වරායේ වෛද්‍යවරයා ( Port Medical Officer ) විසින් ධීවර යාත්‍රාව හා එහි සිටි සියලුම සේවකයින් ද, ටොමීමා නිදා සිටි කාමරය ඇතුළු මළසිරුර ද, පරීක්ෂාවට භාජනය කරන ලදී. එහෙත්, යාත්‍රාවේ සේවකයින්ට බෝවන රෝග ( infectious diseases ) හෝ ටොමීමාගේ මරණය පිළිබඳව සැක සහිත කිසිවක් සොයා ගැනීමට වරායේ



වෛද්‍යවරයාට නො හැකි විය. අනපේක්ෂිතව ටොමීමා මරණයට පත්වී ඇති බැවිනුත්, ඔහු විදේශීය ජාතිකයකු වූ බැවිනුත්, හදිසි මරණ පරීක්ෂණයක් ( inquest ) පැවැත්විය යුතු බව පරීක්ෂණය භාර වරාය පොලිසියට වරායේ වෛද්‍යවරයා දැන්වී ය. ධීවර යාත්‍රාවේ කපිතාන්වරයා විසින් නිකුත් කර තිබූ වාර්තාව අනුව ටොමීමා හදිසියේ මිය ගොස් තිබුණි. කපිතාන්වරයාගේ වාර්තාව, වරාය පොලිසිය විසින් හදිසි මරණ පරීක්ෂකවරයාට ඉදිරිපත් කරන ලදී. හදිසි මරණ පරීක්ෂකවරයා සාක්ෂි සටහන් කිරීමෙන් පසුව ටොමීමාගේ මරණය පිළිබඳව වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීම සඳහා විශේෂඥ අධිකරණ වෛද්‍යවරයෙකු ( judicial medical officer ) වෙත යොමු කළ යුතු බැව් තීරණය කලේ ය. ටොමීමා විදේශිකයෙකු වූ බැවින් හදිසි මරණ පරීක්ෂණයක් ( inquest ) පැවැත්වීමෙන් පසුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කොට වාර්තාවක් ලබා ගැනීම සඳහා අවම වශයෙන් දින තුනක්වත් ගත වන බැවින්, ධීවර යාත්‍රාව එතෙක් වරායේ රඳවා ගතහොත් මූල්‍යමය වශයෙන් දැඩි පාඩු සිදුවන බැවින්, එම යාත්‍රාව නැවත ගමන් ආරම්භ කිරීමට කපිතාන්වරයා විසින් වරාය පොලිසියෙන් අවසර ඉල්ලන ලදී. ඒ සඳහා පොලිසියේ අවසරය ලැබුණි. ඒ අනුව, ටොමීමාගේ මළසිරුර වරාය පොලිසියට බාර දීමෙන් පසුව එම ධීවර යාත්‍රාව නැවත ගමන් ආරම්භ කලේ ය. මේ හේතුව නිසා වෛද්‍ය පරීක්ෂණය (postmortem examination) පැවැත්වීමට පෙර, හදිසි මරණ පරීක්ෂකවරයා සහ අධිකරණ වෛද්‍යවරයා යන දෙදෙනාට, ටොමීමා මරණයට පත් වී සිටි කුටිය පරීක්ෂා කිරීමට නො හැකි වූ අතර (examination of scene where a dead body was found), මරණයට අදාල හේතුන් පිළිබඳ පසුබිමේ විස්තර සොයා ගැනීමට ද නො හැකි විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ ( Code of Criminal Procedure Act No. 15 of 1979 ) තුන්සිය හැත්තෑවේ, උප වගන්ති අංක එක අනුව යම් තැනැත්තෙකු හදිසියේ මිය ගිය විට ( died suddenly ) හෝ නො දන්නා හේතුවකින් ( cause unknown ) මිය ගිය අවස්ථාවන්හි දී, සෑම මරණ පරීක්ෂකවරයෙකුම, ( හදිසි මරණ පරීක්ෂකවරයෙකු පත් කරනු ලබන්නේ අධිකරණ අමාත්‍යවරයා විසිනි ) සහ මහේස්ත්‍රාත්වරයෙකුම එසේ මියගිය තැනැත්තාගේ සිරුර තිබෙන



Scanned with CamScanner

ස්ථානයට ( scene where body is found ) වහාම ගොස්, එහි ද පරීක්ෂණයක් පවත්වා, මළසිරුරේ දැකිය හැකි කැපුම්, සිදුම්, සීරුම් සහ වෙනත් තුවාල ලකුණු ඇත්නම් ඒවා සටහන් කළ යුතු ය.

ටොම්මා මැරී සිටි ධීවර යාත්‍රාවේ කාමරය හදිසි මරණ පරීක්ෂකවරයා විසින් පරීක්ෂා කිරීමට පෙර වරාය පොලිසිය විසින් මුදා හැරීමෙන්, ටොම්මාගේ මරණ පරීක්ෂණය සම්බන්ධයෙන් වරාය පොලිසිය අපරාධ නඩු විධාන සංග්‍රහයට පටහැනිව කටයුතු කර ඇති බව පැහැදිලි ය. පරීක්ෂණ භාර පොලිසියේ වගකීම පැහැර හැර ඇති අවස්ථාවක් ලෙස මෙම ක්‍රියා මාර්ගය දැක්විය හැකි ය. යම් කිසි අයෙකු මරණයට පත් වී ඇති අවස්ථාවක දී එයට හේතුව නො දන්නා විටක හෝ සැක කටයුතු ආකාරයකින් මිය ගොස් ඇත්නම්, වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීමට පෙර මළසිරුර සොයා ගත් ස්ථානයේ දී ම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ව්‍යෝහාරක විද්‍යාඥයෙකු ( Forensic Scientist / Evidence collectors ) සමග අධිකරණ වෛද්‍යවරයා ( judicial medical officer ) විසින් එම මළසිරුරත්, මළසිරුර සොයා ගත් ස්ථානයත් හැකි ඉක්මණින් දැඩි පරීක්ෂාවට භාජනය කළ යුතු ය. බොහෝ විට ඝාතකයා සොයා ගැනීමට උපකාරී වන සාක්ෂි මළසිරුර මත හෝ අපරාධය සිදුවූ ස්ථානයේ තිබීමට අවකාශ ඇත.

යම් කිසි වස්තූන් දෙකක් හෝ වස්තූන් කීපයක් එකිනෙකට ස්පර්ශ වීමෙන් පසුව එක් වස්තුවක තිබෙන කොටස්වල අන්තර්ගත යම්කිසි ප්‍රමාණයක් අනෙක් වස්තූන්වල තැවරීම බොහෝ අවස්ථාවල සිදුවන බව ප්‍රථම වරට ලෝකයාට හඳුන්වා දෙන ලද්දේ ප්‍රංශයේ ලියොන්හි ( Lyon ) පිහිටි සාපරාධී පරීක්ෂණ ආයතනයේ ( Institute of Criminallistics ) අධ්‍යක්ෂවරයෙකු වූ එඩ්මොන්ඩ් ලෝකාඩ් (Edmond Locard) නැමැති පොලිස් පරීක්ෂකවරයා විසිනි. මෙම සිද්ධාන්තය අනුව, අපරාධයක් කළ තැනැත්තාගේ රුධිරය, කෙළ, කොණ්ඩ ගස්, රෝම කූප, ශුක්‍ර තරලය, මූත්‍රා, මලපහ යනාදිය සහ මරණය සිදුවූ අවස්ථාවේ ඝාතකයා ළඟ තිබූ ලේන්සුවක්, මුදල් පසුම්බියක්, හැඳුනුම්පතක්, පනාවක් ලිපියක්, වැනි දෑ සහ ඝාතකයා ඇඳ සිටි ඇඳුම්වල බොත්තම් හෝ කෙඳි අපරාධයට ලක්වූ තැනැත්තාගේ ඇඳුම් මත හෝ ශරීරය මත හෝ අපරාධය සිදුවූ ස්ථානයේ තිබීමට හැකි ය. තවද, අපරාධය සිදු වූ ස්ථානයේ තිබූ



කෙළ, පිදුරු, මඩ, වැලි යනාදී ද්‍රව්‍ය සහ හිස් වෙඩි උණ්ඩ කොපු හෝ වෙඩි උණ්ඩ හෝ මුනිස්සම් කැට යනාදිය අපරාධය සිදු කළ තැනැත්තාගේ ශරීරය මත හෝ අපරාධයට ලක් වූ තැනැත්තාගේ ඇඳුම් මත හෝ ශරීරය මත තිබිය හැකි අතර අපරාධයට ලක්වූ තැනැත්තාගේ ශරීරයේ කොටස් හෝ ඇඳුම්වල කොටස් අපරාධය සිදු කළ තැනැත්තාගේ ඇඳුම්වල හෝ ශරීරය මත හෝ අපරාධය සිදුවූ ස්ථානයේ ( scene ) තිබිය හැකි ය. ඇතැම් විට මෙම ද්‍රව්‍ය ( trace evidence / contact traces ) පියවි ඇසට පෙනීමට හැකි නමුත් සමහර අවස්ථාවල අත් කාචයකින් ( hand lens ) පරීක්ෂා කිරීමෙන් පමණක් සොයා ගත හැකි ය.

සාපරාධී ක්‍රියාවකින් මියගියේ යැයි සැක කරන පුද්ගලයන්ගේ පරීක්ෂණ පැවැත්වීමේ දී හෝ අහඹු සිදුවීමකින් හෝ ස්වාභාවික හේතුවකින් හෝ සිය දිවි හානි කර ගැනීමකින් මියගියේ යැයි සැක කරන පුද්ගලයන්ගේ පරීක්ෂණ පැවැත්වීමේ දී මෙම ද්‍රව්‍යයන් හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. එහි වගකීම පැවරී ඇත්තේ පරීක්ෂණය භාරව ක්‍රියා කරන පොලිස් නිලධාරියාට සහ අධිකරණ වෛද්‍ය නිලධාරියාට ය. යම් අයෙක් අභිරහස් ලෙස මරා දමා ඇති ස්ථානයකට අනවශ්‍ය පුද්ගලයන්ට ඇතුල්වීමට ඉඩ දුන හොත් මෙම වැදගත් සාක්ෂි නැති වී යාමට ( loss ) හෝ විනාශ වී (destroyed) යාමට ඉඩ ඇති බැවින් හැකි ඉක්මණින් එම ස්ථාන ආරක්ෂා කිරීම ද පොලිසියේ වගකීම වේ. මහේස්ත්‍රාත්වරයා ඇතුළු පරීක්ෂණයට සහභාගී වන කණ්ඩායමේ සියලුම නිලධාරීන්, පරීක්ෂණය ආරම්භ කිරීමට පෙර අලුත් ( පාවිච්චි නො කළ ) අත්වැසුම් පැළඳිය යුතුම ය. මළසිරුර තිබූ ස්ථානයේ තිබී ඇඟිලි සලකුණු සොයා ගත හොත්, ඒවා පරීක්ෂණ කණ්ඩායමේ නො වන බව අධිකරණයේ දී ඔප්පු කිරීම සඳහා අත් වැසුම් පාවිච්චි කරනු ලැබේ. මහේස්ත්‍රාත්වරයා, පරීක්ෂණය භාර පොලිස් නිලධාරියා, අධිකරණ වෛද්‍ය නිලධාරියා, ව්‍යෝහාරක විශේෂඥයා සහ පොලිස් ඡායාරූප ශිල්පියා යන අය කණ්ඩායමක් වශයෙන් ( as a team ) සාපරාධී ක්‍රියාව සිදුවූ ස්ථානය පරීක්ෂා කිරීමේ දී, මළසිරුර තිබූ ස්ථානය සහ අවට පරිසරය, මළසිරුර තිබූ ස්වභාවය ( condition of body ), මළසිරුර පිහිටා තිබූ ආකාරය ( position of body ), මළසිරුර මත තිබිය හැකි වල් පැලෑටි සහ ලී කැබලි, කොණ්ඩ ගස් හෝ වෙනත යම් බාහිර වස්තුවක් මළසිරුරේ ඇඟිලිවල දැඩිව සිරව



Scanned with CamScanner

හද වී ඇත්නම් ( මෘත ග්‍රහය / cadaveric spasm ). ඒවා වෝහාරික විද්‍යාඥයන් විසින් ලබා ගත යුතු අතර, අධෝස්ථිතිය පිහිටි ආකාරය ( distribution of hypostatis ), අත්වල තිබිය හැකි ආත්මාරක්ෂක තැලුම් තුවාල ( defence wounds ) තැල්ම හෝ හන්න සහ මළසිරුර මත තිබිය හැකි වෙනත් වැදගත් ලකුණු ලේඛනගත කොට, කළු සුදු ඡේයා පටල සහ වර්ණ ඡේයා පටලවලින් පොලිස් ඡායාරූප ශිල්පියෙකු ( police photographer ) විසින් අධිකරණ වෛද්‍යවරයාගේ අධීක්ෂණය යටතේ ඡායාරූප ගත කළ යුතු ය. දියුණු රටවල නම් මීට අමතරව මේවා වීඩියෝගත කරනු ලැබේ.

මෙසේ ලබා ගන්නා ඡායාරූප සහ වීඩියෝ පටි, සාක්ෂි වශයෙන්, සාක්ෂි සංග්‍රහයට අනුකූලව පැමිණිලි පක්ෂය විසින් නඩුවිභාගයේ දී අධිකරණයට ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇති අතර ඒවා පිළි ගැනීමට අධිකරණයට හැකි ය. නඩු විභාගය ආරම්භ කිරීමෙන් පසුව මෙවැනි සාක්ෂි පැමිණිලි පක්ෂය විසින් විත්තියට නො දන්වා ඉදිරිපත් කිරීම සාක්ෂි සංග්‍රහයට (evidance ordinance) පටහැනි ය. ඒ ආකාරයට එම සාක්ෂි ඉදිරිපත් කළහොත් එයට විරුද්ධ වීමට ( objections ) විත්ති පක්ෂයට අයිතියක් ඇත. හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා, බෝම්බ පිපිරීමකින් මිය යැමෙන් පසුව ආමර්විදියේ පිහිටි එම ස්ථානය සෝදා පිරිසිදු කිරීම වාර්තා ගත වූ අවාසනාවන්ත සිද්ධියකි. හිටපු ඉංදීය අගමැතිවරයෙකු වූ ශ්‍රී රජීව් ගාන්ධි මහතා ඇතුළු දහසය දෙනෙක් බෝම්බ පිපිරීමකින් මදුරාසියේ සිට නිරිත දිගින් පිහිටි ශ්‍රී පෙරුම්බුදූර් (Sriperumbudur) හිදී මරණයට පත් වූ ස්ථානය, මදුරාසි පොලිසිය විසින් සති දෙකක කාලයක් දැඩි ආරක්ෂාව යටතේ තැබීම මෙහි දී සඳහන් කළ යුතු ය. ඒ අනුව ක්‍රියා කිරීමෙන් රජීව් ගාන්ධි මහතාගේ ඝාතකයන් හඳුනා ගන්නා ලදී.

බොහෝ අභිරහස් මළසිරුරු අනපේක්ෂිත අවස්ථාවල දී පොලිසියට හමුවන බැවින් මළසිරුර තිබූ ස්ථානය පරීක්ෂා කිරීම සඳහා පොලිස් නිලධාරීන්, අධිකරණ වෛද්‍ය නිලධාරියා, පොලිස් ඡායාරූප ශිල්පියා, වෝහාරික විශේෂඥවරයා සහ මහේස්ත්‍රාත්වරයා යන නිලධාරීන්, දිවා රාත්‍රී යැයි නො තකා හැකි ඉක්මණින් මළසිරුර හමු වූ ස්ථානයට පැමිණ පරීක්ෂණ ආරම්භ කළ යුතු ය. අධිකරණ වෛද්‍යවරයා විසින් මළසිරුර තිබූ ස්ථානය පරීක්ෂා කිරීමට යන



විට පරීක්ෂණ පවත්වන අවස්ථාවේ දී ඇඳුම්වලට බාහිරව පළඳින දියවරන ( water proof ) වැස්මක් ( apron ), පාවිච්චි නො කරන ලද, සිරිංජර ( syringes ) කීපයක්, ඉඳිකටු ( needles ) කීපයක්, ජීවාණුහරණය කරන ලද පිස්න ( sterile swabs ), රබර් අත් වැසුම් ( surgical gloves ) කීපයක්, ප්ලාස්ටික් බෑග් කීපයක්, ලියුම් කවර කීපයක්, ඇලුම් ලේබල ( adhesive labels ) කීපයක්, කඩදාසි සමග සහ ෆයිල් කවරයක්, ෆෝමලින් බහාලූ කට ලොකු බෝතල් කීපයක් සහ කට පොඩි ප්ලාස්ටික් බෝතල් කීපයක් සහ සෙල්සියස් අංශක බිංදුවේ සිට සෙල්සියස් අංශක පනහ දක්වා උෂ්ණත්වය මැනිය හැකි උෂ්ණ මාපකයක් ( thermometer ), පරිසරයේ උෂ්ණත්වය මැනිය හැකි උෂ්ණ මාපකයක්, අත් කාචයක් ( hand lens ), ෆෝසෙප් අඬුවක් (forceps), පෑන් සහ පැන්සල් කීපයක්, සිරුරේ රේඛීය සිංතුර සටහන් කීපයක් ( anatomical line diagrams ), ප්‍රබල ආලෝකයක් විහිදුවන විදුලි පන්දමක් (electric tourch producing a strong light), පටිගත කිරීමේ කුඩා යන්ත්‍රයක් ( mini tape recorder ), විද්‍යුත් පැනලියක් (electronic flash) සහිත කැමරාවක් ( single lens reflex camera ) යනාදී උපකරණ රැගෙන යා යුතුම ය. මෙම භාණ්ඩ අඩංගු බෑගයක් ( "crime of scene bag " ) පළපුරුදු වෝහාරික ව්‍යාධිවේදීන්ගේ මෝටර් රථයේ ඩිකියේ නොහොත් බඩු බාහිරාදිය තැන්පත් කරන කොටසේ නිතර තබා ඇත.

ශ්‍රී ලංකාවේ අභිරහස් මරණ සිදුවූ ස්ථාන පරීක්ෂා කිරීම සඳහා කොළඹින් බැහැර පළාත්වලට රස පරීක්ෂක දෙපාර්තුමේන්තුවේ (government analyst department) සේවය කරන වෝහාරික විද්‍යාඥයන්ට පැමිණීම දුෂ්කර නිසා, අභිරහස් මරණ පිළිබඳ පරීක්ෂණ පවත්වන විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ඇතුලුව සියලු දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්ට සහ පොලිස් නිලධාරීන්ට මළසිරුරක් හමුවූ ස්ථානයක් පරීක්ෂා කිරීම පිළිබඳ දැනුම සහ එවැනි ස්ථානවලින් සාක්ෂි (contact traces / trace evidence) ලබා ගැනීමේ හැකියාව තිබිය යුතු ය.

පරීක්ෂණය භාර පොලිස් නිලධාරියා, අධිකරණ වෛද්‍ය නිලධාරියා සහ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් මෙම ධීවර යාත්‍රාව ඇතුලුව ටොම්මා නිදා සිටි කාමරය වෛද්‍ය පරීක්ෂණයට ලක් කිරීමට පෙර වරාය පොලිසිය එම යාත්‍රාව මුදා හැර තිබූ බැවින් ටොම්මා මැරී සිටි කාමරය පරීක්ෂා කිරීමට නො හැකිවීම මෙම පරීක්ෂණයේ



Scanned with CamScanner

දැඩි අඩුපාඩුවක් ලෙස සැලකිය හැකි ය. පරීක්ෂණය භාරව කටයුතු කළ පොලිසියේ වගකීම් පැහැර හැරීමක් ලෙස මෙම ක්‍රියා මාර්ගය දැක්විය හැකි ය. සේවයට බඳවා ගන්නා පොලිස් නිලධාරීන්ට අභිරහස් මරණයක් සිදුවූ ස්ථානයක් ආරක්ෂා කිරීම පිළිබඳව දැනට වඩා දැනුවත් කිරීමක් සහ ඒ පිළිබඳ පුහුණුවක් පොලිස් අභ්‍යාස විද්‍යාලවල දී ලබා දිය යුතු ව ඇත.

වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීම සඳහා ටොෂිමාගේ මළසිරුර පොලිසිය විසින් මෘත ශරීරාගාරයට රැගෙන එන ලදී. විදේශීය ජාතිකයන්ගේ මළසිරුරු, අදාල රටට බාර දීමට තිබෙන බැවින්, වෛද්‍ය පරීක්ෂණය ආරම්භ කිරීමට පෙර ටොෂිමා අයත් රටේ ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයට පොලිසිය විසින් ටොෂිමාගේ මරණය පිළිබඳව දන්වන ලදී. ඉන් පසුව එම තානාපති කාර්යාලයේ නිලධාරියෙක් මළසිරුර පරීක්ෂා කිරීමට පැමිණියේ ය. තම රටින් බැහැරව යම් අයෙකු වෙනත් රටක මිය ගිය විට, එම තැනැත්තා මනුෂ්‍ය ඝාතනයකට ලක් කොට ඇති බව මිය ගිය තැනැත්තාගේ ඥාතීන් විසින් සැක පහළ කොට චෝදනා ඉදිරිපත් කළහොත්, ඒවාට පිළිතුරු සැපයීම සඳහා මළසිරුර ඡායාරූප ගත කර ගන්නා ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් තානාපති කාර්යාලයේ නිලධාරියාට උපදෙස් දෙන ලදී. අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ සහ හදිසි මරණ පරීක්ෂකවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව තානාපති කාර්යාලයේ නිලධාරියා මළසිරුර ඡායාරූප ගත කළේ ය. ඉන්පසුව අධිකරණ වෛද්‍යවරයා විසින් වෛද්‍ය පරීක්ෂණය ආරම්භ කරන ලදී.

ටොෂිමාගේ මළසිරුර අධි ශීතකරණයක් තුළ දින කීපයක් තිබූ බැවින් ශරීරය ලී කොටයක් මෙන් තද වී තිබුණි. ඝණව මිදුණු අයිස් තට්ටුවලින් ශරීරයේ ඇතැම් කොටස් වැසී තිබුණි. මියගිය ටොෂිමා, මස් පිඩු සහිත බාහු ඇති නීරෝගී මනාව වැඩුණු සිරුරක් ඇති කිලෝග්‍රෑම් හැටක් බර වූ තරුණයෙක් විය. හිසේ සිට පාදය දක්වා මළසිරුරේ දිග, සෙන්ටිමීටර් එකසිය හැටක් විය. අධිශීතකරණයක් තුළ තැබීම නිසා, සම තදව, රෝස පැහැති වී තිබිණි. සෙන්ටිමීටර් එකක් පළල සහ සෙන්ටිමීටර් එකක් ගැඹුර ඇති දාරයක් ( groove ) පපුවේ ඉදිරිපස දකුණු පැත්තේ සිට වම් පැත්ත දක්වා ඇලව පිහිටා තිබිණි. ඒ හා සමාන පළල දාර



දෙකක් දනහිස් දෙකෙහිම පිහිටා තිබුණි. මිලිමීටර් දෙකක විෂ්කම්භය ඇති ප්ලාස්ටික් ගෝල දෙකක් ටොෂිමාගේ ශිෂ්ණයේ ( penis ) කෙළවර පිහිටි පුපුටියෙහි ( prepuce ) උඩු හා යටි පැත්තෙහි සමට යටින් සවි කොට තිබුණි. සංවාසයේ දී ස්ත්‍රියට ලිංගික සුරතාන්තය (orgasm ) ලබා දීම සඳහා ඇතැම් පිරිමින්, දත් බුරුසුවක මිටකින්, පනා සහ බොත්තමකින් සාදා ගත් මෙවැනි ගෝල, ශිෂ්ණයේ කෙළවර සමට ( පුපුටයෙහි ) යටින් සවි කර ගනු ලැබේ. දත් බුරුසු මිට, පනා සහ ප්ලාස්ටික් බොත්තමකින් යනාදී දේවලින් සාදා ගත් මෙවැනි ගෝල, චීන ජාතිකයන් ආහාර වැළඳීමේ දී පාවිච්චි කරන ලී හෝ ගජ දල කූරු ( chop-sticks ) උල් කර ගෙන ඒවාවලින් පුපුටිය සිදුරු කොට මෙම ගෝල ඇතුල් කර ගන්නා බව වාර්තා වී ඇත. මෙය ජපානයේ පාතාල ලෝකයේ ක්‍රියාකාරී "යකුසා" (Yakuza) නමැති කල්ලියේ සාමාජිකයන් පාවිච්චි කරනු ලබන බහුල ක්‍රමයකි. ස්ත්‍රීන් සමග ලිංගික සේවනයේ යෙදෙන පිරිමින්, ස්ත්‍රියව තම වසහයේ තබා ගැනීම සඳහා පිරිමින් මෙවැනි ක්‍රම යොදා ගන්නා බව වාර්තා වී ඇත. ටොෂිමාගේ වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ අධිකරණ වෛද්‍යවරයාට මෙවැනි දෙයක් ලංකාවේ දී හමු වූ ප්‍රථම අවස්ථාව මෙය විය.

මිලිමීටර් දෙකක විෂ්කම්භයකින් සමන්විත තිත් ( dots ) තිහක් පමණ පපුවේ වම් තන ප්‍රදේශය මත එකිනෙකට ඉතා ආසන්නව ද, එවැනි තිත් සියයක් පමණ දකුණු තන ප්‍රදේශය මත එකිනෙකට ඉතා ආසන්නව ද පිහිටා තිබුණි. දකුණු තන ප්‍රදේශයේ තිබූ තිත් සුදු පැහැති වූ අතර, වම් තන ප්‍රදේශය මත තිබූ තිත් කළු පැහැති විය. ටොෂිමා මරණයට පත්වීමට පැය කීපයකට පෙර සම පිළිස්සීම නිසා එම කළු පැහැති තිත් ඇති වී ඇති බවත්, සුදු පැහැති තිත් ඇති වී ඇත්තේ ඔහු මරණයට පත්වීමෙන් පසුව බවත් වෛද්‍යවරයා නිගමනය කළේ ය. වෙන කිසියම් තුවාලයක් හෝ තැල්මක් අසාමාන්‍ය තත්ත්වයක් මළසිරුරේ බාහිරව දක්නට නො වී ය. ඇට බිඳීමක් හෝ විකලාංගතාවක් ( deformity ) ද මළසිරුරේ නො වී ය. අභ්‍යන්තර පරීක්ෂාව සඳහා ශරීරය විච්ඡේදනය කිරීමේ දී (dissection) සොයා ගැනීමට හැකි වූ එකම වැදගත් ලක්ෂණය මූයේ මොළයේ මස්තිෂ්තක ( cerebral hemispheres ) තුළ ලේ ලප කීපයක් තිබීම පමණි. කම්පනයක් ඇති වූ විට හෝ ස්වසනය අකර්මන්‍යවීම ( respiratory failure ) නිසා හෝ ලේ විෂවීම



Scanned with CamScanner

(toxaemia) හෝ විද්‍යුත්හනනයෙන් ( electrocution ) හෝ හෘදයාබාධයක් සෑදීමෙන් යන හේතූන් නිසා මොළය තුළ මෙවැනි ලේ ලප ඇති විය හැකි ය. සියලු අභ්‍යන්තර ඉන්ද්‍රියයන් නීරෝගී ස්වභාවයක් පෙන්නුම් කළේ ය. ටොෂිමා අනපේක්ෂිතව මිය ගොස් සිටි බව ධීවර යාත්‍රාවේ කපිතාන්වරයා විසින් වාර්තා කර තිබූ හෙයින්, ටොෂිමාගේ හෘදය, පෙනහැල්ල, අක්මාව, අධිවෘක්ක ග්‍රන්ථීන් ( adrenal glands ) සහ මොළය යන ඉන්ද්‍රියයන්වල අවශ්‍ය ස්ථානවලින් ලබා ගත් කොටස් පටකවේද පරීක්ෂාවට භාජනය කළේ ය. අස්වාභාවික ( unnatural ) රෝගයක් හෝ රෝගී තත්ත්වයක් (pathological) හෝ උපතින්ම ඇති වූ රෝගයක් ( congenital disease ) ටොෂිමාට නො තිබූ බව පටකවේද පරීක්ෂණයෙන් හෙළි විය. ටොෂිමා නිරෝගීව සිටි තැනැත්තකු බව අධිකරණ වෛද්‍යවරයා වෛද්‍ය පරීක්ෂණයෙන් පසු නිගමනය කළේ ය.

ගැඹුරු මුහුදේ සති තිපයක් ගොඩ බිමෙන් බැහැර සේවය කරන ධීවරයන්, සේවා මුරයෙන් පසුව අධික ලෙස මත් පැන් පානය කරන බැවින්, ඊතයිල් මධ්‍යසාරය විශ්ලේෂණය කිරීම සඳහා ටොෂිමාගේ මළසිරුරෙන් ලබා ගත් රුධිරය සහ මුත්‍රා, වරාය පොලිසිය මගින් රජයේ රසපරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරන ලදී. රස පරීක්ෂකගේ වාර්තාව අනුව රුධිරය මිලි ලීටර් සියයකට, ඊතයිල් මධ්‍යසාරය මිලි ග්‍රෑම් හැත්තෑ හතරක් ද, මුත්‍රාවල ඊතයිල් මධ්‍යසාරය මිලි ග්‍රෑම් එකසිය දහයක් ද විය. එවැනි ප්‍රමාණයකින් කෙනෙකු අධික ලෙස මත්වීමට ( intoxication ) නො හැකි බැවින්, මධ්‍යසාර විෂ වීමෙන් මරණය සිදු වී නොමැති බව වෛද්‍යවරයා ස්ථිර වශයෙන්ම නිගමනය කළේ ය. අධික ලෙස මත් පැන් පානය කොට නො තිබීම නිසාත්, නීරෝගී ශරීරයකින් හෙබි නිසාත්, ටොෂිමා අනපේක්ෂිතව මරණයට පත් වූයේ කෙසේ දැයි ප්‍රහේලිකාවක් විය. ටොෂිමාගේ මරණයට හේතුව සොයා ගැනීමට නො හැකි වූ නිසා මළසිරුර තවදුරටත් පරීක්ෂා කිරීම සඳහා ( repeat post mortem examination ) සෙල්සියස් අංශක හතරක උෂ්ණත්වයක් ඇති මෘත ශරීරාගාරයේ ශීතකරණය තුළ තබන ලදී.

විෂ වර්ගයක් ශරීරගත වීමෙන් මරණය සිදු වූයේ දැයි, දැන ගැනීම සඳහා, සම්පූර්ණ ආමාශය සහ එහි අන්තර්ගත දෑ, අක්මාවෙන් කොටසක්, රුධිරය සහ මුත්‍රා ද වරාය පොලිසිය මගින් රස පරීක්ෂක



වෙත යවන ලදී. පාසානම්, ඇන්ටිමනි, බිස්මත්, රසදිය සහ රිදීමය ලෝහමය හෝ කාබනික පොස්පරස් සංයෝග, කාබනික් ක්ලෝරීන් සංයෝග, පැරකොට් සහ ඩයිකෝට් වැනි පළිබෝධ නාශක සංයෝග යනා දී කෘමි රසායනික සංයෝග හෝ බාබියුටරේට්, වැලියම්, ලිබ්‍රියම්, පීනෝතයිසීන්, හෙරොයින්, මෝෆීන්, කෝඩේන් යනා දී ඖෂධ කිසිවක් ආමාශයේ සහ අක්මාවේ නො තිබුණු බව එම පරීක්ෂණයෙන් වාර්තා විය. ඒ අනුව, ටොෂිමා මරණයට පත්වී ඇත්තේ විෂ වර්ගයක් ශරීරගත වීමෙන් නො වන බව ද පැහැදිලි විය. පහරදීම්වලින් ඇති වන තැලුම් තුවාල (contusions), පේශීන් තුළට රුධිරය වහනය වීම ( intramuscular bleeding ), අස්ථීන්වල භග්න ( fracture of bones ), අවසංධි වීම් (dislocation), ගෙල මිරිකීමෙන් හෝ බන්ධකයකින් ගෙල තද කිරීමෙන් ගෙලෙහි අභ්‍යන්තරව ඇතිවන තැල්ම හෝ ලේ ගැලීම් සහ කණ්ඨක අස්ථියේ සහ තයිරොයිඩ් කාටිලේජයේ භග්න යනාදි කිසිවක් මළසිරුරේ නො වී ය. තනු ප්‍රදේශය මත පිහිටා තිබුණු කළු පැහැති තිත් නැවත වරක් අත් කාචයකින් ( hand lens ) අධිකරණ වෛද්‍යවරයා දැඩි ලෙස පරීක්ෂාවට භාජනය කළේ ය. විද්‍යුත් ධාරාවක් සන්නයනය ( conducting ) වන කම්බියක තුඩක් සමෙහි ස්පර්ශ වීමෙන්, මෙවැනි තිත් ඇති වීමට හැකි බවට වෛද්‍යවරයා සැක කළේ ය. එසේ නම්, විද්‍යුත් ධාරාවක් සන්නයනය වන කම්බි තුඩක් පපුව මත ස්පර්ශ වීමේ දී හෘදය අක්‍රිය වීමෙන් ( cardiac arrest ) ටොෂිමාගේ මරණය සිදු වී ඇති බව තවදුරටත් අධිකරණ වෛද්‍යවරයා උපකල්පනය කළේ ය. මොළයේ මස්තිෂ්කය තුළ ලේ ලප තිබීම ද විද්‍යුත් ධාරාවක් ශරීරයට ඇතුල් වූ බවට අමතර සාධකයක් විය. තිත් තිබූ ප්‍රදේශය මත තඹ, යකඩ සහ ඊයම් වැනි ලෝහ ස්පර්ශ ( contact traces ) වී ඇද් දැයි සොයා ගැනීමට විශේෂ රසායනික පරීක්ෂණයක් ( accro - reaction test ) වෛද්‍යවරයාගේ උපදෙස් මත රසායනාගාරයේ දී පවත්වන ලදී. පපුවේ තිත් තිබූ ප්‍රදේශය මත තඹ ( copper ) ස්වල්පයක් තිබූ බව රසායනාගාර වාර්තාවේ සඳහන් වී තිබුණි. රථවාහන වැඩපලක සේවය කරන සේවකයන්ගේ සහ විදුලි කාර්මික සේවයේ යෙදෙන්නන්ගේ ශරීරය මත නොයෙකුත් වර්ගයේ ලෝහ තැවරෙන නිසා, එවැනි පුද්ගලයන් විද්‍යුත්හනනයෙන් මියගිය විට මෙම පරීක්ෂණයේ වැදගත්කමක් නොමැත. මේ අනුව, තඹ කම්බි තුඩකින් මතුවන විද්‍යුත් ධාරාවක් පපුව මත ස්පර්ශ වීම නිසා ( electrocution ) හෘදය අකර්මන්‍ය



Scanned with CamScanner

වීමෙන් ( cardiac failure ) ටොම්මාගේ මරණය සිදු වී ඇති බව අධිකරණ වෛද්‍යවරයා උපකල්පනය කළේ ය.

වද හිංසාවන්ට ලක්වන අයගේ ශරීරයේ ශිෂ්ණය, ශිෂ්ණ මුණ්ඩය ( glans penis ), වෘෂණ කෝෂ, කලවා සහ කඳ මත විද්‍යුත් ධාරාවක් පිටවෙන කම්බි තුඩක් තබා දරුණු වේදනාවක් ඇති කොට පාපොච්චාරණ ( confession ) ලබා ගැනීම ඇතැම් රටවල ආරක්ෂක අංශ විසින් පාවිච්චි කරන, බහුල වද හිංසා ( torture ) ක්‍රමයකි. වද හිංසා කිරීම සඳහා පුටුවකට, ඇඳකට හෝ සිටුවා ඇති කණුවකට සිරකරුවා ( prisoner ) බැඳ තබා විද්‍යුත් ධාරාවක් පිට කළ හැකි විදුලි පන්දමක් ( electric torch batton ) ශරීරය මත තබා දැඩි වේදනාව ඇති කිරීම දකුණු ඇමෙරිකාවේ ආරක්ෂක අංශ විසින් පාවිච්චි කරන සුලබ ක්‍රමයක් වේ.

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ ( Universal Declaration of Human Rights ) පස්වන වගන්තිය අනුව අත් අඩංගුවට ගත් සැකකරුවෙකුගෙන් පාපොච්චාරණයක් ලබා ගැනීමට පොලිසිය හෝ හමුදාව මගින් වද හිංසා කිරීම කළ යුතු නො වේ. ශ්‍රී ලංකා රජය ද මෙම විශ්ව ප්‍රකාශනය අනුව ක්‍රියා කිරීමට බැඳී ඇත. විද්‍යුත් ධාරාව සපයන කම්බි තුඩ පපුවේ හෝ කලවේ ඇතුල් පැත්තේ හෝ ශිෂ්ණය මත තබනු ලැබේ. අත් අඩංගුවට ගත් අය බොහෝ විට බැඳ තබා, විද්‍යුත් ධාරාව ශරීරය මත තැබීම සිදු කරනු ලැබේ. එමනිසා විද්‍යුත් ධාරාව සැපයූ කම්බියක් අහඹුවෙන් ( accidentally ) පපුවේ ස්පර්ශ වීමෙන් මරණයට පත් වූයේ ද, නැතහොත් විද්‍යුත් ධාරාවක් සපයන කම්බියක් පපුව මත තබා වද හිංසා කිරීමේ දී හෝ ස්වයංලිංගික ආස්වාදයක් ලබා ගැනීම සඳහා ඇතැම් පිරිමින් සිදු කරන ආකාරයට විද්‍යුත් ධාරාව ලිංගේන්ද්‍රිය මත තැබීමේ දී ( ස්වනාම ප්‍රීණනය - self electriocution ) ටොම්මා මරණයට පත්වූයේ ද යන්න අධිකරණ වෛද්‍යවරයාට විසඳීමට තිබුණි.

පොලිසිය, ආරක්ෂ අංශ සහ රාජ්‍ය අනුග්‍රහය යටතේ පවත්වනු ලබන කණ්ඩායම් ( goon sqauds ) මගින් අත් අඩංගුවට ගන්නා ලද දේශපාලන සිරකරුවන් හෝ වෙනයම් අයට කරනු ලබන වද හිංසා පිළිබඳව සමීක්ෂණයක් ඩෙන්මාර්ක වෛද්‍ය කණ්ඩායමක් ( Danish



Medical Group ) විසින් එක්දහස් නවසිය හැත්තෑ හතේ දී පවත්වන ලදී. එම සමීක්ෂණයේ වාර්තාව අනුව එක්සත් ජාතීන්ගේ සංගමයට (United Nations) අයත් රටවල්වලින් තුනෙන් එකක සංඛ්‍යාවක් එම රටවල් විසින් අත් අඩංගුවට ගත් අය සහ දේශපාලන සිරකරුවන්ට වද හිංසා කළ බව එම වාර්තාවේ සඳහන් වී ඇත. වද හිංසා කිරීම නිසා ඇතැම් අවස්ථාවල වද හිංසාවලට ලක්වූවන් මරණයට පත් වී ඇත. මරණය සිදු නො වුනත් වද හිංසාවලට ලක්වූවන්ට සදාකාලිකව මානසික හා කායික දුර්වලතා ඇති වන බවට ද එම වාර්තාවේ සඳහන් වී ඇත. වද හිංසා කරනු ලබන්නන් (tourturer) හඳුනා ගැනීම වලක්වා ගැනීම සඳහා ,වද හිංසාවලට ලක්වන අයගේ ( tourtured ) ඇස් වැසෙන සේ රෙදි පටියකින් බැඳ තබා වද හිංසා කරනු ලැබේ. අමතකවීම, සිත එකඟ කිරීමට නො හැකි වීම ( inablity to concentrate ), හිසේ කැක්කුම, නින්ද නො යාම, භයානක හීන පෙනීම, ලිංගික දුර්වලතා, කන් ඇසීම දුර්වල වීම, හන්දිපත්වල වේදනාව, නියුරෝසියාව, ඇස් පෙනීම අඩු වීම, ඇවිදීමට අපහසු වීම යනාදිය එම දුර්වලතා බව වාර්තා වී ඇත.

බැටන් පොලුවලින් හෝ වැලි පිර වූ එස්ලෝන් බටයකින් නිරන්තරයෙන් පහරදීම, දියේ ගිලී මිය යන්නට ආසන්න වන තෙක්, වරින් වර වතුර ටැංකියක හිස ඔබා ගෙන සිටීම ( sub marino ), ( හිස ජලයේ ඔබා ගෙන සිටින විට නාඩි වේගය වරින් වර පරීක්ෂා කිරීමෙන් දියේ ගිලී මිය යෑම වලක්වා ගැනීම කරනු ලැබේ. ) එක දිගට දවස් ගණනක් සිට ගෙන සිටීමට සැලැස්වීම, (එසේ සිටීමෙන් ගුරුත්වාකර්ෂණ බලය නිසා රුධිරය කකුල් දෙසට එකතු වීම නිසා ඉදිමීම සහ කම්පනය සැදී ක්ලාන්තය ( vaso vagal fainting attacks ) ඇති වේ.) බටයක් පයිප්ප කරාමයකට සවි කොට බටයේ අනික් කෙළවර නැසින්නකට ( nozzle ) සවි කොට නැසින්න වද හිංසාවට ලක්වන තැනැත්තාගේ නාස් පුඩු තුළට ඇතුල් කොට කරාමය විවෘත කිරීම ( water treatment ), දැල්වෙන සිගරට් කොටවලින් අත්, යටි බාහු, කඳ සහ කකුල් පුළුස්සා වේදනාව ඇති කරවීම, විදුලිය සපයන කම්බිකින් හෝ විශේෂයෙන් තනන ලද විදුලි පන්දමකින් ( electric shock baton ) පපුව, කලවා, ප්‍රදේශය, ඉකිලි ප්‍රදේශය සහ ශිෂ්ණය ස්පර්ශ කිරීම, වද හිංසාවලට ලක්වන තැනැත්තා බංකුවක් මත උඩබැලි අතට සිටින සේ බැඳ තබා යටි පතුල්වලට බැටන් පොලුවලින් පහර දී තැල්ම ඇති කිරීමෙන් දරුණු



Scanned with CamScanner

වේදනා ඇති කිරීම ( falanga ) (මෙවැනි අයට ඇවිදීමට ඉතාම අපහුසය.), නිදා ගැනීම වැළැක්වීම (deprivation of sleep), කෑමට ආහාර හා බීමට ජලය ලබා නො දීම ( deprivation of food & water ), මලපහ සහ මුත්‍රා කිරීමට අවස්ථාව ලබා නො දීම, දෑත් එක්කොට මැණික් කටුව ප්‍රදේශයෙන් බැඳ තබා එල්ලා තැබීම හෝ පාද එක්කොට බැඳ උඩු බැලි අතට එල්ලා තැබීම ( මේ ආකාරයෙන් එල්ලීම නිසා කම්පනය හට ගනී ), මාපියන්ට හෝ දරුවන්ට හෝ සහෝදරයින්ට මරණ තර්ජන ඇති කිරීම් හෝ බිය වැද්දීම් කිරීම, සති දෙකක පමණ කාලයක් තුළ ආලෝකය සහ වාතාශ්‍රය නොමැති කුටියක තනියම සිර කර තැබීම ( solitary confinement ), වද හිංසාවලට ලක් කරන අන් අය බලයෙන් පෙන්වීම, වද හිංසාවලට ලක්වන අයගේ අඳෝනාවලට බලයෙන් සවන් දීමට සැලැස්වීම, දැඩි ලෙස ආලෝකයක් මුහුණට ඇල්ලීම, සත්‍ය ප්‍රකාශ කිරීමේ ඖෂධ ( truth drugs - eg :- thiopentone sodium ) එන්නත් කිරීම, ඇඟිලි දිග හැර අත්ලෙන් කනට වේගත්ව කීප වාරයක් පහර දීම (telefeno), ( එසේ කිරීමේ දී කන් බෙර පිපිරීම ඇති වේ.) යන ක්‍රම වද හිංසා කිරීමට පාවිච්චි කරනු ලැබේ. අත් අඩංගුවට ගත් අයගේ ගෙල කැපීමෙන්, අත් පා කැපීමෙන් හිසට වෙඩි තැබීමෙන් මරණයට පත් කරන අවස්ථා ද ඇත. වද හිංසා කිරීමේ දී අත් අඩංගුවට ගත් කාන්තාවන් දූෂණයට ලක් කළ අවස්ථා ද වාර්තා වී ඇත.

එක් දහස් නව සිය අනූ එකේ සිට එක් දහස් නවසිය අනූපහ දක්වා කාලය තුළ දී පැරණි යුගොස්ලාවියානු රජයේ ප්‍රාන්තයක් වූ බොස්නියාවේ දී යුගොස්ලාවියානු හමුදාවේ සොල්දාදුවන් සහ බන්ධනාගාර කඳවුරුවල දී බන්ධනාගාර නියාමකයන් විසින් අත් අඩංගුවට ගන්නා ලද විවාහක කාන්තාවන් සහ තරුණ ගැහැණු ළමයින් වරින් වර ඔවුන්ගේ පවුලේ අය ඉදිරිපිට දී දූෂණයට ලක් කළ බව එක්සත් ජාතීන් විසින් පත් කරන ලද පරීක්ෂණ කණ්ඩායම විසින් සොයා ගෙන ජාත්‍යන්තර අධිකරණයට වාර්තා කොට ඇත.

ගැහැණියක් සමග ලිංගික සම්බන්ධයක් නොමැතිව හුදකලාව සති ගණනක් මුහුදේ ගත කරන ඇතැම් තරුණයින්, විද්‍යුත් ධාරාවක් ශිෂ්ණය මත තබා ස්වයංලිංගික වින්දනයක් ( autoerotic electrical stimulation ) ලබා ගන්නා බව විද්‍යාත්මක සඟරාවල සහ විද්‍යාත්මක



සම්මන්ත්‍රණවල දී වාර්තා වී ඇත. මේ අන්දමට ස්වයංවින්දනය ලබමින් සිටි තැනැත්තන් මිය ගිය අවස්ථා ද ඇත. යම් අයෙකු හෝ කිහිප දෙනෙකු විසින් ටොෂිමාව බැඳ තබා වද හිංසා කිරීම සඳහා විද්‍යුත් ධාරාවකින් ශරීරය ස්පර්ශ කිරීමේ දී මරණයට පත්වූවා නම්, ටොෂිමාගේ මරණය සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් ( culpable homicide ) වනු ඇත. එසේ නොමැතිව ටොෂිමා සිටි කුටියේ විදුලි උපකරණයක කාන්දුවීමක් තිබී අහම්බෙන් ( accidental ) ඔහු විද්‍යුත්හනනයට ලක් වූයේ නම් හෝ ටොෂිමා ස්වයංලිංගික වින්දනයක් විඳින අවස්ථාවක දී ( self inflicted ) විද්‍යුත්හනනයට ලක් වූයේ නම් ඔහුගේ මළසිරුර තිබූ ඇඳ මත හෝ කුටියෙහි විද්‍යුත් ධාරාව සැපයූ කම්බිය හෝ උපකරණය තිබී සොයා ගත යුතු ය. එවැනි දෙයක් තිබුණේ නම් කපිතාන්වරයාගේ වාර්තාවේ එය සඳහන් විය යුතුව ඇත. පශ්චාත් වෛද්‍ය මරණ පරීක්ෂණය පැවැත්වීමට පෙර ධීවර යාත්‍රාව ශ්‍රී ලංකා වරායෙන් පිටත් වී තිබූ බැවින්, ටොෂිමා සිටි කාමරයේ එවැන්නක් තිබූ බවට සොයා ගැනීමේ අවස්ථාව පොලිසියටත් අධිකරණ වෛද්‍යවරයාටත් බැහැර වී තිබිණි. පපුව සහ දනහිස් දෙකම බැඳ තිබීමේ ලකුණු වන, දාර තිබීමත් සහ මරණයට පෙර සිදුවූ තිත් පපුවේ තිබීමත් නිසා වෛද්‍යවරයාගේ අවසාන නිගමනය වූයේ ටොෂිමා බැඳ තැබීමෙන් පසුව විද්‍යුත් ධාරාවක් සැපයූ කම්බියක තුඩකින් ඔහුගේ ශරීරය ස්පර්ශ කිරීම නිසා ( torture & electrocution ) හෘදය අකර්මන්‍ය වීමෙන් ටොෂිමා මරණයට පත් වී ඇති බවයි.

ටොෂිමා ජවයෙන් පිරි තරුණයකු බැවින් ධීවර යාත්‍රාවේ දී ඇති වූ කැරැල්ලක් මගින් නායකත්වය ලබා දීමට යාමේ දී මෙය සිදුවන්නට ඇතැයි අපට උපකල්පනය ( assumption ) කිරීමට හැකි ය. එක් අයකු හෝ කීප දෙනෙකු විසින් තව කෙනෙකු උපක්‍රමශීලිව මරණයට පත් කරනු ලැබූව ද, මළසිරුර දැඩිව කුණු වී නොමැති නම් ( fresh body ) සුපරීක්ෂාකාරීව වෛද්‍ය පරීක්ෂණය පවත්වා එක්ස් කිරණ පරීක්ෂාව, සූක්ෂම රසායනික පරීක්ෂණ සහ ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂ පරීක්ෂණ ( electron microscope ) වැනි උචිත ( appropriate ) නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කරන්නේ නම්, බොහෝ අවස්ථාවල මරණයට හේතුව සහ ඊට අදාල කරුණු පළපුරුදු විශේෂඥ අධිකරණ වෛද්‍යවරයෙකුට සොයා ගත හැකි බවට මෙම සිද්ධිය එක් නිදසුනකි.



Scanned with CamScanner

ටොෂිමාගේ පපුව මත තිබූ තිත්, එම තිත් මතුපිට තිබූ ලෝහමය තඹ ද්‍රව්‍ය, පපුව හරහා සහ දනහිස් දෙක හරහා තිබූ දාර, මස්තිෂ්කයේ තිබූ ලේ ලප යනාදිය මරණයට හේතුව සොයා ගැනීමට උපකාරී වූ " නිහඬ සාක්ෂි " වේ.



# ඩයටම් පරීක්ෂාවෙන් හෙළි වූ සත්‍යය

ධනපාල මුදලාලි ඇඹිලිපිටියේ වාසය කළ මැණික් ව්‍යාපාරිකයෙකි. ඇඹිලිපිටියේ විසූ ධනවත්ම තැනැත්තා ඔහු විය. වයස අවුරුදු පනස් පහක් වූ ධනපාල මුදලාලිට අවුරුදු විසි තුනක පුතකු ද අවුරුදු දහ අටක දියණියක ද වූ හ. ගොවි කම්කරුවෙකු වශයෙන් ජීවිතය ආරම්භ කළත් ඔහුගේ වාසනාව පෑදුනේ මැණික් පතලකින් වටිනා මැණිකක් ලැබීම නිසා ය. මැණික් පතලක හවුලේ වැඩ කිරීමෙන් මුදල් උපයා ගත් ඔහු පසුව රජයේ ඉඩම්වල අනවසරයෙන් පතල් කපා මැණික් ගැරීමෙන් අවුරුදු දහයක් වැනි කෙටි කාලයකින් කෝටිපතියෙකු විය. මැණික් තක්සේරු කිරීමට ඔහු පමණ දැනුමක් ඇති අයෙක් මුළු මොණරාගල දිස්ත්‍රික්කයේම නො සිටියේ ය. පාසැල් අධ්‍යාපනය ලබා නො තිබුණත් මැණික් පිළිබඳ හසල දැනුමක් ඔහුට තිබුණි. සිංහල භාෂාව කියවීමට හැකි වුවත් ලිවීමේ හැකියාව ධනපාල මුදලාලිට නො තිබුණි. එම නිසා, ව්‍යාපාර කටයුතු සම්බන්ධව සියලු ලිපි ගනු දෙනු ඔහුගේ භාර්යාව විසින් මුල් අවධියේ දී කරන ලදී. පසුව ධනපාල මුදලාලිගේ මැණික් ව්‍යාපාරය දියුණුවීමත් සමගම ගණකාධිකාරීවරයකු සහ උපදේශකවරයෙකු ද එම කටයුතුවලට යොදවන ලදී.

ප්‍රසිද්ධිය ලබා ගැනීම සඳහා පන්සල්, පාසල් සහ රෝහල් වාට්ටු යනාදිය තැනීමට ධනපාල මුදලාලි බොහෝ වියදම් දැරී ය. තම ධනයෙන් ඉදි කරවන ලද එම ගොඩනැගිලි ප්‍රභූවරුන් කැඳවා ප්‍රසිද්ධියේ විවෘත කරන විට ඔහුට ඉමහත් සතුටක් හා ආඩම්බරයක් ඇති විය. මේ නිසාම ඇඹිලිපිටියේ සහ එහි අවට සිටි මන්ත්‍රීවරුන්, උසස් පොලිස් නිලධාරීන්, ධනවත් මුදලාලිවරුන් සහ රජයේ උසස් නිලධාරීන් ඉතා සමීපව ආශ්‍රය කිරීමට ධනපාල මුදලාලිට අවස්ථාව ලැබුණු අතර ඔවුන් සමග දැඩි මිත්‍රත්වයක් සහ කුළුපගකමක් ද පැවැත්වීමට ද අවකාශ සැලසුණේ ය. කල් යෑමේ දී මැණික් කපා ඔප දමා විදේශ රටවලට යැවීමට පවා ධනපාල මුදලාලිගේ ව්‍යාපාරය ක්‍රමයෙන් දියුණු විය. මැණික් ව්‍යාපාරය මත පමණක් බලාපොරොත්තු නො තැබූ ඔහු සංචාරක හෝටලයක් ද තනවන ලදී. ඔහුගේ වාසනාවට මෙන් එම සංචාරක හෝටල් ව්‍යාපාරය ද දිනෙන් දිනම දියුණු වෙන්නට වූයේ ආර්ථික අතින් ධනපාල මුදලාලි

වඩාත් ශක්තිමත් කරවමිනි. ධනය වැඩිවෙත්ම බලය ලබා ගැනීමේ අටියෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමේ අභිලාෂය ද ඔහුගේ සිත තුළ ජනිත විය. එම නිසා, දිස්ත්‍රික්ක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ මිලින්ද සමග ධනපාල මුදලාලි, සමීප ඇසුරක් ඇති කර ගත්තේ ය. නිතරම ධනපාල මුදලාලි ඔහු සමග මන්ත්‍රීතුමාගේ පැජරෝ රථයෙන් ගමන් බිමන් යාමට ද පුරුදු විය. මේ අතරතුර පළාත් පාලන මැතිවරණය ළඟා විය. තම පක්ෂයේ අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය තහවුරු කොට වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ගැනීම මිලින්ද මන්ත්‍රීවරයාගේ අරමුණ වූ අතර, ඔහු එම අදහස ධනපාල මුදලාලිට පැවසී ය. අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ධනපාල මුදලාලි මන්ත්‍රීධුර අපේක්ෂකයෙකු වශයෙන් තමාටත් ඉදිරිපත් වීමට කැමැත්තක් තිබෙන බව මිලින්ද මන්ත්‍රීතුමාට පැවසුවේ ය. ඒ සඳහා තම පක්ෂයේ මහලේකම්වරයාට දන්වා ආසන සංවිධායකවරයෙකු වශයෙන් ධනපාල මුදලාලි පත් කිරීමට මන්ත්‍රීවරයා පොරොන්දු විය. එතැන් පටන් ධනපාල මුදලාලි සමග මිලින්ද මන්ත්‍රීවරයා දිස්ත්‍රික්කයේ සෑම තැනකම දේශපාලන ප්‍රචාරක රැස්වීම් පවත්වමින් සැරි සරන්නට විය.

කල්යාමෙන් පළාත් සභා මැතිවරණය සඳහා නාම යෝජනා භාර දීමේ දිනය ළඟා විය. මිලින්ද මන්ත්‍රීවරයා සමග ධනපාල මුදලාලි ඇතුලු ආධාරකරුවන් ඔහුගේ නිවසේ සිට වාහනවල නැගී නාම යෝජනා භාර ගන්නා කච්චේරිය වෙත ජයග්‍රාහී ලීලාවෙන් පිටත් විය. මේ අවස්ථාවේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රී ධුරාපේක්ෂකයිනුත් හරස් පාරකින් මහා මාර්ගයට පිවිසුණ හ. කච්චේරියට පැමිණෙත්ම මාර්ගය අසල දී දෙපාර්ශවයම එකිනෙකට මුණ ගැසිණි. සටන් පාඨ කියමින් සහ ජය සෝෂා නගමින් දෙපාර්ශවයම කච්චේරි භූමියට ඇතුල් විය. මිලින්ද මන්ත්‍රීතුමාගේ මුහුණ වැසෙන තෙක් මල්මාලා දමා තිබුණි. තුවක්කු අමෝරා ගත් ආරක්ෂක භටයින් කීප දෙනෙක්ම මන්ත්‍රීතුමාගේ ආරක්ෂාවට සිටිය හ. හිටිහැටියේම වෙඩි තබන ශබ්දයක් ඇසුණු අතර ඒ විගසම ආධාරකරුවෝ හිස්ලූයි අත දුවන්නට වූහ. ඒ සමගම දිගින් දිගටම වෙඩි හඬ නැඟෙන්නට ද විය. මිලින්ද මන්ත්‍රීතුමාගේ ආරක්ෂක භටයෝ ද මන්ත්‍රීතුමා වටකර ගෙන සෑම දිශාවකටම වෙඩි තබන්නට වූ හ. මේ අතරම ප්‍රතිවිරුද්ධ පක්ෂයේ මන්ත්‍රීධුරාපේක්ෂකයෙක් ඇද වැටුනි. ඒ අවස්ථාවේ ඉතා කලබලකාරී වාතාවරණයක් හටගත් බැවින් පොලිස්



නිලධාරීන්ගේ දැඩි පරිශ්‍රමයකින් පසු තත්ත්වය සමථයකට පත් කර ගැනීමට හැකි විය. එහෙත්, කුපිත වූ ආධාරකරුවෝ නගරයේ කඩසාප්පුවලට ගල් ගසා ඒවා ගිනිබත් කළ හ. තත්ත්වය මැඩ පැවැත්වීමට යුධ හමුදාවේ උපකාරය ද ලබා ගැනීමට පොලිසියට සිදු විය. ඉන් පසුව දෙපාර්ශවයේම ආධාරකරුවෝ විසිර ගියෝ ය.

වෙඩි තැබීමේ සිද්ධිය පිළිබඳව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැත් වූ ලඝුනොවන/ මූලික නඩු විභාගයේ දී ( non summary proceedings ) සාක්ෂි දීම සඳහා ධනපාල මුදලාලිට ද මහේස්ත්‍රාත් අධිකරණය මගින් සිතාසි ( summons ) නිකුත් කොට තිබුණි. එනමුත් මූලික මහේස්ත්‍රාත් නඩු විභාගයේ දී සාක්ෂි දීමට ධනපාල මුදලාලි ඉදිරිපත් නො වී ය. එමනිසා ධනපාල මුදලාලිව අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට විවෘත වරෙන්තුවක් ( open warrant ) අධිකරණය මගින් නිකුත් කරන ලදී. මිලින්ද මන්ත්‍රීතුමා ද වෙඩි තැබූ බවට සාක්ෂි ඉදිරිපත්ව තිබුණු බැවින්, වෙඩි වැදුනු තැනැත්තාගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් ඔහු ද පොලිසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී. ධනපාල මුදලාලි අත්‍යවශ්‍ය සාක්ෂිකරුවකු බව පොලිසියට සාක්ෂි ඉදිරිපත් කළ බොහෝ දෙනා ප්‍රකාශ කර තිබුණි. සාක්ෂිකරුවනට දැඩි දේශපාලන බලපෑම් එල්ල වූ අතර ධනපාල මුදලාලිගේ සාක්ෂියේ වැදගත්කම මෙහි දී ඉස්මතු විය. සාක්ෂි දීමට ඉදිරිපත් වුවහොත් ධනපාල මුදලාලි මරණ බවට තර්ජනාත්මක දුරකථන ඇමතුම් ඔහුගේ නිවසට ලැබෙන්නට විය. මේ නිසා ධනපාල මුදලාලි දැඩි භීතියෙන් කල් ගෙවමින් සිටි අතර ඔහුගේ මානසිකත්වය ද බිඳ වැටෙමින් තිබුණි. භීතියෙන් ජීවත් වූ ධනපාල මුදලාලි ඇඹිලිපිටියේ පිහිටි තම සුවිසල් මන්දිරයෙන් රහසේ පිට වී කොළඹ පිහිටි සුවිසල් තට්ටු නිවාසයක තම බිරියත් සමග වාසය කිරීමට ගිය අතර දරුවන් දෙදෙනා පමණක් ඇඹිලිපිටිය නිවසේ සිටියෝ ය.

වෙඩි තැබීමේ සිද්ධිය දුටු අයකු වන සැඟ වී සිටින ධනපාල මුදලාලි, අත්‍යවශ්‍ය සාක්ෂිකරුවකු නිසා අධිකරණයට කැඳවිය යුතු බව ප්‍රතිවිරුද්ධ පක්ෂය විසින් මහේස්ත්‍රාත්වරයාට ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. සියලු සාක්ෂි සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා ධනපාල මුදලාලිට අධිකරණයේ පෙනී සිටින ලෙස දෙවන වරටත් වරෙන්තුවක්



Scanned with CamScanner

නිකුත් කළේ ය. එහෙත්, තුන්වැනි නඩු දිනයේදීත් ධනපාල මුදලාලි අධිකරණයේ පෙනී නො සිටි හෙයින් ඔහුව දුටු තැන අත් අඩංගුවට ගෙන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමට විවෘත වරෙන්තුවක් ( open warrant ) නිකුත් කරන ලදී. තමාට එරෙහිව විවෘත වරෙන්තුවක් නිකුත් කිරීම නිසා ධනපාල මුදලාලි මහත් කම්පනයටත් භීතියටත් ලැජ්ජාවටත් පත් විය. ඊට පසු ඔහු ඇඹිලිපිටිය නිවසේ සිටි තම පුතාට දුරකථනයෙන් අමතා තමා දුටු තැන අත් අඩංගුවට ගැනීමට විවෘත වරෙන්තුවක් නිකුත් කොට ඇති බවත් නීතිඥයෙකු මගින් නව දින කිහිපයකින් අධිකරණයට භාර වන බවත් පැවසී ය. ධනපාල මුදලාලිගේ ඥාතීන්ට ඔහු ඇමතූ අවසාන අවස්ථාව එය විය. එම දිනෙන් පසු ඔහු ගැන ආරංචියක් නො වී ය. තම ස්වාමිපුරුෂයා, පාවිච්චි කරනු ලබන සෙලියුලර් දුරකථනය සහ මුදලුත් සමග ඔහු අතුරුදහන් වී ඇති බව ධනපාල මුදලාලිගේ බිරිඳ පොලිසියට පැමිණිල්ලක් කළා ය.

මුර සංචාරයේ යෙදී සිටි පොලිස් නිලධාරියකු විසින් එම පොලිසිය අසල පිහිටි මුහුදු වෙරළේ ගලක් මත සෙලියුලර් දුරකථනයක් තිබී එය පොලිසියට භාර දෙන ලදී. ඊට පැය තුනකට පමණ පෙර තමා මුර සංචාරයේ යෙදී සිටින අතරෙ ජාතික ඇඳුමක් ඇඳ සිටි මැදිවයසේ පිරිමියකු එම දුරකථනය තිබූ ස්ථානයේ ගල මත තුදකලාව හිඳගෙන සිටිනු දුටු බවත් පසුව තමා සේවය හමාර වී ඒ අසලින් යන විට ඔහු නො සිටි අතර එම සෙලියුලර් දුරකථනය තමාට හමු වූ බවත් එම පොලිසියේ ස්ථානාධිපතිවරයාට හෙතෙම වාර්තා කොට තිබුණි. ස්ථානාධිපතිවරයා විසින් ධනපාල මුදලාලිගේ බිරිය කැඳවා සොයා ගන්නා ලද දුරකථනය ඇයට පෙන්වීමෙන් පසුව එම සෙලියුලර් දුරකථනය ධනපාල මුදලාලිගේ බව ඔහුගේ බිරිඳ විසින් හඳුනාගනු ලැබුවා ය.

ධනපාල මුදලාලිගේ හැඩරුව දන්වා ගුවන් විදුලිය මගින් පොලිස් නිවේදනයක් ප්‍රචාරය කළ අතර, ඔහුගේ ඡායාරූපයක් ද දිනපතා පුවත්පත්වල පළ කරවන ලදී. තවත් සතියක් ගත වුවත්, ධනපාල මුදලාලි පිළිබඳව කිසිම ආරංචියක් දැන ගන්නට නො වී ය. ධනපාල මුදලාලි අතුරුදහන් වී දින දහයකට පසුව බේරුවල මුහුදු වෙරළට මළසිරුරක් ගොඩ ගසා ඇති බව ධනපාල මුදලාලිගේ බිරිඳට ආරංචි විය. එම මළසිරුර ඇයගේ ස්වාමිපුරුෂයාගේ දැයි



සැකයක් ඇයට ඇති වූ බැවින් වහාම එම ස්ථානයට ගිය නමුත් ඒ වන විට පොලිසිය විසින් එම මළසිරුර මෘත ශරීරාගාරය වෙත ගෙන ගොස් තිබුණි. මෘත ශරීරාගාරයේ දී එම මළසිරුර ධනපාල මුදලාලිගේ බිරිඳටත් පුතාටත් දුවටත් පෙන්වන ලද නමුත් මළසිරුර ඉදිමී මුහුණ සහ ශරීරය විකෘති වී තිබුණ නිසා, එය ධනපාල මුදලාලිගේ බව හඳුනා ගැනීම ඔවුනට දුෂ්කර විය. තවදුරටත් විමසිලිමත් වූ ඔවුනට මළසිරුරේ දකුණු අතේ මැණික් එබූ රන් මුදුව දක්නට ලැබුණි. ඒ අනුව, මළසිරුර ධනපාල මුදලාලිගේ බව හඳුනා ගැනීමට ඔවුනට හැකි විය.

ධනපාල මුදලාලි මරණයට පත් වූ ආකාරය සැක සහිත බව ඔහුගේ බිරිය විසින් මහේස්ත්‍රාත් පරීක්ෂණයේ දී ප්‍රකාශ කර තිබුණා ය. එහෙයින්, වෛද්‍ය පරීක්ෂණයක් පවත්වා මරණයට හේතුව අධිකරණයට වාර්තා කිරීමට විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියාට මරණ පරීක්ෂණය පැවැත් වූ මහේස්ත්‍රාත්වරයාගෙන් නියෝගයක් ලැබුණි. මන්ත්‍රී ධූරාපේක්ෂකයාගේ වෙඩි තැබීමේ සිද්ධිය ධනපාල මුදලාලි දුටු හෙයින් අත්‍යවශ්‍ය සාක්ෂිකරුවකු ඉවත් කිරීමට ඔහු සඟවා තබා ගැනීමෙන් පසුව ඔහුව මරා මුහුදට විසි කොට ඇති බවට කට කතා මේ වන විට පැතිරී තිබුණි. ධනපාල මුදලාලි මුහුදට පැන දියේ ගිලී මිය ගියේ ද, නැතහොත් ඔහුව වෙනයම් ආකාරයකින් මරණයට පත් කොට මළසිරුර මුහුදට දැම්මේ ද යන්න ස්ථිර වශයෙන් නිගමනය කිරීම විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියාට පැවරී තිබුණි. එම නිසා, වෙඩි වැදීම් වලින් සිදුවන සිදුරු හෝ ගෙල මිරිකීම්වලින් ඇති වුණ කණ්ඨිකාස්ථියේ ( hyoid bone ) භග්න හෝ මුවහත් පිහිවලින් කැපීමේ දී සිදුවන කැපුම් තුවාල හෝ උල් පිහිවලින් ඇනීමේ දී ඇති වන ඇනුම් තුවාල තිබේ දැයි සොයා ගැනීම සඳහා විශේෂයෙන්ම සැලකිලිමත් වූ අධිකරණ වෛද්‍යවරයා මළසිරුර දැඩි ලෙස පරීක්ෂාවට ලක් කළේ ය. බොහෝ සෙයින් කුණු වූ මළසිරුරුවල මරණයට පෙර සිදුවූ මෙවැනි තුවාල නිශ්චිත වශයෙන් හඳුනා ගැනීම අසීරු කාර්යයකි. ධනපාල මුදලාලිගේ මළසිරුර කුණු වී ඉදිමී තිබූ අතර නාසය, තොල් සහ ඇස් දෙක අවට මාළුන් හා මෝරුන් කා තිබූ බවට සලකුණු විය. දැඩි ලෙස කුණු වී ඇති මළසිරුරක වෙඩි උණ්ඩ හෝ මුනිස්සම් තිබේ දැයි හඳුනා ගැනීමට හැකි පහසුම සහ නිශ්චිතම ක්‍රමය වන්නේ ලෝහ පටියකින් ( zip fastner ) වැසිය හැකි නයිලොන්



Scanned with CamScanner

බැග් එකක් තුළට මළසිරුර දමා කොටස් වශයෙන් මළසිරුරේ එක්ස් කිරණ ( x - ray ) ඡේයා පටල ( x - ray films ) ලබා ගැනීම ය. මේ ආකාරයට ධනපාලගේ මළසිරුර එක්ස් කිරණ පරීක්ෂාවට භාජනය කරන ලද අතර එහි වෙඩි උණ්ඩවල හෝ මුනිස්සම්වල ඡායා නො තිබුණ බව සොයා ගන්නා ලදී. වෙඩි වැදීම නිසා භග්න වූ අස්ථීන් කැබලිවලට කැඩීම් හට ගන්නා නමුත් ධනපාල මුදලාලිගේ සිරුරේ එකම අස්ථියක්වත් කැඩී බිඳී නො තිබුණි. කැපුම් තුවාල හෝ ඇනුම් තුවාල ද කිසිවක් නො වී ය. ලණුවකින් හෝ බන්ධකයකින් ගෙල මිරිකීමේ දී ඇතිවන දාර බෙල්ලේ නො තිබුණි. උගුරෙහි තිබෙන කණ්ඨිකාස්ථිය භග්නය වී නො තිබුණි. පපුවට හෝ උදරයට පිහියෙන් ඇනීමකින් රුධිරය වහනය වීමේ දී හට ගන්නා ලේ කැටි පපු කුහරයේ හෝ උදර කුහරයේ නො වී ය. ඒ අනුව, ධනපාල මුදලාලිව මරා මුහුදට දැමූ බවට කිව හැකි තුවාල ඔහුගේ සිරුරේ නොමැති බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. එහෙත්, ප්‍රතිවිරුද්ධ මන්ත්‍රී ධුරපේක්ෂකයාගේ ඝාතනය සම්බන්ධව ධනපාල මුදලාලිගේ මිත්‍ර මිලින්ද මන්ත්‍රීතුමාට එරෙහිව චෝදනා එල්ල වී තිබූ බැවිනුත් එම ඝාතනය පිළිබඳව මහජනයා තුළ මහත් ආන්දෝලනයක් ද ඇති කළ සිද්ධියක් වූ බැවිනුත් එම සිද්ධිය සියැසින් දුටු අත්‍යවශ්‍ය සාක්ෂිකරුවකු ලෙස ධනපාල මුදලාලි සැලකූ හෙයිනුත් ඔහු දියේ ගිලී මියගියේ ද යන්න නිසැකව තවදුරටත් පරීක්ෂා කිරීමෙන් සොයා ගත යුතුව තිබුණි.

දියේ ගිලී මරණයට පත් වූ කෙනෙකුගේ මළසිරුර කුණුවීමට පෙර වෛද්‍ය පරීක්ෂාවට භාජනය කළේ නම් මුහුණ දම් (cyanosis) පැහැති වී මදක් ඉදිමී තිබෙන අතර ( mildly swollen ) නාසයෙන් සහ මුඛයෙන් සියුම් සබන් පෙන වැනි සුදු පැහැති පෙන ( fine white soap like suds ) ගලා ඒම බොහෝ විට ඇති වේ. දියේ ගිලී මියගිය අයෙකුගේ මළසිරුර පූතිභවනය වීම ආරම්භ වූ විට මෙම ලකුණු ක්‍රමයෙන් නැතී වී යාම හට ගනී. පැය හයක් වැනි කාලයකට පසුව ද එය සිදුවීමට පුළුවන.

දියේ ගිලී මිය යන අවසාන මොහොතේ දී ඇඟිලිවල ඇති පේශීන්වල හටගන්නා වූ ක්ෂණික කඨිනතාවය නොහොත් ශවක හුසය ( cadaveric spasm ) ඇතිවීම නිසා වල් පැලෑටි හෝ ලී කැබැල්ලක් අතේ ඇඟිලිවලට ඉතා දැඩි ලෙස සිර වී තද වී තිබීම



දියේ ගිලී මිය යන තැනැත්තන්ගේ අත්වල සමහර අවස්ථාවල දක්නට ලැබේ. යම් කිසි තැනැත්තකු ඝාතනය කොට ජලයට දැම්මේ නම් මෙවැන්නක් සිදු නො වේ.

පැය දෙකක් හෝ ඊට වැඩි කාලයක් යම් අයකු ජලයේ සිටියේ නම්, ඇඳුම් සෝදා පිරිසිදු කරන අයගේ අත්වල සමෙහි ඇතිවන සුදු පැහැතිවීම, මොලොක්වීම සහ සම රැලි ගැසීම (washerwoman appearance of hands and feet / cutis anserina / goose skin appearance ) වැනි ලක්ෂණ දියේ ගිලීමෙන් මිය යන අයගේ අත්වල සහ පාදවල ද දක්නට ලැබෙන බව ඇතැම් අය සිතති. එහෙත්, එම ලක්ෂණයන් දියේ ගිලී මිය යන විට ඇති වන ලක්ෂණ නො වන බව පෙනේ. ඊට හේතුව, මළසිරුරක් කුණුවීමට පෙර පැය දෙකකට වැඩි කාලයක් ජලයේ තැබූ විට ද එම මළසිරුරේ අත්වල සහ පාදවල සුදු පැහැති වීම, මොලොක් වීම සහ සම රැලි ගැසීම හටගන්නා බව දැන් සොයා ගෙන තිබීමයි.

තවද, යම් අයකු දියේ ගිලී ( drowned ) මිය ගිය විට පෙනහලු දෙකම ඉදිමී දම් පැහැති වන අතර පෙනහැලි අල්ලන විට අනන ලද පිපුනු පාන් පිටි වැනි ස්වභාවයක් ( doughy ) අතට දැනේ. ස්වරාලය, ශ්වාසනාලය සහ ශ්වාසනාලිකා තුළ ද ඉහත සඳහන් කරන ලද ආකාරයේ සියුම් සබන් පෙන වැනි සුදු පැහැති පෙන දක්නට ලැබේ. මෙම අභ්‍යන්තර ලකුණු ද දියේ ගිලී මිය යාමෙන් පැය හයකට පසුව නැති වී යෑමට හැකි ය. තවද, ආමාශය ජලයෙන් පිරී තිබිය හැකි ය. තවද, එම තැනැත්තා දියේ ගිලුනු ස්ථානයේ තිබිය හැකි පියවි ඇසට පෙනෙන වැලි, රොන් මඩ, වියළි කොළ කැබලි, කුඩා රිකිලි කැබලි යනාදිය හෝ වෙනත් අපද්‍රව්‍ය එම තැනැත්තාගේ ආමාශය තුළ දක්නට හැකි ය. අන්වීක්ෂයකින් ( microscopy ) පමණක් පරීක්ෂා කිරීමෙන් හඳුනා ගත හැකි ශාක වර්ග ( plankton ) ඇතැම් අවස්ථාවල දියේ ගිලුනු තැනැත්තකුගේ ආමාශයේ තිබී සොයා ගත හැකි ය. මළසිරුර කුණු වී නොමැති නම් මෙකී ශාක වර්ග මළසිරුරේ පෙනහැලිවල සහ ශ්වාසනාලිකා ( respiratory bronchioles ) තුළ තිබී සොයා ගතහොත් මියගිය තැනැත්තා දියේ ගිලී මිය ගිය බව සනාථ කිරීමට වඩාත් වැදගත් සාක්ෂි වේ. පෙනහැලි මතුපිට ලේ ලප ඇති නො වීම සහ පෙනහැලි ආවරණය වන ප්ලූරා පටලය (pleu-



Scanned with CamScanner

ral membrane ) මත දියපට්ටා වැනි බුබුලු ( emphysematous bullae) ඇති නො වීම, දියේ ගිලීමෙන් මිය යන අයවලුන්ගේ දක්නට ඇති විශේෂ ලක්ෂණයක් වේ. ගෙල මිරිකීමෙන් මිය යන අයගේ සහ නාසය සහ මුඛය තද කිරීමෙන් මිය යන අයගේ ඉහත කී ලක්ෂණ පෙනහැලි මතු පිට හට ගැනීම විශේෂත්වයක් බව කිව යුතු ය. එම නිසා, යම් අයෙකුගේ ගෙල මිරිකා මරණයට පත් කොට හෝ නාසය සහ මුඛය වසා මරණයට පත් කොට හෝ මිය ගිය අයෙකුගේ මළසිරුරක් දියට දැමූ විට එවැනි මළසිරුරක පෙනහැලි මත දැඩි ලෙස ලේ ලප ඇත් නම් හෝ පෙනහැලි මත දිය පට්ටා වැනි බුබුලු ඇත් නම්, එම තැනැත්තා දියේ ගිලීමෙන් මිය ගොස් නොමැති බවට සැක පහළ කොට වෛද්‍යවරයා විසින් වෛද්‍ය පරීක්ෂණය පැවැත්විය යුතු වේ.

දියේ ගිලී මිය ගිය අයෙකුගේ හෘදය වස්තුවේ දකුණු පැත්තේ තුන්දිකාව ( ventricle ) සාමාන්‍ය ප්‍රමාණයට වඩා විස්තරණය වී තිබෙන අතර බෙල්ලෙහි දෙපැත්තෙහි පිහිටා ඇති මන්‍ය ශිරා (jugular veins), උදරයෙහි සහ පපු කුහරයෙහි පිහිටා ඇති අධර බාත ශිරාව ( inferior vena cava ) සහ කලවා දෙකෙහිම පිහිටා ඇති ඌරු ශිරාව ( femoral vein ) යන ශිරාවන් විස්තරණය වී තිල් පැහැති වී තිබෙනු දක්නට ඇත. තවද, දැඩි ලෙස කළු පැහැති වූ රුධිරය හෘදය වස්තුව, ශිරා සහ ධමනි තුළ දක්නට ලැබෙන අතර රුධිර කැටි ( blood clots ) හෘදය වස්තුව, ශිරා සහ ධමනි තුළ දක්නට නො ලැබේ. පිහියකින් ඇනීමකින්, කඩුවකින් කැපීමකින් යනාදී හේතුවලින් ලේ වහනය වීමෙන් මිය ගිය අවස්ථාවල දී සහ වෙඩි වැදීමකින් හෝ සිරුරේ විවෘත තුවාල ඇති වීම නිසා ඒවාවලින් රුධිරය දැඩි ලෙස වහනය වී මියගිය අවස්ථාවල දී ද රුධිරය කැටිවීමක් ඇති නො වේ. දියේ ගිලීමෙන්, ගෙල මිරිකීමෙන් හෝ නාසය සහ මුඛය වැසීමෙන් යන ක්‍රමවලින් මියයන විට ප්‍රයිබ්‍රිනෝජන් නමැති එන්සයිමය ( fribrinogen enzyme ) උත්පාදනය වන නිසා මියයන අවස්ථාවේ දී රුධිරයේ කැටිවීමක් ඇති නො වේ. ස්වාභාවික හේතුවකින් මිය යන විට හෘදය වස්තුව සහ මළසිරුරේ ධමනි (arteries) සහ ශිරා ( vein ) තුළ රුධිර කැටි ඇති වේ.

දියේ ගිලී මියගිය අයකුගේ දක්නට ලැබෙන බාහිර හා අභ්‍යන්තර ලකුණු, මළසිරුරු කුණු නො වුවත්, ඇතැම් විට දක්නට නො



ලැබෙන අවස්ථා ද ඇත. යම් අයෙකු අනපේක්ෂිතව ළිඳකට, ඇළකට, ගඟකට, මුහුදකට හෝ ජැටියකට ( jetty ) වැටී මිය ගිය විට ඉහත සඳහන් කර ඇති ලකුණු මළසිරුරේ දක්නට නො ලැබෙන අවස්ථා ද ඇත. බොහෝ විට මෙවැනි අවස්ථාවන්වලින් මියගිය බවට වාර්තා වී ඇත්තේ අධික ලෙස මත් පැන් පානය කොට වෙරි මතින් ළිඳකට, ඇළකට, ගඟකට, මුහුදට වැටුනු අයවලුන්ගේ ය.

අවන්හලකට ගොස් දැඩි ලෙස වෙරි වන තෙක් මත් පැන් පානය කොට ආපසු පැමිණ තම නැවට නගින විට නාවිකයකු පය ලිස්සා මුහුදට වැටීමෙන් ක්ෂණිකව මරණය සිදුවීම, මේ පිළිබඳව පිළිගත් අධිකරණ වෛද්‍ය විද්‍යා පොත්වල සඳහන් කර ඇති උදාහරණයක් වේ. භීතියෙන් සහ කාංසා නියුරෝසියාවෙන් (anxiety neurosis) පෙළෙන අයවලුන් ද ජලයට වැටුනු විට මෙවැනි ආකාරයෙන් මරණය සිදු වේ.

වෙරි මතින් සිටින තැනැත්තකු හෝ කාංසා නියුරෝසියාවෙන් පෙළෙන අයෙකු ජලයට වැටුනු මොහොතේ දී ( instancously ) ජලය, එම තැනැත්තාගේ ස්වරාලය මත නැවරීමෙන් ක්ෂණිකව හට ගන්නා වූ වේගීය ස්නායු උත්තේජනය වීමෙන් ( stimulataion of the vagus ) හෘද ස්පන්දනය නැවතී මරණය ක්ෂණිකව සිදු වේ. මෙවැනි මළසිරුරුවල දියේ ගිලී මියගිය බවට බාහිරව හෝ අභ්‍යන්තරව ඇති විය හැකි ලකුණු නොමැත. එබැවින්, ඒ අන්දමට යම් අයකු මිය ගිය බවට ස්ථිර වශයෙන් කිවහැක්කේ බමන මතින් එන තැනැත්තා පය ලිස්සා දියට වැටුණු බවට නැවේ සිටින අයකු දුටුවහොත් පමණි. කාංසා නියුරෝසියාවෙන් පෙළෙන අයකු දියට වැටී මේ අකාරයෙන් මියගිය විට එම තැනැත්තා දියට වැටුණු බවට ඇසින් දුටු සාක්ෂියක් තිබිය යුතු ය. එසේ ඇසින් දුටු සාක්ෂියක් නොමැති වූ විට යම් අයකු දියට වැටීමෙන් වේගීය උත්තේජනය ඇති වීමෙන් මිය ගිය බවට වෛද්‍යවරයාට වෛද්‍ය පරීක්ෂණයේ දී උපකල්පනය කළ හැක්කේ දියේ ගිලීමෙන් මිය ගිය අයෙකුගේ ඇති වන්නා වූ ඉහත සඳහන් කර ඇති බාහිර හා අභ්‍යන්තර ලක්ෂණ නො තිබුණොත් පමණි. අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පළපුරුද්දක් නොමැති වෛද්‍යවරුන්ට මෙම ක්‍රමයෙන් දියට වැටුණු අයකු මිය ගිය ආකාරය සොයා ගැනීම දුෂ්කර ය. ජලයට වැටීමෙන් පසු වේගීය නිශේධනයෙන් යම් අයකු මිය ගිය විට



Scanned with CamScanner

මළසිරුර එක් වරක්වත් උඩට එන්නේ නැත. පිහිනීමට නො හැකි අයකු හෝ පිහිනීමට හැකි අයකු වුවත් දියට වැටුණු විට දියේ ගිලී මිය යාමට පෙර වාර කීපයක් උඩට සහ පහතට යන අතර, දියේ ගිලීම වැළැක්වීමට එම තැනැත්තා දියෙන් මතුවීමට තැත් කරනු ලැබේ. පිහිනීමට හැකි තැනැත්තා පිහිනා ජීවිතය බේරා ගනු ඇත. පිහිනීමට නො හැකි තැනැත්තාගේ පෙනහැලි තුළට ජලය ඇතුල්වීම නිසා දියේ ගිලීමෙන් ( **drowning** ) මිය යනු ඇත. අධික ලෙස මත් පැන් පානය කළ අය දියට වැටුණු විට මරණයට පත් වන්නේ දියේ ගිලීමෙන් නොව, ජලය එම තැනැත්තාගේ ස්වරාලය මත ස්පර්ශ වී වේගීය ස්නායුව උත්තේජනය වීමෙන් හට ගන්නා වූ හෘද ස්පන්දනය ක්ෂණිකව නැවතීමෙන් ය.

මළසිරුර කුණු වී ඇත්නම් දියේ ගිලී මිය යන අයගේ ඇති වන ඉහත සඳහන් කර ඇති බාහිර හෝ අභ්‍යන්තර ලකුණු දක්නට නො ලැබේ. උත්තර ධ්‍රැවයේ පිහිටා ඇති රටවල වාසය කරන අය දියේ ගිලීමෙන් මිය යාමෙන් පසු පැය හැත්තෑ දෙකක කාලයක් තුළ ජලයේ හෝ ජලයෙන් පිට තිබුණත් දියේ ගිලීමෙන් හටගන්නා වූ බාහිර සහ අභ්‍යන්තර ලක්ෂණ මළසිරුරේ දක්නට ලැබේ. එහෙත්, නිරක්ෂ රේඛාව අවට පිහිටා ඇති ශ්‍රී ලංකාව වැනි රටවල වාසය කරන අය දියේ ගිලීමෙන් මිය ගිය විට අධික උෂ්ණත්වය ඇති කාලයේ දී පැය හයකට පසුව වුව ද මළසිරුරේ කුණුවීම හටගන්නා නිසා දියේ ගිලීමෙන් හටගන්නා වූ බාහිර හෝ අභ්‍යන්තර ලකුණු නැති වී යනු ඇත. උෂ්ණත්වය දැඩි නො වේ නම් පැය දොළහක් හෝ පැය දහ අටකින් පසුව දියේ ගිලීමෙන් හටගන්නා ලකුණු මළසිරුරේ නැති වී යනු ඇත. එම නිසා, කුණු වූ මළසිරුරක් දියේ ගිලීමෙන් මියගිය බව දැන ගැනීමට කළ හැකි එකම ක්‍රමය නම් ඩයටම් පරීක්ෂාවයි. මළසිරුරක් කුණු නො වුවත් ඩයටම් පරීක්ෂාව කිරීමෙන් මරණයට හේතුව දියේ ගිලීම බව සනාථ කිරීමට හැකි වන අතර දියේ ගිලී මියගිය ස්ථානය ද දැන ගැනීමට ඩයටම් පරීක්ෂාව උපයෝගී කර ගත හැකි ය.

ඩයටම් යනු සිලිකොන් ආවරණයක් ( **silicon capsule** ) සහිත මුහුදේ සහ මිරිදියේ ඇති ඇල්ගී ( **algae** ) වර්ගයකට අයත් පියවි ඇසට නො පෙනෙන අන්වීක්ෂයකින් පමණක් දක්නට හැකි ප්ලවාංග ( **plankton** ) වර්ගයකි. ගෝලාකාර, තලයක හැඩති, පෙට්ටි හැඩති,



සරුවක හැඩති හෝ ඉද්දක හැඩති ඩයටම් විශේෂයන් ඇත. සාමාන්‍යයෙන් ඩයටම්වල ප්‍රමාණය මයික්‍රොන් විස්සත් සියයත් අතර වේ. මයික්‍රෝන් යනුවෙන් හැඳින්වෙන්නේ මිලිමීටරයකින් දාහෙන් පංගුවකි. යම් තැනැත්තකු දියේ ගිලුන අවස්ථාවේ දී ආමාශයට සහ පෙනහැලි තුළට ජලය ආශ්වාසනය ( inspiration ) වේ. එම ජලයේ ඩයටම ඇතොත් ඒවා පෙනහැලිවල ඇති ගර්ථ ( alveoli ) තුළට ඇතුළු වී ඊට පසුව ගර්ථ අවට ඇති කේශනාලිකා තුළට ඇතුල් වී පුප්ඵුසීය ශිරා තුළින් රුධිරය සමග හෘදයේ වම් පැත්තට සංසරණය ( **circulate** ) වේ. අනතුරුව ධමනි තුළින් රුධිරය සමග මොලයට, අක්මාවට, වකුගඩුවලට සහ අස්ථිවල අභ්‍යන්තරයේ ඇති ඇට මිදුළු ( **bone marrow** ) තුළට සංසරණය වේ. එම නිසා, මොලයේ, අක්මාවේ සහ වකුගඩුවල කොටස් සහ ඇට මිදුළු පරීක්ෂා කිරීමෙන් ඩයටම හඳුනා ගැනීමට හැකි ය.

ජලයේ දින කීපයක් තිබූ මළසිරුරක අක්මාව සහ මොලය කුණුවන නිසා ද, ජලයේ සිටින මාළුන් මළසිරුර කා දැමීම නිසා ද අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ජලයෙන් ස්පර්ශ වන නිසා ද, ජලයේ ඩයටම තිබෙන නිසා ද, එම ඉන්ද්‍රියයන් තුළ ඩයටම සොයා ගත්තත් එහි වැදගත්කමක් නො වේ. ඇටමිඳුළු ( **bone marrow** ) තිබෙන්නේ අස්ථියකින් ආවරණය වූ කුහරයක ( **marrow cavity** ) බැවින් මළසිරුර කෙතරම් කුණුවුවත් හෝ සතුන් විසින් කා දැමුවත් හෝ ඇටමිඳුළු බාහිර ජලය සමග ස්පර්ශ නො වන නිසාත් ඇටමිඳුළුවල ඩයටම තිබේ දැයි සොයා ගත හොත් නිසැකයෙන්ම එම තැනැත්තා දියේ ගිලී මරණයට පත් වී ඇති බව නිගමනය කළ හැකි ය. ඌර්ව අස්ථිය නොහොත් කලවා අස්ථියෙන් ඇටමිඳුළු ස්වල්පයක් ලබා ගෙන නයිට්‍රික් සාන්ද්‍රනය ( **conc: nitric acid** ) තුළ පැය හතළිස් අටක හෝ හැත්තෑ දෙකකට ආසන්න කාලයක් තුළ අනුක්‍රමයෙන් තාපනය ( **heating** ) කිරීමෙන් ඇටමිඳුළුවල ඇති මේද සහ ප්‍රෝටීන් පිළිස්සී සිලිකොන් ආවරණයක් තිබෙන ඩයටම පමණක් ඉතිරි වේ. මේ ආකාරයට තාපනය කරන ලද ඇට මිදුළු අන්වීක්ෂයකින් පරීක්ෂා කිරීමෙන් ඩයටම තිබේ දැයි දැන ගත හැකි අතර, උද්භිද විද්‍යාඥයෙක් මගින් එම ඩයටමවල වර්ගය හඳුනා ගත හැකි ය.. ඇටමිඳුළුවල ඩයටම තිබීම මියගිය තැනැත්තා දියේ ගිලී මරණයට පත් වී ඇති බව නිගමනය කළ හැකි අතර එම ඩයටම වර්ගය තිබෙන ජලය ඇති ස්ථානය හඳුනා ගත හොත් මියගිය තැනැත්තා දියේ ගිලුනු



Scanned with CamScanner

ස්ථානය ද හඳුනා ගත හැකි ය. එවැනි ස්ථාන හඳුනා ගැනීමට නම් ගංගාවල, මුහුදේ, මුහුදු වෙරළවල, ඇළවල්වල සහ ළිංවල යනාදී ස්ථානවලින් ජලය ලබා ගෙන ඩයටම තිබේ දැයි පරීක්ෂා කළ යුතු ය. අවුරුද්දේ එක් එක් ඍතුව ( seasonal ) අනුව ඩයටම වර්ග වෙනස් වන නිසා ඉහත කී පරීක්ෂණයන් අවුරුද්දේ එක් එක් ඍතුවල දී රටේ සෑම දිස්ත්‍රික්කයකම පිහිටා ඇති ගංගාවල, මුහුදේ, මුහුදු වෙරළවල, ඇළවල්වල සහ ළිංවල ඇති ජලය ඩයටම පරීක්ෂාවන්ට භාජනය කිරීමෙන් එම රටේ ගංගාවල, මුහුදේ, මුහුදු වෙරළවල, ඇළවල්වල සහ ළිංවල යනාදී ස්ථානවල තිබෙන ඩයටම හඳුනා ගෙන තබා ගත යුතු ය. මෙවැනි පරීක්ෂණයන් කරනු ලබන්නේ ඩයටම පිළිබඳ උනන්දුවක් දක්වන උද්භිද විද්‍යා විශේෂඥයන් විසිනි. ප්‍රායෝගික වශයෙන් අධිකරණ වෛද්‍යවරයෙකුට මෙවැනි පරීක්ෂණ කළ නො හැකි බැවින් දියේ ගිලී මරණයට පත් වූයේ යැයි සැක සිතන මළසිරුරක් හමුවන ස්ථානයෙන් පමණක් ජලය සාම්පලයක් ලබා ගෙන ඩයටම පරීක්ෂාව කරනු ලබන අතර ඇටමිදුළුවලින් ලබා ගත් ඩයටම තිබෙන ස්ථානය හඳුනා ගැනීම සඳහා ඩයටම පිළිබඳව විශේෂඥ දැනුමක් ඇති ඩයටම පිළිබඳව පර්යේෂණ පවත්වන උද්භිද විද්‍යා විශේෂඥයෙකු වෙත යවනු ලැබේ.

ධනපාල මුදලාලිගේ මළසිරුර මුහුදෙන් ගොඩ ගසා තිබූ බැවින් ඔහුගේ කලවා අස්ථියෙන් අඟල් හතරක කොටසක් ඉවත් කොට එහි තිබූ ඇටමිදුළු නයිට්‍රික් අම්ලයේ පැය හැත්තෑ දෙකක කාලයකට තාපනය කොට ඩයටම තිබේ දැයි අන්වීක්ෂයක් ආධාරයෙන් පරීක්ෂා කරන ලදී. නල හැඩය ඇති ඩයටම සිය ගණන් එහි තිබුණ බව සොයා ගන්නා ලදී. ධනපාල මුදලාලිගේ මළසිරුර බේරුවල මුහුදු වෙරළේ තිබී සොයා ගත් බැවින් බේරුවල මුහුදු වෙරළේ ජලය ලීටරයක් ලබා ගෙන නයිට්‍රික් අම්ලය තුළ තාපනය කොට ඉතුරු වන මණ්ඩි ( residue ) අන්වීක්ෂයෙන් පරීක්ෂා කරන ලදී. අතුරුදහන්වීමට පෙර ධනපාල මුදලාලි කොළඹට ආසන්න මුහුදු වෙරළක සිටි බව තහවුරු වූ සාක්ෂියක් තිබුණ නිසා එම ස්ථානයේ මුහුදු වෙරළෙන් ලබා ගත් මුහුදු ජලය ද එලෙසම පරීක්ෂා කරන ලදී. එම වෙරළින් ලබා ගත් ජලයේ ඩයටම දක්නට ලැබුණි. බේරුවල මුහුදු වෙරළෙන් ලබා ගත් ජලයේ නල හැඩති ඩයටම නො තිබුණි. ඉහත කරුණු අනුව ධනපාල මුදලාලි කොළඹට ආසන්න මුහුදේ ගිලීමෙන් පසුව ඔහුගේ මළසිරුර බේරුවල වෙරළට



ගොඩ ගසා ඇති බව වෛද්‍යවරයා අධිකරණයට වාර්තා කළේ ය. කොළඹට ආසන්න මුහුදේ ගිලී මියගිය අයගේ මළසිරුර දින කීපයකට පසුව බේරුවල සහ වැලිගම වෙරළේ දී හමු වූ අවස්ථා තිබූ බවට මුහුදු වෙරළ ආරක්ෂක සේවකයින් විසින් මහේස්ත්‍රාත් නඩු විභාගයේ දී ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂිවලින් ද වෛද්‍යවරයාගේ නිගමනය තහවුරු විය. මෙම කරුණු සියල්ල සලකා බලා ධනපාල මුදලාලි කොළඹට නුදුරු මුහුදේ ගිලී මිය ගොස් ඇති බවට මහේස්ත්‍රාත්වරයා විසින් තීන්දු කරන ලදී.

අධිකරණ වෛද්‍යවරයෙකු විසින් පවත්වන පරීක්ෂණයේ මුඛ්‍ය පරමාර්ථය මරණයට හේතුව සොයා ගැනීම වේ. බොහෝ විට දියේ ගිලී සිය දිවි හානිකර ගැනීමකින් යම් අයෙකු මරණයට පත් වූයේ නම් සිය දිවි හානිකර ගැනීමට හේතු වූ කරුණු සොයා ගත හැක්කේ පොලිසිය මගින් පවත්වනු ලබන පරිවේශනීය සාක්ෂි සැලකිල්ලට භාජනය කර ගැනීමෙන් ය. මූලිකව එහි වගකීම පරීක්ෂණය භාර පොලිසියට පැවරෙන අතර අවසානයේ දී සිය දිවි හානි කර ගත් බව තීන්දු කරන්නේ අධිකරණයයි. ඇතැම් පුද්ගලයන් සහ ඇතැම් මාධ්‍යවේදීන්ගේ ද අදහස් වන්නේ සිය දිවි හානි කර ගැනීමට මූලික හේතුව සොයා ගැනීමේ වගකීම ද පැවරී ඇත්තේ අධිකරණ වෛද්‍යවරයා වෙත බව ය. ධනපාල මුදලාලි විසින් මුහුදට පැන සිය දිවි හානි කර ගැනීමට හේතු පාදක වූ කරුණු සොයා ගත හැක්කේ පරිවේශනීය සාක්ෂි මගින් ය.

සිය දිවි හිනි කර ගන්නා අයගේ මනස සාමාන්‍ය අයගේ මනසට වඩා බෙහෙවින් වෙනස් ය. දරාගත නො හැකි කලකිරීමක් හෝ වේදනාවක් හෝ දැඩි පීඩාවක් ඇති වූ විට ඇතැම් අයගේ මනසේ දොම්නස් සිතුවිලි ( depression ) හට ගෙන සිය දිවි හානි කර ගැනීමට පෙළඹෙති. මෙවැනි සිතුවිලි බොහෝ විට හට ගන්නේ දුර්වල මනසක් ඇති අයට ය. ඇතැම් අය සිය දිවි හානි කර ගැනීමට පෙර ලියුමක් ලියා තැබීම හෝ තමාගේ ළඟම ඥාතියෙකුට හෝ හිතවතෙකුට තැපැල් කිරීම කරතත් බොහෝ අය එසේ නො කරති. එවැනි ලියුමක් ධනපාල මුදලාලිගේ නිවසේ හෝ ඔහුගේ තාවකාලික කාමරයේ තිබුණේ දැයි අපි නො දනිමු. ශ්‍රී ලංකාවේ පිරිමින් බොහෝ විට ගෙල වැලදා ගැනීමෙන් හෝ, කෘෂි රසායනික වර්ග පානය කිරීමෙන් හෝ දුම්රියට පැනීමෙන් හෝ උස



Scanned with CamScanner

ගොඩනැගිල්ලකින් බිමට පැනීමෙන් හෝ වෙඩි තබා ගැනීමෙන් හෝ ගෙල කපා ගැනීමෙන් සිය දිවි හානි කර ගන්නා අතර, කෘෂි රසායනික පානය කිරීමෙන් හෝ දියේ ගිලීමෙන් ස්ත්‍රීහු සිය දිවි හානි කර ගනිති. පිරිමි දියේ ගිලීමෙන් සිය දිවි හානි කර ගන්නේ කලාතුරකින් බැවින් ධනපාල මුදලාලිගේ මරණය කෙසේ වූයේ දැයි මහජනයා තුළ සැක පහළ වීම සාධාරණ ය.

ධනපාල මුදලාලිගේ වෛද්‍ය පරීක්ෂණයේ දී ඉවත් කර ගන්නා ලද කලවා අස්ථියෙන් ලබා ගත් ඇටමිදුළුවල තිබූ ඩයටම වර්ගය සහ කොළඹට නුදුරු මුහුදු වෙරළෙන් ලබා ගත් ජලයේ තිබූ ඩයටම වර්ගය සහ බේරුවල මුහුදු වෙරළේ ලබා ගත් ජලයේ එම ඩයටම වර්ගය නො තිබීම නිසා ධනපාල මුදලාලි කොළඹට නුදුරු මුහුදු වෙරළේ දී මුහුදට පැන සිය දිවි හානි කර ගත් බව ඔප්පු කර ගැනීමට උපකාරී වූ " නිහඬ සාක්ෂි " වේ.



# කුඩ මිටෙහි රැඳි විෂ

රහස් ඔත්තු සේවය ඉතා භයානක වෘත්තියකි. රහස් ඔත්තු සේවයේ යෙදෙන්නා අතුරේ යන රා මදින්නාසේ ය. අතුරේ යන රා මදින්නාගේ පය ලිස්සා බිම වැටුනොත් මරණය සිදුවීම හෝ සදාකාලිකවම අබ්බගාතයෙක් වීම නියත ය. රහස් ඔත්තු සේවයේ යෙදෙන්නාගේ ජීවිතයත් එසේම ය. එසේ නම් මිනිසුන් රහස් ඔත්තු සේවයට බැඳෙන්නේ ඇයි? නැගීමට සිතා ගන්නවත් බැරි දුර්ග කඳු නැගීම ඇතැම් අයගේ විනෝදාංශයකි. තම ජීවිතයට හානියක් හෝ අන්තරාවක් ඇති වේ යැයි සිතුවත් ඇතැම් අය එවැනි ක්‍රියාවල යෙදීමෙන් මානසික තෘප්තියක් ලබා ගනිති. රහස් ඔත්තු සේවයට ද එවැන්නෝ බැඳෙන්නේ එම නිසා විය හැකි ය. ඔවුහු බොහෝ විට තම බිරියටවත් නො දන්වා රහසේම එම සේවයේ යෙදෙති.

සීතල යුද්ධය ( cold war ) පැවති අවදියේ දී නැගෙනහිර යුරෝපීය මාක්ස්වාදී රටවල් ධනවාදී බටහිර රටවල සිදුවන යුද්ධ ක්‍රියාමාර්ග සහ උපක්‍රම සහ නවීන තාක්ෂණික ක්‍රම සොයා ගැනීම සඳහා රහස් ඔත්තුකරුවන් යෙද වූ බව ප්‍රකට කරුණකි. සීතල යුද්ධය යනුවෙන් හැඳින්වෙන්නේ, මාක්ස්වාදී සහ ධනවාදී රටවල් එකිනෙකාට එරෙහිව රහසිගතව කරන එදිරිවාදිකම් ය. එසේම බටහිර රටවල් පවා මාක්ස්වාදී රටවල සිදු කරන යුද්ධමය උපක්‍රම හා නොයෙකුත් නවීන තාක්ෂණික ක්‍රම පිළිබඳව දැන ගැනීම සඳහා රහස් ඔත්තුකරුවන් යෙදූ බව ද ප්‍රකට කරුණකි. සීතල යුද්ධය අවසන් වී ඇතත් නොයෙක් රටවල් තමාගේ විරුද්ධවාදීන් ලෙස සලකන අනෙක් රටවල ඔත්තුකරුවන් යෙදීම දැනටත් සිදු කරනු ලැබේ. මාක්ස්වාදී රටවල ඒකාධිපති ආණ්ඩුක්‍රම නො පිළිගන්නා ලෝක පූජිත විද්‍යාඥයන්, ගත්කරුවන්, සුපිරි ක්‍රීඩකයින් සහ කලාකරුවන් බටහිර රටවලට හොර රහසේ පැන එන නමුත්, බටහිර රටවල ජීවත්වන සම්භාවනීය පුද්ගලයින් මාක්ස්වාදී රටවලට හොර රහසේම පැනගිය අවස්ථා වාර්තා වී නොමැත. එවැනි සම්භාවනීය පුද්ගලයින් මාක්ස්වාදී රටවල් අතහැර ධනවාදී බටහිර රටවලට සංක්‍රමනයවීම මාක්ස්වාදී රටවලට දරා ගත නො හැකි පාඩුවක් සහ මදි පුංචිකමක් වන අතර එවැනි ක්‍රියාවලින් මාක්ස්වාදයට වැදෙන්නේ මරු පහරකි. මාක්ස්වාදී රටවලින් බොහෝ



Scanned with CamScanner

පිට මෙසේ පැන යන්නේ ඇමෙරිකාව හෝ ස්වීඩනය, එංගලන්තය වැනි බටහිර යුරෝපීය රටවලට ය. තම මවුබිම් අත්හැර බටහිර රටකට හොර රහසේ පැමිණියත් එම තැනැත්තන්ට බටහිර රටවල නිදැල්ලේ මානසික සුවයෙන් ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට අවස්ථාව නො ලැබේ. මාක්ස්වාදී රටවල් ඔවුන්ගේ රහස් ඔත්තු සේවකයින් ලවා එම තැනැත්තන් පැහැර ගෙන නැවතත් තම රටවල් වෙත රැගෙන යෑමට තැත් කරන අතර, එසේ කිරීමට නො හැකි වුවහොත් බොහෝ අවස්ථාවල ඔවුන් මරා දමනු ලැබේ. එම නිසා, පැන ආ තැනැත්තන් ගත කරන්නේ ඉතා රහසිගත ගුප්ත ජීවිතයකි.

අවුරුදු හතළිස් නවයක් වයසැති ඇන්ටන් වෙකොෆ් රුමේනියාවේ සිට හොර රහසේ එංගලන්තයට පැමිණි අප්‍රසිද්ධ රහස් ඔත්තුකරුවෙකි. රුමේනියාවේ න්‍යෂ්ටික බලාගාර පිළිබඳව පුළුල් තාක්ෂණික දැනුමක් ඔහුට තිබුණි. වෙකෝෆ් ලන්ඩන් නුවර රහසිගතව වාසය කළේ ඔහුගේ බිරිඳ වන හෙලේනා සමග ය. ඔහු පිටුපස රහස් ඔත්තුකරුවන් ලුහුබඳින බව ලන්ඩන් නුවරට පැමිණි මුල් අවදියේ දී වෙකොෆ්ට අවබෝධ විය. එම නිසා වැඩි වශයෙන් ඔහු කුලී රථවල ගියත් පසුව එම තත්ත්වය ක්‍රමයෙන් පහව ගියේ ය. තම ස්වාමිපුරුෂයා ඔත්තුකරුවකු ලෙස රුමේනියාවේ දී සේවය කළ බව හෙලේනා දැන සිටියේ නැත. රැකියාව වශයෙන් වෙකොෆ් එංගලන්තයේ න්‍යෂ්ටික බලාගාරයක සේවය කළේ ය. රැකියාව අවසන් වී තම නිවසට යාම සඳහා ලන්ඩන් නුවර වික්ටෝරියා දුම්රිය පොළට දිනපතාම පැමිණීම වෙකෝෆ්ගේ සාමාන්‍ය සිරිතයි.

වෙනදා මෙන්ම එදිනත් වික්ටෝරියා දුම්රිය පොළ අතුරු සිදුරු නොමැතිව නිවෙස්වලට යන මගීන්ගෙන් පිරී තිබුණි. සුපුරුදු පරිදි වෙකොෆ් තම බෑගය අතෙහි ඇතිව මිනිසුන් අතරින් වේදිකාවේ නවතා තිබූ දුම්රිය වෙත පැමිණියේ අසුනක් ලබා ගැනීමේ අටියෙනි. හදිසියේම ඔහුගේ දකුණු කලවෙහි පිටුපස දරුණු වේදනාවක් ඇති විය. යම්කිසි දෙයක් ඔහුගේ කකුලේ ඇනුණු බව තේරුම් ගත් වෙකොෆ් විගස වටපිට බැලූ විට කුඩයක් අතේ ඇතිව ඔහු පිටුපසින් පැමිණි අයකු විදේශීය උච්චාරණයකින් ඉංග්‍රීසි බසින් කථාකරමින් " මට සමාවන්න " යැයි බැගෑපත්ව පවසා එම ස්ථානයෙන් ඉක්මණින් ඉවත් විය. එම තැනැත්තා අත තිබූ කුඩ මිට කෙළවර අත්වැරැද්දකින් තම කලවට ඇනෙන්නට ඇතැයි සිතූ වෙකොෆ් එම



සිද්ධිය එතරම් ගණන් නො ගෙන දුම්රිය මැදිරියට ඇතුළු වී අසුනක වාඩි වී සුපුරුදු පරිදි පොතක් කියවීමට පටන් ගත්තේ ය. වික්ටෝරියා දුම්රිය පොළෙහි සිට වෙකොෆ්ගේ නිවසට දුම්රියෙන් යාමට සාමාන්‍යයෙන් පැයකුත් විනාඩි තිහක් පමණ ගත වේ. දුම්රිය මැදිරියට ඇතුළු වී ස්වල්ප වේලාවක් ගතවීමෙන් පසුව වෙකොෆ්ගේ කලවෙහි කුඩමිට ඇනුණ ස්ථානය කැක්කුම් දෙන්නට විය. වේදනාව ඉවසා ගත් වෙකොෆ් තම නිවස අසල තිබූ දුම්රිය පොළෙන් බැස නිවසට පැමිණියේ ය. තමාට සිදුවූ සිද්ධිය බිරිඳට පවසා ඇඟපත සෝදා ගෙන රාත්‍රී ආහාරය ගැනීමට සූදානම් වුවත් ඔහුගේ මුළු ශරීරයම රිදෙන්නට විය. මේවන විට වෙකොෆ්ට දැඩිව උණ ගැනුණි. ඩිස්ප්‍රීන් පෙති දෙකක් ගිල දැමූ වෙකොෆ් රාත්‍රී ආහාරය ද නො ගෙන තම බිරිය සමග නින්දට ගියේ රෝගී තත්ත්වයකිනි.

මැදියම් රැය වන විට ඔහුට උණ ෆැරන්හයිට් අංශක එකසිය දෙකක් දක්වා වැඩි වූ අතර උණ විකාරයෙන් වෙකොෆ් දොඩවන්නට විය. ඔහුගේ මුළු ශරීරයම දහඩියෙන් තෙත් වී කැස්ස ද හට ගෙන රෝගය ක්‍රමයෙන් උත්සන්න විය. වේලාව රාත්‍රී එකට පමණ වූ බැවින් මැදියම් රැයේ වෛද්‍යවරයෙකු වෙත තම සැමියා රැගෙන යාම හෙලන්ට අපහසු කාර්යයක් විය. තමාට වැලඳී ඇත්තේ රෝගයක් නොව, ඔත්තුකරුවෙක් තමා මැරීමට විෂක් කකුලට විද ඇති බවට වෙකොෆ් සැක පහළ කළත් ඒ බව තම බිරියටවත් දැන් වූයේ නැත. තමා ඇඳ සිටි කලිසම් කකුලේ ලේ බිංදු කීපයක් තිබීම එම සැකය තහවුරු කිරීමට හේතුවක් විය. සම්පූර්ණ සිද්ධිය තම බිරියට දැන්වුයේ නම් මේතාක් තමා ඇයගෙන් සඟවා තිබූ රහස එළිවන බව ඔහු සිතුවේ ය. මේවන විට වෙකොෆ් යුවල රුමේනියාවෙන් පිටවී ලන්ඩන් නුවර පදිංචියට පැමිණ අවුරුදු පහක් පමණ විය. පසුදා එළිවන විට වෙකොෆ් ලේ කැටි පිට කරමින් කහින්නට පටන් ගත්තේ ය. තත්ත්වය ක්‍රමයෙන් දරුණු වූ බැවින් අලුයම ගිලන් රථයක් ගෙන්වා වෙකොෆ් ළඟම තිබෙන රෝහලට ඇතුල් කරන ලදී. ඒ වන විට වෙකොෆ්ගේ රුධිර පීඩනය පහත වැටී ඔහුට දැඩි ලෙස කම්පනය හටගෙන තිබුණි. රුධිරයෙහි ඝන මිලි මීටරයකට සුදු රක්තාණු තිස්තුන්දාහක් ( white blood cell count of 33,000 per cubic mm ) විය. එමනිසා වෙකොෆ්ට කැස්ස සමග ලේ පිටවන දරුණු නියුමෝනියාව ( pneumonia ) සමග ලේ විෂ වීම ( septecaemia ) සෑදී ඇති බව වෛද්‍යවරුන් නිගමනය



Scanned with CamScanner

කළේ ය. නියුමෝනියාව සෑදී තිබෙන්නේ හිමෝපිලස් ඉන්ෆ්ලුවන්සා ( haemophilus influenza ) නමැති බැක්ටීරියාව පෙනහැලි තුළට ඇතුළු වීමෙන් බව රෝග විනිශ්චය කළ වෛද්‍යවරු වෙකොෆ්ට පෙනිසිලින් එන්නත් කළෝ ය. ආරම්භයේ දී මඳ සුවයක් ලැබුවත්, රෝහලට ඇතුල් කර දින තුනකින් පසුව වෙකොෆ්ගේ කම්පනය සීඝ්‍රයෙන් වැඩි වී ඔහුගේ වකුගඩු අක්‍රිය (kidney failure) විය. රෝගය ක්‍රමයෙන් උත්සන්න වූ බැවින් වෙකොෆ්ව දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කරන ලදී. මෙම රෝගය ආරම්භ වීමට පෙර වික්ටෝරියා දුම්රියපොළේ දී තමාගේ කකුලේ යම්කිසි කටුවක් වැනි දෙයක් ඇනුන බව ඔහු වෛද්‍යවරුන්ටවත් පැවසුවේ නැත. එසේ පැවසුවා නම් වෙකොෆ් රුමේනියාවේ සිට එංගලන්තයට පැමිණි රහස් ඔත්තු සේවයේ යෙදෙන අයකු බව හෙළි වී රෝගය සුව වීමෙන් පසුව වෙකොෆ්ගේ ජීවිතයට දැඩි තර්ජනයක් විය හැකි බව ඔහු සිතුවේ ය. රෝගය වැලඳී පස්වෙනි දින ඔහු මිය ගියේ ය.

වෙකොෆ්ගේ මරණයට හේතුව නියුමෝනියාව බව වෛද්‍යවරු නිගමනය කළෝ ය. වෙකොෆ් රුමේනියාවේ සිට පැමිණි රහස් ඔත්තුකරුවකු බව වෛද්‍යවරු දැන නො සිටියත් ඔහුගේ මරණය කෙටි කලක දී සිදුවූ නිසා හදිසි මරණ පරීක්ෂණයක් ( inquest ) පැවැත්විය යුතු බව පොලිසියට දැන්වී ය. මේ අනුව, අධිකරණ වෛද්‍ය විශේෂඥයකු විසින් වෙකොෆ්ගේ පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත්විය. වෙකොෆ්ගේ වම් කලව මත සෙන්ටිමීටර් දෙකයි දශම පහක පමණ විෂ්කම්භයක් ඇති කළු පැහැති රවුම් සිදුරක් ( puncture ) වෛද්‍යවරයාට දක්නට ලැබිණි. වෙකොෆ්ගේ පෙනහැලි විශාල වී, ඉදිමී, තද වී නියුමෝනියාව සෑදී තිබූ බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. අක්මාව කහ පැහැති වී තිබූ අතර වකුගඩු දෙකම ඉදිමී සුදු පැහැති වී තිබුණි. මුත්‍රාශය හිස් වී තිබුණි. සිදුරු වූ තුවාලය තිබූ කලව එක්ස් කිරණ ( X - ray ) පරීක්ෂාවට භාජනය කරන ලදී. අධිකරණ වෛද්‍ය නිලධාරියාට එක්ස් කිරණ පටලයේ දක්නට ලැබුණේ ඔහුට අදහා ගත නො හැකි දෙයකි. එනම්, කලවේ මාංශපේශීවල තිබූ කුඩා ලෝහමය ගෝලයක ( sphere ) ඡායාවක් ය. එක්ස් කිරණ පටලය පරීක්ෂා කොට එම ගෝලය කලවේ තිබෙන ස්ථානය අධිකරණ වෛද්‍යවරයා උපකල්පනය කොට වෙකොෆ්ගේ කලවෙන් එය ඉවත් කළේ ය. ඔහු මීට පෙර කිසි දිනක දක්නට නො ලැබූ එය මිලිමීටර් එකයි දශම පහයි



දෙකක විෂ්කම්භය ඇති ලෝහමය සුදු පැහැති ගෝලයක් විය. එම ගෝලයෙහි සිදුරු දෙකක් දක්නට ලැබුණි. එම ගෝලයෙහි එක් සිදුරක විෂ්කම්භය මිලිමීටරයකින් දශම තුනයි පහකි ( 0.35 mm ). සුදු පැහැති කුඩු වැනි ද්‍රව්‍යයකින් එම සිදුරු ( hole ) පුරවා තිබුණි. එම ගුලිය අවට තිබූ මාංශ පේශී බුරුල් වී එයට රුධිරය වහනය වී තිබුණි. වෙකොෆ්ට වැලඳී තිබුණේ බැක්ටීරියාවලින් සෑදුනු නියුමෝනියාවක් නොව ලෝහමය ගුලිය තුළ තිබූ ද්‍රව්‍ය ශරීරගතවීමෙන් ඇති වූ නිව්මෝනියාව සහ කම්පනය නිසා බව අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. ගුලියෙහි තිබූ ද්‍රව්‍ය විශ්ලේශනය කිරීම අසීරු කරුණක් විය. එංගලන්තයේ පෝටන් ඩවුන්හි ආරක්ෂක ආයතනයේ දී ( government chemical Defence Establishment at Porton Down, England ) එම ගෝලය පරීක්ෂාවට භාජනය කරන ලදී. සති තුනකට පසු ප්‍රතිඵල නිකුත් විය. සියයට අනූවක් ප්ලැටිනම් ( 90% platinum ) සහ සියයට දහයක් ඉරිඩියම් (10% iridium) යන ලෝහ වලින් එම ගෝලය සාදා ඇති බවත් රයිසින් ( ricin ) නමැති විෂ වර්ගයකින් එය පුරවා තිබූ බවත් රසායනාගාර වාර්තාවෙහි සඳහන් විය.

මේ පිළිබඳව සියලු විස්තර බ්‍රිතාන්‍ය රහස් තොරතුරු සේවාවන්වලට දන්වන ලදී. කලක සිට එඬරු ඇටවලින් (castor seed) රයිසින් නමැති ඉතා ප්‍රබල මාරාන්තික විෂ වර්ගයක් නිපදවීමට රුමේනියානු රහස් ඔත්තු සේවාවන් විද්‍යාත්මක පරීක්ෂණ පවත්වා ඇති බව බ්‍රිතාන්‍ය රහස් ඔත්තු සේවාවලින් දැන ගන්නට ලැබුණි. එම නිසා වෙකොෆ්ගේ මරණය සිදු වී ඇත්තේ රයිසින් නැමැති දරුණු විෂ ශරීරගත වීමෙන් බවට රසායනාගාර විද්‍යාඥයන් සැක පහළ කළේ ය. ඒ අනුව වෙකොෆ්ට එන්නත් කර තිබූ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් එඬරු ඇටවලින් කෘත්‍රිමව ලබා ගත් රයිසින් විෂ රසායනාගාරයේ දී ඌරෙකුට එන්නත් කරන ලදී. වෙකොෆ්ට ඇති වූ රෝග ලක්ෂණ සියල්ලම ඌරාට ද ඇති වී සතියකට පසුව එම ඌරා ද මරණයට පත්විය. වෙකොෆ්ගේ පශ්චාත් මරණ පරීක්ෂණයේ දී අභ්‍යන්තර ඉන්ද්‍රියයන්වල දක්නට ලැබුණු සියලු ලක්ෂණ ඌරාගේ පශ්චාත් මරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත් වූ පශු වෛද්‍යවරයාට ( veterinary surgeon ) ද දක්නට ලැබුණි. වෙකොෆ්ට වෙඩි තබා මරා දැමීමට අවස්ථාවන් කොතරම් තිබුණත් රුමේනියානු රහස් ඔත්තු සේවාවන්ට අවශ්‍යව තිබුණේ ඔවුන් නිෂ්පාදනය කළ



Scanned with CamScanner

රයිසින් නමැති මාරාන්තික විෂ වර්ගයේ ප්‍රබලතාවය තම මවුබිමට ද්‍රෝහි වී හොර රහසේ එංගලන්තයට සංක්‍රමණය වූ වෙකොෆ් මගින් දැන ගැනීමට ය. තම ජීවිතය පූජා කරමින් රයිසින් ඉතා ප්‍රබල විෂ වර්ගයක් බව වෙකොෆ් ඔප්පු කළේ ය. තමාගේ ස්වාමිපුරුෂයා රුමේනියාවේ දී රහස් ඔත්තු සේවයේ යෙදී සිටි බව දැන ගත් හෙලේනා දැඩි කලකිරීමකට පත් විය.

රයිසින් නැමැති ඉතා ප්‍රබල විෂ වර්ගය භාවිතා කොට මනුෂ්‍ය ඝාතනයක් කළ ප්‍රථම අවස්ථාව මෙය බව වාර්තා වී ඇත. නාගයෙකු දෂ්ට කිරීමෙන් පසු ශරීරගත වූ සර්ප විෂ ප්‍රමාණයකට සමාන රයිසින් විෂ ප්‍රමාණයක් මනුෂ්‍යයෙකුට එන්නත් කළ විට අනිවාර්යයෙන්ම මරණය සිදු වේ. එම ප්‍රමාණය කොතරම් කුඩා දැයි කිවහොත් එය මනුෂ්‍යයෙකුගේ මුළු බරින් මිලියනයකින් පංගු දෙකකි. වෙකොෆ් මිය ගියේ මෙම හේතුව නිසා ය. විරේචක ඖෂධයක් වශයෙන් එඬරු ඇට සර්ම කලාපීය රටවල පාවිච්චි කරනු ලැබේ. මෙය ඉතා භයානක ය. ඇතැම් අවස්ථාවල එඬරු ඇට භාවිතයෙන් මරණය පවා සිදු වී ඇත. **එඬරු ඇට බැදීමෙන් පසු එහි අන්තර්ගත රයිසින් බොහෝමයක් විනාශයට පත් වේ.** එමනිසා මෙහි තිබෙන භයානකත්වය බොහෝ දුරට අඩු වේ. තවද, විරේචකයක් වශයෙන් එඬරු ඇට භාවිතා කළ විට ආහාර මාර්ගයේ ( alimentary canal ) ඇති එන්සයිම ( enzymes ) විසින් එඬරු ඇටවල ඇති රයිසින් නැමති විෂ විනාශයට පත් වේ. මෙම හේතුව නිසා එඬරු ඇට විරේචකයක් වශයෙන් පාවිච්චි කළත් මරණය සිදුවන්නේ කලාතුරකිනි. ආභරණයක් ලෙස පැලඳවීම සඳහා නානා වර්ණ වලින් යුතු එඬරු ඇට අලංකාර මාල සෑදීමට ඉංදියාව, නයිජීරියාව හා ශ්‍රී ලංකාව වැනි රටවල කාන්තාවන් බහුලව පාවිච්චි කරනු ලැබේ. මේවා පැලඳීමෙන් ප්‍රවේශම් විය යුතු ය. එඬරු ඇටවලින් සෑදූ එවැනි මාලයක එඬරු ඇට ගිලීම නිසා දරුණු ලෙස අසනීප වූ දාහත් හැවිරිදි ගැහැණු ළමයෙකු ස්කොට්ලන්තයේ රෝහලක දැඩි සත්කාර ඒකකයක ප්‍රතිකාර ලැබීමෙන් පසු සුවය ලැබූ බව වාර්තා වී ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ මියාමි ( Miami ) නගරයේ වාසය කළ ගැහැණු ළමයෙකුට එඬරු ඇටවලින් සෑදූ මාලයක් පැලඳීමෙන් පසු එඬරු ඇට ශරීරයේ ස්පර්ශ වීමෙන් කරප්පන්, ශරීරය මත පලු ඇතිවීම, තොල් සහ මුහුණ ඉදිමීම, ශරීරය රත් පැහැති වීම සහ කැසීම, හුස්ම ගැනීමේ අපහසුව හා කම්පනය



ඇති දැඩි අසාත්මික ප්‍රතික්‍රියාවලින් ( allergic reaction ) ඇතිවන රෝග ලක්ෂණ හටගත් බව වාරතා වී ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ විස්කොන්සින් ( Wisconsin ) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යාවක් එඬරු ඇටවලින් සෑදූ මාලයක ඇට ඇඟිලිවලින් කුඩු කිරීමෙන් පසුව එවැනිම අසාත්මික ප්‍රතික්‍රියාවක් සෑදුනු බවට වාර්තා වී ඇත.

විෂක් ශරීරගත කොට යම් අයෙකුගේ මරණය සිදු කිරීම මනුෂ්‍ය ඝාතනයක් කිරීමට මිනිසා විසින් යොදා ගන්නා බිහිසුණුම ක්‍රමය (most cruel) බව බොහෝ විනිසුරුවන්ගේ මතයයි. උල් පිහියකින් ඇන, හෝ පොල්ලකින් හිසට පහර දී හෝ කඩුවකින් හෝ මන්නයකින් කපා හෝ ගිනි අවියකින් වෙඩි තබා හෝ බෝම්බයක් ගසා දමා යනාදි ක්‍රමවලින් යමෙකු ඝාතනය කිරීමේ දී ඝාතනයට ලක්වන තැනැත්තාට යම් කිසි අවස්ථාවක දී තමාගේ ජීවිතයට අන්තරාවක් හෝ හානියක් වන්නට යන බව හැඟී යන බවක් බොහෝ විට දැන ගන්නට ලැබෙනු ඇත. එම නිසා ඇතැම් විට තමාගේ ජීවිතය ගලවා ගැනීමට යම්කිසි අවකාශයක් තිබේ. පහරකට ලක්වන තැනැත්තකු ආත්මාරක්ෂ සටන් ක්‍රම දන්නේ නම් මරණයෙන් බේරීමට ද හැකි ය. එනමුත්, විෂ වර්ගයක් ශරීරගත වන බව එයට ලක්වන තැනැත්තා නො දනියි. යම් කිසි විෂක් ආහාරවලට හෝ ජලයට එකතු කිරීමෙන් හෝ යම් තැනැත්තෙකුට එන්නත් කිරීමෙන් මිනිස් සිරුරට විෂක් ශරීරගත කළ හැකි ය. පානීය ජලයට හෝ ආහාර වේලට විෂ වර්ගය ඇතුලු කිරීම වඩාත් පහසුම ක්‍රමයයි. පානීය ජලයට හෝ ආහාර වේලට එකතු කරන විෂ වර්ගයේ සුවඳක් හෝ රසයක් තිබිය යුතු නැත. අතීතයේ දී එබැවින් මේ සඳහා බොහෝ විට පාවිච්චි කොට ඇත්තේ පාසානම් ලවන ය ( arsenic salts ). විෂක් සිරුරට එන්නත් කළ හැක්කේ වෛද්‍යවරයෙකුට හෝ හෙදියකට හෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව දැනුමක් ඇති අයෙකුට පමණි.

විෂ වර්ගයක් ශරීරගත වීමෙන් මනුෂ්‍ය ඝාතනයක් කර මහත් ආන්දෝලනයක් ඇති කළ අවස්ථා දෙකක් අප රටෙහි වාර්තා වී ඇත. පළමු වැන්න නම් එක්දහස් නව සිය හැට හතේ දී වෛද්‍ය ඩෙමන්ඩ් කුලරත්න, ඔහුගේ මව වන ලීලා කුලරත්න සහ සේවිකාව වන සොපියා යන තිදෙනාම එකතු වී වෛද්‍ය කුලරත්න මහතාගේ බිරිඳගේ ආහාරයට පාසනම් එක් කොට ඇයගේ මරණය සිදු කිරීමේ

චෝදනාවයි. මහාධිකරණයේ දී පැවැත් වූ නඩු විභාගයේ දී තිදෙනාටම මරණ දණ්ඩනය නියම විය. එනමුත් අභියාචනා අධිකරණයේ දී තිදෙනාම නිදහස් විය.

දෙවැනි අවස්ථාව නම් මදුමේහය නොහොත් දියවැඩියාව රෝගයට භාවිතා කරනු ලබන ග්ලිබෙන්කමයඩ් නොහොත් ඉයුගුලුකෝන් නමැති පෙති වරින්වර දිගු කාලයක් තුළ රහසිගතව රසල් ඉන්ග්‍රම් නැමැත්තාට ශරීරගත කිරීමෙන් එක්දහස් නව සිය හැත්තෑ අටේ අගෝස්තු මස දහනව වෙනි දින ඔහුගේ මරණය සිදු කිරීම සහ ඒ ආකාරයෙන්ම එම පෙති දේවගැති පීරිස් සහ ඩැර්ලින් විසින් තම බිරිය සහ රසල් ඉන්ග්‍රම් යන දෙදෙනා ගේ මරණය සිදු කිරීමත් ය. ඉයුනිස් පීරිස් නමැති තම බිරියට ඉයුගුලුකෝන් ශරීරගත කිරීමෙන් එක් දහස් නව සිය හැත්තෑ නවයේ මාර්තු මස දහ නවවෙනි දින මේ නිසා දේවගැති ජෝර්ජ් ෆෙඩ්රික් මැතිව් පීරිස් සහ ඔහුගේ අනියම් සබඳා පැවැත් වූ ඩැර්ලීන් මිලිසෙන්ට් ඉන්ග්‍රම් නැමැත්තියට විරුද්ධව එක්දහස් නවසිය අසූවේ මාර්තු මස දහ නව වෙනි දින කොළඹ මහාධිකරණයේ මිනී මැරීමේ චෝදනාවට නඩු පවරන ලදී. විනිසුරු ගරු තිස්ස බණ්ඩාරනායක සභාපති ගරු විනිසුරු වී. රාමානාදන් සහ ගරු විනිසුරු වික්‍රමසේකර යන විනිසුරු මඩුල්ල විසින් මෙම නඩු විභාගයට ගැනීම ඖෂධයක් ශරීරගත කොට මරණයක් ශ්‍රී ලංකාවේ සිදු වූ වාර්තා ගත සිද්ධියකි. මැතිව් පීරිස් දේවගැති තුමා අභියාචනා අධිකරණයටත් උපරිමාධිකරණයටත් අභියාචනා ඉදිරිපත් කළත් ඒවා නිෂ්ප්‍රභ විය.

පොඩි දරුවෙකු හෝ වේවා, වැඩිහිටියෙකු හෝ වේවා, මහල්ලෙකු හෝ වේවා මියගිය විට එයට හේතුව වෛද්‍යවරයෙකුට සැකයෙන් තොරව මරණ සහතිකයක් නිකුත් කිරීමට නො හැකි නම් හදිසි මරණ පරීක්ෂණයක් පවත්වා පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වා විෂ වර්ගයක් ශරීරගත වී ඇද්ද හෝ නැද්ද යැයි සොයා ගැනීමේ වැදගත්කම දේවගැති මැතිව් පීරිස්ගේ ක්‍රියාවෙන් මොනවට පැහැදිලි නොවේ ද?

යම් අයෙකු මියගිය විට මළසිරුර ලබා ගැනීම සඳහා අනවශ්‍ය හදිසියක් දක්වන්නේ නම්, මරණ සහතික නිකුත් කරන වෛද්‍යවරයා සහ හදිසි මරණ පරීක්ෂකවරයා ඉතාම කල්පනාකාරී විය යුතු ය.



කුමන හෝ විෂ වර්ගයක් ශරීරගත කොට යම් අයෙකුගේ මරණය සිදු කළත් මරණය සිදු කළ පෙති වර්ගයේ කොටසක් හෝ මරණය සිදු කළ ද්‍රාවනයේ කොටසක් ආමාශයේ ඉතිරි වී තිබීම බොහෝ විට සිදු වේ. එමෙන්ම ආමාශයේ රත් පැහැතිවීම, සංතුලිත වීම, ඉදිමීම, පිළිස්සීම, තැම්බීම හෝ සිදුරු වීම ද සිදු විය හැකි ය. ඇතැම් විට විෂ වර්ගයේ විශේෂ සුවඳක් ආමාශය තුළ වහනය වීමට පුළුවන. මරණයට හේතුවන ලක්ෂණ අභ්‍යන්තර ඉන්ද්‍රියයන්වල නොමැති නම්, හෝ මරණය ගෙන දිය හැකි අභ්‍යන්තර තුවාල ශරීරයේ නොමැති නම් ආමාශය සහ එහි අන්තර්ගත දෑ ඇත්නම් ඒවායින් කොටසක්, කුඩා බඩවැල්වල සහ අක්මාවේ කොටස් විෂ වර්ග විශ්ලේෂණය කිරීම සඳහා රස පරීක්ෂක වෙත යැවිය යුතු ය.

වෙකොෆ්ගේ පෙනහැලිවලට රුධිරය වහනය වන දරුණු නිව්මෝනියාවකින් මරණයට පත් වූ බව වෛද්‍යවරුන් ප්‍රථමයෙන් රෝග විනිශ්චය කර තිබුණත්, අධිකරණ වෛද්‍යවරයා මළසිරුර එක්ස් කිරණ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුව කකුලේ විෂ වර්ගය අඩංගු වූ ලෝහමය ගෝලය වෙකොෆ්ගේ මරණයට හේතුව හෙළි කළ " නිහඬ සාක්ෂියක් " විය.



Scanned with CamScanner

# මිලේච්ඡ ස්වාමිපුරුෂයා

තිලකා දිළිඳු තරුණියකි. පවුලේ දරිද්‍රතාවයට පිටුවහලක් වීමට, ඇය ගමේ තිබූ තේ කර්මාන්ත ශාලාවේ දවසේ පඩියට වැඩ කළා ය. එම තේ කර්මාන්ත ශාලාවේම සේවය කළ සිරිමල් ඇයට ආදරය කළේ ය. අවුරුද්දක පමණ කාලයක් පෙම්වතුන් ලෙස සිටි ඔවුන් දෙදෙනා පසුව විවාහ දිවියට පා තැබුවේ දෙපාර්ශවයේම මවුපියන්ගේ විරුද්ධත්වය මධ්‍යයේ ය. විවාහයෙන් පසු ඔවුන් දෙදෙනා ජීවත් වූයේ කටු මැටි බිත්ති සහිත පොල් අතු සෙවිලි කළ කුඩා නිවසක් කුලියට ගෙන ය. විවාහ වී අවුරුද්දක් පමණ මොවුන් ප්‍රීතියෙන් ගත කළත් දිනෙන් දින ඇති වූ ආර්ථික ප්‍රශ්න හේතුවෙන් ඔවුන්ගේ පවුලේ සමගිය දෙදරා යන්නට විය. විවාහයට පෙර මත් පැන් පානය නො කළ සිරිමල් පසුව සුරාවට පුරුදු විය. සිරිමල්ගේ බේබදුකම නිසා දෙදෙනා අතර නිතර අඬදබර ඇති විය. බොහෝ විට සිරිමල්ගේ පහර දීමට ලක් වූ තිලකා ඒ පිළිබඳව පොලිසියට පැමිණිලි කළ අවස්ථා ද විය. විවාහ වී අවුරුදු එක හමාරක් ගත වුවත් තිලකා ගැබ් නො ගත්තා ය. දරුවකු නො ලැබීම ගැන සිරිමල් නිතර තිලකාට අවලාද නැගුවේ ය. මේ හේතු නිසා පවුල් ජීවිතය ගැන ඇය දැඩි කලකිරීමට පත් විය.

තමා මැවූ ලෝකය සිහිනයක් පමණක් බව තේරුම් ගත් ඇය, සිය දිවි හානි කර ගැනීමට තීරණය කළා ය. කෘමිනාශක පානය කිරීමෙන් කර්මාන්ත ශාලාව තුළ එක් දිනක් තිලකා සිහිසන් නොමැතිව වැටී සිටියා ය. ඇය දුටු එම කර්මාන්ත ශාලාවේ සේවය කරන ප්‍රේමසිරි වහාම මැදිහත් වී ඇයව රෝහලට ගෙන ගියේ ය. කල් ඇතිව රෝහලට රැගෙන නිසි වේලාවට ප්‍රතිකාර ලබා දීම නිසා සුවය ලැබූ තිලකා රෝහලෙන් පිට වූවා ය. තමාගේ ජීවිතය ගලවා ගැනීමට උදව් උපකාර කළ නිසා, තම කටුක ජීවිතය තවදුරටත් දික් වූ බව තිලකා ප්‍රේමසිරිට කීවා ය. ප්‍රේමසිරි අවිවාහකයෙකි. තිලකා ගත කරන අමිහිරි කටුක ජීවිතය ගැන ප්‍රේමසිරි දුක් විය. තිලකා වැනි දිළිඳු යුවතියක විවාහ කර ගෙන, බේබද්දකු වී සිරිමල් ඇයට පහරදීම ගැන, ඔහු පිළිබඳව පිළිකුලක් හා තරහක් ද ප්‍රේමසිරිගේ සිතෙහි ඇති විය.



සුවය ලැබීමෙන් පසු නැවත රැකියාවට පැමිණි තිලකාගේ දුක් සැප විමසීමට ප්‍රේමසිරි ඉදිරිපත් වූයේ, ඇය ගැන පහල වූ අනුකම්පාව නිසාම ය. එහෙත්, ක්‍රමයෙන් එම අනුකම්පාව, ආදරයක් බවට පත් විය. තම විවාහක ස්වාමියාගෙන් නො ලැබෙන දයාව සහ රැකවරණය තිලකාට ප්‍රේමසිරිගෙන් ලැබෙන්නට විය. කර්මාන්ත ශාලාවේ සේවය කරන අනිකුත් සේවකයින්ට ද මෙය රහසක් නො වී ය. තිලකාගේ සහ ප්‍රේමසිරිගේ සම්බන්ධය කල්යාමේ දී සිරිමල්ට ද ආරංචි විය. ඒ පිළිබඳව සංඩු සරුවල් ඇති වී තිලකා සිරිමල්ගෙන් පහරට ලක් වූ වාර ද බොහෝ විය. දිගෙන් දිගටම සිරිමල් තිලකාට බැන වැදීමත්, පහරදීමත් නිසා ඇය සිරිමල් ගෙන් ඈත් වී ප්‍රේමසිරිට ක්‍රමයෙන් සමීප වන්නට විය. තිලකාගේ සහ ප්‍රේමසිරිගේ සම්බන්ධය දැන ගත් ප්‍රේමසිරිගේ මිතුරෝ එවැනි සම්බන්ධකම්වලින් උද්ගත විය හැකි අනිසි ඵල විපාක තිලකාටත් ප්‍රේමසිරිටත් පහදා දුන් හ. ඉන් පසුව ඔවුන් අතර ඇති සම්බන්ධය නවතා දැමීමට දෙදෙනාම තීරණය කළෝ ය. තිලකා මේ බව සිරිමල්ට දන්වා සිටි අතර මත් පැන් පානය නතර කරන ලෙස ද ඇය ඔහුගෙන් ඉල්ලා සිටියා ය. සිරිමල් ද එයට එකඟ වූ අතර, ඉන් පසුව ආරාවුලක් නැතිව ඔවුහු ජීවිතය ගත කළෝ ය. එසේ ටික කලක් ගත වීමෙන් පසුව නැවත වරක් සිරිමල් සුපුරුදු බේබදුකම ආරම්භ කළේ ය.

හදිසියේම එක් දිනක තිලකා අතුරුදහන් වී ඇති බවට සිරිමල් පොලිසියට පැමිණිල්ලක් කළේ ය. එදින තිලකා සමග පන්සල් යෑමෙන් පසුව, දෙදෙනාම රාත්‍රී අටට පමණ නිවසට ආ බව ඔහු පොලසියට පැවසුවේ ය. ඊට පසුව මිත්‍රයකු හමුවීමට තමා නිවසින් පිට වී ගිය බවත්, රාත්‍රී එකොළහට පමණ නැවත නිවසට පැමිණි විට තිලකා නිවසේ නො සිටි බවත්, ඔහු පොලිසියට කියා සිටියේ ය. පසුව තිලකාගේ මහ ගෙදරට ද ගොස් ඇය එහි පැමිණ ඇත්දැයි සොයා බැලු නමුත්, එහි ද ඇය නො සිටි බව සිරිමල් තවදුරටත් පොලිසියට කියා සිටියේ ය. මේ අතර තිලකාගේ මව පොලිසියට කියා සිටියේ සිරිමල් සහ තිලකා අතර පසුගිය කාලය තුළ නිතර අඬදබර තිබූ බැවින්, තිලකාගේ අතුරුදහන්වීම ගැන සිරිමල් සැක කරන බව ය. ඒ අනුව, කටඋත්තරයක් ගැනීමට සිරිමල්ව පොලිස් අත් අඩංගුවට ගත් අතර, තිලකාගේ අතුරුදහන්වීම් ගැන තමා කිසිවක් නො දන්නා බව හෙතෙම පොලිසියට තරයේ ප්‍රකාශ කළේ ය. තිලකාගේ අතුරුදහන්වීම ගැන කට කථා ගමේ



Scanned with CamScanner

පැතිරී තිබුණත්, සිරිමල් තවදුරටත් රඳවා ගැනීමට ප්‍රබල සාක්ෂි නො තිබූ නිසා පොලිසිය විසින් ඔහු අවශ්‍ය වූ විටක ඉදිරිපත් වන බවට වූ කොන්දේසිය මත පොලිස් අත් අඩංගුවෙන් මුදා හරින ලදි.

තිලකා අතුරුදහන් වී දින කිහිපයක් ගතවූ පසු, සිරිමල්ගේ නිවසට ආසන්නව ඇති පොල් ඉඩමේ තිලකාගේ මළසිරුර වළලා ඇති බවට පොලිසියට දුරකථන ඇමතුමක් මගින් දැන ගන්නට ලැබුණි. ඒ අනුව සිරිමල්ගේ නිවසට ආසන්නව ඇති පොල් ඉඩමේ අලුතින් වලවල් හාරා ගොඩ කර ඇති බවට සැක කරන ස්ථාන පරීක්ෂා කිරීමෙහි පොලිස් නිලධාරීහු නිරත වූ හ.

ටික කලකට පෙර පොළව හාරා තිබූ ස්ථානවල පස බුරුල් වී තිබෙන අතර, එම ස්ථානවල පස අවට පසට වඩා වෙනස් වර්ණයක් ඇත. හාරා ඇති යැයි සැක කරන ස්ථානවලට යකඩ කුරකින් ඇනීමෙන්, පහසුවෙන් යකඩ කුර පස තුළට යනු ලැබේ. මළසිරුරක් මිනී පෙට්ටියක නො දමා නො ගැඹුරු වළක වළලා තැබූ විට එහි අවට දුගඳ හැමීමක් ද ඇති වේ. එවැනි ලකුණු ඇති ස්ථානයක් හඳුනා ගෙන අඩි තුනක් පමණ හැරීමේ දී, මිනී පෙට්ටියක් නොමැතිව වළලා තිබූ මිනිස් සිරුරක් පොලිස් නිලධාරීන්ට හමු විය. එම මළසිරුර දැඩි ලෙස කුණු වී තිබුණත්, කන් පෙති දෙකෙහි තිබූ කරාබු ජෝඩුවෙන් සහ ඇඳ සිටි සායෙන්, වළලා ඇත්තේ තිලකාගේ සිරුර බව ඇයගේ මව හා ඥාතීහු හඳුනා ගනු ලැබූ හ.

අභිරහස් ලෙස මරා වළලා ඇතැයි සැක කරන මළසිරුරක් ගොඩ ගැනීම කළ යුත්තේ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ ඇති විධිවිධාන අනුව පළාතේ මහේස්ත්‍රාත්වරයාගේ නියෝගයක් මත පමණි. මහේස්ත්‍රාත්වරයා විසින් එවැනි නියෝගයක් විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාට ලබා දුන් විට වළලා තිබෙන මළසිරුරක් ගොඩ ගැනීමේ පූර්ණ වගකීම වෛද්‍යවරයා වෙත පැවරේ. එවැනි මළසිරුරක් ගොඩ ගැනීම වෛද්‍යවරයාගේ අධීක්ෂණය මත පමණක් කළ යුතු ය. එවැනි පිළිවෙතක් අනුගමනය නො කොට ඇතැම් අවස්ථාවල අධිකරණ වෛද්‍ය කටයුතු පිළිබඳව පළපුරුද්දක් නොමැති දිස්ත්‍රික් වෛද්‍යවරයකු ඉදිරිපිට නුපුහුණු ( unskilled ) කම්කරුවන් ලවා පොලිසිය මගින් එවැනි මළසිරුර ගොඩ ගෙන ඇති අවස්ථා



ඇත. මළසිරුරක් ගොඩ ගැනීමේ දී භාවිතයට ගන්නා උදලු, අලවංගු ආදිය නුපුහුණු කම්කරුවන් විසින් අපරීක්ෂාකාරීව භාවිතා කරනු ලැබීමෙන් මළසිරුරවලට හානි සිදු වේ. එම නිසා, ඇතැම් විට අස්ථීන් භග්නය වීම් ද සිදු වේ. එවැනි භග්න මරණයට පෙර හෝ මරණයෙන් පසුව සිදුවූ ඒවා දැයි වෙන් කර ගැනීම සමහර අවස්ථාවල අසීරු වේ. මළසිරුරු ගොඩ ගැනීමේ දී පුරා විද්‍යා කැනීම් කටයුතුවල දී භාවිතා කරනු ලබන සූක්ෂම පිළිවෙත් (archeological techniques) අනුගමනය කිරීම ඉතා වැදගත් ය. එවැනි ක්‍රම අනුගමනය කළ හැක්කේ කැනීම් කටයුතු කිරීමට දැනුම සහ පළපුරුද්ද ඇති විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන්ට පමණක් ය.

තිලකාගේ මරණය අභිරහස් මරණයක් නිසා වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීමට විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාට මහේස්ත්‍රාත්වරයාගෙන් නියෝගයක් ලැබුණි. ඒ අනුව, අධිකරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත්විණි.

ඉදිරිපස ඉරීගිය කළු තන පටයක්, ඉරී ගිය සුදු පැහැති යට සායක් ද, ලා කොළ පැහැති දිග සායක් ද ශරීරයේ තිබිණි. ඇඳුම් සියල්ලෙහිම සහ ශරීරයේ මඩ තැවරී තිබුණ අතර හඳුනා ගැනීමට නො හැකි තරමට මළසිරුර කුණු වී තිබුණි. ශරීරයෙහි බොහෝ ස්ථානවල අපිචර්මය ( epidermis ) ගැල වී තිබුණි. මළසිරුරේ එකම තුවාලයක්වත් බාහිරව දක්නට නො වී ය. බෙල්ලේ පිහිටි තයිරොයිඩ් කාටිලේජය මැදින් කැඩී එහි දකුණු පැත්තේ ලා රෝස පැහැති වර්ණයක් විය. මියගිය තිලකාගේ ගෙල මිරිකීමේ දී තයිරොයිඩ් කාඩිලේජය ඇඟිල්ලෙන් තද කිරීම නිසා එය තුළට රුධිරය වහනය වීම නිසා ලා රෝස පැහැති වර්ණය හට ගැනීමට හේතුව බව වෛද්‍යවරයා නිගමනය කළේ ය. අභ්‍යන්තර ඉන්ද්‍රියයන්වල තුවාල නො වූ අතර අස්ථීන්වල භග්න කිසිවක් නො වී ය. අභ්‍යන්තර ඉන්ද්‍රියයන් දැඩි ලෙස කුණු වී තිබුණත් මියගිය තැනැත්තිය නීරෝගී අයකු බව අධිකරණ වෛද්‍යවරයාට නිගමනය කළ හැකි විය. තිලකාගේ ගෙල මිරිකා ඇයගේ මරණය සිදු කොට ඇති බව සියලු කරුණු සලකා බැලූ අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේ ය. තවද, යෝනි මාර්ගය සහ ගුද මාර්ගය විස්තරනය වී (dilated) තිබුණි. මියගිය තිලකාගේ යෝනි මාර්ගයෙන් සහ ගුද මාර්ගයෙන් පිස්න ( swab ) ලබා ගෙන, එම පිස්නවල ශුක්‍රාණු



Scanned with CamScanner

(sperms) තිබේ දැයි දැන ගැනීමට එම පිස්න රස පරීක්ෂකවරයා වෙත පරීක්ෂණය භාර පොලිසිය මගින් ඉදිරිපත් කරන ලදී. යෝනියෙන් සහ ගුද මාර්ගයෙන් ලබා ගත් පිස්නවල ශුක්‍රාණු ඇති බව රස පරීක්ෂකවරයා විසින් වාර්තා කොට තිබුණි. ඒ අනුව, ඇය මරණයට පෙර දූෂණය කොට ඇති බව නිගමනය කළ හැකි විය.

විවාහක කාන්තාවකගේ යෝනි මාර්ගයේ ශුක්‍රාණු තිබීමට හැකි වුවත්, ගුදමාර්ගයේ ශුක්‍රාණු තිබීම අසාමාන්‍ය දෙයක් බවත් එවැන්නක් සිදු වීමට හැක්කේ, ගුද මාර්ගය තුළින් ලිංගික සේවනය වූ අවස්ථාවක පමණක් බවත් අඹුසැමියන් අතර එවන්නක් සිදුවීම බොහෝ විරල බවත්, අධිකරණ වෛද්‍යවරයා විසින් පොලිසියට පහදා දෙන ලදී. තිලකාගේ යෝනි මාර්ගයෙන් ලබා ගත් පිස්නයේ තිබූ ශුක්‍රාණු සිරිමල්ගේ දැයි දැන ගැනීම සඳහා සිරිමල්ව පොලිසිය විසින් නැවත අත් අඩංගුවට ගන්නා ලදී. තිලකා අතුරුදහන් වූ දිනය වන පසළොස්වක පෝයදා හෝ ඊට පෙර දින තිලකා සමග ලිංගික සම්බන්ධකම් පැවැත් වූයේ දැයි, සිරිමල්ගෙන් පොලිසිය ප්‍රශ්න කළේ ය. පන්සල් යෑමට පෙර ඔවුන් දෙදෙනා ලිංගික සේවනයේ යෙදුන බව ඔහු පොලිසියට පැවසුවේ ය. සිරිමල්ගේ ශුක්‍ර ධාතු ( seminal fluid ) ලබා දීමට කැමති දැයි පොලිසිය සිරිමල්ගෙන් විමසුවේ ය. එයට සිරිමල් එකඟ වූ බැවින් ( මෙවැනි පරීක්ෂණයක දී සැකකරු විරුද්ධ වන අවස්ථාවන්හි දී අධිකරණ නියෝගයක් මත කැමැත්ත ලබා ගත යුතු ය. ) සිරිමල්ගේ ශුක්‍රාණු ලබා ගැනීමට අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කරන් ලදී.

මියගිය තිලකාගේ යෝනියෙන් සහ ගුද මාර්ගයෙන් ලබා ගන්නා ලද ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූපය ( profile ) සහ සිරිමල්ගේ ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූපය රසායනාගාරයේ දී පරීක්ෂාවට ලක් කරන ලදී. සිරිමල්ගේ ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූපයට වඩා තිලකාගේ ගුද මාර්ගයෙන් සහ යෝනි මාර්ගයෙන් ලබා ගන්නා ලද ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූපය වෙනස් බව සොයා ගන්නා ලදී. පන්සල් යෑමට පෙර තම බිරිය සමග ලිංගික සේවනයේ යෙදුණු බවට සිරිමල් කර තිබූ ප්‍රකාශය මුසාවක් බව D.N.A. පරීක්ෂණවල ප්‍රතිඵල මගින් අධිකරණ වෛද්‍යවරයාට පැහැදිලි විය. ඒ බව අධිකරණ වෛද්‍යවරයා පොලිසියට දැන්වීමෙන් පසු එවැනි බොරුවක් කීමට සිරිමල්ට ඇති අවශ්‍යතාව කුමක් විය යුතු දැයි සිතූ පොලිසිය,



සිරිමල්ගේ හැසිරීම ගැන දැඩි සෝදිසියෙන් සිටියේ ය.

තිලකාගේ මරණය පිළිබඳව ඇය රැකියාව කළ තේ කම්හලේ සේවය කළ ඇය සමග අනියම් සම්බන්ධයක් පැවැත් වූ බවට සැක කළ ප්‍රේමසිරි යන අයකු ගැන පොලිසිය සැක කළේ ය. එබැවින්, ප්‍රේමසිරි අත් අඩංගුවට ගෙන ඔහුගේ කැමැත්ත ඇතුව, ඔහුගේ ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූපය පරීක්ෂණයට භාජනය කිරීම සඳහා අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. තිලකාගේ ගුද මාර්ගයේ සහ යෝනි මාර්ගයෙන් ලබා ගත් ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූපයට වඩා වෙනස් ප්‍රතිරූපයක් ප්‍රේමසිරිගේ ශුක්‍රාණුවල දක්නට ලැබුණු බව රසායනාගාර වාර්තාවේ සඳහන් විය. ඒ අනුව ප්‍රේමසිරි ද නිදොස් බව ඔප්පු විය. මෙහි දී ප්‍රේමසිරි පොලිසියට කියා සිටියේ තමා මෙම අපරාධය නො කළ බවත් සිරිමල්, සමග දැඩි සම්බන්ධකම් පවත්වන ගමේ හොරකම් සහ කසිප්පු ජාවාරමේ යෙදී සිටින චන්දන, සෝමපාල සහ විජේ යන තරුණයින් තිදෙනා තිලකාගේ මරණය ගැන සැක කරන බවත් ය. මේ වන විට ඔවුන් තිදෙනාම ගමෙන් අතුරුදහන් වී තිබීම ද, පොලිසියේ සැකයට තවත් හේතුවක් විය.

පසුව සැඟ වී සිටි චන්දන, සෝමපාල සහ විජේ යන තිදෙනාම පොලිසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී. තිලකාගේ අභිරහස් මරණය ගැන ඔවුන්ගෙන් පොලිසිය ප්‍රශ්න කළේ ය. එහෙත් තිලකාගේ මරණය පිළිබඳව කිසිවක් නො දන්නා බව ඔවුහු කියා සිටිය හ. එහෙත් මොවුන් එතරම් හොඳ චරියාවකින් ජීවත් නො වන අය බව දන්නා පොලිසිය ඔවුන් මීට පෙර කරන ලද වැරදි පිළිබඳව සොයා බැලීමේ දී පිරිමි ළමයෙකු සමග සමලිංගික ක්‍රියාවක යෙදීමේ වරදට සැකපිට විජේට නඩු පවරා තිබූ බව පොලිස් වාර්තාවල සඳහන් වී තිබුණු බව සොයා ගන්නා ලදී. මෙහි දී තිලකාගේ මරණය සම්බන්ධයෙන් විජේ ගැන පමණක් නොව තිදෙනා ගැනම සැක පහල කළ පොලිසිය, තිදෙනාගේම ශුක්‍ර තරලය පරීක්ෂාවට භාජනය කිරීමට අධිකරණයෙන් අවසර ලබා ගත්තේ ය. විජේගේ ශුක්‍ර තරලයේ D.N.A. ප්‍රතිරූපය තිලකාගේ ගුද මාර්ගයෙන් ලබා ගත් ශුක්‍ර තරලයේ ප්‍රතිරූපයට සමාන බවත් චන්දනගේ ශුක්‍ර තරලයේ D.N.A. ප්‍රතිරූපයට තිලකාගේ යෝනියේ තිබී සොයා ගත් ශුක්‍රාණුවල D.N.A. ප්‍රතිරූපයට සමාන බවත් පරීක්ෂණාගාර



Scanned with CamScanner

වාර්තාවලින් පැහැදිලි විය. මෙම ප්‍රතිඵල අනුව තිලකාගේ මරණය සිදුවීමට පෙර චන්දන තිලකා සමග ලිංගික සේවනයේ යෙදී ඇති බවත් තිලකාගේ ගුද මාර්ගයෙන් විජේ ලිංගික සේවනයේ යෙදී ඇති බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් නිගමනය කරන ලදී. තවද, සෝමපාල මියගිය තිලකා සමග ලිංගික සම්බන්ධකමක් පවත්වා නොමැති බව ද පරීක්ෂණවල දී හෙළි විය.

සියලු විද්‍යාත්මක පරීක්ෂණවල ප්‍රතිඵල ඔවුනට දැන්වීමෙන් පසුව, නරක මිතුරන් ආශ්‍රය කිරීම නිසා මෙම ඉරණම තමනට අත් වූ බවත්, තිලකා දූෂණය කොට ගෙල මිරිකා මරා දමා ඇයගේ සිරුර වළලා දැමීමට ඔවුන්ව පෙළඹුවේ තිලකාගේම සැමියා වන සිරිමල් බවත්, ඊට හේතු වූයේ තිලකා කලකට පෙර ප්‍රේමසිරි සමග පැවැත් වූ අනියම් සම්බන්ධතාවයට ඇයගෙන් පළි ගැනීමට බවත්, තිදෙනාම පොලිසියට පැවසුවෝ ය.

යම් අයෙකුගේ නාසය සහ මුඛය වසා හුස්ම හිර කිරීම නොහොත් නිශ්වාසය ( smothering ) කිරීමෙන්; මරණයට පත් වූ විට මුහුණ දම් පැහැතිවීම හෝ රත් පැහැති වීම ඇති වේ. තවද, මුහුණේ ලේ ලප (petechial haemrrhags) හට ගනී. නාසය සහ මුඛය වසා මරණයට පත් කළ අයෙකුගේ බොහෝ විට මුහුණේ සීරීම් හා තැල්ම හට නො ගන්නා නිසා එසේ මරණයට පත් කොට තිබෙන කෙනෙකුගේ මුහුණ දම් පැහැතිවීම හෝ රත් පැහැති වීම, මුහුණ ඉදිමීම හා මුහුණේ ලේ ලප යන ලක්ෂණ සොයා ගැනීම ඉතාම දුෂ්කර ය. බොහෝ ශ්‍රී ලාංකිකයින්ගේ සම තද දුඹුරු පැහැති බැවින් හුස්ම හිර කිරීමෙන් හට ගන්නා මුහුණේ රත් පැහැති වීම, මුහුණ දම් පැහැති වීම සහ මුහුණේ ලේ ලප ඇති වීම හඳුනා ගැනීම නුපුහුණු අධිකරණ වෛද්‍යවරයෙකුට කළ නො හැකි ය. එම නිසා, දුඹුරු සහ කළු පැහැති වර්ණයකින් යුත් ශ්‍රී ලාංකිකයන්ගේ නාසය සහ මුඛය වසා මරණයට පත් වූ විට ඒ බව හඳුනා ගත හැක්කේ, පෙනහැලි, හෘදය මත ( epicardium ) හෝ ස්වරාලයේ ඇතුල් පැත්තේ හට ගන්නා කුඩා ලේ ලප වලින් සහ රුධිරය තද කළු පැහැති වීම, රුධිරය කැටි නො වීම, තයිරොයිඩ් කාටිලේජය කැඩී ඒ අවට රුධිරය වහනය වීම යන ලක්ෂණයන් ගෙන් ය. නාසය සහ මුඛය වසා මරණයට පත් වී ඇති අයෙකුගේ මළසිරුර කුණු වී ගියවිට එම සලකුණු හඳුනා ගත නො හැකි ය.



එවැනි අවස්ථාවන් හඳුනා ගත හැක්කේ, මරණය සිදු වීමට වෙන කිසියම් හේතුවක් සොයා ගැනීමට නො හැකිවීම සහ මුහුණ හෝ ගෙල තද කිරීමේ දී මුහුණේ හෝ බෙල්ලෙහි හට ගන්නා තැලුම්, තයිරොයිඩ් කාටිලේජයේ ( thyroid cartiladge ) භග්නවීම, හෝ එයට රුධිරය වහනයවීම යන බාහිර ලක්ෂණ හඳුනා ගැනීමෙන් ය.

දැඩි ලෙස කුණු වූ තිලකාගේ ශරීරයෙහි තිබූ තයිරොයිඩ් කාටිලේජය කැඩී තිබුණ අතර එයට රුධිරය වහනය වී තිබුණි. තරුණ කාන්තාවක වූ තිලකාගේ ඉන්ද්‍රියයන්වල වෙනයම් රෝග ලක්ෂණයන් නො තිබුණි.

දැඩි භීතියට පත් අයෙකුගේ ගෙල තද කිරීමේ දී කැරෝටික ධමනි ( carotid artery ) මත පිහිටා ඇති ශීර්ෂපෝශී කෝටරකය ( carotid sinus ) උත්තේජනය ( stimulation ) වීමෙන් හෘද ස්පන්දනය නැවතීම නිසා ( cardiac arrest ) ක්ෂණිකව මරණය හට ගනී. මේ ආකාරයට මරණය සිදුවීම වේගීය නිෂේධනය ( vagal inhibition ) යනුවෙන් අධිකරණ වෛද්‍ය විද්‍යාවේ සඳහන් කර ඇත. දූෂණය කිරීමට තැත් කරන පිරිමියෙකු අතින් වේගීය නිෂේධනයෙන් ගැහැණියකගේ මරණය සිදු වුවත්, ශ්‍රී ලංකාවේ පවත්නා රෝම ලංදේසි සාපරාධි නීතිය අනුව දූෂණය කිරීමට තැත් කරන පිරිමියාට එම අවස්ථාවේ දී ඇත්තේ ගැහැණිය මැරීමේ පූර්ව චේතනාවක් (guilty intention) නොව, ගැහැණිය කෑ ගැසීම වැලැක් වීමේ චේතනාවෙන් ගෙල තද කිරීමක් පමණක් යැයි, යන තර්කය ඉදිරිපත් කිරීමෙන් සාහසිකයා මිනීමැරීමේ ( murder ) චෝදනාවෙන් නිදහස් වීමට බොහෝ අවකාශ ඇත. එසේ වීම මිනීමරුවන් නීතියේ හිඩැස් අතරින් රිංගා යෑමකි.

කෙතරම් කුණු වී ගිය මළසිරුරක වුව ද කපා, කොටා හෝ ගෙල ලණුවකින් මිරිකා හෝ අතින් ගෙල මිරිකා හෝ වෙඩි තබා යම් අයකු මරණයට පත් කොට ඇති අවස්ථාවන්හි දී පළපුරුදු අධිකරණ වෛද්‍යවරයෙකු පූර්ණ බාහිර සහ අභ්‍යන්තර පරීක්ෂාවන් පැවැත්වීමෙන් පසුව මරණයට හේතුව සොයා ගත හැකි ය. ඉතා දැඩි ලෙස කුණු වූ ගැහැණියකගේ මළසිරුරක කන්‍යා පටලයේ මරණයට පෙර තිබූ තත්ත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට වෛද්‍යවරයාට අපහසු ය. පූතිභවනය වීම නිසා යෝනි පටලය



Scanned with CamScanner

විනාශ වී යාම හෝ ප්‍රතිහරණය වූ යෝනි ප්‍රදේශය සතුන් විසින් කා දැමීම මෙයට හේතුවයි

තිලකාගේ යෝනි මාර්ගයේ සහ ගුද මාර්ගයේ තිබූ ශුක්‍ර තරලය, සහ තයිරොයිඩ් කාටිලේජය කැඩී තිබීම මරණයට හේතුව සහ මරණය සිදුවූ ආකාරය **( mode of death-natural suiude accident or homicide )** සොයා ගැනීමට උපකාරී වූ " නිහඬ සාක්ෂි " වශයෙන් සැලකිය හැකි ය.



# බොස්නියාවේ සිදු වූ සමූහ මිනිස් ඝාතන

එක්දහස් නවසිය තිස් නවයේ සිට එක්දහස් නවසිය හතළිස් පහ දක්වා පැවති දෙවැනි ලෝක මහා සංග්‍රාමයේ දී ඒකාධිපති ඇඩොල්ෆ් හිට්ලර්ගේ නාසි ( Nazi ) හමුදාව විසින් සිදු කරන ලද අති බිහිසුණු අපරාධ පිළිබඳව ලෝකයාට පසුව දැන ගැනීමට අවකාශ ලැබිණ. එහෙත්, ඉතිහාසයෙන් මිනිසුන් පාඩම් ඉගෙන ගෙන නොමැති බව වර්ෂ එක්දහස් නවසිය අනූ එකේ සිට වර්ෂ එක්දහස් නවසිය අනූපහේ දෙසැම්බර් දක්වා වූ කාලය තුළ පැරණි යුගෝස්ලාවියාවේ ඇති වූ ජාතිවාදී කෝල. හල ( ethnic violence ) නිසා එහි ජනගහණයෙන් මිලියන දෙකයි දශම දෙකයි හතක් දෙනා අවතැන් වී සිරකඳවුරුවල දී දරුණු වද හිංසාවලට ලක් වූ බවත්, අටදහස් හත්සියයක් පමණ දෙනා මරා දමා සමූහ මිනී වලවල් එකසිය පනහක පමණ එම මළසිරුරු වළලා තිබෙන බවත්, මීට අමතරව සිය ගණන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් දූෂණය කොට දරුණු වදහිංසාවලට ද ලක් කර ඇති බවත් අනාවරණය වීමෙන් මෙම කරුණ සනාථ වනු ඇත.

දහහතරවෙනි ශතවර්ශයේ සිට දහසය වන ශතවර්ෂය දක්වා වූ කාලය තුළ තුර්කියානුවන් ( Turks ) විසින් බෝල්කන් ( Balkans ) ප්‍රදේශය ආක්‍රමණය කරන ලදී. තුර්කියට ආසන්න වූ සර්බියාව සහ මැසෙඩෝනියාව ආක්‍රමණය කොට පසුව නිදහස් කර ගන්නා ලද නමුත් ක්‍රොඒෂියාව ද ආක්‍රමණය කිරීමෙන් ඊට පසුව නිදහස් කර ගන්නා ලදී. එක්දහස් තුන්සිය අසූ නවයේ දී තුර්කීන් විසින් සර්බියාව ආක්‍රමණය කළත් එක්දහස් අටසිය තිස් තුනේ දී එය ස්වාධීන රාජ්‍යයක් විය. තුර්කියානුවන්ගේ බලය අවුරුදු හාරසියක කාලයක් තුළ පැවැත්වුණි. එම කාලය තුළ බොල්කන් ප්‍රදේශයේ ජීවත් වූ විශාල ජන කොටසක් ඉස්ලාම් ආගම වැළඳ ගත් හ. දහ අටවෙනි ශත වර්ෂය තුළ දී තුර්කීන්ගේ ආධිපත්‍යය ඉවත් කිරීම සඳහා හන්ගේරියානුවන්ගේ ( Hungarian ) සහ ඉන් අනතුරුව ඔස්ට්‍රියානුවන්ගේ ( Austrian ) ආධාරය බෝල්කන් ප්‍රදේශවාසීන්ට



Scanned with CamScanner

ලැබුණි. එම නිසා දහනව වෙනි ශතවර්ෂය තුළ බෝල්කන් ප්‍රදේශවාසීන් ඔස්ට්‍රියානුවන්ගේ සහ හන්ගේරියානුවන්ගේ බලපෑම් වලට ලක්විය. තුර්කීන්ගෙන් නිදහස ලබා ගැනීමට සර්බිවරුන් උත්සාහ කළ අතර, ඔස්ට්‍රියානුවන්ගෙන් සහ හන්ගේරියානු අධිරාජ්‍යයෙන් ( Austro-Hungarian Empire ) නිදහස ලබා ගැනීමට ක්‍රොඒෂියානුවෝ උත්සාහ කළ හ. මෙම අවධියේ දී දකුණු බෝල්කන් ප්‍රදේශයේ ජීවත්වන සියලු ස්ලාව් ජාතිකයන් ( Slavs ) එක්සත් විය යුතු බවට මතයක් ගොඩ නැගුණි. මේ අනුව යුගෝස්ලාවියාව නොහොත් දකුණු බෝල්කන් ප්‍රදේශයේ ජීවත් වන ස්ලාව්වරුන්ගේ දේශය ( "Land of the South Slavs" ) වශයෙන් රටක් බිහි විය. ප්‍රධාන වශයෙන් තුර්කියානුවන්ගෙන් පැවැත්වෙන . බොස්නියානු මුස්ලිම්වරුන් ( Bosnian muslims ), සත්‍යලබ්ධික සර්බිවරුන් ( orthodox Serbs ) සහ රෝමානු කතෝලික ක්‍රොඒෂියානුවන් ( Roman catholic Croatians ) යැයි කොටස් තුනකින් යුගෝස්ලාවියාව සමන්විත විය. සර්බියානුවරුන් සහ ක්‍රොඒෂියානුවන් සර්බෝ ක්‍රොඒෂියානු (Serbo-Croatian) නමැති එකම භාෂාවක් කථා කළත් සර්බියානුවන් ලිවීම ( writing ) සඳහා සිරිලික් අක්ෂර ක්‍රමය ( Cyrillic script ) පාවිච්චි කළ අතර ක්‍රොඒෂියානුවන් ලිවීම සඳහා පාවිච්චි කරන ලද්දේ රෝමානු අක්ෂර ක්‍රමයයි ( Roman script ).

එක්දහස් නවසිය හතළිස් පහේ සිට, මාෂල් ටිටෝ එක්දහස් නවසිය අසූවේ මියයන තෙක් පැරණි යුගෝස්ලාවියාවේ ජීවත් වූ සියලු ජනවාර්ගික කොටස් එක්සේසත්ව ඔහු විසින් පාලනය කරන ලදී. සහෝදරත්වය සහ එකමුතුකම ( " Brotherhood and Unity" ) නමැති උද්යෝග පාඨය ( slogan ) උපයෝගී කර ගනිමින් විවිධ වෙනස්කම්වලින් හෙබි පැරණි යුගෝස්ලාවියාවේ ජීවත් වූ ජනවාර්ගික කොටස් එක්සත් කොට ඒක පාක්ෂික ( one party rule ) රජයක් මගින් පැරණි යුගෝස්ලාවියාව පාලනය කිරීමට ක්‍රොඒෂියානු ජාතිකයකු වූ මාෂල් ටිටෝට හැකි විය. මාෂල් ටිටෝගේ බලය අභියෝගයට ලක් නො වූවත් පැරණි යුගෝස්ලාවියානු මධ්‍යම ආණ්ඩුවේ වැදගත් තනතුරු සර්බිවරුන්ට හිමි විය. දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසු, විශාල වශයෙන් සර්බියාවේ තිබූ කර්මාන්ත ක්‍රොඒෂියාවට සහ බොස්නියාවට මාෂල් ටිටෝ විසින් මාරු කර යවන ලදී. ක්‍රොඒෂියානුවන්ට මෙම තත්ත්වය නුරුස්නා (resenment) දෙයක් විය. උපතින්ම මාෂල් ටිටෝ ක්‍රොඒෂියානුවෙක් වූවත් ඔහුගේ



පාලන ක්‍රමය තුළින් සර්බියාව දුර්වල තත්ත්වයකට පත්වන බව බොහෝ සර්බිවරුන් විශ්වාස කළ හ. එක්දහස් නවසිය අසූවේ මාෂල් ටිටෝගේ මරණයෙන් පසු පැරණි යුගෝස්ලාවියාව වරින් වර පාලනය කරන ලද්දේ ( rotation of leader ship ) පැරණි යුගෝස්ලාවියාව ෆෙඩරල් ක්‍රමයකින් ( federal system ) පාලනය කළ දේශපාලන නායකයන් විසිනි. එනමුත් මාෂල් ටිටෝගේ පාලන කාලයේ දී පැරණි යුගෝස්ලාවියාවේ නො තිබූ ජනවාර්ගික ජාතික හැඟීම් ( ethnic nationalistic feelings ) ඉස්මතුවන්නට විය. ක්‍රොඒෂියාව සහ ස්ලොවේනියාව නිදහස් රාජ්‍යයන් වශයෙන් පැරණි යුගෝස්ලාවියාවෙන් වෙන්වීමට තැත් කළ අතර ජාතික හැඟීමෙන් යුතු සර්බිවරුන්ට අවශ්‍ය වූයේ පැරණි යුගෝස්ලාවියානු රජය යටතේ ජීවත් වී එය නව නවත් ශක්තිමත් කිරීමට ය. මෙම තත්ත්වය යටතේ පැරණි යුගෝස්ලාවියානු සමූහාණ්ඩුවල ජාතික නායකයන් බිහිවන්නට විය.

එක්දහස් නවසිය අසූ හතේ දී ස්ලොබොඩාන් මිලොසොවිච් (Slobodan Milosevic) සර්බියාවේ ජනාධිපති විය. සර්බියාව බලවත් වේ යැයි යන බිය නිසා එක්දහස් නවසිය අනූ එකේ දී බොස්නියා-හර්සගොවිනා සමූහාණ්ඩුවේ ජනාධිපති වශයෙන් අලියා ඉසෙබෙගොවිච් ( Alija Izetbegovic ) පත්විය. බොස්නියා හර්සගොවිනා සමූහාණ්ඩුව පැරණි යුගෝස්ලාවියානු මධ්‍යම සමූහාණ්ඩුවෙන් ඉවත් වුවහොත් බොස්නියානු සර්බිවරුන් බොස්නියා-හර්සොගොවිනා රජයෙන් ඉවත් වන බවට සර්බියානු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක මනෝචිකිත්සක රඩොවෝන් කැරඩිෂ් ( Radovan Karadzic ) විසින් අනතුරු ඇඟවීමක් කරන ලදී. ස්ලොවේනියාව සහ ක්‍රොඒෂියාව එක්දහස් නවසිය අනූ එකේ ජූනි මස විසි පස්වෙනි දින පැරණි යුගෝස්ලාවියානු මධ්‍යම රජයෙන් ස්ලොවේනියාව සහ ක්‍රොඒෂියාව ඉවත්ව වෙනම නිදහස් රාජ්‍යයන් බවට ප්‍රකාශ කිරීමෙන් දින තුනකට පසුව පැරණි යුගෝස්ලාවියාවේ යුද්ධය ආරම්භ විය. ඊට දින තුනකට පසු යුගෝස්ලෝවියානු මහජන හමුදාව ස්ලෝවේනියාව ආක්‍රමණය කිරීමෙන් පසු ක්‍රොඒෂියාව ද ආක්‍රමණය කරන ලදී. බොස්නියා-හර්සේගොවිනා ( Bosnia-Herzegovina ) සමූහාණ්ඩුව පැරණි යුගෝස්ලෝවියාවෙන් වෙන් වී වෙනම රාජ්‍යයක් වශයෙන් පැවතිය යුතු ද යන්න විසඳා ගැනීම සඳහා එක්දහස් නවසිය අනූදෙකේ පෙබරවාරි මස විසි නවවන දින සහ මාර්තු

පළමුවන දින ජනමත විචාරණයක් පවත්වන ලදී. බොස්නියා-හර්සේගොවිනා සමූහාණ්ඩුව ස්වාධීන රාජ්‍යයක් වශයෙන් පැරණි යුගෝස්ලාවියාවෙන් වෙන් විය යුතු බව බොස්නියන් මුස්ලිම්වරු සහ ක්‍රොඒෂියානුවන් ස්ථිරවම ප්‍රකාශ කර සිටි අතර, බොස්නියන් සර්බිවරුන් මෙම ජනමත විචාරණය වර්ජනය කරන ලදී. ජනමත විචාරණය බල රහිත බව ඔවුහු ප්‍රකාශ කර සිටියෝ ය. සරයේවෝ (Sarajevo) අගනුවර වශයෙන් සලකා පැරණි බොස්නියානු පෙඩරල් සමූහාණ්ඩුවේ කොටසක් සමග බොස්නියා-හර්සොගොවිනා සර්බි සමූහාණ්ඩුවක් ( Serbian Republic of Bosnia - Herzegovina ) වශයෙන් පැරණි යුගෝස්ලාවියාවේ කොටසක් තුළ පැවැත්විය යුතු බව බොස්නියානු සර්බිවරු තරයේ කියා සිටිය හ. බොස්නියා-හර්සොගොවිනා නව ස්වාධීන සමූහාණ්ඩුව ජාත්‍යන්තරව පිළිගැනීමෙන් පසුව මෙම මතභේදය නිසා එක්දහස් නවසිය අනූ දෙකේ අප්‍රේල් මස සිට එහි දරුණු යුධ සටන් ඇවිලුනි. බොස්නියානු සර්බිවරුන්ගේ නිල නොවන හමුදා (Bosnian Serb irregular forces) සහ යුගෝස්ලාවියානු මහජන හමුදාවන් නව බොස්නියා-හර්සොගොවිනා සමූහාණ්ඩුවට විරුද්ධව දරුණු ආක්‍රමණයන් සිදු කරන ලදී. මේ අතරතුර සර්බියාව ( Serbia ) සහ මොන්ටිනිග්‍රෝව ( Montenegro ) ද ස්වාධීන රාජ්‍යයන් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දේ ය.

පැරණි යුගෝස්ලාවියාවේ සිදුවුනු මිනිස් ඝාතන සහ වද හිංසා සිදු කරන ලද්දේ යුගෝස්ලාවියානු මහජන හමුදාවන් ( Yougoslavian National Army ) සහ එහි ක්‍රියාත්මක වූ ජාතිවාදීන්ගේ පෞද්ගලික හමුදාවන් ( paramilitary forces ) විසිනි. යුධ ගිනි ඇවිලෙමින් තිබුණු බොස්නියා-හර්සොගොවිනා නව රජයේ සහ ක්‍රොඒෂියානු නව රජයේ සාමය සුරක්ෂිත කිරීම සඳහා සාම සාධක හමුදාවක් (peace keeping forces - United Nations Protection Force / UNPROFOR) එක්සත් ජාතීන්ගේ සංගමය විසින් එක්දහස් නවසිය අනූ දෙකේ මුල් අවදියේ දී බොස්නියාවට පිටත්කර යවන ලදී. එක්දහස් නවසිය අනූදෙකේ මාර්තු මස, නව බොස්නියානු රජයේ අගනුවරට සාමසාධක හමුදාවක් පැමිණියත්, සර්බිවරුන්ගේ ආක්‍රමණයන් වැලැක්වීමට නොහැකි විය. නව බොස්නියා-හර්සොගොවිනා රජයේ දේශපාලන හා හමුදා බලය බොස්නියානු



ජාතික හමුදාව අත්පත් කරගත සරයේවෝ ( Sarajevo ) අගනුවර ද ඔවුන් විසින් යටත් කර ගන්නා ලදී.

සරයේවෝ අගනුවරට බොස්නියානු සර්බි හමුදා විසින් එල්ලකරන ලද ෂෙල් වෙඩි පහරවල් කෙතරම් දරුණු වූයේ ද කිවහොත්, එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවලටත් ඔවුන්ගේ ආරක්ෂාවෙන් මෙම පහරදීම්වලට ලක්වීමට සිදුවුණි. ෂෙල් වෙඩි පහරදීම් කෙතරම් දරුණුවූවා දැයි කිව හොත් එක්දහස් නවසිය අනූ දෙකේ මැයි දහසය වන දින එක්සත් ජාතීන්ගේ හමුදාව සරයේවෝ අගනුවරින් ඉවත් කිරීමට ( evacuate ) සිදු විය. එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ මූලස්ථානය සරයේවෝ නගරයෙන් ඉවත් කොට, බෙල්ග්‍රේඩ් ( Belgrade ) සහ සාග්‍රේබ් ( Zagreb ) යන නගරවලට රැගෙන යාමට සිදු විය. සර්බියානු හමුදාවන් විසින් එක්දහස් නවසිය අනූ දෙකේ මැයි තිස්වන දින සරයේවෝ අගනුවර පිහිටි ජනාකීර්ණ වෙළඳ පොළකට මෝටාර් ප්‍රහාරයක් ලක් කිරීමෙන් පසුව අවම වශයෙන් පුද්ගලයන් විසිදෙනෙකුවත් මරණයට පත්වීම නිසා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ( UN Security council ) විසින් යුගෝස්ලාවියානු සමූහාණ්ඩුවට ( සර්බියාව සහ මොන්ටිනිග්‍රෝව යන නව රජයන් ) එරෙහිව ආර්ථික සම්බාධක ( economic sanctions ) පනවන ලදී. මෙම ආර්ථික සම්බාධක ඉවත් කිරීමට නම් බොස්නියා-හර්සොගොවිනා රාජ්‍යයට එරෙහිව නව යුගොස්ලාවියානු රජය (සර්බියාව සහ මොන්ටිනීග්‍රෝව) සිදු කරන සියලුම යුධමය ක්‍රියාමාර්ග නවතා දැමීමටත් යුගෝස්ලාවියානු මහජන හමුදාව සහ නිල නොවන හමුදා නිරායුධ කිරීමත් සහ සර්බියානු පාලනයක් ඇති කිරීම සඳහා බොස්නියාවෙන් බොස්නියානු මුස්ලිම්වරුන් ඉවත් කිරීමත් වහාම නැවැත්විය යුතු විය.

"නිවුයෝක් නිවුස්ඩේ" ( New york newsday ) නමැති පුවත්පතේ සේවය කළ රෝයි ගට්මන් නමැති රූපවාහිනී මාධ්‍යවේදියාගේ මැදිහත් වීම නිසා පැරණි යුගොස්ලාවියාවේ සිදු වූ දරුණු අති විශාල මිනිස් කුරිරුකම්, වදහිංසා, ඝාතනයන් හා ජාතිවාදී සංහාරයන් (genocide) පිළිබඳව සෙසු ලෝකයාට රූපවාහිනී මාධ්‍ය තුළින් දැක ගන්නට ලැබුණි. මේ සඳහා රෝයි ගට්මන් හට "පුලිට්සර් ත්‍යාගය" (pullitzer) එක්දහස් නවසිය අනූ දෙකේ දී පිරිනමන ලදී. පැරණි යුගෝස්ලාවියාවේ සිටි ක්‍රිස්තියානු සර්බිවරුන් විසින් බොස්නියානු



Scanned with CamScanner

මුස්ලිම් වරුන්ට සහ ක්‍රොයේෂියානුවන්ට එරෙහිව කරන ලද දරුණු වදහිංසා එමගින් ලෝකයාට පළමු වරට දැන ගන්නට හැකි විය. ඊට පසුව එම සිරකඳවුරුවලට බ්‍රිතාන්‍යයේ ස්වාධීන රූපවාහිනිය අවධානය යොමු කොට දරුණු වද හිංසාවන්ට ලක් වූ සිරකරුවන්ගේ තත්ත්වය රූපවාහිනිය ඔස්සේ සෙසු ලෝකයාට පෙන්වන ලදී. ඊට පසුව පැරණි යුගෝස්ලාවියාවේ ( former Yugoslavia ) සිදු වුණු මෙම යුද අපරාධ ( war crimes ) පිළිබඳව සොයා බැලීමට ජාත්‍යන්තර සාපරාධි අධිකරණයක් ( International criminal Tribunal for former Yugoslovia - ICTY ) එක්සත් ජාතීන්ගේ සංවිධානය ( united nations ) මගින් පත් කරන ලදී. මේ යුධ අපරාධ සිදු කරන ලද්දේ පැරණි යුගොස්ලාවියානු මහජන හමුදාව බවත් එයට නායකත්වය දී ඇත්තේ මනෝචිකිත්සකයෙකු වූ රැඩෝවාන් කැරඩ්ෂ් ( Radovan Karadzic ) සහ බොස්නියානු සර්බ්වරුන්ගේ දේශපාලන නායකයා වූ ජනරාල් රත්කෝ මිලඩ්ෂ් ( Ratko Miladic ) බවත් පරීක්ෂණ අනුව වාර්තා විය. නෙදර්ලන්තයේ හේග් අගනුවර ජාත්‍යන්තර අධිකරණය මගින් ( ICTY ) මිනිස් වද හිංසා හා ඝාතන සිදු කිරීමේ වරදට බොස්නියානු සර්බ්වරුන් හතළිස් තුන් දෙනෙකුටද, ක්‍රොරේෂියානුවන් අටදෙනෙකුට ද, යුගෝස්ලාවියා මහජන හමුදාවේ නිලධාරීන් තුන්දෙනෙකුට ද, බොස්නියා මුස්ලිම්වරු තුන්දෙනෙකුට සහ රැඩෝවාන් කැරඩ්ෂ් සහ ජනරාල් රත්කෝ මිලඩ්ෂ් වෙත ද නඩු පවරා ඇත. එසේ වුවත් මේ දක්වා කැරඩ්ෂ් සහ මිලඩ්ෂ් යන දෙදෙනා ජාතික වීරයින් මෙන් බොස්නියාවේ නිරුපද්‍රිතව සැරිසරති.

ජාතිවාදී කෝල, හලවලින් වැඩි වශයෙන්ම පීඩාවට පත් වූයේ පැරණි යුගොස්ලාවියාවේ බොස්නියානු මුස්ලිම්වරුන් බව පසුව වාර්තා විය. මෙම අර්බුදයෙහි වස්තු බීජයට හේතු වූයේ පැරණි යුගොස්ලාවියානු මහජන හමුදාවේ ජාතිවාදය සහ ආගම් වාදය යි. වැඩි වශයෙන් ප්‍රබලව සිටි ක්‍රිස්තියානු සර්බ්වරුන් විසින් මුස්ලිම් බොස්නියානුවන් සහ ක්‍රොඒෂියානුවන් සමූලඝාතනය කරන ලදී. බොස්නියානු මුස්ලිම්වරු ඔවුන්ගේ වාසස්ථානවලින් බලහත්කාරයෙන් පලවා හැර මුස්ලිම් ගැහැණුන් දූෂණය කර වද හිංසා කොට නිරපරාදේ මිනිසුන් දහස් ගණනින් මරා දැමූ හ. තත්ත්වය කෙතරම් බරපතල වූවා දැයි කිවහොත් එය මැඩ පැවැත්වීමට සර්බියානු රජයට ආර්ථික සම්බාධක පැනවීමට එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට ( United Nations ) සිදු විය. සිවිල් යුද්ධයකට මැදි වී සිටින



සර්බ්වරුන් සහ ක්‍රොඒෂියානුවන් අතරට ඇමෙරිකාව මැදිහත්වීම තුළින් "Dayton Peace Accord" නමැති සාම සම්මුතියක් එක්දහස් නවසිය අනූපහේ දී ඇති කර ගනු ලැබී ය. එම සාම සම්මුතියේ නිර්මාතෘ වශයෙන් ඇමෙරිකාව කටයුතු කළේ ය. යුධ අපරාධ, ජාතිවාදී කෝල, හල, මිනීමැරීම්, සොරකම්, මංකොල්ලකෑම්, දූෂණ යන සියල්ලක්ම පිළිබඳව පුළුල් පරීක්ෂණ පැවැත්වීමට අවකාශ දීමටත්, වැරදිකරුවන් ජාත්‍යන්තර අධිකරණයට භාර දීමටත්, සියලු යුද සිරකරුවන් නිදහස් කිරීමටත්, බලහත්කාරයෙන් පවත්වා ගෙන යන සියලු වැඩබිම් නවත්වා අවතැන්වූවන්ට තම පැරණි වාසස්ථාන කරා යෑමට ඉඩ ප්‍රස්ථා සලසා දීමටත්, මිනිස් අයිතිවාසිකම් සහ ජාත්‍යන්තර රතු කුරුස හමුදාවට යුද්ධ පැවති ප්‍රදේශවලට ඇතුල් වී, අවශ්‍ය කටයුතු කිරීමට ඉඩ සැලැස්වීමටත්, ඩේටෝන් සාම සම්මුතියට අනුව අවසර ලබා දිය යුතු විය. මීට අමතරව සාම සම්මුතිය ක්‍රියාත්මක කරවීම සඳහා සන්නද්ධ සොල්දාදුවන් හැට දහසකින් යුත් නේටෝ ( NATO ) හමුදාවක් බොස්නියාවේ නතර කොට තැබූ හ. බොස්නියානු ජනාධිපති වෙනුවෙන් අලියා ඉසෙබෙජොවිච් ( Aliya Izetbegovic ), ක්‍රොඒෂියානු ජනාධිපති ෆැන්ජෝ ටුඩ්මාන් ( Franjo Tudjman ) සහ සර්බියානු ජනාධිපති ස්ලෝබෝඩාන් මිලෝසොවිච් ( Slobodan Milosevic ) යන අයවලුන් විසින් එක්දහස් නවසිය අනූපහේ දෙසැම්බර් මස දහහතර වන දින පැරීසියේ දී මෙම සාම ගිවිසුමට අත්සන් තබන ලදී. මෙම සාම සම්මුතිය නිසා බොස්නියාවට නීත්‍යානුකූල රාජ්‍යයක් හිමි වූ අතර බොස්නියානු සර්බ්වරුන්ට ද බොස්නියාවෙන් සියයට හතළිස් නවයක අර්ධ ස්වයං පාලන ස්ප්සරකා ( Sperska ) යන ජනරජයක් හිමි වූ අතර ඉතිරි සියයට පනස් එක ක්‍රොඒෂියානු-මුස්ලිම් පෙඩරල් කොටසක් බවට පත් විය. තවද, ඉහත සඳහන් ජාත්‍යන්තර සාපරාධි අධිකරණයේ නඩු පවරා ඇති කිසිම අයෙකුට මෙම රාජ්‍යයන්වල රාජ්‍යතාන්ත්‍රික තනතුරක් දැරිය නො හැකි විය. එක්දහස් නවසිය අනූදෙකේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ගත් තීරණයකට අනුව බොස්නියාවේ සමූහ මිනීවලවල් පරීක්ෂා කිරීම සඳහා ඇමෙරිකාවේ පිහිටි ස්වේච්ඡා සංවිධානයක් වන මිනිස් අයිතිවාසිකම් පිළිබඳව වෛද්‍යවරුන්ගේ සංගමයට (Physicians for Human Rights) කොන්ත්‍රාත් පදනමක් මත භාර දෙන ලදී. මිනිස් අයිතිවාසිකම් පිළිබඳව දැඩි උනන්දුවක් දක්වන අයවලුන් ඇමෙරිකාවේ සිටින



Scanned with CamScanner

නිසා රාජ්‍ය නොවන ආයතනයක් වන මෙම සංගමයට මෙවැනි විශාල පුළුල් පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය මුදල් ලබා දෙන ලදී

මේ අනුව, බොස්නියාවේ නැගෙනහිර පිහිටි සර්ස්කා (Cerska) නමැති ප්‍රදේශයේ එකසිය හැටක් පමණ දෙනා වළලා දමා ඇති බව සැක කරන මිනීවළක් පරීක්ෂා කිරීමට මෙම ආයතනයට අවකාශ ලැබිණි. කැනීම් කටයුතු කිරීමට පෙර සමූහ මිනීවල ආරක්ෂා කිරීමටත් එහි අවට බිම් බෝම්බ වළලා තිබේ දැයි පරීක්ෂා කිරීමටත් නේටෝ හමුදාව යොදවන ලදී. මෙවැනි විශාල භාරදූර සහ පුළුල් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මහ ලේකම්වරයාගේ පූර්ණ සහයත්, අනුමැතියත්, ක්‍රොඒෂියානු, බොස්නියානු හා සර්බියානු රාජ්‍යයන්වල පූර්ණ කැමැත්ත සහ සහයෝගය අවශ්‍ය විය. ඩේටෝන් සාම සම්මුතිය ( **Dayton Peace agreement** ) අනුව එම රාජ්‍යයන් පූර්ණ සහයෝගය ලබා දීමට බැඳී සිටි අතර සමූහ මිනීවලවල් එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ ආරක්ෂාව යටතේ පැවතිනි.

පැරණි යුගොස්ලාවියාවේ සිදු වී ඇති කෲර මිනිස් වදහිංසා සහ ජාතිවාදී මිනීමැරීම්වලට වගකිව යුතු අය සොයා ඒ අයට විරුද්ධව ජාත්‍යන්තර අධිකරණය ඉදිරියේ නඩු පැවරීමට පියවර ගැනීමෙන් ජාත්‍යන්තර ප්‍රජාව සෙසු ලෝකයාට පෙන්වා දී ඇත්තේ තවදුරටත් මෙවැනි සාහසිකකම් ඉවසා සිටීමට නො හැකි බවත්, එවැනි සාහසිකයන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත් සහ අපරාධවලට ලක් වූ අයට සහ ඒ අයගේ ඥාතීන්ට සාධාරණය සහ යුක්තිය ඉෂ්ඨ කර දෙන බවත් ය. මෙවැනි අපරාධකරුවන් පිළිබඳව අතීතයේ දී කළාක් මෙන් නිර්දය ලෙස විවේචනය කරමින් පණිවිඩ පමණක් නිකුත් කොට, බලවත් ජාතීන් එයින් ගැලවීම වෙනුවට, සාහසිකයින්ට විරුද්ධව දැඩි ලෙස ක්‍රියා කිරීමට ඔවුන් දැන් ප්‍රයත්න දරන බව පෙණේ.

මෙවැනි පරීක්ෂණවල දී සපුරාලිය යුතු පරමාර්ථයන් නම්, සමූහ මිනීවල නිසැකව හඳුනා ගැනීම, මිනීවලේ ඇති සියලු මළසිරුරු ගොඩ ගෙන ඒවා ස්ථිර වශයෙන් හඳුනා ගැනීම, මරණයට හේතුව සොයා ගැනීම, වළලා තිබූ කාලය නිර්ණය කිරීම සහ නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටා ඇති ජාත්‍යන්තර සාපරාධී අධිකරණයට මේ



පිළිබඳව වාර්තා කිරීමත් ය. ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියෙකු, එම නිලධාරියාට සහායකයෙකු, අධිකරණ වෛද්‍ය නිලධාරීන් සිව්දෙනෙකු, විද්‍යාත්මක දත්ත රැස් කිරීමට වෝහාරක විශේෂඥයින් ( **Forensic Scientist** ) තුන්දෙනෙකු, මෘත ශරීරාගාර සහායකයින් ( **post mortem assistant** ) තුන්දෙනෙකු, විකිරණ නිලධාරීන් දෙදෙනෙකු, ඡායාරූප ශිල්පීන් දෙදෙනෙකු, පරිගණක දත්ත සැකසුම්කරුවන් දෙදෙනෙකු, රියදුරන් දෙදෙනෙකු, සාමාන්‍ය කම්කරුවන් දහදෙනෙකු සහ කාර්මික ඉංජිනේරුවෙකුගෙන් පරීක්ෂක කණ්ඩායම සමන්විත විය. සාමාන්‍ය කම්කරුවන් හැර අන් සියලුදෙනා බොස්නියානුවන් නොවූ අතර ඔවුහු විජාතිකයින් වූ හ. අධිකරණ වෛද්‍ය නිලධාරීන් සහ කණ්ඩායමේ සේවය කළ අනිකුත් නිලධාරීන් බොස්නියාවෙන් පරිබාහිරව අනිකුත් රටවලින් තෝරා ගත් අයවලුන් වූ හ. ඒ අනුව, ගුවතමාලාව, ආජන්ටිනාව, උරුගුවායි, ඇමෙරිකා එක්සත් ජනපදය, එංගලන්තය, ස්කොට්ලන්තය, ඩෙන්මාකය සහ ශ්‍රී ලංකාව වැනි රටවලින් විශේෂඥයින් තෝරා ගත්තේ පරීක්ෂණ පැවැත්වීමේ දී පක්ෂග්‍රාහී වූයේ යැයි යන චෝදනාව ඉවත් කිරීමට සහ පරීක්ෂණ කණ්ඩායමට ජාත්‍යන්තර තත්ත්වයක් ලබා දීමට ය.

සමූහ මිනීවල හාරා මළසිරුරු ගොඩ ගැනීමට සති හතරක් ගත වූ අතර සියලු මළසිරුරු පරීක්ෂා කිරීමට තවත් සති හයක් වසන්ත සෘතුවේ දී ගත විය. ඇමෙරිකානු ජාතික ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිලධාරියෙක් කණ්ඩායමේ නායකත්වය දැරුවේ ය. උපනායක වශයෙන් සේවය කළේ ද, ඇමෙරිකානු ජාතිකයෙක් ය. කණ්ඩායමේ විශේෂඥයින් තෝරා ගැනීම, ඔවුන් කැඳවීම, කණ්ඩායමට ආරක්ෂාව සැපයීම සහ නවාතැන් පහසුකම් සලසා දීම කණ්ඩායමේ නායකයාගේ වගකීම විය. පරීක්ෂණ පවත්වන අවස්ථාවේ ඒවායෙහි රහස්‍යභාවය රැකීමට 'සියලුදෙනා පොරොන්දු වී සිටි අතර, පුවත්පත්වලට සහ මාධ්‍යවේදීන්ට යම් තොරතුරක් දුන්නේ නම් එය කරන ලද්දේ කණ්ඩායමේ නායකයා සහ උපනායකයා විසින්ම පමණි. කණ්ඩායමේ අයට බොස්නියාවේ ඕනෑම ස්ථානයකට නිදහසේ යාමටත් එදිනෙදා ගමන් බිමන් යාමටත් අවසරය බොස්නියානු රජයෙන් ලබා දීමට ක්‍රියා කළේ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියා ය. එදිනෙදා ගමන් බිමන්, වාහන සැපයීම, පරීක්ෂණයට අවශ්‍ය උපකරණ, බඩු භාණ්ඩ සැපයීම, කණ්ඩායමේ අයට නවාතැන්



Scanned with CamScanner

පහසුකම් ලබාදීම, ගුවන් තොටුපොලේ සිට විශේෂඥයින් රැගෙන ඒම සහ පරීක්ෂණය සඳහා වෙන් කොට ඇති ප්‍රතිපාදන මනාව පාලනය කොට මුදල් පරිහරණය කිරීම යන මේ වගකීම් ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියා සතු විය.

ක්‍රොඒෂියාව සහ බොස්නියාව තුළ නිදහසේ කරදරයකින් තොරව ගමන් කිරීම සඳහා සහ පරීක්ෂණ කණ්ඩායමේ අයගේ ආරක්ෂාව සඳහා සාග්‍රේබ් ( Zagreb ) නුවර පිහිටා තිබූ එක්සත් ජාතීන්ගේ කාර්යාලයයෙන් අනන්‍යතා පතක් ( indentity card ) කණ්ඩායමේ සෑම කෙනෙකුටම නිකුත් කරන ලදී. නවාතැනෙන් බැහැරව සිටින විට එය පැළඳගෙන සිටීමට කණ්ඩායමේ සෑම කෙනෙකුටම උපදෙස් දී තිබුණි. රාජකාරී කටයුතුවලට යාමේ දී සහ පරීක්ෂණ පැවැත් වූ ස්ථානයේ දී කණ්ඩායමට ආරක්ෂාව සලසා දුන්නේ එක්සත් ජාතීන්ගේ ක්‍රියාන්විත හමුදාවේ ( Implementation Force ) සන්නද්ධ භටයන් ය. සති දෙකකට වරක් ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියා සහ ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ අධීක්ෂණය යටතේ, පරීක්ෂණ කණ්ඩායමට මුහුණ පෑමට තිබූ අනපේක්ෂිත ප්‍රශ්නවලට විසඳුම් සොයා ගැනීම සඳහා, සියලු දෙනාගේම අදහස් විමසා විසඳුම් ලබා ගන්නා ලදී.

ජාතිවාදී කෝල, හල ඇති වූ රටවල පානීය ජලය, විදුලිය, සන්නිවේදනය, සෞඛ්‍ය වැනි මූලික අවශ්‍යතාවන් පවා නොමැති තත්ත්වයක් බොස්නියාවේ දී ද තිබුණි. බොහෝ ස්ථානවල දවසේ පැය විසිහතර තුළම ජලය නො තිබුණි. මෙය ජාත්‍යන්තර වශයෙන් වගකීමෙන් යුතු පරීක්ෂණයක් බැවින් අවශ්‍ය සියලුම බඩු බාහිරාදිය බොස්නියාවට රැගෙන ඒමට සිදු විය. විදුලි උත්පාදන යන්ත්‍ර, ජල පොම්ප, ශීතකරණ, අධිශීතකරණ, ජංගම වැසිකිළි, නාන කාමර, විකිරණ යන්ත්‍ර, මෘත ශරීර පරීක්ෂා කිරීමට අවශ්‍ය සියලුම උපකරණ, නිදා ගැනීමට අවශ්‍ය තාවකාලික ඇඳන්, වීඩියෝ උපකරණ, කැමරා, ලිවීමට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය, කොළ, ආදර්ශ එකතු කිරීමට අවශ්‍ය මලු, ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, වාහන යනාදිය සහ පරීක්ෂණයට අවශ්‍ය සියලු දෙයක්ම ඇමරිකාවෙන් ගුවන් මගින් බොස්නියාවට රැගෙන එන ලදී. බොස්නියාවේ රඳවා තිබූ නේටෝ හමුදා කඳවුරෙන් අවශ්‍ය ඉන්ධන සපයා දෙන ලදී.



ජාතිවාදී මිනීමැරුම්වලට ලක්වූවන් වළලා තිබූ මිනීවලවල් හඳුනා ගැනීම තරමක් අපහසු වන්නේ එම පරීක්ෂණ පවත්වන විට බොහෝ කල්ගතවීමත්, එවැනි මිනීවලවල් හඳුනා ගැනීම සඳහා ඇසින් දුටු සාක්ෂිකරුවන් සොයා ගැනීම ඉතා අසීරු වීමත් නිසා ය. මෙම සාපරාධී ක්‍රියාවන් අවුරුදු පහකට පමණ පෙර සිදු වූ ඒවා බැවින් එම මිනීවලවල් හඳුනා ගැනීමට අසීරු වූයේ එම වලවල් මත ගස්වැල් වැවී පොලවේ දැකිය හැකි වෙනසක් නොතිබූ නිසා ය. කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිලධාරියා සහ වෝහාරක මානව විද්‍යාඥයන් ඇතුලු කීප දෙනෙක්; පරීක්ෂණය ආරම්භ කිරීමට පෙර බොස්නියාවට ගොස් ජනමාධ්‍ය මගින් අතුරුදහන් වූවන් පිළිබඳව තොරතුරු දැන ගැනීම සඳහා අතුරුදහන් වූවන්ගේ ඥාතීන් කැඳවා ඔවුන් සමග සාකච්ඡා කොට අවශ්‍ය විස්තර සහ ජාතිවාදී කෝල, හල ඇති වූ ස්ථාන සහ මිනී වලවල් තිබිය හැකි යැයි අනුමාන කරන ස්ථාන පිළිබඳව මහජනයාගෙන් තොරතුරු ලබා ගත් හ. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිලධාරියා සහ ජ්‍යෙෂ්ඨ වෝහාරක මානව විද්‍යාඥයා ඇතුළු තවත් නිලධාරීන් කීපදෙනෙක් සමූහ මිනී වලවල් ඇතැයි සැක කරන ස්ථාන පරීක්ෂා කිරීමට ගියෝ ය. අත් අඩංගුවට ගත් අයට වෙඩි තබන අවස්ථාවේ දී ගස්වලට වෙඩි වැදුනු ලකුණු, හිස් කබල් කීපයක් සහ හිස් වෙඩි උණ්ඩ කොපු කීපයක් එම ස්ථානයේ තිබී ඔවුන් විසින් සොයා ගන්නා ලදී. පරීක්ෂණ කණ්ඩායම නවාතැන් ගෙන තිබුණේ බොස්නියාවේ පිහිටි ටුස්ලා නගරයේ ය. පරීක්ෂණ පැවැත් වූ තාවකාලික මෘතශරීරාගාරය පිහිටා තිබුණේ ටුස්ලා සිට මිනිත්තු විස්සක පමණ වාහනයකින් යා හැකි ක්ලේෂියා ( Kjlaesia ) යන ස්ථානයේ ය. මෘත ශරීරාගාරය වශයෙන් පාවිච්චියට ගත්තේ, ජාතිවාදී අරගලයෙන් දැඩි ලෙස කැඩී බිඳී ගොස් තිබුණ රෙදිපිළි නිප්පදවන කම්හලකි ( garment factory ). කැඩී බිඳී ගිය මෙම කම්හලට නල ජලය, විදුලිය, සහ වාතාශ්‍රය සුලභව ලැබෙන සේ; බාහිර අයට නො පෙනෙන ලෙස පිළිසකර කොට තිබුණි. මෘත ශරීරාගාරයට දවසේ පැය විසි හතරේම ආරක්ෂාව සපයන ලද්දේ බොස්නියානු පොලිසිය මගිනි. ජලය හෝ විදුලිය සැපයීම නතර වුවහොත් ඒවා යථා තත්ත්වයට පත් කරන ලද්දේ කණ්ඩායමේ සේවය කළ ඉංජිනේරුවා විසිනි. විදුලිය සැපයීම නැවතුනහොත් එයට පිළියමක් වශයෙන් ඩීසල් වලින් ක්‍රියා කරන විදුලි උත්පාදක ජෙනරේටරයක් ආනයනය කොට මෘත ශරීරාගාර භූමියේ සවිකර තිබුණි. ටුස්ලා



Scanned with CamScanner

(Tuzla) නගරයේ සිට ක්ලේෂියා ( Kjlaesia ) දක්වා මහා මාර්ගයේ දෙපස තිබූ නිවෙස්වල දොර, ජනෙල් සහ බිත්තිවල අධිබලවේග වෙඩි උණ්ඩ වැදීමෙන් සිදු වූ සිදුරු සහ පිපිරීම් දක්නට තිබුණි. සමූහ මිනීවලවල් තිබුණේ ගෙවල් නොමැති තරමක් ඝන කැලෑ ප්‍රදේශයක ය. එම ස්ථානයට ප්‍රවේශ වීමට තිබෙන බොරලු පාර අවට සහ දෙපස තිබූ සියලු නිවාස කැඩී බිඳී බිත්ති පුපුරා පොලවට සමතලා වී තිබුණි. සමූහ මිනීවලක් හෑරීම උදලු සහ ගල් ඉති පාවිච්චි කොට පොලව හාරා කරන්නම් වාලේ කළ යුතු ක්‍රියාවක් නො වේ. පුරාවිද්‍යා කැනීම් කටයුතු කරන ආකාරයට සැලසුමක් සහිතව එහි කැනීම් සිදු කළ යුතු ය. එහි කැනීම් ඉතාමත් සුපරීක්ෂාකාරීව පස් තට්ටුවෙන් තට්ටුවට පරීක්ෂා කළ යුතු ය. වරකට අඟල් දෙකකට වඩා ඝනකම ඇති පස් තට්ටුවක් ඉවත් නො කළ යුතුය. එසේ කළහොත් කුඩා අස්ථීන් ලබා ගැනීමට නො හැකි වීමේ අවස්ථාව ඇත.

ප්‍රථමයෙන් මහ පොලව මත සිට තට්ටු වශයෙන් ක්‍රමයෙන් පස් ඉවත් කළ යුතු ය. වළලා තිබෙන මළසිරුරක කොටස් දිස් වූ විට පුරා විද්‍යා කැනීම් කරන ආකාරයට බුරුසු සහ කුඩා අත් ස්කෝප්ප මගින් මළසිරුර මත ඇති පස් ක්‍රමයෙන් ඉවත් කොට මළසිරුරු එකිනෙකට සාපේක්ෂව තිබෙන ආකාරය ඡායාරූප සහ වීඩියෝ ගත කරන ලදී. කැනීම් කරන අවස්ථාවේ දී සොයා ගන්නා ලද වෙඩි උණ්ඩ සහ කොපු කුඩා බ්‍රවුන් පේපර් ( brown paper ) මලුවල දමා රෙජිස්ටරයක ලේඛණගත කරන ලද අතර, මඩ නොමැති විට සෙන්ටි මීටර් දහයක් ඝණ තට්ටු වශයෙන් පස් ඉවත් කරන ලදී. පස්වල සැඟ වී තිබෙන වෙඩි උණ්ඩ හෝ කොපු සොයා ගැනීමේ අරමුණින් ඉවත් කරන පස් ද පෙනේරයක දමා ජලයෙන් සෝදා පරීක්ෂා කරන ලදී. පස්වල තිබී සොයා ගන්නා ලද වෙඩි උණ්ඩ සහ කොපු ද, බ්‍රවුන් පේපර් මලුවල දමා රෙජිස්ටරයේ සටහන් කරන ලදී.

ක්ලේෂියාවේ සමූහ මිනීවල තිබූ ස්ථානය මඩ වී තිබුණි. එම මිනීවල හෑරීමට පෙර එහි අවට බිම් බෝම්බ වළලා තිබේ දැයි පරීක්ෂා කරන ලද්දේ ස්වීඩන් ජාතික විශේෂඥ කණ්ඩායමක් (demining experts) විසින් ය. සමූහ මිනීවල කැනීම් කටයුතුවලට වෝහාරක මානව විද්‍යාඥයන්ගේ ( Forensic anthropologist ) සහාය



බෙහෙවින් ලබා ගන්නා ලදී. කැනීම් කරන විට ක්‍රමයෙන් පොලව මතුපිට සිට පස් ඉවත් කරන විට සෑම අවස්ථාවක්ම වීඩියෝ ගත කොට ඡායාරූප ගත කරන ලදී. සම්පූර්ණ වූ කොටස් වලින් සමන්විත වූයේ යැයි සිතන සෑම මළසිරුරක්ම නයිලෝන් මල්ලක (body bag) දමා එයට අනුක්‍රමික අංකයක් යොදන ලදී. මලු සියල්ලක්ම වාහනයක පටවා සර්ස්කා සිට ක්ලේෂියාවට ක්‍රියාත්මක සන්නද්ධ භටයන්ගේ ( inplementation force / IFOR ) ආරක්ෂාව යටතේ රැගෙන විත් සෙල්සියස් අංශක හතරක උෂ්ණත්වය ඇති ශීත කරන ලද කන්ටේනරයක ( container ) තබන ලදී.

සමූහ මිනීවලේ වළලා තිබූ අය කවුරුන් දැයි හඳුනා ගැනීම, ඔවුන්ගේ වයස හා ස්ත්‍රී පුරුෂ භාවය නිර්නය කිරීම, මරණයට හේතුව සහ මරණය සිදු කළ ආකාරය ( mode ), මළවුන්ගේ ජාතිය, සමාජ තත්ත්වය සහ වළලා තිබූ කාලසීමාව යන මේ කරුණු සොයා ගැනීම, පශ්චාත් මරණ පරීක්ෂණවල පරමාර්ථයන් වූයේ ය. සියලුම පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කරන ලද්දේ සුදුසු පරිදි පිළිසකර කරන ලද ක්ලේෂියාවේ පිහිටි තාවකාලික මෘත ශරීරාගාරක දී ය. මළසිරුරු තැන්පත් කරන ලද ශීතකරණ කන්ටේනරය, මළසිරුරු සහ මළසිරුරුවල ඇඳුම් සෝදා පිරිසිදු කරන ස්ථානය සහ ඇඳුම් අව් රශ්මියෙන් වේලන ස්ථාන යන මේවා සියල්ලක්ම පිහිටා තිබුණේ මෘත ශරීරාගාරයට බාහිරව අවට නුදුරු ස්ථානවල ය. මළසිරුරු විච්ඡේදනය කිරීම, ඒවා පරීක්ෂා කිරීම, ඇඳුම් ඡායාරූප ගත කිරීම, සොයා ගන්නා ලද ඇඳුම් පැලඳුම් සහ නොයෙකුත් භාණ්ඩ ඡායාරූප ගත කිරීම ඒවා ලේඛණ ගත කිරීම සහ ලබා ගත් දත්ත සියල්ලක්ම පරිගණකගත කිරීම යන මේ සියලු කටයුතු ඒවා කිරීමට දැනුම සහ කුසලතාවන් ඇති නිලධාරීන් විසින් මෘත ශරීරාගාරය ඇතුළත දී සිදු කරන ලදී.

සෑම මළසිරුරක්ම ප්‍රථමයෙන් පොලොරොස්කොපි (flouoroscopy) පරීක්ෂාවට භාජනය කරන ලදී. පොලොරොස්කොපි පරීක්ෂාව යනු එක්ස්රේ පරීක්ෂාවට සමාන එකකි. මළසිරුරේ ඇඳුම් මත හෝ මළසිරුර තුළ වෙඩි උණ්ඩ, කොපු හෝ වෙනත් ඕනෑම ලෝහමය ඒවා ඇත්නම් පොලොරොස්කොපි පරීක්ෂාවෙන් දැක ගැනීමට හැකි වේ. සියලුම මළසිරුරු දැඩි ලෙස කුණු වී තිබුණි. එමනිසා, ඇඟිලි සලකුණු ලබා ගැනීමට නො හැකි විය. මළසිරුරු



Scanned with CamScanner

සියල්ලම ගැඹුරු වළක වළලා තිබූ හෙයින් සතුන් හා දැමීමෙන් හටගන්නා ලකුණු දක්නට නො ලැබුණි. අස්ථීන් දිරාපත් වී නො තිබුණි. මෙයින් හැඟීගියේ වළලා දමා තිබූ සෑම මළසිරුරක්ම ඒ වන විට මාස විසි හතරක් පමණ කාලයක් තුළ වළලා දමා තිබූ බවයි. පොලොරොස්කොපි පරීක්ෂාවේ දී සොයා ගන්නා ලද වෙඩි උණ්ඩ, කොපු සහ වෙඩි උණ්ඩ යැයි සැක කරන සෑම ලෝහමය වස්තුවක්ම අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් මළසිරුරෙන් ඉවත් කර සෝදා පරීක්ෂා කොට, ලේඛණගත කිරීමෙන් පසුව වෝහාරක විශේෂඥයින්ට ( Forensic Scientist ) භාර දෙන ලදී. තවදුරටත් ඒවා පිරිසිදු කොට පරීක්ෂා කොට, ඡායාරූපගත කිරීමෙන් පසුව ඹුවුන් පේපර් මලුවල බහා භාණ්ඩ ලේඛණයේ ලේඛණගත කරන ලදී. සෑම මළසිරුරකින්ම සොයා ගන්නා ලද එවැනි උණ්ඩ සහ කොපුවල දත්ත, පරිගණකයට ඇතුලත් කරන ලදී. වෙඩි උණ්ඩ සහ කොපු පරීක්ෂා කිරීමෙන් ඒවා නිපද වූ රට සහ වර්ෂය සොයා ගැනීමට හැකි විය. සොයා ගන්නා ලද කොපු සියල්ලක්ම යුගොස්ලාවියානු ජාතික හමුදාව නිරූපනය කරන ඉංග්‍රීසි මුල් අකුරු වන J.N.A. ( Yugoslavian natioanal army ) යනුවෙන් සටහන් වී තිබුණි.

අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් පශ්චාත් මරණ පරීක්ෂක සහායකවරයාගේ ආධාරය ඇතිව මඩ සහ කුණු වී ගිය ඔප්ප් තැවරී තිබූ මළසිරුරුවල තිබූ ඇඳුම් ප්‍රවේශමෙන් ඉවත් කරන ලදී. පොලොරොස්කොපි කරන විට ඉවත් කිරීමට නො හැකි වූ වෙඩි උණ්ඩ සහ කොපු අධිකරණ වෛද්‍යවරයාට සොයා ගැනීමට හැකි වූ විට, ඒවා ද ලේඛණගත කොට වෝහාරක විද්‍යා විශේෂඥයන්ට භාර දෙන ලදී. මීට අමතරව සාක්කුවල තිබූ පසුම්බි, දුම්වැටි පැකට්, දුම්වැටි කොපු, ලියුම් කැබලි යන සියල්ලම ප්‍රවේශමෙන් ඉවත් කොට ලේඛණ ගත කොට තවදුරටත් පරීක්ෂාව සඳහා වෝහාරක විද්‍යා විශේෂඥ කණ්ඩායමට භාර දෙන ලදී. ඊට පසු මළසිරුරුවල ඇඳුම් පිරිසිදු කිරීම සඳහා ඒවා පිරිසිදු කරන කණ්ඩායමට භාර දෙන ලදී. එක් කණ්ඩායමක් විසින් ඇඳුම් සෝදා පිරිසිදු කොට අව් රශ්මියේ වේලන ලදී. වෙනත් කණ්ඩායමක් විසින් ඇට කැබලි සියල්ලක්ම සෝදා පිරිසිදු කරන ලදී. ඇටසැකිලි පිරිසිදු කිරීමට අධි පීඩනයෙන් ජලය සපයන නල ජලය භාවිතා කරන ලදී. කුණු වී ඇති මස් කොටස් ඉවත් කිරීමට සෝඩියම්



හයිපෝකොලෝරයිට් ( sodium hypochorite ) රසායනික ද්‍රව්‍ය තුළ අස්ථීන් පැයක පමණ කාලයක් බහා තිබීමෙන් පසුව නයිලෝන් කෙඳි සහිත බුරුසු පාවිච්චි කොට අස්ථීන් ශුද්ධ පවිත්‍ර කරනු ලැබී ය. එක් මළසිරුරක පොලොරොස්කොපි පරීක්ෂාවටත්, අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් එක් මළසිරුරක් පරීක්ෂා කිරීමටත්, ඇටකැබලි සෝදා පිරිසිදු කොට වේලීම සඳහාත් අවම වශයෙන් පැය තුනක පමණ කාලයක් ගත විය. සෝදා පිරිසිදු කොට වේලා පිළිසකර කරන ලද ඇට සියල්ලක්ම තවත් නිලධාරියෙකු විසින් එකිනෙකට පරීක්ෂා කොට නිසියාකාරව එක්කොට මැලියම් වලින් සවි කරන ලදී. වළලා තිබූ සෑම මළසිරුරකම ඇටසැකිලි ස්වාභාවිකව සිරුරේ පිහිටි ආකාරයට එකට එකතු කොට සම්පූර්ණ ඇටසැකිල්ලක් තනා ගැනීමට ප්‍රයත්න දරන ලදී. එකම මළසිරුරකවත් ඇට සියල්ලක්ම සොයා ගෙන පූර්ණ ඇටසැකිල්ලක් තනා ගැනීමට නො හැකි වුණි. මළසිරුරු එකක් මත තවත් එකක්, එකම මිනීවලේ අක්‍රමවත්ව තිබීමත් කැනීම් කටයුතු කිරීමේ දී මළසිරුරුවල අස්ථීන් මිශ්‍ර වීම ඊට හේතු විය. මළසිරුරු එකිනෙක මත සමූහ මිනීවල තුළ අක්‍රමවත්ව තිබූ බැවින්, කෙතරම් සුපරීක්ෂාකාරීව කැනීම් කටයුතු කළත්, මළසිරුරු ඉවත් කොට මලුවල දැමීමේ දී බොහෝ විට එක මළසිරුරක් ඉවත් කරන විට තවත් මළසිරුරක ඇට සමග මිශ්‍ර වීම සිදු වේ. මීට අමතරව දත්, පාදවල කුඩා ඇට සහ ක්ශේරුකා වැනි ඇට පස් ගුලිවල සැඟ වී තිබෙන නිසා මළසිරුරක තිබෙන ඇට දෙසීය හයම බොහෝ අවස්ථාවල සමූහ මිනී වළක කැනීම් කටයුතු කිරීමේ දී සොයා ගත නො හැකි ය. බොහෝ විට සොයා ගත හැක්කේ හිස් කබල, ප්‍රගණ්ඩාස්ථිය, අරාස්ථිය, අන්වරාස්ථිය, ජංඝාස්ථිය, අනුජංඝාස්ථිය, ඌර්ව අස්ථිය සහ උරපතු ඇටය, ශ්‍රෝණිය, කශේරුකා සහ අක්ෂක අස්ථීන් වැනි විශාල අස්ථීන් ය. ඇතැම් විටක කැනීම් කිරීමෙන් පසුව ලබා ගන්නා ලද අස්ථීන් බහාලන ලද එකම මල්ලක වෙනත් මළසිරුරකට අයත් අස්ථීන් තිබිය හැකි ය. සෝදා හැකි තරම් පිරිසිදු කොට පිළිසකර කරන ලද ඇට කැබලි කැඩී බිඳීගිය ඇට එකිනෙකට සවි කොට අලවා සම්පූර්ණ කරන ලද එක් මළසිරුරකට අයත් යැයි නිර්ණය කරනු ලබන ඇටසැකිල්ල මේසයක් මත තබා වෝහාරක මානව විශේෂඥ කෙනෙකුගේ සහාය ඇතිව අධිකරණ වෛද්‍යවරයා විසින් සුපරීක්ෂාකාරීව පරීක්ෂා කරන ලදී. එහි දී අස්ථීන්වල වයස, මරණයට පෙර අස්ථීන්වල සිදු වී තිබූ භග්න

සහ මරණයට පසුව සිදු වී තිබූ භග්න, සිදුරු, කැපීම් යනාදිය තිබේ දැයි දැන ගැනීමට ද පරීක්ෂා කරන ලදී. වෙඩිවැදීම්වලින් ඇතිවූ සිදුරු අස්ථීන්වල ඇත්නම් එම අස්ථීන්වල ඇතුල්වීමේ ( entrence ) සහ පිටවීමේ ( exit ) තුවාල කුමන ඒවා දැ යි එහිදී හඳුනා ගන්නා ලදී. ඒ අනුව, හඳුනා ගන්නා ලද සියලු තුවාල පූර්ව සකස් කරන ලද ඇටසැකිලි රේඛීය රූප සටහන් වල ( skeletal drawings ) ලේඛණ ගත කරන ලදී. එසේ කිරීමෙන් එක් එක් ඇට සැකිල්ලෙහි කොපමණ වෙඩි පහරවල් තිබුණේ දැයි සොයා ගත හැකි විය. ඊට පසුව සෑම ඌර්ව අස්ථියකින්ම නොහොත් කලවා අස්ථියකින්ම, D.N.A. පරීක්ෂාව සඳහා ඇට මිදුළු ( bone marrow ) ස්වල්පයක් ලබා ගන්නා ලදී. එකී D.N.A. පරීක්ෂාව කරනු ලැබුවේ ඇමෙරිකා එක්සත් ජනපදයේ සියැටල්හි පිහිටා ඇති පරීක්ෂණාගාරයේ දී ය.

ඉහත සඳහන් අන්දමට සෑම මළසිරුරක්ම පරීක්ෂා කිරීමෙන් පසුව ලබා ගන්නා ලද ඇඳුම්, මුදු, අත්ඔරලෝසු, සපත්තු මේස්, පසුම්බි සහ වෙනත් ලිපි ලේඛණ කඩදාසි කැබලි යන සෑම දෙයකම විස්තර පරිගණකයට ඇතුලත් කරන ලදී. ඊට අමතරව සෑම මළසිරුරක්ම සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් පූර්ව පිළිවෙලකට සැකසුම් කරන ලද වාර්තාවක් ( previously strcutrued report ) සකස් කරන ලදී.

සර්කා ( Cerska ) සමූහ මිනීවලේ ගොඩ ගන්නා ලද මළසිරුරු එකසිය විසි හයක වෙඩි උණ්ඩ සහ කොපු එක්දහස් දෙසීය තිස් දෙකක් තිබූ අතර ඇඳුම්, පසුම්බි, රියදුරු බලපත්‍ර සහ වෙනත් ලේඛණ යනාදියෙන් මළසිරුරු පහළොවක් නිසැකවම හඳුනා ගන්නා ලදී. ගොඩ ගන්නා ලද මළසිරුරු අවුරුදු පහළොවත් අවුරුදු හතළිස් පහත් අතර වයසැති පිරිමි අයවලුන් වූ අතර ඔවුන් සියල්ලකගේම දත් සෞඛ්‍ය සම්පන්නව නො තිබූ අතර ඔවුන් ඇඳ සිටියේ ඉරා ගොස් මසා තිබූ දිළිඳු අය අඳින ඇඳුම් ය. එකම ගැහැණියෙකුගේ ඇටසැකිල්ලක්වත් නො වී ය. මෙයින් හැඟෙන්නේ මොවුන් සියල්ලන්ම එකම ගමක හෝ ස්ථානයක දිළිඳුකමින් ජීවත් වූ පිරිමි අය බව. ය. බොහෝ හිස් කැබලිවල ද, ඇතැම් අයගේ පපුවේ, උදරයේ සහ ඉන ප්‍රදේශයේ ද වෙඩි පහරවල් වූ අතර, සෑම ඇටසැකිල්ලකම ද වෙඩි පහරවල් විය. බොහෝ ඇට සැකිලිවල



උණ්ඩ සිදුරු එකකට වඩා විය. සොයා ගන්නා ලද එකම අස්ථියකවත් කැපුම් හෝ ඇනුම් තුවාල නො වී ය. මෙයින් හැඟෙන්නේ මොවුන් සියලු දෙනාම එකම ස්ථානයක එකිනෙකට ආසන්නව සිටුවා තබා අධිබලවේග රයිපල් තුවක්කුවලින් එක්වරකට වඩා වැඩි වාර ගණනක් වෙඩි තබා මරණයට පත් කොට එකම වලක මාස දහනවයකට හෝ මාස විසි හතරක කාලයකට පෙර වළලා දමා ඇති බවය. මෙසේ වෙඩි තබා ඇත්තේ යුගෝස්ලාවියානු ජාතික යුධ හමුදාව විසින් බවත් නිගමනය කරන ලදී. රුවන්ඩාවේ සිදු වූ මෙවැනි ජාතිවාදී කෝල, හලවල දී සමූහව ඝාතනය කරන ලද අයගේ අස්ථීන්වල තිබුණේ මන්නාවලින් සිදු කරන ලද දරුණු කැපුම් තුවාල ය. යුධ අධිකරණයක මේ පිළිබඳව නඩු විභාග පවත්නා තුරු පරීක්ෂණයේ දී සොයා ගන්නා ලද සෑම භාණ්ඩයක්ම සහ සෑම ඇටසැකිල්ලක්ම නෙදර්ලන්තයේ හේග් නගරයේ පිහිටා ඇති යුධ අධිකරණයෙහි සුරක්ෂිතව තබා ඇත. යම් හෙයකින් වෛද්‍ය පරීක්ෂණ වාර්තා හඳුනා ගැනීමට උපකාරී වූ භාණ්ඩවල සත්‍යතාව හෝ සැකයක් විත්තිය විසින් ඉදිරිපත් කරන්නේ නම් ඒ පිළිබඳව නැවත විත්තිය වෙනුවෙන් පෙනී සිටින විශේෂඥයින් ලවා ඒවා පරීක්ෂා කිරීම සඳහා එවැනි පියවරක් ගෙන ඇත.

මීට අවුරුදු කීපයකට පෙර අප රටේ සූරියකන්දේ දී සමූහ මිනීවලවල් පරීක්ෂාවන් සිදු කළ ආකාරය මෙනෙහි කොට බොස්නියාවේදී එම පරීක්ෂණ සිදු කළ ආකාරය සන්සන්දනය කිරීම වැදගත් වනු ඇත. සූරියකන්දේ දී එම වලවල්වල වළලා තිබූ අය හඳුනා ගැනීමට නො හැකිව ඒවායේ අසම්පූර්ණ වාර්තා නීතිපති දෙපාර්තමේන්තුවේ ඇත. එක්සත්ජාතීන්ගේ ජාත්‍යන්තර ආයතනයේ අධීක්ෂණය යටතේ බොස්නියානු සමූහ මිනීවලවල්වල පරීක්ෂණ පැවැත් වූ ආකාරයෙන් ශ්‍රී ලාංකිකයන් වන අප පාඩම් ඉගෙන ගත යුතු ය.

නිරන්තරයෙන්ම බහුතර මිනිස් වර්ගයා නො දැනුවත්වම හෝ දැනුවත්ම හෝ අතිශය අමානුෂික කුරිරු ක්‍රියාවන්වලට පෙළෙඹෙන බවක් පෙනේ. එත්මන් දාර්ශනිකයන්ගේ පරම යුතුකම විය යුත්තේ මෙවැනි අසාමාන්‍ය පෙළඹවීම්වලින් මිනිසා ආරක්ෂා කර ගැනීමට වග බලා ගැනීම බව ගේබ්‍රියල් මාර්ෂල් පවසා තිබුණත් පැරණි යුගොස්ලාවියාවේ සිදු වූ දරුණු මිනිස් ඝාතන සිදු වූයේ දාර්ශනිකයින් මුනිවත රැක ගෙන සිටීම නිසා නො වේ දැයි අපට ප්‍රශ්න කළ හැකි ය.



Scanned with CamScanner



## කතුවරයා ගැන

මහාචාර්ය චන්ද්‍රසිරි නිරිඇල්ල මහතා රුහුණ සරසවියේ අධිකරණ වෛද්‍ය මහාචාර්යවරයා වන අතර ගාල්ල කරාපිටිය ශික්ෂණ මහ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා ලෙස ද කටයුතු කරයි.

කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ ආරම්භක ශිෂ්‍යයකු වන මොහු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයයේ කොළඹ වෛද්‍ය පීඨයේ M.B.B.S. ගෞරව උපාධියක් ලබා එංගලන්තය, ස්කොට්ලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය, බොස්නියාව සහ සිංගප්පූරුව ආදී රටවල අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැලී පර්යේෂණ කර පශ්චාත් උපාධි පුහුණුව ලබා ඇති අතර වර්තමානයේ එම ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරීව රාජකාරි කටයුතුවල යෙදී සිටින ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨතම අධිකරණ වෛද්‍ය මහාචාර්යවරයා ද, අධිකරණ වෛද්‍ය විශේෂඥවරයා ද වේ.

ශාස්ත්‍රීය කටයුතුවලට අමතරව 1989 වර්ෂයේ භීෂණ සමයේ සිට 1995 වර්ෂය දක්වා රුහුණ සරසවියේ උපකුලපති තනතුර දැරූ මොහු එතුළින් පරිපාලනය පිළිබඳව ද දැනුමක් ලබා ඇත්තෙකි. අධිකරණ වෛද්‍ය විද්‍යා දැනුම තවමත් ළදරු අවධියක පවතින අප රටේ ජනතාවට ඔහු ලබා ඇති දැනුම් සම්භාරයෙන් කොටසක් හෝ බෙදා දීමේ අරමුණින් ලියා ඇති මෙම පොත ඔහු විසින් සිංහල බසින් ලියන ලද ප්‍රථම ග්‍රන්ථය වේ.

අධිකරණ වෛද්‍ය විද්‍යාවේ සිද්ධාන්ත පදනම් කර ගනිමින් ඔහුගේ අත්දැකීම් නිර්මානශීලීව විස්තර කරන මේ පොතෙන් මහජනයාගේ අයිතිවාසිකම් පිළිබඳව අවබෝධයක් ද ලබා දෙන අතර අපරාධ පරීක්ෂණ ක්ෂේත්‍රයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීනට, පොලිස් නිල දරුවනට, රස පරීක්ෂක නිලධාරීනට, නීතිඥයනට සහ විනිසුරුවනට තම රාජකාරී කටයුතු නිසි අයුරින් කිරීමට මහ පෙන්වීමක් ද කෙරේ.

**මහාචාර්ය කාලෝ ෆොන්සේකා**

ISBN 955 - 95206 - 1 - X

මිල 200/=

Scanned with CamScanner